# දහම් පාසල

## 11 ශ්‍රේණිය

# බෞද්ධ සංස්කෘතිය

## පෙළපොත් ආශ්‍රිත කෙටි සටහන්

දන්ත වෛද්‍ය පීඨ බෞද්ධ සහෝදර සංගමයේ තිළිණයකි
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

පවතින COVID - 19
වසංගත තත්ත්වය
සැලකිල්ලට ගනිමින්
ඉගෙනුම් ඉගැන්වීම්
ක්‍රියාවලියේ පහසුව
වෙනුවෙන් මුල් කර්තෘනට
හානි නොවන අයුරින් දහම්
පාසල් පෙළපොත්
ආශ්‍රයෙන් කෙටිසටහන්
නිර්මාණය කරන ලදි.

තෙරුවන් සරණයි !

# පිදුම

ආදරණීය නංගියේ , මල්ලියේ...

ඔබේ දහම් නැණ වඩවාලන්නට...

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය

දන්ත වෛද්‍ය පීඨ

බෞද්ධ සහෝදර සංගමයෙන්

පිදෙන

දහම් පඩුරකි මේ...!



# පටුන


| | | පිටුව |
|---|---|---|
| 01. | බෞද්ධ සිරිත් විරිත්වල පදනම | 1 |
| 02. | පැවිදි ජීවිතය ආශ්‍රිත සිරිත් විරිත් | 4 |
| 03. | ගිහි ජීවිතයේ සිරිත් විරිත් | 20 |
| 04. | ශාසනික කටයුතු හෙවත් පිංකම් පිළිබඳ සිරිත් විරිත් | 31 |
| 05. | උත්සව හා සම්බන්ධ සිරිත් විරිත් | 39 |
| 06. | බෞද්ධ පාලකයින්ගේ සිරිත් විරිත් | 43 |
| 07. | බුදු දහම හා කලා ශිල්ප | 47 |
| 08. | බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පය | 49 |
| 09. | බෞද්ධ මූර්ති කලාව | 69 |
| 10. | බෞද්ධ කැටයම් කලාව | 76 |
| 11. | බෞද්ධ චිත්‍ර කලාව | 82 |
| 12. | බෞද්ධ සිංහල සාහිත්‍යය | 95 |
| 13. | බුරුමයේ බුදු දහම | 99 |
| 14. | තායිලන්තයේ බුදු දහම | 106 |
| 15. | චීනයේ බුදු දහම | 118 |
| 16. | ජපානයේ බුදු දහම | 126 |

# බෞද්ධ සංස්කෘතිය

## 1. පාඩම
## බෞද්ධ සිරිත් විරිත්වල පදනම

- "මිනිසුන්ගේ ඇතුලතත් පිටතත් දැල්ය. ඔවුන් ඒවායේ පැටලී සිටී. මෙය ලිහිය හැකි වන්නේ කෙසේදැයි", දෙවියකු විසින් බුදුන්ගෙන් විමසූ විට, බුදුන්, "ශීලයෙහි පිහිටා, සිත හා ප්‍රඥාව දියුණු කළ බුද්ධිමත් තැනැත්තා මෙය ලිහා ගනු යැයි" වදාළ සේක.

### නිවන් මග හා ශීලය

- මධ්‍යම ප්‍රතිපදාවේ ගමන් කිරීමෙන් විමුක්තිය ලබාගත හැක.
- මෙය සීල, සමාධි ,ප්‍රඥාව ඇති කරගැනීමට ඇති මාර්ගය වේ.
- සීලය යනු සම්මා වාචා, සම්මා කම්මන්ත ,සම්මා ආජීවයෙන් ජීවත්වීමයි.
- මෙය පංචශීලය ආරක්ෂා කිරීමෙන් ද රැකිය හැකිය.
- සමාධිය යනු සම්මා වායාම, සම්මා සති හා සම්මා සමාධි දියුණු කිරීමය.
- මෙමගින් සම්මා දිට්ඨියෙන් පොහොසත් වී, අවසානයේ සම්මා සංකල්පය දියුණු වීමෙන් ප්‍රඥාව ලබාගත හැකිය .
- නිවන ලබා ගැනීමට කරනු ලබන සදාචාරාත්මක වැඩපිළිවෙළ ශීලය වේ.

### හිරි ඔතප්

- හිරි ඔත්තප්ප - ශීලයට හේතු වන ලෝකපාලක ධර්මය/ දේව ධර්මය වේ.
- හිරි - පව් කිරීමට ඇති ලැජ්ජාව වේ. මේ බාහිර බලපෑමක් නිසාවෙන් හෝ තමාගේම අභ්‍යන්තරයෙන්ම එන හැඟීමක් නිසා සිදුවිය හැක.
- ඔත්තප්ප - පව් කිරීමට ඇති බිය වේ.
- මෙය ආකාර සතරකි.

1. අත්තානුවාද භය - තමන්ම තුළින් ඇතිවේ.
2. පරානුවාද භය - අනුන්ගේ දොස් නැගී දැයි සිතා ඇතිවන භය.
3. දණ්ඩ භය - දඬුවම් ලැබේ යැයි සිතා ඇතිවන භය.
4. දුගති බය - අපාය ගත වේ යැයි සිතා ඇතිවන භය

## චාරිත්‍ර හා වාරිත්‍ර ශීලය

- ශීලය දෙයාකාරයකි. චාරිත්‍ර ශීලය, වාරිත්‍ර ශීලය.

චාරිත්‍ර ශීලය - යහපත් හැසිරීම්වල නිරත වීමයි.
වාරිත්‍ර ශීලය - වැරදි හැසිරීමෙන් බැහැර වීමයි.

- මෙය රකින්නේද හිරිඔත්තප්පය වේ.

## සීලයේ ප්‍රභේද

### (A)පළමු වර්ග කිරීම

- ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය - උපසම්පදා භික්ෂු භික්ෂුණීන් සඳහා
- දස සීලය - සාමණේර සාමණේරයන් සඳහා
- පංචශීලය හා අෂ්ඨාංගික ශීලය - ගිහියන් සඳහා

### (B)දෙවන වර්ග කිරීම

- ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය - මෙයට බුදුන් වදාළ සියලුම ශික්ෂා පද අදාළ වේ.
- ඉන්ද්‍රිය සංවර ශීලය - මනස ද සමඟින් ලෝභ, මෝහ, දෝශ යන තුන් දොසින් පංච ඉන්ද්‍රියන් සංවර කර ගැනීම මෙයට අදාළ වේ.
- ආජීව පාරිශුද්ධ ශීලය - ධාර්මික දිවිපෙවතක් ගත කිරීමට පාරිශුද්ධ තත්ත්වය රැකී පංචශීලය හා අෂ්ඨාංගික ශීලය රැකීම.
- ප්‍රත්‍ය සන්නිශ්‍රිත ශීලය - චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලානො ප්‍රත්‍ය යන සිව්පසය පිළිබඳව ප්‍රත්‍යවේක්ෂා කර පිළිගැනීම වේ.

## සිරිත් විරිත් වල අභිමතාර්ථ

- සංඝයාගේ පහසුව, යහපත් බව සඳහා.
- මෙලොව, පරලොව දී ඇතිවිය හැකි  ආශ්‍රයන්ගෙන් ආරක්ෂා වීම හා ඒවායෙන් දුරුවීමට.
- ශික්ෂාකාමී පුද්ගලයන්ගේ පහසුව උදෙසා.
- නොහික්මුණු පුද්ගලයින්ට  නිග්‍රහ කිරීමට.
- නොපැහැදිලි වූවන්ගේ පැහැදීම උදෙසා.
- පැහැදුණු අයගේ පැහැදීම වැඩි කිරීම උදෙසා.
- බොහෝ කල් පැවතීමට.
- හික්මවීමට අනුබලයක් වීම සඳහා.

### සංක්ෂිප්තයක් ලෙස

- අභ්‍යන්තර ශික්ෂණයට
- බාහිර ඇවතුම් පැවතුම් නිසි ආකාරව පවත්වාගෙන යෑමට
- සාමූහික පැවැත්ම ඇති කිරීමට

## ගිහි පැවිදි වෙනස

- දෙපිරිසම මැදුම් පිළිවෙතෙහි ගමන් කරනු ලබයි.
- වෙනස් වන්නේ පැවිදි උතුමන් ගමන් කරන වේගය වේගවත් වීමය.
- ධම්මපදයෙහි සඳහන් වන පරිදි ඕරුව හිස් කළ තරමටම වේගයෙන් ගමන් කළ හැකි වේ.
- එම නිසා පැවිදි උතුමන් අල්පේච්ඡ ජීවිතයක් ගත කරනු ලබයි.

# 2. පාඩම
# පැවිදි ජීවිතය ආශ්‍රිත සිරිත් විරිත්

පැවිද්දෙහි අවස්ථා දෙකකි. - “පබ්බජ්ජා , උපසම්පදා “

I.පබ්බජ්ජා - සසුන්ගතවීම
II.උපසම්පදා - සංඝ ශාසනයේ පූර්ණ සාමාජිකයකුගේ තත්වයට පත් කරන අධිශීල ලාභය.

## පැවිදි බිමට ඇතුළත් වීමේ චාරිත්‍ර

- දෙමාපියන්ගේ අනුමැතිය ලද සත් අවුරුදු විය ඉක්මවූ, විරූපී නොවන පිරිමි දරුවකුට පැවිදි බිමට ඇතුළත් විය හැක.
- පැවිද්ද අපේක්ෂා කරන දරුවා රජ කුමරුවකු පරිද්දෙන් සරසා විහාරයට ගෙන යයි.
- අභිනිෂ්ක්‍රමණය කරනු ලබන ගිහි ජීවිතයේ සමෘද්ධිය සංකේතවත් කිරීමත්, සිදුහත් කුමරුගේ මහාභිනිෂ්ක්‍රමණය සිහිගැන්වීමත් නිරූපණය කරයි.
- හිස මුඩු කිරීම හෙවත් භණ්ඩු කර්මය කිරීම.
- මුල් කෙස් රොද දරුවාගේ අතට දී තච පංචක භාවනා කර්මස්ථානය කියා දෙයි.
- තච පංචකය - කෙස්, ලොම්, නිය, දත්, සම
- එක එකෙහි පිළිකුල් සහිත බව වටහා දෙයි.
- දරුවා පිරිසිදු කර සුදු වතින් හා උතුරු සළුවෙන් සරසයි.
- දෙමව්පියන්ගේ හා උපාධ්‍යායන් වහන්සේ ඇතුළු රැස්ව සිටින සංඝයා වහන්සේලාට වැඳ නමස්කාර කරයි.
- කුලදරුවා අටපිරිකර ඇතිව උපාධ්‍යායන් වහන්සේ ළඟ උක්කුටුකයෙන් හිඳ පැවිද්ද ඉල්ලයි.
- “අවසරයි ස්වාමීනි, මම පැවිද්ද ඉල්ලමි.” මෙලෙස තෙවරක් පැවිද්ද ඉල්ලයි.
- “සියලු දුක් නිවීම වූ නිර්වාණය සාක්ෂාත් කරනු පිණිස අනුකම්පා කොට මෙම සිවුරු ගෙන මා පැවිදි කරනු මැනවි”. යනුවෙන් නැවත තෙවරක් කියයි.
- පසුව සිවුරු පෙරවීම සිදු කරයි.
- සිවුරු හදිද්දී, පොරවද්දී චීවර ප්‍රත්‍යාවේක්ෂාව කළ යුතුය.
- “මේ සිවුරු හදින්නේ පොරවන්නේ ශීතල වළකාලනු පිණිස ය. උෂ්ණය වළකාලනු පිණිස ය.මැසි මදුරු පීඩා වළකාලනු පිණිස ය.” ලෙස සිහිකළ යුතුයි.
- පසුව “ අවසර ස්වාමීනි, තිසරණ සහිත පැවිදි දසසිල් ඉල්ලා සිටිමි. මා කෙරෙහි අනුග්‍රහ කොට මට සිල් දෙනු මැනවි.” ලෙස පැවිදි දස ශීලය ඉල්ලයි.

- දස ශික්ෂා,

    1. ප්‍රාණ වදයෙන් දුරු වීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.
    2. නොදුන් දෙය ගැනීමෙන් වෙන්වීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.
    3. අබ්‍රහ්ම චර්යාවෙන් වෙන්වීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.
    4. මුසාවාදයෙන් වෙන්වීමේ ශික්ෂාපදය සමාදන් වෙමි
    5. මත්පැනින් වෙන්වීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.
    6. අකාලයේ ආහාර ගැනීමෙන් වෙන්වීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.
    7. නාට්‍ය, ගීත, වාදන හා විසුළු දැකුම්වලින් වෙන්වීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.
    8. මල ගඳ විලවුන් දැරීමෙන් වෙන්වීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.
    9. උස් අසුන්, මහ අසුන් පිළිගැනීමෙන් වෙන්වීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.
    10. රන්, රිදී, මසු, කහවණු පිළිගැනීමෙන් වෙන්වීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

- සාමණේරයන් වහන්සේලා බණ කීම වැනි ආගමික චාරිත්‍ර ධර්ම පුහුණු කර ගත යුතුය.
- සාමණේර නම විනය කර්මයක් කිරීම සඳහා සුදුස්සෙක් නොවේ.

## උපසම්පදා චාරිත්‍ර

- විසි වසක් සම්පූර්ණ වූ සාමණේර නමක් උපසම්පදාව ලැබීමට සුදුසු වෙයි.
- මෙම විනය කර්මය විශේෂ සීමාවක සිදුකරයි.
- විශේෂ සීමා දෙවර්ගයකි.
- විහාර භූමියක සකස් කරගනු ලබන "විහාර සීමාව" එක් වර්ගයකි.
- ගඟක් ඇතුළත හෝ දියෙන් වට වූ ස්ථානයක සකස් කරගනු ලබන "උදකුක්ඛෙප" සීමාව අනෙක් වර්ගයයි.
- මෙම විනය කර්මයට උපසම්පදා භික්ෂූන් හා උපසම්පදා අපේක්ෂකයන් පමණක් සහභාගි වෙයි.
- උපසම්පදා අපේක්ෂකයා සුදු වතින් හා සළුවෙන් සැරසී අටපිරිකර සහිතව සංඝයා වෙත පැමිණෙයි.
- එම සංඝයා අතුරෙන් ජ්‍යොෂ්ඨ තෙර නමකට තම උපාධ්‍යායන් වහන්සේ වශයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටියි.
- මෙය උපාධ්‍යාය ගහණ නමින් හැඳින්වෙයි.
- උපසම්පදා අපේක්ෂකයා නාග නමින් හඳුන්වයි.
- උපසම්පදා කර්මය අවසන් වනතුරු උපාධ්‍යයන් වහන්සේ තිස්ස නමින් හඳුන්වයි.
- "කම්මාචරිය" නමින් හැඳින්වෙන භික්ෂුවක් නාගට උපදෙස් දීම සඳහා මහා සංඝයාගෙන් අවසර පතයි.
- අවසරය ලද පසු නාග මහා සංඝයාගෙන් ඉවත් කරයි.
- අටපිරිකර හඳුන්වාදී, සංඝයා ඉදිරියේ අන්තරායික ධර්මය නැමැති ප්‍රශ්න වලට පිළිතුරු දෙන ආකාරය කම්මාචරිය විසින් කියා දෙනු ලබයි.

- අන්තරායික ධර්ම වලට ඇතුලත් වන්නේ උපසම්පදා අපේක්ෂකයාගේ සෞඛ්‍ය විමසීම පිළිබඳව අසන ප්‍රශ්නත් ඔහු සමාජ බැඳීම හා වගකීම් වලින් යුක්ත කෙනෙක්දැයි විමසා බැලීමට අසනු ලබන ප්‍රශ්නත් ය.
- නැවතත් නාග මහා සංඝයා වෙත කැඳවනු ලබයි.
- මහා සංඝයාගේ පා වැඳ "ස්වාමීනි, සංඝයාගෙන් උපසම්පදාව ඉල්ලමි. අනුකම්පා කොට මා සාමනේර භාවයෙන් මුදවා." යනුවෙන් තෙවරක් අයැද සිටී.
- පසුව කම්මාචාරින් වහන්සේ මහා සංඝයාගෙන් අවසර ලබාගෙන නාගගෙන් අන්තරායික ධර්ම පිළිබඳ ප්‍රශ්න විචාරයි.
- නාගගේ පිළිතුරුවලින් මහා සංඝයා සෑහීමට පත්වුවහොත් උපසම්පදා කර්මයට අනුමැතිය ලැබෙයි.
- පසුව මහා සංඝයා විසින් "මේ නම ඇති උපාධ්‍යායන් වහන්සේට අනුයුක්තව මේ නම ඇති තැනැත්තේ උපසම්පදා කරන ලද්දේය" යන කර්ම වාක්‍ය කීමෙන් උපසම්පදා කර්මය අවසන් වෙයි.
- උපසම්පදාව ලැබූ භික්ෂුව විනය කර්මවලට සහභාගිවීමට සුදුසුකම ලබයි.
- භික්ෂු ප්‍රාතිමොක්ෂය යනු උපසම්පන්න භික්ෂුවක් කෙරෙහි බලපාන ආචාර ධර්ම පද්ධතිය යි.
- ථේරවාද භික්ෂු ප්‍රාතිමෝක්ෂයේ ශික්ෂාපද 227 කි.

## දෛනික පැවිදි චාරිත්‍ර

- හිරු නැගෙන්නට පළමු භික්ෂුව අවදි වේ.
- සතර ආරක්ෂා භාවනාවෙන්: එනම් බුද්ධානුස්සති භාවනාව, මෛත්‍රී භාවනාව, අසුභ කම්මට්ඨාන භාවනාව හා මරණානුස්සති භාවනාව යන මින් එකක් වඩමින් ස්වල්ප වේලාවක් කල් ගෙවයි.
- බෝ මළුව හා සෙසු තැන් අතුපතු ගා පවිත්‍ර කරයි.
- දැහැටි වළඳා මූණ කට සෝදා, මනාව සිවුරු හැඳ පුරවා චෛත්‍යය හා බෝධීන් වහන්සේ වඳියි.
- උදෑසන බුද්ධ පූජාව පවත්වයි.
- උදෑසන හීල් දානේ වළඳයි.
- අභ්‍යන්තර පාරිශුද්ධිය හා බාහිර පාරිශුද්ධිය පිළිබඳ කටයුතුවලට මුල් තැනක් දෙයි.
- හිසකෙස් දැඟුලක් දික් වීමට ප්‍රථම හෝ දෙමසක් ගෙවීමට ප්‍රථම හිසකෙස් බෑම සිදු කරයි.
- සිවුරු හරිහැටි මසා සෝදා පඩු පොවා පිරිසුදුවට තබා ගනියි.
- ලැගුම් ගෙය පවිත්‍ර කොට පිළිවෙලකට තබා ගනියි.
- අවශ්‍ය විටෙක විරේක බෙහෙත් ආදිය පාවිච්චි කරයි.
- දහවල් දානයෙන් පසුව ධර්ම ශාස්ත්‍රීය ඉගැන්වීම් කටයුතුවල නිරතවෙයි.
- සාමනේරයන් වහන්සේලා පිරිවෙන් වලට හෝ පෞද්ගලික පැවිදි ආචාර්යවරයන් වෙත ගොස් ධර්ම ශාස්ත්‍රය හදාරති.
- සූත්‍ර සජ්ඣායනා කිරීමද සිරිතකි.
- වැඩිමහල් තෙරුන් වහන්සේ නමක විසින් ධර්ම දේශනයක් පවත්වන අතර පසුව ගැටලු තැන් සාකච්ඡාවට භාජනය කරයි.
- සාමාන්‍යයෙන් සතර පෝයටම ආරාම වල ධර්ම දේශනා පවත්වයි.

- සන්ධ්‍යාවේ දී ගැමියෝ ද ධර්ම ශ්‍රවණයට පැමිණෙයි.
- භික්ෂූන් විසින් සන්ධ්‍යාවේ දී විහාරයට පැමිණෙන උපාසක උපාසිකාවන් පංච ශීලයෙහි පිහිටුවා මල් පහන් පූජා හෝ බුද්ධ පූජා වැඩසටහන් මෙහෙයවයි.
- කළුවර වැටීගෙන එද්දී බෝමැඩ හා දාගැබ වටා පහන් දල්වා මල් පහන් ගිලන්පස පූජා කොට වන්දනාවේ යෙදී ස්වල්ප වේලාවක් භාවනාවේ යෙදෙයි.
- දවස අවසානයේ ආචාර්යවරයන් හා වැඩිමහල් භික්ෂූන් වැඳ සමා කරගනියි.

## සිව්පස පරිභෝගය පිළිබඳ පොදු සිරිත්

- චීවර (ඇඳුම්) , පිණ්ඩපාත (ආහාර), සේනාසන (ගෙවල් දොරවල්) හා ගිලානප්‍රත්‍ය (බෙත්හේත්) යන්න සිව්පසයට අයත් වේ.
- සිල්වතුන් විසින් සිවුපසය පරිභෝග කළ යුත්තේ කෙලෙස් වලට භාජනය නොවන පරිද්දෙනි. මෙය ප්‍රත්‍යාවේක්ෂා කිරීම නම් වේ.

### ප්‍රත්‍යවේක්ෂා කිරීම

- ‘‘මා මේ සිවුරු පරිභෝග කරන්නේ සීතල නැති කරගැනීමට හා උෂ්ණය වළක්වාගැනීමටය. අව්වෙන් සුළඟින් ආරක්ෂා වීමට හා මැසි මදුරු, පත්තෑ, ගෝනුසු ආදියෙන් වන පීඩා වළක්වා ගැනීමටය.නො වැසුවහොත් ලැජ්ජාව නැතිවන ශරීරාවයවයන් වසා ගනු පිණිසය.’’ ආදී වශයෙන් සිවුරු බාර ගැනීමේදීත් සිවුරු පරිභෝග යෙදීත් මෙනෙහි කිරීම සිවුරු පිළිබඳ ප්‍රත්‍යාවේක්ෂාවයි.
- මේ ආකාරයෙන් ආහාර ප්‍රත්‍යාවේක්ෂාව, සේනාසනය ප්‍රත්‍යාවේක්ෂාව හා ගිලන්පස ප්‍රත්‍යාවේක්ෂාව සිදුකරයි.
- ප්‍රත්‍යාවේක්ෂා කිරීමෙන් සිවුපසය වැළඳීම එම සිව්පසය දෙන්නවුන්ට මහත්ඵල මහානිශංස වීමට හේතු වේ.
- සිව්පසය ප්‍රත්‍යාවේක්ෂා කිරීමේ පිළිවෙතින් ලද දෙයින් සතුටු වීමට මග පෙන්වයි.
- ‘‘මා මේ භුක්තිවිඳින දෙය මා ධාර්මිකව උපයා ගත් දෙයකි’’ යි ගිහියාටද ප්‍රත්‍යාවේක්ෂා කළ හැකිය.
- ගිහියා ද පෙහෙවස් සමාදන් වූ විටදී භික්ෂූන් වහන්සේලා ලෙසින් ආහාර ප්‍රත්‍යාවේක්ෂා කර වැළඳීමේ චාරිත්‍රය පුරයි.
- සේඛියා නමින් හැඳින්වෙන ශික්ෂා පද පන්සැත්තෑවක් භික්ෂු විනයෙහි ඇතුළත් වේ.
- මෙයින් සිවුරු පෙරවීම, දන් වැළඳීම ආදී කාර්යයන්හි පැවතිය යුතු ආකාරය පිළිබඳව මඟ පෙන්වයි.
- ආගන්තුක වත, ආවාසික වත, සේනාසන වත ආදී වශයෙන් පැවිදිවත් 14 කි.

## සිවුරු හැඳීම හා පෙරවීම

- බුදුරජාණන් වහන්සේ විසින් සිව්පසයෙන් මුල්තැන සිවුරට දී ඇති අතර දෙවැනි තැන දී ඇත්තේ පිණ්ඩපාතයටයි.
- සිවුරු කට්ටලයට තුන් සිවුරක් ඇතුළත්ය.
- අන්තරවාසක, උත්තරාසංග, ශංඝාටිය වශයෙන් හෝ සාමාන්‍ය ව්‍යවහාරයේදී අඳනය, තනිපට සිවුර හා දෙපට සිවුර ලෙස හඳුන්වයි.
- සිවුරු හැඳීම හා පෙරවීම පිළිබඳ ව සේඛියා ශික්ෂා පද හතරක් දක්වා ඇත.

  i. පරිමණ්ඩලාකාරව සිවුර හැදිය යුතුය යනු පළමුවන ශික්ෂා පදය යි.
  ii. පොරවන සිවුර ද (තනිපට සිවුර) පරිමණ්ඩලාකාරව පෙරවිය යුතුය යනු දෙවැනි ශික්ෂා පදයයි.
  iii. විහාරයෙන් පිටව යන විට මනාකොට සිවුරෙන් කය වසා ගෙන ගමනෙහි යා යුතුය යනු තුන්වෙනි ශික්ෂා පදය යි.
  iv. මනාකොට සිවුරෙන් කය වසා ගෙන ගමෙහි හිඳිය යුතුයි යනු 4 වන ශික්ෂා පදය යි. උරහිස අත් ආදිය විවෘත කරගෙන ගමෙහි නොහිඳිය යුතුයි යනු මෙහි අදහසයි.

- අඳනය හැඳ පටියක් බැඳීම කළ යුතුය.
- අංසකඩය,  බැනියමක් හෙවත් කංචුකයක් වශයෙන් නොව පොරෝනා පරිෂ්කාරයක් වශයෙන් සකස් කර ගත යුතුය.
- අශෝක වැනි චන්ඩ රජකු ධර්ම විජය කළ සක්විති රජකු බවට පරිවර්තනය වූයේ නිග්‍රෝධ සාමණේරයන් වහන්සේගේ විනීත, සංවර දර්ශනය නිසාය.
- සිවුරු තුනක් ළඟ තබා ගැනීමට භික්ෂුවකට විනයෙන් ඉඩ ලැබී ඇත.

## ගිහියන්ගේ ඇඳුම් භාවිතය පිළිබඳ සිරිත්

පෙකනිය නොදක් වා
සළු ඇඳ බොලට දක් වා
නොපව තන සක් වා
සිනා නොමසෙන් දසන් දක් වා

නොකියා සිය හිමි ට
නැතිව ද උතුරු සළු ප ට
ගමන් ඉක්මන් කො ට
නොයන් නුඹ වසන ගෙන් පිටත ට

- කාව්‍ය ශේඛරයෙහි පියෙකු දියණියට දුන් අවවාදය ඉහත පරිදි වේ.
- උඩරට බෞද්ධ මනාළියන් සුදු පැහැ ඇඳුමෙන් සැරසුණේය.

- ආගමික කටයුතු වලට, අවමංගල කටයුතු වලට, විශේෂ උත්සව වලට බෞද්ධයන් සුදු ඇඳුමෙන් සහභාගි වෙයි.
- නිතර පවිත්‍ර ඇඳුම් ඇඳිය යුතුය.
- ගමනක් ගොස් ආ විට දහඩියෙන් තෙත් වූ ඇඳුම් අව්වේ දමා වේලා ගත යුතුය.
- තෙත රෙදි කිසිවිටෙක ගුලි ගසා නොතැබිය යුතුය.
- තෙත ඇඳුම් දොරවල් උඩ, ඇඳ හෝ පුටු ඇදි මත වැනීමෙන් වැළකිය යුතුය.

## දන් වැළඳීම පිළිබඳ සික පද

- දන් වැළඳීම සඳහා භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් පනවා වදාළ සේඛියා ශික්ෂා පද 30කි.
- සිහියෙන් යුතුව ආහාර පිළිගත යුතුය.
- තමා වළඳන්නාවූත්, නොවළඳන්නාවූත් සෑම දේම බෙදෙන තරමක් බෙදීමට ඉඩ නොදිය යුතුය.
- පාත්‍රයට යොමු කළ සිත් ඇති ව ආහාර පිළිගත යුතුය.
- ආහාර බෙදද්දී නොසැලකිල්ලෙන් වට පිට බැලීම නුසුදුසුය.
- පාත්‍රයේ ගැටියේ යට මට්ටමට ආහාර පිළිගත යුතුය.
- බතට සෑහෙන පමණට සූප පිළිගත යුතුය.
- සිහියෙන් හා සැලකිල්ලෙන් ආහාර වැළඳිය යුතුය.
- පාත්‍රයට යොමු කළ සිත් ඇතිව ආහාර වැළඳිය යුතුය.
- ආහාර බඳුනෙහි තැනින් තැන නොවළඳා පිළිවෙලින් කොනක සිට වැළඳීම ආරම්භ කළ යුතුය.
- බඳුනෙහි මුදුනෙන් ආහාර අනා වැළඳීම ද නොකළ යුතුය.
- ව්‍යංජන ආදිය වැඩියෙන් ලබා ගන්නා අටියෙන් බෙදූ ඒවා බතින් නොවැසිය යුතුය.
- ගිළනකු නොවේ නම් පිට අයගෙන් බත් හෝ ව්‍යංජන ඉල්ලීම ද නුසුදුසු .
- අවමන් කරන අදහසින් අනුන්ගේ පාත්‍රය දෙස නොබැලිය යුතුය.
- අඩුවක් ඇති නම් දීම හෝ දෙවීම පිණිස බැලීම වරදක් නොවේ.
- බත් පිඩු මහත් කොට සාදා නොවැළඳිය යුතුය.
- බත් පිඩු රවුම් කොට තනා වැළඳිය යුතුය.
- බත් පිඩු මුව ළඟට ගන්නට කලින් කට ඇරීම සුදුසු නැත.
- වළඳනා කළ සම්පූර්ණ අතම කට තුළට නොදැමිය යුතුය.
- ආහාර කටට විසි නොකළ යුතුය.
- මුව තුළ ආහාර තබාගෙන කතා නොකළ යුතුය.
- බත් පිඩ කටින් කඩාගෙන කෑම ද නුසුදුසුය.
- වඳුරන් මෙන් ආහාර හක්කේ තබා ගෙන නොවැළඳිය යුතුය.
- වළඳද්දි අත ගසා දැමීමෙන් බත් හුළු විසුරුවීමෙන් වැළකිය යුතුය.
- දිව එළියට දමා වැළඳීම නුසුදුසු ය.
- තළු ගසා ආහාර නොවැළඳිය යුතුය.
- ‘‘සුරු සුරු’’ හඬ නංවමින් ආහාර නොවැළඳිය යුතුය.
- වළඳද්දි අත ලෙව කෑම නුසුදුසුය.
- ඇඟිලි වලින් පාත්‍රය සූරා වැළඳීම ද නුසුදුසුය.

- වළඳද්දී තොල් ලෙවකෑම නුසුදුසුය.
- ඉඳුල් තැවරුණු අතින් පැන් බඳුන් ආදිය නොඇල්ලිය යුතුය.
- බත් හුළු සහිත පාත්‍ර සේදූ වතුර බිම නොදැමිය යුතුය.
- වතුර, බත්, කටු, ලෙලි ආදිය වළඳන තැන දැමීමෙන් අපිරිසිදු නොකල යුතුය.
- වළඳන තැන, සොටු සීරීම නොකළ යුතුය.
- භාජනවල හැඳි ගැටෙන ශබ්ද ඇති කරවමින් ආහාර ගැනීම.
- පමණ දැන ආහාර වැළඳිය යුතුය.
- මේ සියලු ශික්ෂා පද සම්පිඩනය කලවිට ප්‍රධාන ආචාරධර්ම කිහිපයක් මතු කරගත හැක.

1. ආහාර අපතේ නොයන පරිද්දෙන් පිළිගත යුතුය. වැළඳීම කළ යුතුය.
2. ආහාරයෙහි පමණ දැන වැළඳීම කළ යුතුය.
3. එකට ආහාර ගන්නා අය තුළ පිළිකුලක් ඇති නොවන පරිද්දෙන් ආහාර ගත යුතුය.
4. බලා ඉන්නා අය තුළ ද අප්‍රසන්නතාවයක් ඇති නොවන පරිද්දෙන් ආහාර ගත යුතුය.
5. ආහාර ගැනීමේදී ආහාර ගන්නා ස්ථානයේ පවිත්‍රතාවයත් තම තමන්ගේ ඇඳුම් පැළඳුම් වල පවිත්‍රතාවයත් රැක ගත යුතුය.

## ආහාර ගැනීමේ ගිහි සිරිත්

- කෑම ගැනීමට ප්‍රථම අත කට සෝදා ගත යුතුය.
- කෑම මේසයේ දී පවා වැඩිහිටියන්ට සැලකිය යුතුය.
- අමුත්තන් සිටින්නේ නම් ඔවුන්ට සංග්‍රහ කිරීම ද පළමුවෙන් කරනු ලැබේ.
- පළමුවෙන් තමන්ට බෙදාගැනීම බෞද්ධ සිරිතක් නොවේ.
- ආහාර තමන්ට සෑහෙන පරිදි බෙදා ගත යුතුය.
- කෙනෙකුත් බෙදන්නේ නම් අතිරික්ත වන පරිදි නොගැනීමටත් සිත තබාගත යුතුය.
- කෙනෙකු බෙදද්දී තමන්ට අනවශ්‍ය නම් පිඟානට උඩින් පිටි අල්ල ඇල්ලීම සිරිතකි.
- සියලු දෙනාම එකවර කෑම ගැනීම ආරම්භ කිරීම බෞද්ධ සිරිතකි.
- කෑමට ගිජු නොවී පමණ දැන කෑම ගැනීම කළ යුතුය.
- ''චත්තාරො පංච ආලොපෙ- අභුත්වා උදකං පිවේ
  අලං ඵාසු විහාරාය - පහිතත්තස්ස භික්ඛුනො''
  ''නිවන් ලබනු රිසි පැවිද්දා විසින් සම්පූර්ණයෙන් කුස පිරී තද නොවන්න පරිදි බඩට අල්ලන ප්‍රමාණයෙන් බත් පිඩු හතරක් පහක් අඩුකොට වළඳා පැන් පානය කළ යුතුය. එසේ වැළඳීමෙන් ඉරියව් පැවැත්වීමේ පහසුවත් නිරෝගී භාවයත් ඇති වන්නේය.'' මෙලෙස බුදුන් වහන්සේ භෝජනයේ මිම්ම හඳුන්වා දී ඇත.
- භොජනම්හි ච මත්තඤ්ඤුං - බුදුරජාණන් වහන්සේ විසින් ධම්මපදයේ යමක වග්ගයේ පෙන්වා දී තිබෙන්නේ ආහාරයේ පමණ දැන ගැනීම මාරයාට මැඩලීමට නොහැකි වන පුද්ගලයෙකු තුළ තිබෙන ගුණධර්මයක් වශයෙනි.
- කෑම බෙදා ගැනීමේදී අන්‍යයන්ට කරදරයක් නොවිය යුතුය.
- අන්‍යයන්ට අප්‍රසන්නතාවයක් ඇති නොවන පරිද්දෙන් කෑම ගැනීම සිදුකළ යුතුය.

- හෝජන සංග්‍රහයකදී නම් එක් එක පිඟාන වෙනුවෙන් තබා ඇති අත්පි  ස්නාව ඔඩොක්කුවේ එළා ගැනීම හොඳ බෞද්ධ සිරිතකි.
- කෑම මේසයකදී සියලු දෙනාම කෑම කා අවසන් වනතුරු අත සේදීම හෝ අසුනින් නැගිටීම නොකළ යුතුය.

## සේනාසන පරිභෝගය පිළිබඳ සිරිත් විරිත්

- “ආරෝග්‍යා පරමා ලාභා” නීරෝගීකම උතුම් ලාභයකි
- පුද්ගලයෙකුගේ අභ්‍යාන්තර පවිත්‍රතාවය මෙන්ම බාහිර පවිත්‍රතාවය ද බුදුදහමෙහි දී ඉතා අගය කොට සලකයි.
- සෙනසුන පවත්වා ගන්නා අයුරු, වැසිකිළි භාවිතය, බොජුන් හල හා ආහාර ගන්නා අයුරු, ගිලනුන්ට උවටැන් කිරීම ආදිය පිළිබඳ ව බුදුන් වහන්සේ විසින් උපදෙස් දී ඇත.

### සේනාසන වත

- යම්කිසි විහාරයක වසන භික්ෂූන් විසින් පන්සල හෙවත් ආරාමය පවත්වා ගැනීම සඳහා පැවැත්විය යුතු පිළිවෙත මෙයින් අදහස් කෙරේ.
- ඇඳ, පුටු, පඩික්කම්, බුමුතුරුණු ආදිය අව්වේ වියළා ධූලි ඉවත් කොට පවිත්‍ර කළයුතුය.
- මකුළු දැල් ආදිය ඉවත් කොට පළමුව උඩ පිසදා ඉන්පසු බිත්ති හැමද පසුව බිම ඇමදිය යුතුය.
- ගෙබිම දූලි වැඩිනම් වතුර ඉස දූලි නොනැගෙන සේ ඇමදිය යුතුය.
- කුණු කසළ ප්‍රමාණය වැඩි නම් පළමුව අතින් ගෙන ඉක්බිති ඉලපතෙන් අතුගා පුරවාගෙන කුණු කසල ඉවත්කළ යුතු තැනට ගෙන ගොස් දමා අත් සෝදා ගත යුතුය.
- බුමුතුරුණු ආදිය අතුරා පළමු තිබූ පිළිවෙලින් ඇඳ පුටු ආදි අසුන් පැනවිය යුතුය.
- ධූලි සහිත වාතය එන දිශා වල දොර ජනෙල් වැසිය යුතුය.
- ඒ ඒ වෙලාවට සුදුසු පරිදි කවුළු ඇරීම හා වැසීම කළ යුතුය.
- විහාරය විවෘත වන පරිදි නිතරම කවුළු හැර තැබීම නොකළ යුතුය.
- මිදුල් ඇමද කසළ ඉවත් කළ යුතුය.
- සෑ මලු, බෝ මලු,  ප්‍රතිමා ගෘහ පිරිසිදු කර තැබිය යුතුය.
- බොන පැන්, පරිභෝග පැන් තැබිය යුතුය.
- මොහොතකට පෙර තමන් අතුපතු ගෑ මිදුල දෙස බලා සිටීමෙන් ලත් ප්‍රීතියෙන් ඇතැම් භික්ෂූන් නිර්වාණය පවා අවබෝධ කරගත් බව සමන්තපාසාදිකාවේ සඳහන් වේ.
- ආගන්තුක භික්ෂුවක් ආරාමයට පැමිණියේ වී නමුත් එහි සෙනසුනක් ලද කල්හි පළමුවෙන් කළ යුතුව ඇත්තේ එය කලින් අනිකකු විසූ තැනක් ද නො විසූ තැනක් දැයි විමසා බැලීමයි.
- අනිකකු නො විසූ තැනක් නම් පරීක්ෂාකොට එයට ඇතුළු විය යුතුය. එසේ කළ යුත්තේ ස්ථානය ආරක්ෂා සහිත තැනක් දැයි යන්න දැන ගැනීමටයි.

## ගිහියාට ආදර්ශයක්

- අමදිනු ලැබූ ආරාම මිදුලෙහි පවිත්‍රත්වය.
- ශිෂ්‍යයා ගුරුවත් පිරීමක් වශයෙන් ආචාර්යවරයා වැළඳූ පාත්‍ර භාජනාදිය සෝදා තැන්පත් කිරීම.
- ආචාර්යවරයාගේ සිවුරු තෙත නම් වියළා නමා තැන්පත් කර තැබීම.
- පැන් භාජනය පුරවා වසා තැබීම.
- ආරාමයේ භාණ්ඩ ඒ ඒ දේවලට නිසි තැන තබා ගැනීම.
- ආරාමයේ ඇතුල් වන භික්ෂූන් වහන්සේ පාවහන් ගලවා පිටතින් තැබීම.

## ගමික වත

- යම්කිසි සෙනසුනක වාසය කර එයින් පිට ව යන තැනැත්තා විසින් පිළිපැදිය යුතු වත ගමික වතයි.
- යම්කිසි සෙනසුනක වාසය කර පිට ව යන තැනැත්තා එහි බඩු මුට්ටු ආරක්ෂා වන ආකාරයට තබා යයි.
- කාමරේ කුණු කසළ ඉවත් කොට මැනැවින් පවිත්‍ර කර දොර, ජනෙල් වසා යතුර ආවාසයේ සුදුස්සකුට බාර දෙයි.
- ආවාසය තෙමෙනවා නම් නිසි පිළියම් යොදා එය පිළිසකර කරයි.
- බුදුරජාණන් වහන්සේ ද තමන් වහන්සේට බුද්ධත්වය ලබා ගැනීමට පිහිට වූ අචේතනික බෝධීන් වහන්සේට සතියක් අනිමිසලෝචන පූජාවෙන් පුද කළ සේක.

## වැසිකිළි වත

- වැසිකිලියට, කැසිකිලිය ට හා නාන තොටට පිවිසීමේදී පැමිණි පිළිවෙලට ඇතුල් විය හැක.
- වැසිකිලියට එන තැනැත්තේ ඇතුළෙහි කිසිවකු ඇති නැති බව දැන ගැනීමට පිට සිට කෑරීම කරයි.
- ඇතුලත කෙනකු සිටිනම් පිටත ඉන්න අයට ඒ බව දැනගැනීමට ප්‍රතිචාර වශයෙන් කෑරීම කළ යුතුය.
- සිවුර දැමීමට ඇති වැලෙහි හෝ දඬුවෙහි සිවුර දමා වැසිකිළියට පිවිසිය යුතුය.
- පාදුකාව උඩට පැමිණෙන තුරු අඳනය නො එසවිය යුතුය.
- ශබ්දය නැගෙන සේ තනමින් වර්චස් නොකළ යුතුය.
- දැහැටි ආදිය සපමින් වර්චස් නොකළ යුතුය.
- වර්චස් කරන තැනින් බැහැරව වර්චස් හෝ මුත්‍රා නොකළ යුතුය.
- මුත්‍රා කරන තැන කෙළ නොගැසිය යුතුය.
- ශබ්ද නැගෙන සේ සේදීම නොකළ යුතුය.
- පාදුකාව මතම සිට අඳනය පහත දමා ඉන් පිටතට යා යුතුය.

- සේදීමට ගත් වතුර බඳුනෙහි ඉතිරි කර නොතැබිය යුතුය.
- වැසිකිළියෙහි වතුර අවසන් වී නම් වතුර තැබිය යුතුය.
- වැසිකිලිය අපවිත්‍ර වී නම් සෝදා පවිත්‍ර කල යුතුය.
- ජලය නොමැති නම් අන් ක්‍රමයකින් පවිත්‍ර කළ යුතුය.
- තමා නිසා වැසිකිලිය අපවිත්‍ර වුවහොත් වෙන කෙනෙකුට එය පවිත්‍ර කිරීමට ඉඩ නොතබා තමා විසින් ම පවිත්‍ර කළ යුතුය.
- වැසිකිළියෙහි හා ඉන් පිටත කසළ ඇතොත් ඇමද පවිත්‍ර කළ යුතුය.
- වැසිකිළි චාරිත්‍රයක් කඩකිරීම නිසා බුද්ධ කාලයේ දී කොසඹෑ නුවර භික්ෂූන් අතර ආරවුලක් ඇති විය.
- විනයධර හා ධර්මධර භික්ෂූන් අතර ඇති වූ කළහය කෙළවරකට නොපැමිණීම නිසා බුදුන් වහන්සේට කොසඹෑ නුවර අතහැර පාරිලෙය්‍ය වනයට යෑමට සිදු විය.

## ගිලානෝපස්ථානය පිළිබඳ සිරිත් විරිත්

- වරක් බුදුරජාණන් වහන්සේ ද ආනන්ද හිමියන් සමඟ ගිලන්ව සිටි භික්ෂුවකට උපස්ථාන කළ සේක.
- මෙහිදී බුදුරජාණන් වහන්සේ උපස්ථායකයා හා ගිලනා තුල තිබිය යුතු ගුණාංග වදාළහ.
- උපස්ථායකයා තුල තිබිය යුතු ගුණාංග
    1. දක්ෂ උපස්ථායකයා ගිලනා ට හිත බෙහෙත් පිළියෙළ කර දෙයි.
    2. හිත අහිත ආහාර පාන දැන, හිත බොජුන් සපයයි. අහිතකර බොජුන් ඉවත් කරයි.
    3. ලාභ ප්‍රයෝජන අපේක්ෂාවෙන් නොව මෙත් කුළුණෙන් උවටැන් කරයි.
    4. මළ මූත්‍ර ආදිය ඉවත් කිරීමේදි පිළිකුල් නූපදවයි.
    5. වරින් වර ගිලනාගේ හිත සැනසෙන පරිදි උපදෙස් දෙයි.

- උපස්ථානයට යෝග්‍ය ගිලනා
    1. සැප වූ ආහාර පාන ගනියි.
    2. සැප වූ ආහාර පානාදියෙහි පමණ දනියි.
    3. නියමිත වේලාවට බෙහෙත් පාවිච්චි කරයි.
    4. උපස්ථායකයාට තමාගේ අසනීප තොරතුරු නොසඟවා දක්වයි.
    5. ධෛර්යය උපදවා රෝගය ඉවසයි.

## බෞද්ධ රජවරුන්ගේ සෞඛ්‍ය සේවා

- ධර්මාශෝක රජතුමා මිනිසුන්ට පමණක් නොව සතුන්ටද ආරෝග්‍යශාලා පිහිටුවිය.
- බෙහෙත් පැළෑටි සෑම තැනම රෝපණය කළේය.
- බෙහෙත් වර්ග තැන්පත් කර තැබීය.
- එකල රජවරුන් අසරණයන්ට නොමිලේ බෙහෙත් දුන් නතර අතර වෙදකම් කළ වෛද්‍යවරුන්ට ගම් බිම් ආදිය ප්‍රදානය කළ බව සඳහන් වේ.
- සමහර ඉඩකඩම් බෙහෙත් ද්‍රව්‍ය ආදිය වැවීම පිණිස වෙන්කර ඇත.
- බුද්ධදාස රජතුමා ලංකාව පුරාම සෑම ගම් 10 කටම වෛද්‍යවරයෙකු බැගින් පත් කොට ගමක් ගමක් පාසා වෙදහල් කරවා ඇත.
- ළමුන්, ගැබිණි මව්වරුන්, අන්ධයන් සහ රෝගීන් සඳහා පලවන උපතිස්ස රජු ආරෝග්‍ය ශාලා සහ දානශාලා කරවා ඇත.
- උදය රජතුමා පොළොන්නරුවේ සහ පදවියේ ආරෝග්‍යශාලා කරවා ඒවායේ නඩත්තුව සඳහා ගම් ප්‍රදානය කළ බව කියවේ.
- පස්වන කාශ්‍යප රජතුමා වසංගත රෝගීන්ට සාත්තු කිරීම සඳහා අනුරාධපුර නගරයේ ආරෝග්‍යශාලා පිහිටුවීය.
- හතරවන කාශ්‍යප රජතුමා හා හතරවන මහින්ද යන රජවරු සෞඛ්‍ය සේවා කටයුතු කළ අය බව චූලවංශයේ සඳහන් වේ.
- ගිහියන්ට ද ප්‍රථමාධාර පෙට්ටියක් තබා ගත හැක.
- බෙහෙත් පැළෑටි වවාගත හැක.

## ගුරු ශිෂ්‍ය සම්බන්ධය පැවැත්වීම පිළිබඳ සිරිත් විරිත්

### පිය පුතු සංකල්පය

- එනම් ගුරු ගෝල දෙපක්ෂය අතර පිය පුතු සංකල්පය ඉපදවීමයි.
- මහාවග්ගපාලියේ පියපුතු සංකල්පය ඉදිරිපත් කර ඇත.
- ආරාම අධ්‍යාපනයේ දී ගුරුවරයා හැඳින්වීමට "උපාධ්‍යාය" යන වචනයත්, "ආචාරිය" යන වචනයත් යෙදේ.
- ශිෂ්‍යයා හැඳින්වීමට සද්ධිවිහාරික යන වචනයත් අන්තේවාසික යන වචනයත් යෙදේ.
- ආරාම අධ්‍යාපනයේදී ගෝලයා හැඳින්වීම සඳහා සද්ධි විහාරික හා අන්තේවාසික යන වචන භාවිතා කෙරේ.
- මේ වචන දෙකේම අර්ථය ළඟ වසන්නා යනුයි.

**ශිෂ්‍යයා විසින් ගුරුවරයා කෙරෙහි පැවතිය යුතු ආකාරය**

- මෙම ආචාර ධර්ම මහාවග්ගපාලියේ මහා බන්ධකයේ සඳහන් වී ඇත.
- කලින් අවදි වන ශිෂ්‍යයා ගුරුවරයා ගේ රුචිය අනුව දැහැටි හා මුව දෝනා පැන් පිළිගන්වයි.
- ඉක්බිති ගුරුවරයා වසන විහාරය, මිදුල හා වැසිකිළියද ඇමද පිරිසුදු කරයි.
- කැඳ බත් ආදී යමක් ඇතොත් ගුරුතුමාට පිළිගන්වා වළඳා අවසානයේ දී භාජන සෝදා තැන්පත් කරයි.
- වැලඳූ තැනද පවිත්‍ර කොට ආසන පිළියෙළ කොට තබයි.
- ගුරුවරයා පිඬු පිණිස ගමට යනු රිසි වී නම් පා-සිවුරු පිළිගන්වා ගුරුවරයා තමාගේ පැමිණීම බලාපොරොත්තු වන්නේ නම් සිවුරු හැඳ පොරවා පාත්‍රය ගෙන පසුපසින් ගමන් කරයි.
- පිඬු සිඟා ගත් පසු තමා පළමුවෙන් පැමිණ පා-සිවුරු තබා පෙර මගට ගොස් ගුරුවරයාගේ පා-සිවුරු පිළිගනියි.
- පසුව ගුරුවරයාට පා සේදීම පිණිස පැන් තබා අසුන් පනවා ගුරුවරයා වාඩි වූ කල්හි පැන් හා ආහාර පිළිගන්වයි.
- ගුරුවරයා වළඳා අවසන් කළ විට පාත්‍ර ආදී භාජන සෝදා තබා තමා ආහාර වළඳයි.
- කාලය ඉක්මනට ළංව තිබේනම් ගුරුතුමාට පැන් හා ආහාර පිළිගන්වා තමා වළඳා ඊට පසු ගුරුවරයාගේ වත් සපුරයි.
- ගුරුවරයාගේ සිවුරු නමා තබයි.
- සිවුරු තෙත් වී නම් වියලා නමා තබයි.
- ගුරුවරයා බැහැර ගොස් එන සෑම වෙලාවකම පෙර මගට ගොස් පා සිවුරු පිළිගනී.
- පැන් තබා ගිලන්පස ඇත්නම් පිළිගන්වයි.
- ගුරුවරයා ස්නානය කරනු කැමති නම් උණු පැන් හෝ සිසිල් පැන් සපයයි.
- ගුරුවරයා පිටතට ගොස් නාන්නේ නම් අවශ්‍ය උපකරණ එහි ගෙන යයි.
- ගුරුවරයා කැමති වන්නේ නම් නෑවීම හා ඇඟ ඉලීම ද සිදු කරයි.
- ස්නානය කොට අවසන් වූ පසු ගුරුවරයාගේ ජල සාටක ආදී උපකරණ විහාරයට ගෙනැවිත් තබයි.
- ගුරුවරයාගේ සිවුරු සේදීමට ඇත්නම් සෝදා වියලා තබයි.
- සිවුරු පඬු පෙවීමට ඇත්නම් එය සිදු කරයි.
- නැතිනම් ගුරුවරයාට ඒ සඳහා උදව් වෙයි.
- මේ හැර ගුරුවරයා කෙරෙහි පැවතිය යුතු විශේෂ ආචාරධර්ම කිහිපයකි.
- ගුරුවරයා කතා කරන කල්හි එය නිම වන්නට කලින් අතරට කතා නොකළ යුතුය.
- ගුරුවරයා වරද සහිත කතාවක් කරන්නේ නම් එය වැළැක්විය යුතුය.
- ගුරුවරයාට ශාසනයේ යම් කලකිරීමක් වුවහොත් ගුරුවරයා ගේ පදිංචිය වෙනස් කර වෙන තැනකට ගෙන යා යුතුය.
- ගුරුවරයාගෙන් අවසර නො ගෙන උන්වහන්සේට අහිතවත් පුද්ගලයන්ට පාත්‍ර සිවුරු කිසිවක් නොදිය යුතුය.
- ඔවුන් දෙන දෙයක් පිළිගැනීමෙන් වැළකිය යුතුය.
- ඔවුනට වත් නොකළ යුතුය.
- ගුරුවරයාගේ අවසර නොගෙන පිටත නොයා යුතුය.
- ගුරුවරයා රෝගාතුර වුවහොත් දිවි හිමියෙන් උවටැන් කළ යුතුය.

## ගුරුවරයා ශිෂ්‍යයා කෙරෙහි පැවතිය යුතු අන්දම

- ස්වකීය ශිෂ්‍යයා ගිලන් වුවහොත් ගුරුවරයා විසින් ශිෂ්‍යයා තමන් වහන්සේට කළ සියලුම වත් පිළිවෙත් පෙරළා ශිෂ්‍යයා වෙනුවෙන් ද කළ යුතුය.
- ගුරුවරයා කලින් අවදි වී ශිෂ්‍යයාට දැහැටි දිය යුතුය.
- මුව දෝනා දිය සැපයිය යුතුය.
- අසුන් පැනවිය යුතුය.
- දවසේ අවසානය දක්වා සියලු වතාවත් ශිෂ්‍යයාට දැක්විය යුතුය.
- ශිෂ්‍යයා ගිලන් නම් මේ වැඩපිළිවෙළ ශිෂ්‍යයාගේ ගිලන් බව මඟ හැරෙන තුරු ගුරුතුමා විසින් කළ යුතුය.
- ගුරුවරයා විසින් ශිෂ්‍යයාට පාත්‍ර සිවුරු ආදියෙන් අඩුපාඩුකම් තිබේදැයි සොයා බැලිය යුතුය.
- අඩුපාඩුකම් තිබේ නම් ඒවා සම්පූර්ණ කළ යුතුය.
- ශිෂ්‍යයාට ධර්ම විනය පාඩම් කරවීමෙන් ද ඒවායේ අර්ථ අදහස් කියා දීමෙන් ද වරද කළ කල්හි අවවාද කිරීමෙන් ද අනුග්‍රහ කළ යුතුය.
- ශිෂ්‍යයාට බුදු සසුන ගැන හෝ පැවිද්ද ගැන හෝ කලකිරීමක් ඇති වුවහොත් කරුණු පහදා දීමෙන් එය දුරු කළ යුතුය.
- ශිෂ්‍යයාට යම්කිසි කරුණක් ගැන සැකයක් ඇති වුවහොත් එය දුරු කළ යුතුය.
- සිවුරු කැපීම, මැසීම, පඬු පෙවීම, සේදීම යනාදිය කරන ආකාරය කියා දිය යුතුය.
- ආචාර්යවරයා හා ශිෂ්‍යයා අතර යම්කිසි මතභේදයක් ඇති වන්නට ගිය හොත් දෙදෙනාගේම නිදහස රැකෙන පරිද්දෙන් ඈත් විය යුතුය.
- මනාව නොපවතින ශිෂ්‍යයා පලවා හරින්නට ආචාර්යවරයාට බලය තිබේ.

## ගිහි ගුරු ශිෂ්‍ය සම්බන්ධය

- බුදුරජාණන් වහන්සේ විසින් සිඟාලෝවාද සූත්‍රයේදී සිඟාල ගෘහපතියා වෙනුවෙන් ගිහියන් සඳහා ගුරු ශිෂ්‍ය ඇවතුම් පැවතුම් පිළිබඳ දේශනා කොට තිබේ.
- ගුරු ශිෂ්‍ය සම්බන්ධය දක්ෂිණ දිශාව නැමදීමට සමාන වේ.
- ගුරුවරයා දක්ෂිණ දිශාවට සමාන වන්නේ ඔහු ගුරු පූජා ලැබීමට සුදුස්සකු වන බැවිනි.
- "අත්තානමේව පඨමං පතිරූපෙ නිවේසයේ" - ඔවා දෙනු පරහට තමා සම්මතයෙහි පිහිටා සිට.
- සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් ශිෂ්‍යයා විසින් ගුරුවරයා කෙරෙහි පැවැත්විය යුතු යුතුකම් පහ.

1. ගුරුහු දැක හුනස්නෙන් නැගිටීම වැනි ආචාර පැවැත්වීම.
2. ගුරුවරයාට උපස්ථාන කිරීම.
3. අවවාද ආදියට ඇහුම්කන් දීම.
4. වතාවත් කිරීම.
5. සකසා සිප්සතර ඉගෙනීම.

- තමාට යමක් සත්‍යයැයි නිවැරදියැයි නොවැටහෙන්නේ නම් එය ගුරු ගෞරවය නිසා කිසිවිටෙකත් බාර නොගන්නා ලෙස බුදුරදුන් කාලාමයන්ට උපදෙස් දුන් බව කාලාම සූත්‍රයෙහි සඳහන් වෙයි.
- නිගණ්ඨනාථපුත්තගේ ප්‍රධාන දායකයා වූ උපාලි ගෘහපතියා බුදුරජුන් වෙත ගොස් වැඳ, වාද කොට, පැහැදී තමා බුදුසමය වැළඳ ගැනීමට කැමති බව ප්‍රකාශ කළේය.

- එවිට බුදුන් වහන්සේ ප්‍රකාශ කර සිටියේ තවදුරටත් විමසා බලා තීරණයක් ගන්නා ලෙසයි.
- අනුරාධපුර යුගයේ විසූ ත්‍රිපිටක චුල්ලසුම්ම ස්ථවිරයෝ ත්‍රිපිටක චුල්ලනාග ස්ථවිරයන්ගේ ගුරු හාමුදුරුවෝය.
- එක් අවස්ථාවක සතිපට්ඨාන සූත්‍රයේ "ඒකායනමග්ග" ගැන මේ දෙදෙනා අතර ඇතිවූ මතභේදයකදී ශිෂ්‍යයාගේ මතය හරි බව ගුරු හාමුදුරුවන්ට තේරුම් ගිය නිසා චුල්ලනාග ස්ථවිරයන් ධර්ම දේශනා කරන අවස්ථාවකදී පිරිස ඉදිරිපිටදීම චුල්ලසුම්ම ස්ථවිරයෝ ශිෂ්‍යයාගේ මතය නිවැරදි බව පිළිගත්හ.
- ගුරුවරයා විසින් ශිෂ්‍යයා කෙරෙහි පිළිපැදිය යුතු ආකාර 5 සිඟාලෝවාද සූත්‍රයෙහි සඳහන් වේ.

1. මනා සේ හික්මවීම.
2. කරුණාවෙන් ඉගැන්වීම.
3. තමා උගත් සිප්සතර ශිෂ්‍යයන්ට නොසඟවා කියා දීම.
4. ශිෂ්‍යයා හිත මිතුරන්ට හඳුන්වා දීම.
5. ශිෂ්‍ය උවදුරුවලින් රැක ගැනීම.

## ගුරු ගෝල සම්බන්ධය පිළිබඳව සාහිත්‍යයෙන් උදාහරණ

- ගුරුවරුන් තුල ඇති නිහතමානී ගුණය ට උදාහරණයක් විසුද්ධිමග්ගයෙන් දැක්වේ.
- රුහුණේ තුලාධාර පබ්බත වාසි ධම්මරක්ඛිත ස්ථවිරයෝ මහා විහාරයෙන් පැමිණි ත්‍රිපිටක චූලාභය තෙරුන් වහන්සේට ධර්මය උගන්වා අවසානයේදී තම ශිෂ්‍යයාගේ පාමුල පැදුරක හිඳගෙන ශිෂ්‍යයාගෙන් නිහතමානීව කමටහන් ඉල්ලා සිටියාහුය.
- සද්ධර්මරත්නාවලියෙහි නාගසේන වස්තුවෙහි එන රෝහණ මහ තෙරුන් වහන්සේ විසින් නාගසේන සාමණේරයන් අස්ව ගුප්ත මහ තෙරුන් වෙත වස් විසීම සඳහා යවනු ලැබූ අවස්ථාව ගුරු ගෞරවය නිසා ගුරුවරයා ඉදිරිපිට ගුරුවරයාගේ නම කීම යහපත් සිරිතක් නො වන බව පැහැදිලි වේ.

## ගුරු ගෙදර

- ගුරු ගෙදර නමින් ගිහි ගුරුවරයකු විසින් පවත්වාගෙන ආ පාසල් ද නේවාසික ආයතන විය.
- සේනක කුමරු දිසාපාමොක් ආචාරීන් ගේ ගුරු ගෙදර ඉගෙනීම කළ අයුරු කාව්‍යශේඛරයේ දැක්වේ.

එදවස් පටන් කොට
ඔහු ගෙයි පළමු නැගි සිට
මිසක් කී තැන සිට
නොයේ නොසිටි නොරිසි ලෙස කට

අත් පා මෙහෙවරි න්
දවසැර ගුරුන් හසරි න්
දුන් උන් අවසරි න්
පසුව සැතපේ සැමට අදරි න්

| | |
|---|---|
| ගුරු සිත් නොරිද | වා |
| වේලාව නොවරද | වා |
| බැති පෙම් උපද | වා |
| අකුරු උගනී කුමරු සොඳ | වා |

- ගුත්තිල කාව්‍යයේ ද තේමාව වී ඇත්තේ බෞද්ධ ගුරු ශිෂ්‍ය සම්බන්ධය පිළිබඳ අදහසකි.
- තම ගුරුවරයා අභිබවා ගොස් සටන් වැදීමත් එවන් ශිෂ්‍යයකු සමඟ සටන් වැදීමත් බෞද්ධ ශිෂ්‍යයකුට හා ගුරුවරයකුට නුසුදුසු බව පැහැදිලි කරයි.

## ආගන්තුක සත්කාරය පිළිබඳ සිරිත්

- ආගන්තුකයා යනු අන්‍ය තැනක සිට පැමිණි තැනැත්තා ය.

### ආගන්තුක වත

- වැඩිමහලු ආගන්තුක භික්ෂුවක් එනු දුටු ආවාසික භික්ෂුව පෙරමඟට ගමන් කොට පා සිවුරු පිළිගෙන සුදුසු තැන්වල තබයි.
- අසුන් පනවා පා දෙවීමට, මුව දෙවීමට පැන් එලවයි.
- ආගන්තුක භික්ෂුවට වඩා ආවාසික භික්ෂුව වැඩිමහලු නම් ආගන්තුක භික්ෂුව ආවාසික භික්ෂුවට වඳියි.
- ආගන්තුක භික්ෂුව වැඩිමහලු නම් පවන් සැලීම ආදියෙන් වෙහෙස නිවා ගැනීමට උදව් වෙයි.
- දැහැත් ගිලන්පස ඇතිනම් පිළිගන්වයි.
- බීමට පැන් වත් පිළිගන්වයි.
- වැසිකිළි කැසිකිළි ඇති තැන්, පැන් ඇති තැන් ආදිය පිළිබඳ ආගන්තුක භික්ෂුවට දැනුමක් ලබා දෙයි.
- සැඟෙන වෙලාවකට නැවතීමට පැමිණි අයකු නම් සෙනසුනක් ද පැවරිය යුතුයි.
- ආගන්තුක භික්ෂුව විසින් ද ඉටු කළ යුතු වත් ඇත.
- ආරාමයට පිවිසීමේදී පාවහන් ඉවත් කර, කුඩ අකුලා, හිස වසා පොරවා ඇති නම් ඒ ආවරණ ඉවත් කර සන්සුන්ව ආරාමයට ඇතුළු විය යුතුයි.
- වැඩිමහලු ආවාසික භික්ෂූන්ට අභිවාදනය කොට සෙනසුන් ආදිය ලද කල්හි සෙනසුන අනිකකු නො විසූ තැනක් නම් පරීක්ෂා කොට ඇතුළු විය යුතුයි.
- ආවාසිකයා වෙන වැඩක යෙදී සිටියේ නම් ඒ වැඩේ නවත්වා ආගන්තුක සත්කාර කළ යුතුය.

### ගිහි ආගන්තුක සත්කාර

- ගිහි ආගන්තුක සත්කාර හා පැවිදි ආගන්තුක සත්කාර අතර සැලකිය යුතු තරම් වෙනසක් නැත.

## ආචාර සමාචාර විධි

- සාමාන්‍යයන් අතර පැවැත්වෙන ආචාර කිරීමේ විදිය නම් සෘජුව සිට ළමැද ඇඳිලි බැඳීමයි.
- නැතහොත් දෙඅත් ඔසවා ඇඳිලි බැඳීමයි.
- දෙමව්පියන්ට හා වැඩිහිටි නෑයන්ට දරු මට්ටමේ අය පසඟ පිහිටුවා හෝ උක්කුටකයෙන් හිඳ නමස්කාර කිරීමෙන් ආචාර කරයි.
- දරුවෝ බොහෝ විට දෙමවුපියන්ගේ ගුරුවරුන්ගේ දෙපා සිඹ හෝ දෙපා මත නළල තබා හෝ වැඳීමෙන් ආචාර කරති.
- ආචාර කිරීමේදී ඊට පිළිතුරු වශයෙන් සමාචාර කිරීමද වැදගත් වෙයි.
- ඇඳිලි බැඳීමෙන් සමානයන්ට ආචාර කිරීමේදී ‘‘ආයුබෝවන්’’ කියයි.
- ආචාර ලබන්නාද එලෙසින්ම ‘‘ආයුබෝවන්’’ කියා සමාචාර දක්වයි.
- දරුවන් වැඩිහිටියන්ගේ දෙපා නැමද ආචාර කරනු ලබන විට වැඩිහිටි බෞද්ධයෝ ‘‘තෙරුවන් සරණයි’’ කියා වඳින්නාගේ හිස අතගා සමාචාර කරයි.
- කවර මට්ටමේ බෞද්ධයින්ට වුවද ආචාර කිරීමේදී හෝ දවසේ ප්‍රථම වරට හමු වීමේ දී හෝ ‘‘තෙරුවන් සරණයි’’ යනුවෙන් ආනිශංසා කරයි.
- හරසර සහිතව පිළිගත යුතු අවස්ථාවක දී බුලත් අතක දුම්කොළයක් තබා දීමෙන් කරන ආචාර ක්‍රමය සිංහල බෞද්ධයන් අතර පවතී.

## ආගන්තුකයන්ට සංග්‍රහ

- ඈතින් පැමිණෙන ආගන්තුකයන්ට මූණ කට සෝදා ගැනීමට වතුර සැපයීම.
- වැසිකිලි ආදිය තිබෙන තැන් පිළිබඳව දැනුවත් කිරීම.
- ගෙදරට පැමිණෙන අමුත්තන්ට පළමුවෙන්ම බුලතින් සංග්‍රහ කරයි.
- අසල්වැසි කවුරු ගෙට ගොඩ වැදුණත් බුලත් තට්ටුව පිරිනැමීම සිංහල බෞද්ධ සිරිතකි.
- ඈතින් පැමිණි අමුත්තන්ට කැවිලි සහිතව තේ පැනින් හෝ සිසිල් බීමෙන් හැකි ඉක්මනින් සංග්‍රහ කරයි.
- සුදු ඇමූ මේසයකට කෑම ඇර අමුත්තන්ට සංග්‍රහ කරයි.
- කෑම මේසයේ දී සියලු දෙනාම වාඩි වූ පසු ආහාර ගැනීම ආරම්භ කරයි.
- සියලු දෙනාම කෑම කා අවසන් වනතුරු අත නො සේදීමත් සිදුකරයි.
- වැඩිහිටියන් ළඟින් යන විට හෝ ළඟට ආ විට අසුනින් නැගිටීම සිරිතකි.
- වැඩිහිටියකු සමඟ හෝ ගෞරව කළ යුත්තකු සමඟ හෝ කතා කරන විට හිස්වැස්ම අතට ගැනීම හෝ කරේ ඇති සළුව අතට ගැනීම සිරිතකි.

# 3. පාඩම
# ගිහි ජීවිතයේ සිරිත් විරිත්

සිංහලයන්ගේ සිරිත් විරිත් වල පසුබිම

1) ඉන්දීය වෛදික සිරිත් විරිත්
2) ලංකා ආදි වැසියන්ගේ සිරිත් විරිත්
3) බෞද්ධ සිරිත් විරිත්
4) ද්‍රවිඩ සිරිත් විරිත්
5) පෘතුගීසි සිරිත් විරිත්
6) ලන්දේසි සිරිත් විරිත්
7) ඉංග්‍රීසි සිරිත් විරිත්

- ප්‍රධාන ලක්ෂණය සුබ මුහුර්තයකට ඇරඹීමයි.
- තෙරුවන්ගේ ආශිර්වාදය ලබා ගැනීමෙන් බෞද්ධ මුහුණුවර පෙන්වනු ලබයි.

## දාරකෝත්පත්ති හා කුමාර කාලය හා සම්බන්ධ සිරිත් විරිත්

### ගැබ් පෙරහැර දීම

- ඉන්දියානු සිරිතකි.
- මවට ප්‍රිය දේ සපයාදෙන අතර අප්‍රිය දෙයින් ඈත් කරනු ලබයි.
- ගැබිණි මාතාවන් නිතර මල් පහන් පූජා කර තෙරුවන් නැමදීම සිදුකරනු ලබයි.
- පිරිත් ශ්‍රවණය සිදුකරයි.
- අවසානයේ දී අංගුලිමාල පිරිත ශ්‍රවණය කරයි.
- උදාහරණ :- සද්ධර්මරත්නාවලිය
- පූජාවලිය

### දොළදුක්

- ගැබිණි මාතාවන්ට ඇතිවන ආශාවන් තෘප්ත කිරීමයි.
- නැතහොත් දරු ගැබ වියළී නැසී යන්නට හැකි යැයි විශ්වාස කෙරේ.

  උදාහරණ:- විදුර ජාතකය
  විහාර මහා දේවියගේ දොළදුක
  වනවාසික තිස්ස ගේ මව

## උපන්දින මගුල

- අතීතයේ දී උපත සිදුවන කාමරය තිඹිරිගෙය ලෙස හැඳින් වේ.
- අබ කුඩු සහ කහ කුඩු ඉසීම මගින් කාමරය පිරිසිදු කරනු ලබයි.
- බිලින්දා ඖෂධයන් ගෙන් නහවා රන් කිරි පෙවීම සිදු කරයි.
- උපන් වේලාව මගින් ජන්ම පත්‍රය සෑදීම කරනු ලබයි.

## නම් තැබීම

- උපන් දිනය, උපන් නැකත, උපන් ලග්නයට ගැලපෙන අකුරක් තෝරාගෙන අර්ථවත් නමක් තැබීම සිදුකරනු ලබයි.
- සංඝ, බෝධි ආදී සිංහල නම් භාවිතා විය.

## දොරට වැඩුම

- බිලින්දා ඉපිද ටික දවසකින් විහාරයකට හෝ දේවාලයකට රැගෙන යයි. ඌව පළාතේ දී මෙය බිලින්දා ඉපද මාස තුනකින් සිදුකරනු ලබයි.
- බිලින්දා ත්‍රිවිධ රත්නයට පූජා කර ආශිර්වාද ලබා ගනී.
- අතේ වදකාර බඳිනු ලබයි.

## කන් විදීම

- මොනරාගල විහාරස්ථාන වලදී දොඩම් කටුවෙන් කන විදීම.
- කන් පෙත්ත යටින් දෙහි ගෙඩියක් තබා පැහිරි කටු වෙන් විද කහ නූල් පොටින් පැමිණීම සිදු කරනු ලබයි.
- කන් සිදුර පෑහීම වැළැක්වීමට කරපිංචා නැටි කැබැල්ලක් සිදුරෙන් තබයි.

## බත් කැවීම

- සුබ මොහොතට, නෙළුම් හෝ කෙසෙල් කොළ මත කැම, මිල මුදල් ,රන් ආභරණ තබා පොල් තෙල් පහන් දල්වා දරුවාට කැමති දෙයක් ගැනීමට ඉඩ හැරීම.
- මාමා කෙනෙකු දරුවාට කිරි බත් පිඩක් කවා, ඉණ පස්ලෝ හවරියක් බැඳීම සිදු කරනු ලබයි.

### කෙස් කැපීම

- සද්ධර්මරත්නාවලියේ සඳහන් වේ
- භික්ෂූන්ට කිරිබත් දන් දීමක් සිදු කරයි.

### ජන්ම දින උත්සවය

- දන්දීම, පිරිත් කීම, විහාර වල පූජා පැවැත්වීම නෑදෑ හිතවතුනට සංග්‍රහ කිරීම සිදුකරනු ලබයි.
- ඉන්දීය හා ලාංකීය රජවරු තුලාභාර දාන පැවැත්වීම.
- තුන්වන දප්පුල, 1වන සේන, උදය, 4 වන සේන, මහා විජයබාහු, පලමු වන මහා පැරකුම්බා.

### අත්පොත් තැබීම

- පන්සලේ භික්ෂූන් වහන්සේ මංගල නැකතින් දරුවන්ට අකුරු කියවන ලදී.

## ආවාහ විවාහ චාරිත්‍ර

- තරුණයෙකු පිටතින් තරුණියක ගෙනවිත් සරණ කිරීම ආවාහ නමින් හැඳින්වේ.
- තරුණියත් පිට තරුණයෙකුට සරණ කිරීම විවාහ නමින් හැඳින්වේ.
- වේද සාහිත්‍යයට අනුව විවාහයේ අරමුණ :- 1) පුතෙකු ලබා ගැනීම.
  2) පරම්පරාව ගෙන යාම.
  3) රති සැප විඳීම.
- සෑම බුදුවරයෙක් ම බුද්ධත්වයට ප්‍රථම විවාහ ජීවිතයට ඇතුළත් ව පුතෙකු ලබා ගැනීම.
- ශිල්ප ශාස්ත්‍ර නොදැනීම පිරිමියෙකුට අවාහයක් කරගැනීම සුදුසු කමක් නොවේ.
- සිදුහත් කුමාරයාට පවා ශිල්ප දැක්වීමට සිදු විය.
  උදාහරණ- ජාතකට්ඨ කථාව.
- සම වයස් හෝ ඉතා අඩු වයස් පරතරයන් විවාහ දිවියකට සුදුසු බව බෞද්ධ සමාජය අදහසයි.
  උදාහරණ:- පරාභව සූත්‍රය.

"අතීත යොබ්බනො පො සො - ආනෙති තිම්බරුත්ථනිං
තස්සා ඉස්සා ණ සුපති - තං පරාභවතෝ මුඛං"

### ඥාති විවාහ

- ඇවැස්ස නෑනා හා ඇවැස්ස මස්සිනා අතර විවාහය සිංහල බෞද්ධ සමාජයේ නොයෙක් විට දක්නට ලැබේ.
- සහෝදර සහෝදරියන් ගේ දරුවන් අතර විවාහය සුදුසු නොවේ.
- උදාහරණ:- සද්ධර්මරත්නාවලිය.

### දායාද

- මනාලයා හෝ මනාලයාගේ දෙමව්පියන් විසින් මනාලියගේ දෙමව්පියන්ට - කුස රජතුමා පබාවතිය ලබාගැනීමට රන් රුවක් ඇගේ දෙමාපියන්ට තුටු පඩුරක් ලෙස යැවීම.
- මනාලියගේ පියා විසින් මනාලයාට -
  1) කොසොල් රජු බිම්බිසාර රජුට දුව දුන්නෙ කාශි නැමැති ගමක් සමගය.
  2) ධනංජය සිටාණන් විශාකාව දීග දුන්නෙ මසුරන් හා වෙනත් සැප සම්පත් සමගය.

### තීරණ ගැනීම

- දෙමව්පියන් විසින් තීරණ ගනු ලබන අතර දරුවන්ගෙන්ද අදහස් විමසීමක් සිදු කරයි.
- විවාහයට පෙර දෙපාර්ශවය හඳුනාගැනීම සඳහා නිවෙස්වලට යනු ලැබේ.
- හඳහන් ගැලපේ නම්, සුභ නැකතක් බලා මංගල දිනය තීරණය කරයි.
- ලියාපදිංචියෙන් දින දාහතරකට පසු හා තෙමසකට පෙර විවාහය කිරීම නීත්‍යානුකූල අවශ්‍යතාවකි.

### මංගල චාරිත්‍ර

- මඟුලට ආසන්න දිනක සංඝයා වහන්සේ වැඩමවා මංගල දානයක් දීම.

## මංගල දින චාරිත්‍ර වාරිත්‍ර

### මනාලයා පැමිණීම

- ප්‍රථමයෙන් මනාලියගේ පාර්ශවය විසින් මනාල පාර්ශවය පිළිගනු ලැබේ.
- පාවඩ පිටින් පැමිණෙන මනාලයා, දෙවන මනාලයා හා නෑදෑයන් පිළිගැනේ.
- මනාලියගේ බාල සොහොයුරා විසින් පා දෝවනය සිදුකරයි, මනාලයා විසින් ගල් බැඳි මුද්දක් වතුර බේසමට දමනු ලැබේ.
- පාවඩ එලූ රජකයාට ද තෑගී මුදලක් ලබා දෙනු ලැබේ.

- මනාලියගේ පියා ට බුලත් හුරුල්ලක් ලබාදීම සිදුවේ. මෙම බුලත් හුරුල්ලේ ඇති බුලත් කොල ගනන නෑදෑයන්ගේ ගණනට සමාන වෙයි.

## පෝරුවේ චාරිත්‍ර

- අඩි 4-3 , අඟල් 7-8 උස වේදිකාවකි. පුරාණයේ දී කොහොඹ ලෑලිවලින් සාදන ලදී. කලාකරුවකු ලවා හැකිතරම් විචිත්‍රවත් ලෙස අලංකාර කරනු ලැබේ.
- මඟුල් පෝරුව මත පැදුරු එලා සුදු රෙද්දක් අතුරා ඒ මත ලෙලි අරින ලද පොල් ගෙඩියක් හා හාල් සේරු දෙකක් තබා රිදී කාසි විසිර වනු ලැබේ.
- උඩරට සමහර පෙදෙස්වල පෝරුව මත මෝල් ගහක් ද තබනු ලැබේ.
- මගුල් පෝරුව පිළියෙල කරන්නේ ද පිරිත් මණ්ඩපය මෙන් ඉදිරිපස නැගෙනහිරට මුහුණ දෙන ලෙසයි.
- පෝරුව කොන් හතරේ පහන් දැල්වීමට පුන් කළස් හතරක් තබනු ලැබේ.
- සුබ මොහොතින් මනාලයා වම්පසින් ද මනාලිය දකුණු පසින් ද පෝරුවට නංවනු ලැබේ.
- ඉක්බිති වැඩිහිටියෙකු විසින් චාරිත්‍රානුකූල ස්තෝත්‍ර හා අෂ්ඨක කියනු ලැබේ.
- අනතුරුව මනාලියගේ මාමා විසින් මනාලයාගේ වම් අතේ සුලැඟිල්ලත් මනාලියගේ දකුණු අතේ සුලැඟිල්ලත් සේද හුයකින් හෝ රන් කෙන්දෙන් බැඳ කෙන්ඩියකින් අතපැන් වත් කරනු ලැබේ.
- අනතුරුව මනාලයා මනාලියට තැළි පිළි පළඳවා මුදු මාරු කිරීම මෙහිදී සිදු කරයි.
- මනාලයා විසින් මනාලියගේ මෑණියන්ට සුදු රෙදි යාර දහයක් පරිත්‍යාග කිරීම ද සිරිතකි.
- මංගල පෝරුව මත සිටින මනාල යුවළට කන්‍යාවන් විසින් ජයමංගල ගාථා කියා ආශිර්වාද කිරීම පැහැදිලිව පෙනෙන එකම බෞද්ධාගමික සිරිතයි.
- නව යුවල දෙමව්පියන් ඇතුළු වැඩිහිටි ඥාතීන්ට බුලත් හුරුළු දීමෙන් පසුව පෝරුවෙන් බැසීමට නියමිත සුභ මොහොතේදී අතිනත් ගෙන පෝරුවෙන් බසිති. මෙවිට ම චාරිත්‍රයක් වශයෙන් පොල් ගෙඩියක් දෙපලු කිරීමද සිරිතකි.
- මීළඟට මංගල කිරිබත අනුභවය සිදු කරයි.
- ඉක්බිති බත බුලතින් කාටත් සංග්‍රහ කර මනාලිය මනාලයා විසින් දෙන ලද සාරියෙන් සැරසී නියමිත සුබ මොහොතට කලින් මනාල යුවල දෙමාපියන්ගේ දෙපා වැඳ අවසර ගනිති.

## මනාලියට ඔවා බස්

- දීග යන දුවට පියා හෝ වැඩිහිටියෙකු විසින් ගිහි ජීවිතය ගත කල යුතු අන්දම පිළිබඳ අවවාද දීමයි. උදාහරණ -: කාව්‍යශේඛරය.
- ධනංජය සිටුතුමා විසින් ස්වකීය දියනිය වූ විශාඛාවන්ට දුන් අවවාද 10.
  1) ඇතුළත ගිනි පිටතට නොදිය යුතුය.
  2) පිටත ගින්න ඇතුළට නොගත යුතුය.
  3) දෙන්නහුටම  දිය යුතුය.
  4) නොදෙන්නහුට නොදිය යුතුය.
  5) දෙන්නහුටද නොදෙන්නහුට ද දිය යුතුය.
  6) සුවසේ හිඳ ගත යුතුය.
  7) සුවසේ අනුභව කළ යුතුය.

8) සුවසේ නිදාගත යුතුය.
9) ගින්න පිදිය යුතුය.
10) ගෘහ දේවතාවා වැදිය යුතුය.

- අනේපිඩුසිටුතුමා වුල සුබද්‍රා වන්ට දුන්නෙත් මේ අවවාද 10 යි.

- උග්ග නම් තැනැත්තෙක් විසින් දීස යන තම දූ වරුන්ට බුදුරදුන් ලවා අවවාද කර වූ අවස්ථාවක් අංගුත්තර නිකායේ ඇතුළත් වේ.
    1) පුබ්බුට්ඨායිනී
    2) පච්ඡානිපාතනි
    3) කිංකාර පටිස්සාවිනි
    4) මනාපචාරිනී
    5) පියවාදිනී

## පවුලේ සාමාජිකයන් අතර සම්බන්ධකම් පැවැත්වීම පිළිබඳ සිරිත් විරිත්

- බිරියට වඩා නෑයෙකු හෝ සහායකයකු නැතැයි ආදී ආර්ය සමාජයේදී සලකන ලදී.
- සැමියා හා බිරිඳ අතර අන්‍යෝන්‍ය සම්බන්ධයෙන් ධර්ම, අර්ථ ,කාම යන ත්‍රිවිධ සම්පත් විදිය හැකි බව පැරණි ඉන්දීය සමාජය පිළිගෙන තිබුණි.
- විවාහ වී පුතෙකු ඇති නොකෙරුවොත් ඔහු පරපුරට ණය කාරයෙක් බව පසුකාලීන බෞද්ධ සමාජය ද පිළිගන්නා ලදී.
- පැවිද්දකු නොවේ නම් අවිවාහකයකු වගකිව යුතු පුද්ගලයෙකු වශයෙන් නොපිළිගැනීම මෙකළ සමාජයේද සිරිතයි.

### භාර්යාව කෙරෙහි සැමියෙකුගේ යුතුකම් හා සිරිත් විරිත්

- බුදුරදුන් සිඟාලෝවාද සූත්‍රයේ දී සැමියෙකුගෙන් බිරියකට ඉටු විය යුතු යුතුකම් පහක් දක්වන ලදී.
  බිරිඳට බුහුමන් කිරීම,
  අවමන් නොකිරීම,
  පරඹුවන් සේවනය නොකිරීම,
  ගෘහ සංවිධානය පැවරීම හා බිරියට ඇඳුම් පැළඳුම් සපයාදීම එම යුතුකම් පහයි.
  උදාහරණ:- පූජාවලිය

- බුදුරදුන් විසින් පෙන්වා දෙන ලද පවුල් විනාශයට තුඩු දෙන චාරිත්‍ර ධර්ම 6.
    1) මත්වීමෙන් පමාවට හේතු වූ රහමෙරහි යෙදීම.
    2) අවේලාවන්හි වීදි මාර්ග ආදියෙහි හැසිරීම.
    3) ගී නැටුම් දැකීමෙහි ඇලීම.

4) යුදූ කෙළියෙහි යෙදීම.
5) පාප මිත්‍ර සේවනය.
6) අලස කමින් කල් ගෙවීම.

## බිරිඳගෙ පැවැත්ම හා සිරිත් විරිත්

- සිංහල බෞද්ධ යන දූර පවතින බොහෝ සිරිත් විරිත් පැරණි හින්දු ආර්ය සමාජයේ පැවත එන ලදී. වෛදික සාහිත්‍යය ග්‍රන්ථයන්හි ලැබෙන ගෘහණියන්ගේ යුතුකම් ද එසේය.
  ඒවා ශීර්ෂ පහකට ලඝු කර හැක.
  1) ගේදොර කටයුතු සංවිධානය.
  2) හිමියාට ඔහුගේ නෑදෑයින්ට සැලකීම.
  3) විනීත ප්‍රිය මනාප ඉරියව් පැවැත්වීම.
  4) විනීත ඇඳුම් පැලඳුම් භාවිතය.
  5) හිතුමතේ නිවසින් බැහැරට නොයාම.

- සිඟාලෝවාද සූත්‍රයෙහි දක්වා ඇති කරුණු පහ.
  1) ගෙදර දොර වැඩ කටයුතු මනාව කිරීම.
  2) ස්වාමියාගේ පරිවාර ජනයාට මනාකොට සංග්‍රහ කිරීම.
  3) පර පුරුෂයන් සේවනය නොකිරීම.
  4) සැමියාගේ වස්තුව ආරක්ෂා කර දීම.
  5) ගේ දූර කටයුතු අනලස්ව කිරීම.

- මීට අමතරව ඉන්දු-ආර්ය සමාජයේ අගය කළ කාන්තා පැවතුම් රාශියක් ද බුදුරජාණන් විසින් අනුමත කරන ලදී.

උදාහරණ:- කාව්‍යශේඛරය
සද්ධර්මරත්නාවලිය

- බුදුරදුන් කොසොල් රජතුමාට වදාළ හොඳ බිරිඳ තුළ තිබිය යුතු විශිෂ්ට ගුණ 4.
  1) නුවණැති වීම
  2) සිල්වත් වීම
  3) නැදි මයිලන් දෙවි කොට සැලකීම
  4) පතිවත රැකීම

- පතිවත රැකීම විවාහක කාන්තාවක තුළ තිබිය යුතු උසස්ම ගුණය ලෙස පෙර සිටම බෞද්ධ සමාජය විසින් සලකන ලදී. උදාහරණ :- සඳකිඳුරු දා කව, යශෝදරා වත, පත්තිනි හෑල්ල.

- බෞද්ධ සාහිත්‍යයේ සඳහන් භාර්යාව වර්ග හතකි.
  1) වධක භාර්යා
  2) චෞර භාර්යා

3) ස්වාමි භාර්යා
4) මාතෘ භාර්යා
5) භගිනි භාර්යා
6) සඛී භාර්යා
7) දාසි භාර්යා

### දරුවන් කෙරෙහි දෙමවුපියන්ගේ පැවැත්ම හා සිරිත් විරිත්

- දෙමව්පියන් දරුවන් හදන්නේ සතර බ්‍රහ්ම විහරණ පෙරදැරි කොටගෙනය.
  1) මෙත්තා 2) කරුණා 3) මුදිතා 4) උපේක්ඛා

- සිඟාලෝවාද සූත්‍රයේදී මවුපියන් උපමාකර ඇත්තේ පෙරදිගට ය. සිඟාලෝවාද සූත්‍රයේ දෙමව්පියන් විසින් දරුවන්ට ඉටු කළ යුතු යුතුකම් පහ.
  1) පාපෙන් වැලැක්වීම
  2) යහපතෙහි පිහිටුවීම
  3) ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වීම.
  4) සුදුසු කල්හි අවාහ විවාහ කර දීම
  5) තම දායාද පවරා දීම

- මිහිරි දෙයක් ලදින් භාගයක් අනුභව කොට ලා භාගයක් හිණ තබා ගෙන අවුත් දෙන කෙනෙකු මෙන් - සද්ධර්මරත්නාවලිය.
- පවුලෙහි වගකීම වැඩිමහල් දරුවාට පැවරුණු ආකාරය - සද්ධර්මලංකාරය

### දෙමව්පියන් කෙරෙහි දරුවන්ගේ පැවැත්ම හා සිරිත් විරිත්

- දරුවන්ගේ මුල්ම ගුරුවරුන් දෙමව්පියන් වන බැවින් දෙමව්පියන් පූර්වාචාර්යවරුන් යන නමින් හඳුන්වයි.
- වැඩිහිටියන් වනතුරු ම දරුවන් දෙමවුපියන්ගේ අනුමැතියක් තොරව හෝ අනුදැනුමකින් තොරව කිසිදු තීරණයක් නොගනී. උදාහරණ සද්ධර්මාලංකාරයේ කිංචි සංගා කතාව.
- කුඩා සේනක කුමරු ශිල්පී ගැනීමට ප්‍රථම දෙමාපියන් නැමදි බව කාව්‍යශේඛරය දැක්වේ.

- සිඟාලෝවාද සූත්‍රයේ යුතුකම් 5
  1) මවුපියන් පෝෂණය කිරීම.
  2) මව්පියන්ගේ කටයුතු ඉටු කිරීම.
  3) කුල වංශය රැකීම.
  4) මවුපියන්ගෙන් ලැබෙන දායාද ආරක්ෂා කිරීම.
  5) මව්පියන් මළ කල්හි ඔවුන්ට පිංපෙත් පැමිණවීම.

- මවුපියන් පෝෂණය කිරීම මංගල කාරණයක් බව මංගල සූත්‍රයේ දැක්වේ.

- මව්පිය උපස්ථානයේ වැදගත් කම පෙන්වන ජාතක කතා රැසකි.
- බුද්ධ චරිතයෙන් ද මව්පිය උපස්ථානය ගැන ඉගෙන ගතහැකි ආදර්ශ රාශියකි.
- වයසට ගිය මවත් පියාත් පෝෂණය නොකරන තැනැත්තා වසලයෙක් යැයි බුදුරජාණන් වහන්සේ වසළ සූත්‍රයේ දී දේශනා කර ඇත.

## ධනය ඉපයීම හා රැකියාව සම්බන්ධ සිරිත් විරිත්

- බෞද්ධ ගිහියා අනුන් තලා පෙළීමෙන් වැලකී ධාර්මික යැයි සම්මත රැකියාවක් මගින් ධනය රැස් කළ යුතු බව සිඟාලෝවාද සූත්‍රයෙහි සහ බුදුගුණ අලංකාරයේ ලිච්ඡවි රාජ වර්ණනාවෙහි සඳහන් වේ.
- ලංකාවේ කෘෂිකර්මයට මූලිකත්වයක් ලැබීමට බෞද්ධ පසුබිම ද ඉවහල් වන්නට ඇත.
- ලංකාවේ මූහෙළ නම් නුවරක පවත්වනු ලැබූ වප් මගුල් උත්සවය පිලිබඳ සද්ධර්මාලංකාරය විස්තර වෙයි.
- නෙළුම් කවි වශයෙන් වැඩි වශයෙන්ම භාවිත වන්නේ වෙස්සන්තර ජාතකයේ සහ යශෝදරාවතෙහි එන පද්‍යයන්ය.
- කුඹුරු ගොවිතැනට පලිබෝධකයින් ගෙන් සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා පුවක් මල් ගෙනවිත් කුඹුරේ තැන් තැන් වල එල්වීම ගැමියන්ගේ සිරිත විය.
- ගම්බද ගොවියෝ කමත පූජනීය ස්ථානයක් ලෙස සලකති.
- ජනවාරි මාසයේදී අලුත් සහල් මංගල්‍යය පවත්වන ලදී.
- වෙළඳාම් බෞද්ධයන් ගේ රැකියාවකි, නමුත් විස වර්ග වෙළදාම, අවි ආයුධ වෙළඳාම, මස් වෙළදාම, මිනිසුන් සත්ව වෙළඳාම හා මත්ද්‍රව්‍ය වෙලදාම යන ඒවායෙන් වැළකිය යුතු අතර වැරදි මිනුම් එනම් හොර තරාදි පඩි, වැරදි මීටර් කෝදු හා ද්‍රව මනින වැරදි මිම් වලින් බෞද්ධයා වැළකිය යුතුය.
- අතීතයේ සිටම පොහොය දිනය නිවාඩු දිනයක් වූ බැවින් පොහොය දිනයට වෙළඳාම් කරන අයගෙන් පහන් පූජාවට තෙල් බද්දක් අය කරන ලදී. සතර පොහොය ම ගොවිතැන් කටයුතුවල නොයෙදීම ද බෞද්ධ සිරිත යි.
- ව්‍යාපාර සඳහා ව්‍යාපාර ආරම්භයේ දී හා පවත්වාගෙන යාමේදී පිරිත් පින්කම් ආදිය කොට සංඝයා වහන්සේලා සඳහා දානමය පිංකම් පවත්වා ආශිර්වාද ලබා ගනී.

## බෞද්ධ අවමංගල සිරිත් විරිත්

### මරණයට පෙර සිරිත්

- ජීවිතයේ අවසාන කාලයේ දී බෞද්ධයින් වැඩි වශයෙන් පින්දහම් කිරීමට නැඹුරුවේ.

## පිං පොත කියවීම

- මරණාසන්න අවස්ථාවේදී පිං පොත කියවීම ප්‍රයෝජනවත්ය.

## මළ ගෙදරක සාමාන්‍ය සිරිත්

- කෙනෙකු මළ පසු සිරුර උඩුකුරුව තබා දෙඅත් නාභිය මත තබා දෙපසට නොවිහිදෙන සේ ළංකර මහපට ඇඟිලි එක්කර රෙදි පටියකින් බඳිනු ලැබේ. මුඛය හා ඇස් වැසෙන සේ සකස් කරයි. හිස බටහිර දෙසට හරවා තබනු ලැබේ. මළමිනිය ඉහළින් සිදුවේ නම් බැඳීමද සිරිතයි.
- මෘත ශරීරය පිළිබඳ අවසන් කටයුතු අවසන් වන තෙක් ගිනි දැල්වීම ආහාර පිසීම සිදු නොකරයි. එම  දින කීපය තුළ ගෙදර වැස්සන්ට ආහාර පානයෙන් සංග්‍රහ කරන්නේ අසල්වැසියන් ය.
- අඟහරුවාදා හා සිකුරාදා දිනවල සිංහලයෝ අවමඟුල් උත්සව නොගනිති. භූමිදානය ට හෝ ආදාහනය ට පෙර මළමිනිය පෙට්ටියක තැන්පත් කිරීම එකල සිරිතයි.
- මිනියක් දැවීමෙ විස්තරය සද්ධර්මරත්නාවලියේ මහාකාල වස්තුවෙහි දැකගත හැකිය.
- භූමදානයේදී වල මත සිව්කොනේ කණු සිටුවා ගොක්කොළවලින් සැරසිල්ලක් කිරීමත් වලට උඩින් සුදු රෙද්දක් ඇදීමත් සිරිතයි. ආදාහනයකදී නම් සෑය වටා සුදු රෙද්දක් ඇදීමත් අවට සැරසිලි කිරීම සිරිතයි.
- භික්ෂුවක් අපවත් වූ විට පළමුවෙන් විහාර සාණ්ඨාව නොකඩවා නාද කිරීමෙන් එය ගම්වැසියන්ට දැනුම් දේ. භික්ෂූන් වහන්සේගේ හිස් රැවුල් බා අලුත් සිවුරක් පොරවා මළ කඳ මනාව සැරසූ යහනක තබා ඉඩකඩ ඇති සරසන ලද ශාලාවක තබති. ශාලාවේ පොරි ඉස මළ සිරුර දෙපස ඇත්දත් ආදිය තබා ගෞරව කරයි. ආදාහනය තෙක් භික්ෂු දෙනමක් දිවා රෑ මාරුවෙන් මාරුවට එහි රැඳෙති. දායකයින් විසින් අවසන් උත්සවය සංවිධානය කරනු ලැබේ. සොහොන් බිම දක්වා හේවිසි නාද සහිත පෙරහැර රැගෙන යන්නේ දායක නෑදෑ හිතවතුන් සමඟ ය. මතක වස්ත්‍ර පිදීම පින් දීම හා ධර්ම දේශනා පවත්වනු ලැබේ.

## පාංශුකූල චාරිත්‍රය

- සමහර ප්‍රදේශවල සොහොන් බිමේ දී සමහර පෙදෙස් වල නිවසේදී සිදු කෙරේ. පාංශුකූලයට ගමේ පන්සලේ භික්ෂූන් වහන්සේට ආරාධනා කළ යුතුය.
- මතක වස්ත්‍රයට සාමාන්‍යයෙන් පූජා කෙරෙන්නේ සුදු රෙදි යාර දහයකි.
- ඉක්බිති අනිත්‍ය දුක්ඛ අනාත්ම යන තිලකුණු මෙනෙහි කිරීමත් සියලුම භික්ෂූන් වහන්සේලා පහත ගාථාව සජ්ඣායනා කරනු ලැබේ.

"අනිච්චා වත සංඛාරා - උප්පාද වය ධම්මිනෝ
උප්පජ්ජිත්වා නිරුජ්ජන්ති - තෙසං වූප සමෝ සුඛෝ"

- දහම්සොඬ ජාතකයේ දැක්වෙන පරිදි දහම්සොඬ රජ්ජුරුවන්ට ශක්‍ර දේවේන්ද්‍රයා රාක්ෂ වෙසක් මවාගෙන විත් දේශනා කළේද මෙම ගාථාව යි.
- අනතුරුව බඳුනකට පැන් වත් කරමින් මියගිය ඥාතිවරයාට කුසල් අනුමෝදන් කරවයි. එහිදී භික්ෂූන් වහන්සේලා පහත ගාථාව සජ්ඣායනය කර යි.

"යථාවාරි වහාපූරා - පරිපූරෙන්ති සාගරං
එව මේව ඉතෝ දින්නං - පේතානං උපකප්පති"

- ආදාහනයකදී නම් දේහය රැගත් පිරිස චිතකය වටා තෙවරක් පැදකුණු කොට දේහය රැගත් පෙට්ටිය දර සෑයෙහි තබනු ලැබේ. මෙය දේහය තැන්පත් කළ පසු චිතකය තෙවරක් පැදකුණු කිරීම ලෙස නිවැරදි විය යුතුය. සෑයට ගිනි දල්වන්නේ මළ තැනැත්තාගේ බෑනලා දෙදෙනෙකි. ඔවුන් එය කරන්නේ, පිටිපස්සට කරගත් ගිනි පන්දම් අතේ ඇතිව සෑය වටා තෙවරක් ගමන් කොට සොහොනට පිටුපස හරවා ගෙන ය.
- භූමදානයකදී නම් මිනිය වළට බැස්ස වූ කෙණෙහි නෑ හිත මිතුරන් වළට පස් පිඩ බැගින් දැමීමද සිරිතය.
- ලංකාවේ සමහර පෙදෙස්වල අවමගුල් කටයුතු අවසන් වූවායින් පසුව එදිනම හවස පිළියෙල කරගත් ආහාර වේලක් සපයනු ලැබේ. මේ ගෝදානය නමින් හැඳින්වේ. සතියක් යනතුරු මලගෙදරදී රාත්‍රියට වෙස්සන්තර ජාතකය ගායනය කිරීම ද සමහර බෞද්ධ ගෙවල්වල සිරිතකි.
- මරණයෙන් සිදුවී තෙදිනකට පසු, සත් දිනකට පසු, තෙමසකට පසු හා වර්ෂයකට පසු පිළිවෙලින් මහා සංඝයා විෂයෙහි දානමය පිංකම් පවත්වා මළගිය ඥාතියාට පිං පැමිණවීම සිදු කෙරේ.

## මතක බණ හා දාන

- මළවුන්ට පින් දීම සඳහා පවත්වනු ලබන පින්කම් වල ධර්ම දේශනා මතක බණ නමින්ද දන් දීම මතක දාන නමින්ද හැඳින්වේ. බෞද්ධයන්ගේ මතක පින්කම් හින්දූන්ගේ ශ්‍රද්ධා දානය සිහිපත් කරයි.
- පරදත්තූපජීවී, නිජ්ඣාමතන්හික, ඛුප්පිපාසික, පාංශු පිශාචක, කාලකඤ්ජ ලෙස බෞද්ධ ඉගැන්වීම් අනුව ප්‍රේතයෝ කොටස් පහකි. එහෙයින් අනුන් දෙන පිනකින් යැපෙන්නේ පරදත්තූප ජීව නම් ප්‍රේතයෝ ය. සතියකින් දෙන දානයේ පින් අනුමෝදන්ව ප්‍රේත ආත්මයෙන් මිදෙන බව කියනු ලැබේ.
- මතක දාන දුන්විට පින් දීම කරන්නේ පැන් වැඩීමෙනි.

"උන්න මේ උදකං වට්ටං - යථා නින්නං පවත්තති
එව මේව ඉතෝ දින්නං - පේතානං උපකප්පති"

# 4. පාඩම

# ශාසනික කටයුතු හෙවත් පිංකම් පිළිබඳ සිරිත් විරිත්

- පිංකම් යනු නිවන් අවබෝධය සහ මෙලොව පරලොව ජීවිත සැපවත් කරගැනීම අරමුණ ඇතිව ශ්‍රද්ධාවෙන් සිදුකරනු ලබන කටයුතු වේ.
- ලෝභය නැති කිරීමට දන්දීම ද. මෝහය නැති කිරීමට ශීලයද, මෝහය නැති කිරීමට භාවනාද, සිදු කරනු ලබයි.
- දාන, ශීල සහ භාවනා යනු ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා වේ.
- දානය, ආමිස දාන, අභය දාන, ධර්ම දාන, පත්ති දාන ලෙස විවිධාකාර වේ.

## සාංඝික දානය පිළිබඳ සිරිත් විරිත්

- නිවසට වැඩමවා සිදුකරන සාංඝික දානයකදී දායකයා දින ගණනකට පෙර, අවම උපසම්පදා භික්ෂූන් වහන්සේලා හතර නමක් ඇතුලුව භික්ෂූන් වහන්සේලා ගණන සඳහන් කොට පන්සලේ භික්ෂූන් වහන්සේට දැහැත් වට්ටියක් පූජා කර ආරාධනා කරනු ලබයි .
- දානයට ප්‍රථම නිවෙස් පිරිසිදු කොට, ගොක්කොල සැරසිල්ලකින් ආරුක්කුවක් සාදයි.
- බත, දානයද මාළු පිනි, ව්‍යාංජනද කැවිලි අවුල්පත්ද, වතුර පැන් ලෙසද හඳුන්වන අතර පූජා කිරීමට ප්‍රථම ආහාර ඉඳුල් කරනු නොලබයි.
- හේවිසි හොරණෑ සහිතව ධාතු කරඬුව ප්‍රමුඛ සංඝයා වහන්සේලා පෙරහරින් වැඩමවනු ලබයි.
- ධාතු කරඬුව උස් අසුනකද, භික්ෂූන් වහන්සේලා වැඩහිඳින ස්ථානය උඩුවියන්ද බඳින අතර පිරිකර සහිත දාන වස්තු සුදු රෙදි අතුරා ඒ මත තබනු ලැබේ .
- පංච ශීලය පිහිටුවා , ධාතු කරඬුවට බුද්ධ පූජාව පිළිගන්වා, පසුව පූජා කිරීමේ පාලි ගාථාද කියා බුද්ධ පූජාව සිදු කර ලබන අතර ගිහි පිරිස ගාථා සජ්ජායනා කරනු ලබයි.
- භික්ෂූන් වහන්සේලා විසින් ප්‍රාර්ථනා ඉටුවීම පිළිබඳ ආශිර්වාදාත්මක ගාථා සජ්ජායනා කොට පින් අනුමෝදන් කොට දානය වළඳා, උන්වහන්සේලාට පිරිකර පූජා කරනු ලබයි .

- භුක්තානුමෝදනාවේදී කරන ලද පිනෙන් සතුටුවන ලෙසත් දායකයින් පොළඹවමින් දානානිශංස වර්නණා කරනු ලබන අතර අවසානයේ දෙවියන්ට , මියපරලොව ගිය ඥාතීන්ට, භූතයන්ට, සියලු සත්ත්වයන්ට පින් පමුණුවා, අවසානයේ භික්ෂූන් වහන්සේලට වැද නමස්කාර කොට පුණ්‍ය කර්මය අවසන් කරනු ලබයි.

## ධර්ම දානය, දහම් දෙසීම සහ ධර්ම ශ්‍රවණය පිළිබඳ සිරිත් විරිත්

- ධර්ම දානය සියලු දාන අතරින් උසස්ම දානය වේ. දහම් දෙසීම , දහම් පොත් කියවීම සහ දහම් පොත ලිවීම ප්‍රධාන ක්‍රම වේ,
- බෞද්ධ සමාජීය ජීවිතයේ ආර්ථික, සමාජීය, දේශපාලන හා ආධ්‍යාත්මික ගැටලු වලට උපදෙස් ලැබෙන්නේ ධර්ම දේශනා වලිනි .
- ධර්මය දේශනා කරන භික්ෂූන් වහන්සේ සුදු වියනක් යට සුදු ඇතිරිලි දමූ උස් ආසනයකද, ශ්‍රාවකයන් බිම ඇතිරූ පැදුරු වලද සිටින අතර තවද, භික්ෂූන් වහන්සේ වටාපතක්ද දරයි.
- බිම හිද, හිටගෙන, පහත් අසුන්වල හිද, පාවහන් පයලා, හිස් වැසුම් ලා, රියක සිටින, වැතිර සිටින අයට දහම් දෙසීම නොකරන අතර පසුපස යමින් ද දහම් දෙසනු නොලබයි.

ධර්ම දේශනයකදී,

- දේශකයන් වහන්සේ පලමුව සාදු නාදයෙන් පසු, පංච ශීලය පිහිටුවා දේවාරාධනයෙහි යෙදෙයි.පසුව කාල ඝෝෂයද, නැවත ශ්‍රාවකයන් සාදුකාර දී ධර්ම දේශනාව සිදු කරනු ලබයි. අවසානයේ දේශනාව කැටි කොටදක්වා , දේශනාවේ අරමුණු සඳහන් කොට සියල්ල පින් අනුමෝදන් කරනු ලබයි.
- දක්ෂිණා විභංග සූත්‍රය, වෙස්සන්තර ජාතකය, දේවදූත සූත්‍රය , ගිලාන සූත්‍රය , කපි ජාතකය , සතිපට්ඨාන දේශනාව සහ අරියවංශ දේශනාව ආදිය අතීතයේ ජනප්‍රිය වූ දහම් මාතෘකා වේ.
- ධර්ම ශ්‍රවණයේදී ශ්‍රාවකයන් පහත් අසුනක හිද දෙඅත් ඔසවා වැද සිටිය යුතු අතර එහෙයි ස්වාමීනි ලෙස ප්‍රති උත්තර දීම සිදු කරයි.
- අවසානයේ පඩුරු පිලිගන්වනු ලැබේ.

## කඨින දානය පිළිබඳ සිරිත් විරිත්

- කඨින චීවරය යනු වස් අවසානයේ භික්ෂූන් වහන්සේලාට පූජා කරනු ලබන චීවරයයි.
- ජූලි සිට ඔක්තෝබර් දක්වා ඇති වස් කාලයේදී දායකයින් විසින් වස් දාන පිළිගැන්වීම කරනු අතර වස් තෙමස අවසානයේ කඨින සිවුර පූජා කර සර්ව රාත්‍රික පිරිත් දේශනාවක් සහ සංඝයා හට සාංඝික දානයක් පිළිගන්වනු ලැබේ.

- කඨින චීවරය සදහා පෙරහරින් විහාරස්ථානයට වැඩම කරනු අතර එම සුදු රෙද්ද පඩු ගසා එදිනම එම සිවුර පොරවා භික්ෂූන් වහන්සේ නමක් කඨිනානිසංස පිළිබඳ ධර්ම දේශනාවක් සිදු කරනු ලබයි.

## උපෝසථ සීල සමාදානය පිළිබඳ සිරිත් විරිත්

- පෙහෙවස් උපෝසථ අෂ්ඨාංග සීල සමාදානය පසළොස්වක පොහෝ දින වල සිදු කරන අතර සුදු වතින් සැරසීම සිරිතකි.
- උතුරු සළුව, පත්කඩය හා නවගුන වැල පෙහෙවස් සමාදානයේ අංග වේ.
- ඇතම් විට උපාසක උපාසිකාවන් ප්‍රත්‍යාවේක්ශා කොට දන් වලදනු ලැබේ .
- සන්ධ්‍යාවේ නැවත අෂ්ඨාංග සීලය සමාදන් වී පසුදා උදේ පන්සිල් සමාදන් වී සිල් පවාරණය කරනු ලබයි.

## බෞද්ධ ශාන්ති කර්ම

- මෙලොව ජීවිතයේ යහපත් ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් කරනු ලබන ආගමික කටයුතු ශාන්ති කර්ම වේ. උදා : පිරිත් දේශනා

### පිරිත් දේශනා සම්බන්ධ සිරිත්

- බුදුරදුන් විසින් විශාලා මහනුවර තුන්බිය දුරු කිරීමට රතන සූත්‍රය ( ගංගාරෝහන සූත්‍රය) දේශනා කිරීම සමග පිරිත් දේශනා ආරම්භ වූහ.
- අතීතයේ ශ්‍රී ලංකාවේ රජවරුන් විසින් ගංගාරෝහන පූජාව ලෙස බුදුරුවක් හෝ අනද හිමිගේ රුවක් සාදා රතන සූත්‍ර දේශනා කොට පැන් ඉස රෝග සහ දුර්භීක්ෂ බිය තුරන් කිරීමට කටයුතු කලහ.
- සෙත් පැතීමට, අසනීප ඇත්තන්ට සුවය පැතීමට , ගෙයකට මුල් ගල් තැබීමට, ආශිර්වාද ලබාගැනීමට ආදි විවිධ අරමුණු මුල් කොට පිරිත් දේශනා පවත්වනු ලැබේ.
- තිස් පැයේ පිරිත්, සති පිරිත්, වරු පිරිත් සහ කෙටි කාලයක දී දේශනා කරන ආකාරය මත පිරිත් දේශනාවේ අරමුණු වෙනස් වේ.
- රතන සූත්‍රය, ඛන්ද පරිත්ත, මොර පරිත්ත, ධජග්ග පරිත්ත, කරණීය මෙත්ත සූත්‍රය, මහාමංගල සූත්‍රය ආදි පිරිත් සූත්‍ර ද, පිරුවානා පොත් වහන්සේට අදාල සරණාගමනය, දසසික්ඛා පද, සතර

ප්‍රත්‍යවේක්ශන සහ බත්තිංසාකාරය ඇතුළු බණවරද, සතර කමටහන්, දොරකඩ අස්න හා අනුශාසනාද පිරිත් දේශන වලට ඇතුලත් ය.

### ආටානාටිය සූත්‍ර දේශනාව

- අමනුශ්‍යයන් පලවා හැරීම සඳහා දේශනා කරන අතර පලමුව මෙත්ත සූත්‍රය, ධජග්ග සූත්‍රය හා රතන සූත්‍රය සත් දිනක් සජ්ජායනා කිරීමෙන් පසු දේශනා කරයි.
- භික්ෂූන් වහන්සේ මස් මාංශ, කැවිලි අනුභව නොකළ යුතු අතර දොර කවුලු වැසූ කාමරයක, මෙත් සිතින් ආරක්ෂාවට අවි හා පලිස් ගත් පිරිස් සිටිය යුතුය.

### පිරිත් මණ්ඩපය

- හතරැස් හෝ අටපට්ටම් හැඩැති, උඩුවියන් ඇති, නා දලු, බුලත් කිනිති හා සිවිය කොල හා මල් එල්වා අලංකාර කරනු ලබයි.
- දොරටුව දකුණට හෝ නැගෙනහිරට තබන අතර ඉන්ද්‍රඛීලය (රාජගහ) ලෙස ලපටි පුවක් ගසක් සිටුවයි. ධාතු කරඬුවට, පූජා ද්‍රව්‍ය, ගොක්කොලින් සැරසූ පැන් කලයක්ද තැබීම අනිවාර්යය වේ.
- පහන් දල්වා පුන්කලස් සතරක්ද, පිරිත් හුය පුවක් මල් කිනිත්තක එතීමද, ලද පස් මල් මණ්ඩපය තුල විසිරවීමද සිදු කරයි. චාරිත්‍ර අරඹන්නේ සඳුන් කිරි පැනින් දෑත් පවිත්‍ර කරගැනීමෙනි.
- පිරිත් මණ්ඩපය බුදුරජාණන් වහන්සේගේ බුද්ධත්වය ලැබූ අවස්ථාව නිරූපණය කරන්නේ යැයි සිතයි.
- පිරිත් ආරම්භයේ දී ධාතු කරඬුව පිරුවානා පොත් වහන්සේ සහ භික්ෂූන් වහන්සේලා යන ත්‍රිවිධරත්නයම පිරිත් මණ්ඩපයේ වැඩ සිටිති.

### පිරිත් දේශණය

- පිරිත් දේශනයේ දී පිරිත පේ කිරීම මහ පිරිත දෙසීම යුග කීම සරණාගමනය කීම, සූත්‍ර දෙසීම, විහාර අස්න, දොරකඩ අස්න හා අනුශාසනා අස්න කීම, හමාර දෙසීම සහ සෙත් පිරිත් දෙසීම ලෙස චාරිත්‍රානුකූල පිරිතක අංග දහයකි. පිරිත් දේශනයට සහභාගි වන භික්ෂූන් වහන්සේලා ගණන අටත් දහසයත් අතර ඉරට්ටේ සංඛ්‍යාවකි. මහපිරිත් අවසානයේ දම්සක් පැවතුම් සූත්‍රයත් බෙර වැයීම ලෙස ශබ්ද පූජා පැවැත්වීම සිරිතය.

සත් වරුවේ පිරිත් සහ සත් දිනයේ පිරිත්

- සෑම දිනකම උදේ 6:00 සවස තුන හා රෑ 9:00 ට සියලුම දේශකයෝ එක්ව මහා පිරිත් දෙසුමක් පවත්වති. පිටස්තර සූත්‍ර හතක් විචිත්‍ර ශෛලියකින් දේශනා කරයි විහාර අස්න සහ අනුශාසනා අස්නෙන් පසු ව සෙත් පිරිත් දේශනයකින් සෑම පිරිතක් ම අවසන් වේ.

### පිරිත් පැන් හා පිරිත් නූල්

- මෙමගින් පිරිතේ ශබ්දයේ බලය සහ අනුහස දරන්නට ලැබේ යැයි විශ්වාස කරයි. පිරිත් හුය දේශනාව අතරදී පිරිත් පැන් කළය, ධාතු කරඬුව හා පිරිත් පොත , සම්බන්ධ කර සෑම භික්ෂූන් වහන්සේ නමක් ම එය අතේ දරා ගනිති. උවදුරු නසා ශාන්තිය ලැබෙන බව විශ්වාසයයි.

### බෝධි පූජාව සහ ඒ සම්බන්ධ සිරිත් විරිත්

- බෝධි පූජා ඉතිහාසය
- බුදුරදුන් ජීවත්ව සිටියදී මෙන්ම පිරිනිවන් පෑමෙන් පසුවත් තමන් වහන්සේ වෙනුවට පිදීමට ජේතවනාරාමයේ ආනන්ද බෝධීන් වහන්සේ රෝපණය සිදු විය.
- අශෝක රජු සමයේ ශ්‍රී ලංකාවට දෙවන පෑතිස් රජ සමයේ සංඝමිත්තා මෙහෙණින් වහන්සේ අත ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙන්ම බෝධි පූජාව සඳහා උපදෙස්ද එවන ලදී.
- බෝධි පූජාවක චාරිත්‍ර ප්‍රධානම චාරිත්‍රය බෝධි මූලය පැනින් නැහැ වීමයි.
- පළමුව පංචශීලය පිහිටුවීමත් පසුව පහන් සුවඳ දුම් මල් කොඩි සහ පැන් කල ගෙන කවි කියමින්ය ප්‍රදක්ෂිණා කරයි.
- පසුව බෝධීන් වහන්සේට පුද පූජා පැවැත්වීම කරයි. එසේම බුද්ධානුස්සති භාවනාව, සෙත් පිරිත් සජ්ජායනය, පුණ්‍යානුමෝදනාව ද, අවසානයේ ත්‍රිවිධරත්නය සමාකර බෝධි පූජාව අවසන් කරයි.

## ධර්ම යාත්‍රා හෙවත් වන්දනා ගමන් පිළිබඳ සිරිත්

- සැදැහැවත් කුල පුත්‍රයකු සංවේගයෙන් නැරඹිය යුතු ස්ථාන හතරකි. එනම් බුදුරදුන් උපන් ස්ථානය, බුදු වූ ස්ථානය, දම්සක් පැවැත්වූ ස්ථානය හා පිරිනිවන් පෑ ස්ථානය. එනම් පිළිවෙලින් ලුම්බිණිය, බුද්ධගයාව, ඉසිපතනය හා කුසිනාරා නුවරයි. එසේම ධාතු නිදන් කොට සෑදූ චෛත්‍යයන් ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛා රෝපණය කර ඇති වූ පූජනීය ස්ථාන ද වැඳපුදා ගනී.

### වන්දනා ගමනක වැදගත්කම

- ගිහියන් චිත්ත ඒකාග්‍රතාවය සඳහා ද භාවනායෝගී භික්ෂූන් වහන්සේලා විමුක්ති සුවය උදෙසාද වන්දනා ගමන් වල යෙදෙති.
- යමකු වන්දනා ගමනක් අතරමගදී මරණයට පත්වුවහොත් ඔහු දෙව්ලොව උපදින බව බුදුරදුන් වදාළ බව පරිනිබ්බාන සූත්‍රයේ දැක්වේ.
- නඩ වශයෙන් වන්දනා ගමන් යති.
- තම දැනුම අත්දැකීම් බුදු දහමේ කරුණු වැඩිදුරටත් දැනගැනීමට වන්දනා ගමන් උපකාරි  වේ.

## පොහොය හා වන්දනා සිද්ධස්ථාන

- පසළොස්වක පොහොය දිනයන් ඇසුරු කරගෙන වන්දනා ගමන් යාම සිරිත වේ.
- වෙසක් පොහොය බුදු තෙමගුල යමා මහ පෙළහර පෑම සමනල කන්ද හා කැලණියට බුදුරදුන් වැඩම කිරීම වැදගත්කම වේ.
- පොසොන් පොහොය ලක්දිව බුදුසසුන ස්ථාපිත කිරීම නිසා මිහින්තලය සහ අනුරාධපුරය වැඳ පුදා ගනියි. ථූපාරාමය බුදුරදුන්ගේ අකු ධාතු නිදන් කොට දෙවන පෑතිස් රජු කරවූ ප්‍රථම චෛත්‍යයි.
- රුවන්වැලිසෑය සර්වඥ ධාතූන් වහන්සේලා ද ජේතවනාරාමයේ බුදුරදුන්ගේ පටි ධාතුව හා කේසධාතු ද නිධන් කොට ඇත.
- අභයගිරිය වලගම්බා රජු ද මිරිසවැටිය දුටුගැමුණු රජු ද කරවන ලදී. මිහින්තලේ අම්බස්තල චෛත්‍ය මහින්ද මහ රහතන් වහන්සේගේ ධාතු නිදන් කොට ඇත.
- ඇසළ පොහොයේ දී සිදුහත් කුමරු මව්කුස පිළිසිඳ ගැනීම, මහාභිනිෂ්ක්‍රමණය කිරීම, දම්සක් පැවතුම් සූත්‍රය දෙසීම, වස් සමාදන් වීමේ ආරම්භය සහ මහනුවර දළදා පෙරහැර පැවැත්වීම වැදගත්කම වේ.
- නිකිණි පොහොය ප්‍රථම සංගායනාව ආරම්භ වූ දිනයි.
- බිනර පොහොයේ දී මහියංගනය වැඳපුදා ගනී.
- වප් පොහොයේ දී කඨින චීවර පූජා ආරම්භ වේ.
- ඉල් පොහොය සැරියුත් තෙරුන් පිරිණිවන් පෑ දිනයි.
- උඳුවප් පොහොය සංඝමිත්තා තෙරණිය ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලක්දිවට වැඩම කළ දිනයි.
- දුරුතු පොහොය බුදුරදුන්ගේ ප්‍රථම ලංකාගමනය සිදු විය. එසේම තෙවන ලංකාගමනය ද සිරිපා වන්දනාව ආරම්භ වීම ද වැදගත්කමකි.
- නවම් පොහොයේ අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලා පත් කරන ලදී.
- මැදින් පොහොයේ දී බුදුරදුන් කිඹුල්වත් පුරට වැඩම කරන ලදී .
- බක් පොහොයේ දී බුදුරදුන් නාගදීපයට වැඩම කරන ලදී.

## වන්දනා ගමනට සූදානම් වීම හා සම්බන්ධ චාරිත්‍ර

- හොඳින් පිරිසුදු වී ඇත ගමනකදී නාම පන්සලේ දෙවියන්ට පඬුරක් බැද නිරුපද්‍රිතව ඒමට ලැබෙන ලෙස ප්‍රාර්ථනා කරයි.
- විවිධ ආහාර අග්ගලා අලුවා ආදී කෑම බෙදා හදාගෙන කෑම සිරිතකි.
- මල් සුවඳ කූරු ආදී පූජා ද්‍රව්‍ය ද රැගෙන යයි.

- කිසිවකුත් මත්පැන් පාවිච්චි නොකරයි.
- භික්ෂූන් වහන්සේලා සහභාගී වනවා නම් අවශ්‍ය දේවල් ද රැගෙන යයි.
- ගමනාරම්භයේදී, පන්සිල් සමාදන් වී පුවක් මලක් හෝ බෞද්ධ කොඩියක් වාහනයේ ඉදිරිපස බැඳීම සිරිතකි.

### සිරිපා වන්දනා ගමන පිළිබඳ විශේෂ චාරිත්‍ර

- වන්දනාකරුවන් ගමේ පන්සලේ සුමන සමන් දෙවියන්ට බාර වීම සිදු කරයි.
- ගමන ආරම්භ කරන්නේ රාත්‍රියේදීය.
- අලුයම කඳු මුදුනටත් නැගීම සිරිතයි.
- සීත ගඟුල ස්ථානයේ ස්නානය කොට අලුත් ඇඳුම් ඇඳ පඬුරු බැඳ කන්ද නැගීම ආරම්භ කරයි.
- තුන් සරණය, හිමගත වර්ණනාව, සමන් දෙවි වරුණ ආදී පද්‍ය ද ගායනා කරයි.
- ඉහළ නගින්නෝ මෙන්ම පහල බසින්නෝ ද ආශිර්වාද කරති.
- ගෙත්තම්පාන ස්ථානයේ ඉදිකටු නූල් පූජා කිරීම චාරිත්‍රයකි.
- ඉර සේවය නැරඹීමද සිරිතකි. සිරිපා වැඳීමට පැමිණි වාර ගණන මත සණ්ටාව නාද කිරීම ද බැතිමතුන්ගේ සිරිතකි.

## බෞද්ධ සිද්ධස්ථානයක දී වන්දනාවේ දී අනුගමනය කරන චාරිත්‍ර

- බෞද්ධ සිද්ධස්ථාන වලට හිස්වැසුම් පාවහන් ගලවා සංසුන්ව ඇතුළුවෙයි.
- අත් පා දෝවනය කොට මල් පහන් පූජා කොට පූජා සිදු කරයි. පසුව විහාරස්ථානයේ භික්ෂූන් වහන්සේ හමුවී පංචශීලයේ පිහිටුවයි.
- පළමුව දාගැබත්, දෙවනුව බෝධීන් වහන්සේත්, තෙවනුව බුදුපිළිම වහන්සේ වන්දනා කිරීම සිරිතයි.
- පළමුව පහන් ද, පසුව මල්, සුවඳ දුම් ද, ගිලන්පස ද, දැහැත් ද අනුපිළිවෙළින් පූජා කරයි.
- පසුව ගාථා කියා වන්දනාවේ යෙදෙයි.
- වන්දනා කිරීමේදී අන්ජලී නමස්කාරය, පංචාංග පතිය්ඨාපිත නමස්කාරයද, උක්කුටික නමස්කාරයද හා දණ්ඩ නමස්කාරය ද යන ඉරියව් වලින් එකක් වන්දනාවේදී අනුගමනය කරයි.

## වන්දනා ගාථා අනුපිළිවෙල

- පළමුව පංචශීලය ද, තෙරුවන් සිහි කිරීම, සොලොස්මස්ථාන වන්දනාව, චෛත්‍යය වන්දනාව, බෝධීන් වහන්සේ වැඳීම, විශේෂ ස්ථානයක නම් එම ස්ථානයේ විශේෂ ගාථාවද, පහන් පූජා කිරීමේ ගාතා, සුවඳ පූජා කිරීම, මල් පූජාව, ආහාර හෝ ගිලන්පස දැහැත් පූජා කිරීම, මෛත්‍රී භාවනාව වැඩීම, දෙවියන්ට පින් දීම, ප්‍රාර්ථනා ගාථා කීම, දෙමාපියන් වැඳීම සහ අවසානයේ ත්‍රිවිධරත්නය සමා කර ගැනීම සිදුකරයි.

## ස්ථානය නැරඹීම

- පිළිම ගෙවල් ආදියද, බිතු සිතුවම්, ජාතක කතා, ශාසන ඉතිහාසය පිළිබඳ දැනගැනීම ඓතිහාසිකව හා ආගමික වැදගත් වන තවත් දේවල් නැරඹීම ද සිරිතකි.
- වන්දනා ගමන අවසානයේ දෙමාපියන් වැඩිහිටියන් වැඳ සමාකර ගැනීම ද, නෑදෑ හිතවතුන් හට වන්දනා ගමන තොරතුරු කීමද, පැරණි බෞද්ධ ගැමියන් ගේ සිරිතකි.

# 5. පාඩම
# උත්සව හා සම්බන්ධ සිරිත් විරිත්

## සිංහල අලුත් අවුරුද්ද පිළිබඳ සිරිත් විරිත්

- බෞද්ධ අබෞද්ධ සියලු සිංහලයන්ට වැදගත් උත්සවයකි.
- මෙය ඇරඹෙන්නේ නානුමුර මංගල්‍යයෙනි. එනම්, ඉස් සෝදා නෑමේ චාරිත්‍රයෙනියි.
- මෙහිදී දෙහි ඇඹුල්, සඳුන්, සුනු හිසෙහි ගා සේදීම සිදු කරන්නේ සුබ මුහුර්තයෙන් යි.
- බෞද්ධ විහාරවල බුදු පිළිම වහන්සේලා පවා කැඩපතක ට වැටෙන ඡායාව ආශ්‍රයෙන් මෙම මංගල්‍යයට සහභාගී කරවයි.
- නැකතට පරණ අවුරුද්දේ වැඩ අත්හැර, පුණ්‍ය කාලයේ දී වෙහෙර විහාර වලට ගොස් පින්දහම් කටයුතු සිදුකරයි .
- නව අවුරුද්ද ලැබූ පසු විහාරවල සාන්ධ්‍යාරය නාද කිරීම සිදු කරනු ලබයි.
  පසුව ගෘහණිය ශුභ මුහුර්තයෙන් ලිප ගිනි මොලවා, ගිතෙල් මිශ්‍ර කිරිබතක් පිස, සියලු දෙනා එක්ව වැඩ අල්ලා, ගනුදෙනු කර, සියලු දෙනා එක්ව ආහාර අනුභව කරයි.
- ගනුදෙනු කිරීම යනු බුලත් කොළයක ඔතා මුදලක් දුන් විට අනෙකා ඊට තව මුදලක් එකතු කර නවා නැවත දීමයි.
- බාලයන් විසින් වැඩිහිටියන්ට බුලත් හුරුළු දී නැමදීම මෙහි එන සදාචාරාත්මක වටිනා සිරිතකි.
- "මාතා පිතු උපට්ඨානං, ඤාතකානඤ්ච සංගහො, පුත්තදාරස්ස සංගහෝ "වැනි මංගල කරුණු ද අවුරුදු උත්සවය හා සම්බන්ධ වේ .
- අසල්වැසියන්ට අවුරුදු කෑම යැවීම, ඔවුන්ට සංග්‍රහ කිරීම මගින් එකිනෙකා අතර එකමුතුකම, සමගිය වර්ධනය කරවයි.
- ගැහැනු පිරිමි දෙපාර්ශවයම අවුරුදු ක්‍රීඩා වල නිරත වේ. මෙම ක්‍රීඩා කිරීමට ප්‍රථමව ගොක්කොල පැලක් තනා පත්තිනි දෙවඟන පිදීම ද සිදු කරනු ලැබේ.
- විශේෂ බෙහෙත් තෙලක් පිළියෙල කර, හිසට පයට ඖෂධීය කොළ අතුරා සුබ මොහොතින් වැඩිහිටියකු හෝ හාමුදුරුවන් වහන්සේ නමක් විසින් හිසට ගෑම සිදු කරනුයේ, "භවතු සබ්බ මංගලං" යන ආශිර්වාදාත්මක ගාථාව සජ්ඣායනා කරමිනි.
- අවසාන වශයෙන් සුබ මොහොතින් රැකී රක්ෂා වලට පිටත්ව යාම ද සිදු කරනු ලබයි.
- බිඳ වැටී ගිය සමාජ සම්බන්ධකම් නෑදෑ හිත මිතුරුකම් ඇති කිරීම, වැඩිහිටියන්ට සැලකීම, වෙලාවට වැඩ කිරීම වැනි වටිනා සිරිත් විරිත් ගැබ්ව පවතින අවුරුදු උත්සවය කාටත් විශේෂ වූවකි.

## වෙසක් උත්සවය පිළිබඳ සිරිත් විරිත්

- බුදුන්ගේ ත්‍රිවිධ මංගල්‍යය සැමරීම කරනු ලබන උත්සවය වේ.
- අතීත ඉන්දියාවේ වෙසක් උත්සවය පවත්වා ඇති බව පාහියන් භික්ෂුව පවසා ඇත. රෝද සහිත රථ සරසා ඒවායේ කුඩු, බුද්ධ ප්‍රතිමා තබා විදි සංචාරය කර ඇති බව පවසයි.
- ලක්දිව ද දුටුගැමුණු රජු සමයේ සෑම වර්ෂයකම වෙසක් උත්සව (24) පවත්වා ඇති අතර, භාතිය රජු (28), වසභ රජු (24), සේන රජු අඛණ්ඩව වෙසක් උත්සව පවත්වා තිබේ .

- වර්තමානයේ දී බුදු සිරිත හා ජාතක කතා චිත්‍රයට නංවා වෙසක් තෝරණ ඉදිකිරීම ද කැපී පෙනෙන චාරිත්‍රයකි.
- වෙසක් දින නිවෙස් වල වෙසක් කොඩි එල්ලීමද, වෙහෙර විහාර හා මාර්ගයන් සැරසීම ද සිරිතකි.
- එදින පෙහෙවස් සමාදන් වීම ද, විහාර ආරාමයන්ට ගොස් වැඳුම් පිදුම් කිරීම ද, අනුරපුර, කැලණිය, මිහින්තලයේ වැනි පූජනීය ස්ථානවලට ගොස් ආමිස හා ප්‍රතිපත්ති පූජාවල නිරත වීම ද සිදු කරනු ලබයි.
- අතීතයේ පටන් වර්තමානයේ දී ද දන්සල් දීම සිදු කරනු ලබන චාරිත්‍රයකි.
- සෑම දෙනාහටම වෙසක් ආසිරි පත් හුවමාරු කිරීම ද කැපී පෙනෙන චාරිත්‍රයක් ලෙස සැලකිය හැකිය.
- භක්ති ගීත ගායනය ද තවත් එක් සුවිශේෂී අංගයකි.
- ආලෝක පූජාව වෙසක් උත්සවය තවත් අංගයකි. වෙහෙර විහාර, නිවෙස්, මාර්ග ද විදුලි බුබුළු වලින් ආලෝකමත් කරනු ලබයි.

## පෙරහර පැවැත්වීම පිළිබඳ සිරිත් විරිත්

- ආගමික නායකයින් සිහිකිරීම, පූජනීය වස්තුවකට පූජෝපහාර දැක්වීම පදනම් කරගෙන වාර්ෂිකව පෙරහර පවත්වනු ලබයි.

### මහනුවර ඇසල මහා පෙරහැර

- ආරම්භ වන්නේ කප් සිටුවීමෙනි. කප් සිටුවීම යනු ගෙඩි නො හටගත් කොස් ගසකින් සාදාගත් කපක් හද ඇති දවසක සරසා තාවකාලික වහලක් යට සිටවනු ලැබීමයි .
- මුල් දින පහ පෙරහැර පවත්වනු ලබන්නේ කප වටා ගමන් කිරීමෙනි. මේ **කුඹල් පෙරහර** ලෙස හැඳින්වේ .
- 6 වන දිනයේ සිට දළදා මාලිගාවේ දේවාල සතරේ පෙරහැරවල් එක්වී දිනපතා මහ මළුව වටා ගමන් කරයි.
- 11 වන දිනයේ සිට 15 වන දින දක්වා අංගසම්පූර්ණ රන්දෝලි පෙරහැර වීදි සංචාරය කරනු ලබයි.
- 15 දින රාත්‍රියේ උත්කර්ෂවත් රාත්‍රියකි.
- දළදා පෙරහැර, දළදා මාළිගාවෙන් පිටත් වන අතර දේවාල පෙරහරත් සූදානම්ව මාලිගාවට පැමිණේ.
- පෙරහැරේ මුලින්ම දළදා පෙරහැර ද, ඊළඟට නාථ, විෂ්ණු, කතරගම, පත්තිනි දේවාලවල පෙරහර ද ගමන් කරයි.
- මුලින්ම ගිනිබෝල කරුවන් හා පන්දම්කරුවන් ගමන් කරන අතර මෙමගින් මාර්ගයේ ඉඩකඩ සපුරා ගනී .
- ඉන්පසුව හේවිසි ගසන්නන් හා හොරණෑ පිඹින්නන් ය.
- ඉන්පසු අනුපිළිවෙලට ප්‍රාදේශීය අධිපතිවරුන් තමන්ගේ කොඩි සහිතව ඇතුන් පිටින් ගමන් කරයි. මෙහිදී රනින් වැඩ දැමූ අලංකාර ඇඳුම්වලින් සැරසුණු අලි ඇතුන් ද, නැටුම් කණ්ඩායම් ද වේ.
- විලක්කු කර තබා ගත් අය දෙදෙනා බැගින් ආලෝක කරණය ද සපයනු ලැබේ.
- මේ අතර කොඩි සේසත් හා මුර ආයුධ දරන අය ද වේ .
- මින් පසුව මාලිගාවේ මංගල හස්ති රාජයා දළදා කරඬුව ද රැගෙන තේජාන්විතව ගමන් කරනු ලැබේ.
- ඉන්පසුව දියවඩන නිලමේ ඇතුළුව සේසත් මුතුකුඩ සහිත පරිවාර ජනයා ද ගමන් කරනු ලැබේ.

- මාලිගාවේ පෙරහැර අවසන් වූ පසු එක් එක් දේවාල පෙරහර ගමන් කරනු ලැබේ.
- අවසන් දින රාත්‍රියේ දී මහවැලි ගඟේ තොටේදී කපු රාළලා ගඟ මැද්දට ගොස් රන් කඩුවකින් දිය කපති. අෂ්ඨක ජයමංගල ගාථා කියමින් දේවාභරණ හා පැන් කෙණ්ඩිය දේවාලය කරා ගෙන ගොස් ඊළඟ අවුරුද්ද දක්වා තැන්පත් කර තබනු ලබයි.

### මිහිඳු මහා පෙරහැර

- මහා වංශයට අනුව කිත්සිරිමෙවන් රජු මෙම උත්සවය ආරම්භ කර ඇත.
- මිහිඳු හිමියන් ගේ ශරීරයේ ප්‍රමාණයට රන් පිළිරුවක් තබා, මිහින්තලාවේ සිට අනුරපුර සොත්ථියාකර විහාරයට වැඩමවා, දින තුනක් තබා, නැවත අනුරපුර මහ මළුවේ මාස තුනක් හිඳුවා, අවසානයේ නුවර මන්දිරයක් තනා එහි තැන්පත් කරවීය.
- මහමග පෙරහැරවල් වලින් වැඩමවා ගෙන ගොස් ඇත.
- වර්තමානයේ දී ද පොසොන් දින මෙලෙස අනුරුවන් සකසා වීදි සංචාරය කරනු ලබයි.
- එදින මිහිඳු හිමියන් දේශනා කළ **චුල්ලහත්තිපදෝපම සූත්‍රය** දේශණා කරනු ද ලබයි.

### සංඝමිත්තා පෙරහැර

- උඳුවප් පුර පසළොස්වක දින මේ පවත්වනු ලැබේ.
- ශ්‍රී මහා බෝධිය ලක්දිවට වැඩමවීම, මෙහෙණි සස්න පිහිටුවීම, සංඝමිත්තා රහත් මෙහෙණිය සිහිපත් කිරීම යනාදිය මෙහි අරමුණ වී තිබේ .
- පාත්‍රයක බෝධි අංකුරයක් අතැතිව සංඝමිත්තා මෙහෙණින් වහන්සේගේ පිළිරුවක් රථයක වැඩමවා පෙරහැරින් වීදි සංචාරය කරවීම වර්තමානයේ සිදුකරනු ලබයි.

### වෙනත් පෙරහැරවල් පිළිබඳව පොදු චාරිත්‍ර

- ගමන් කරන මාර්ගය ගොක් රැහැන් වලින් සැරසීම.
- ආරම්භයේදීම ප්‍රථමව, පන්සිල් සමාදන් විය යුතුය.
- පිරිසිදු වාම් ඇඳුම් ඇඳ සිටිය යුතුය.
- බෞද්ධ කොඩි ජාතික කොඩි සේසත් ඉදිරියේම ගමන් කරනු ලබයි.
- ඉන්පසුව බෙර වයන්නන්, හොරණෑ පිඹින්නන් ගමන් කරනු ලබයි.
- සුදු කොඩි, කහ කොඩි, මල් වට්ටි හා වෙනත් පූජා භාණ්ඩ පසුව ගමන් කරයි.
- ඊළඟට ධාතු කරඬුව, පිළිම, පිරිත් පොත් වියන් යටින් වැඩම කරනු ලබයි.
- කුඩා ගුවන් ත්‍රිවිධ රත්නයට වැඩම වන්නේ නම් මැනවි.
- සංඝයා වහන්සේලා පෙරටු කර ගෙන ගිහි උපාසක උපාසිකාවන් තෙල්, මල්, සුවඳ දුම් රැගෙන සාධුකාර දෙමින් අවසානයේ ගමන් කරනු ලබයි.

## නේත්‍රා ප්‍රතිෂ්ඨාපන මංගල්‍යය

- අලුතෙන් නිර්මාණය කරන ලද හෝ ජරාවාස වූ පිළිමයක් පිළිසකර හෝ පවත්නා වූ පිළිමයකට නෙත් තැබීමේ උළෙල වේ .
- බුදු පිළිම වලට ගරු බුහුමන් පුද සත්කාර කරනුයේ නේත්‍රා ප්‍රතිෂ්ඨාපනයෙන් පසුවය.
- උත්සවයට සුදානම සුභ දවසක් හා සුභ නැකත මේ සඳහා අවශ්‍ය වේ.
- පෙර දින සවස හයට කෝසල බිම්බ වරනයේ කවි කීමෙන් උත්සවය ආරම්භ වේ.
- රාත්‍රී 8 කල සිටුවීම /කලස්ථාපනය කරනු ලැබේ .
- පසු දින පාන්දර 3 මල් පැළ වෙත පිදේනි දෙනු ලැබේ. පාන්දර 5 නැකැත් වේලාවට නේත්‍ර සිත්තම් කරනු ලැබේ.

- මුලින්ම විහාරයේ අට කොනෙහි ඉන්ද්‍ර, වරුණ ආදී දිසා අධිපති දෙවිවරුන්ට පූජාසන අටක් විහාරයේ පිටත අටකොනේ ඉදිකරනු ලැබේ.
- දොරකඩ දෙපස - ද්වාර පාලක දෙවිවරුන්ට පූජාසන 2
- දොරකඩ ඉදිරිපස - ඉඩම බාර ක්ෂේත්‍ර පාල දෙවියන්ට පූජාසන 1
- පන්සල ඉඩමෙන් බාහිරව - බංගපාල දෙවියන්ට පූජාසන 1

## කලස්ථාපනය කල සිටුවීම

- මුට්ටි 80 හාල්, හකුරු, මුදල් දමා සකස්කර ගැනීම වේ.
- ඉන් පසුව බිම හාල් අතුරා එහි ඇඟිල්ලෙන් අටමගල අඳිනු ලැබේ. ඒ මත පැදුරු එලා වී පස් වර්ගයක් තුනියට අතුරා පොල්කොල තිරවලින් කොටස් අටකට බෙදනු ලැබේ .
- එක් කොටසකට කළ 40 වන සේ කොටස් දෙකකට බෙදා එක් කොටසක් බ්‍රහ්ම ගර්භය ලෙසද, අනෙක් කොටස විෂ්ණු ගර්භය ලෙස ද නම් කරයි. සේරුක්කාල නම් පුවරුව මත විශේෂිත මුට්ටියක්, රන් රිදී මුතු හා නව රුවන් සහිත බ්‍රහ්ම කලය බ්‍රහ්ම ගර්භය මධ්‍යයේ ද , සහල් සහිත විෂ්ණු කල විෂ්ණු ගර්භය මධ්‍යයේ ද අනික් මුට්ටි වලට වඩා උසින් තැන්පත් කෙරේ.
- එක් එක් මුට්ටි ලේන්සුවකින් වසා කන්න නූල නම් නූලකින් සියලුම මුට්ටි වටා ඇඳ දෘඩ වර්ණ රෙද්දකින් සියලුම මුට්ටි වසනු ලැබේ .
- ජෝතිය, සාලුව, හිස්වැස්ම, කඩු කන් හා පූන නූල යන බ්‍රාහ්මණ ඇඳුමෙන් සැරසුණු මිනිසුන් කීපදෙනෙක්, බුදු පිළිමය ඉදිරිපිට විහාර බිමේ ඇතුළත හාල් මත අඳින ලද අටමගල මැද නවරත්න රන් හාල් ආදිය යෙදු කල ගෙඩියක් තබා රුක්කත්තන කෝටුවක් වටා කඩමාලු ව එතීමෙන් සාදාගත් ඉන්ද්‍රකීලය නම් රූපය එම කළගෙඩිය සිටුවනු ලැබේ.
- ඊට අමතරව විහාරය ඇතුළත ගණදෙවියන්ට ආසනයක් ද පිළියෙළ කරනු ලැබේ.
- ඉන්පසු තුප්පොට්ටිය, හැට්මය, ලේන්සුව, උස් ජගලත් තොප්පිය යන රතුපාට ඇඳුමෙන් සැරසුණු පුද්ගලයෙක් කඩුවක් දරා, දුන් කබලක් හා කොතලක් ගෙන සංස්කෘතික ශ්ලෝක ගායනා කරමින් සියලු පූජාසන කරා ගොස් සුවඳ හා පැන් පූජා කරයි.
- ඉන්පසුව බෙර, හොරණෑ සහිත පෙරහැරකින් බඩිගපාල පූජාසනය වෙත ගොස් පූජා පවත්වා ආපසු විහාරයට පැමිණේ .

## නේත්‍රා තැබීම

1. රජතුමා වෙනුවට ප්‍රධාන ශිල්පියා රජ ඇඳුමෙන් සැරසී (තුන් පොට්ටිය, හැට්ටය, තොප්පිය, කඩුව හා ආභරණ) වහන්තරාව නම් අගනා රෙද්දකින් හිස වසාගෙන පැමිණේ.
2. දෙවැන්නෙන් වහන්තරාවකින් හිස වසා කැඩපතක්, තෙල්කුරු සහ කළු සායම් රැගෙන එයි.
3. ස්තෝත්‍ර කීමට බ්‍රාහ්මණයන්ද එක්වේ.
4. එලන ලද පියවිලි මතින් විහාරයට ඇතුළුව ඉන්ද්‍රකීලය අභියස ඇති පිළිමය වෙත ගොස් දෙවැන්නා කැඩපත පිළිමයේ දෙසට යොමු කළ විට ශිල්පියා සිත්තම් කරයි.
5. දෙවැන්නා සහ බ්‍රාහ්මණයා මන්ත්‍ර ජප කරයි.
6. ඉන්පසු ශිල්පියා වහන්තරාවෙන් ඇස් වැසෙන සේ බැඳ දිය බඳුනක් වෙත ගොස් අෂ්ටක කියමින් හිස දොවා ගනී .
7. ඉන්පසු කඩුවෙන් දිය කහ බඳුන සුනු විසුනු කිරීමෙන් අනතුරුව විහාරයේ ප්‍රධාන දොර වෙත පැමිණ තෑගි බෝග ලබාගනී. ඉන්පසු පිළිමය ඉදිරිපිට තිරය ඉවත් කරයි.

# 6. පාඩම
# බෞද්ධ පාලකයින්ගේ සිරිත් විරිත්

## ආදී බෞද්ධ පාලකයින්ගේ සිරිත්

- දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ... මිනිසුන් සමාජ විරෝධී වැඩ කරන කාලයේ එබඳු වැරදි වැඩවලින් මර්දනය කිරීමට ‘‘මහාසම්මත රජු’’ පත් කර ගත් බව කියැවේ.
- රජුට වැටුපක් ලෙස දාන කොටසක් ලබා දෙන ලදී.
- රජ යනු අධර්මය තුරන් කොට ධර්මය පවත්වා ගනිමින් මහජන සිත් අලවන්නා වූ (රංජනය කරන්නා වූ) තැනැත්තා වේ .
- සක්විති රජු/ චක්‍රවර්තී රජු - රටවැසියා නොපෙළවන්නාවූ ද, අවි බලයෙන් ජනතාව යටපත් නො කරන්නා වූ ද, අයුක්තිය අසාධාරණය පිටුදැක යුක්තිය හා සාධාරණය මත ක්‍රියාකරන, තිරිසනුන්ට පවා රැකවරණය සලසන, "ධම්මිකෝ ධම්ම රාජා" ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද, ධාර්මික රජතුමා මෙනමින් හඳුන්වනු ලැබේ .
- චක්කවත්ති සීහනාද සූත්‍රයේ පරිදි "**දස සක්විති වත්**" සක්විති රජකු විසින් ඉටු කරන සිරිත් 10කි.

1. දස කුසල්හි හැසිරෙමින් අඹු දරුවන් ආදී ඇතුළත් ජනයාට ධාර්මිකව රැකවරණය සැපයීම.
2. ධර්මය ඇසුරු කොට බල සෙනඟ ද ධර්මයෙහි පිහිටුවා ඔවුන්ට රැකවරණය සැපයීම.
3. අනුයුක්ත ක්ෂත්‍රියයන් ද ධර්මයෙහි පිහිටුවා රැකවරණය සැපයීම.
4. බ්‍රාහ්මණ ගෘහපතින්ටද ධර්මයෙහි පිහිටුවා රැකවරණය සැපයීම
5. නියම් ගම් හා ජනපදවාසීන්ටද ධර්මයෙහි පිහිටුවා රැකවරණය සැපයීම.
6. මහණ බමුණන්ට ද ධාර්මිකව රැකවරණය සැපයීම .
7. මෘග පක්ෂීන්ට ද ධාර්මිකව රැකවරණය සංවිධානය කිරීම.
8. රටේ අධර්මය ක්‍රියා නොපවත්වා ලෙස කටයුතු කිරීම.
9. කර්මාන්ත ආදිය සඳහා ධානය නොමැතියන්ට ධාන්‍ය බෙදාදීම.
10. ධාර්මික සිල්වතුන් කරා ගොස් අකුසල් හා අවට බැහැර කරලීමට උපදෙස් ලබා දීම.

- සාරාංශගත කළ විට .....
  - සක්විති රජතුමා දැහැමින් සෙමෙන් රට පාලනය කරයි.
  - තිරිසනුන් ඇතුළු මිනිසුන්ගේ ජීවිත ආරක්ෂාව සහතික කරයි.
  - ආර්ථික සුරක්ෂිතතාවය තහවුරු කරයි.
  - ප්‍රවීණයන්ගෙන් නිතර නිතර උපදෙස් ලබා ගනියි.

**<u>දසරාජ ධර්ම 10 කි</u>.**

දානය, ශීලය, පරිත්‍යාගය, ඍජු බව, මෘදු බව, තපස් බව, ක්‍රෝධ නොකිරීම, හිංසා නොකිරීම, ඉවසීම, විරුද්ධ නොවීම.

**<u>සතර අගති</u>**

ඡන්ද, ද්වේෂ, භය, මෝහ

- සතර අගතියට නොගොස් වැඩ කරන රජුගේ කීර්තිය පුර පක්ෂයේ සඳ මෙන් වැඩෙන බව දීඝ නිකායේ දැක්වේ.

"ඡන්දා දෝසා භයා මොහා - යො ධම්මං නාතිවයතති
වඩ්ඪති තස්ස යසො - සුක්ඛ පක්ඛෙව චන්දිමා "

**සතර සංග්‍රහ වස්තු 4**

සාමය හා ආරක්ෂාව පතන රජකු බෞද්ධ පාලකයෙකු මහජනයාට සංග්‍රහ කළ යුතු ආකාරය.

- දානය
- ප්‍රිය වචනය
- සමානාත්මතාවය
- අර්ථචරියාව

- **සප්ත අපරිහානි ධර්‍ම**

ජනසම්මතවාදී පාලන ක්‍රමයක සාර්ථකත්වයට අතිශයින් හේතු වන රජ දරුවන් අනුගමනය කළ බුදුරදුන් ගේ පැසසුමට ලක් වූ නොපිරිහෙන ධර්ම 7.

1. ඔවුන් නිතර රැස් වී ප්‍රශ්න සාකච්ඡා කිරීම.
2. සමගිය රැස්වී, සමගියෙන් කටයුතු කොට, සමගින් විසිර යාම.
3. පනවා ඇති නීති නොකඩවා අනුගමනය කිරීම. කලින් පණවා නැති රීති නොපැමිණවීම.
4. වැඩිහිටියන්ට ගරු බුහුමන් කිරීම. ඔවුන්ගේ අවවාද පිළිගැනීම.
5. කාන්තාවන්ට කරදර නොකිරීම. බලහත්කාරකම් නොකිරීම.
6. රාජ්‍ය ඇතුළත, පිටත පිහිටි පූජනීය ස්ථානවලට ගරු කිරීම, ආරක්ෂා කිරීම.
7. ආගමික පූජකවරුන්ට ගරු සැලකිලි දැක්වීම පහසුකම් සැලසීම. රාජ්‍යයට නොපැමිණි පූජකවරුන් ගෙන්වාගැනීම.

## අශෝක රජ සිරිත්

- සක්විති රජ සිරිත්, දස රාජධර්ම , සිව් සඟරාවත්, චක්‍රවර්ති රාජ සංකල්ප ක්‍රියා කළ ප්‍රථම රජතුමා වනුයේ ධර්මාශෝක අධිරාජ්‍යයා වේ .
- අශෝක සිරිත් අපට එතුමාගේ සෙල්ලිපි, ටැම් ලිපි මගින් හඳුනාගත හැකිය.
- සියලු දේ ගැන කලකිරීම හේතු කොටගෙන එතුමා කාලිංග මාස යුද්ධයේ දී අනුගමනය කළ දික් විජය ප්‍රතිපත්තිය අතහැර දමා ධර්මවිජය ප්‍රතිපත්තිය අනුගමනය කලේය. (ගිරිලිපි 13)
- මින්පසු බෞද්ධ පාලකයෙකු වී මිනිස් ඝාතන, සත්ව ඝාතන සම්පූර්ණයෙන්ම අත් හළේය. (ගිරිලිපි 1)

- මිනිසුන්ට මෙන්ම සතුන්ට ද ආරෝග්‍යශාලා ඉදිකර තිබීම .සෙවන සඳහා මහා මාර්ග වල ගස් රෝපණය කරවීම.
- දාසයෙන්ට, සේවකයින්ට සැලකීම. මවුපියන්ට සැලකීම. සියලු දෙනා සමඟම සහයෝගයෙන්, සමගියෙන් කටයුතු කළ බව. ( ගිරිලිපි 11)
- යමෙක් කොතරම් අවමාන කලත් දරාගෙන සිටි බව. ( ගිරිලිපි 13)
- සියලුම අන්‍යාගමිකයන්ට ගරු කළ බව. (ගිරිලිපි 7 ,ගිරි ලිපි 12)
- සියලුම නිකායන්ට ගරු කළ බව. (ටැම් ලිපි 6)

## සිංහල බෞද්ධ රජ සිරිත් සමහරක්

### රාජාභිෂේකය

- බුදු දහම පමණක් නොව අභිෂේකය පිළිබඳවද චාරිත්‍ර ඉන්දියාවෙන් ලංකාවට ලැබී ඇත .
- අභිෂේක මංගල්‍යය මුලින්ම තිස්ස රජු වෙනුවෙන් පැවැත්වී ය.
- ක්ෂත්‍රිය කන්‍යාවක විසින් දක්ෂිණාවර්ත හක් ගෙඩියකින් අනවතප්ත විලෙන් ගෙනෙන ජලයෙන් රජුගේ හිස මත නැවීමෙන් රජතුමා අභිෂේක කළ බව සඳහන් වේ.
- අභිෂේකයට අවශ්‍ය සියලු ද්‍රව්‍ය අශෝක රජතුමා තිස්ස රජුට එවා ඇත.
- ඒවා නම් වාලව්ජිනිය, මඟුල් කඩුව, ශ්වේත ඡත්‍රය, මිරිවැඩි සඟළ, මෞලි පට්ටය (හිස් වෙළුම) පාමගම, කෙණ්ඩිය, රන්වන් සඳුන්, නොදැවිනා කෙළක් පිළිම, මහානර්ඝ වූ අත්පිස්නා පිළිකඩය, නාගයන් විසින් ගෙන එන ලද අඳුන් , අරුනුවන් මැටිය, අනෝතත්ත විලෙන් ගෙනා ජලය, ගංගා නම් ගඟේ දිය, දක්ෂිණාවර්ත සංඛය, කන්‍යාවර්තය, වර්ධමානකය, ශරීරංකාරය පිණිස ගල්වන ලද සුණු, කුමාරිකාවන්, රන් බඳුන් බඩුය, මාහැඟි සිවිකාය, මාහැඟි අරලුය, නෙල්ලිය, අමාඔසුය, පක්ෂීන් විසින් ගෙනෙන ලද සැටදහසක් අමුණු හැල් සහල් හා අභිෂේකෝපකරණයන් ඇතුළත් වේ.

### පැරණි ලංකාවේ අභිෂේකය සිදු වූ ආකාරය

- සරසන ලද ශාලාවක උදුම්බරා ලීයෙන් කළ මණ්ඩපයක, උදුම්බරා ලීයෙන් කරන ලද පුටුවක රජතුමා වාඩිවී ක්ෂත්‍රිය කන්‍යාවක දක්ෂිණාවර්ත වූ හක් ගෙඩියකින් ගංගා නම් ගඟේ ජලය රජුගේ හිස මත අභිෂේකය කරමින් මෙසේ කියයි.

  " ක්ෂත්‍රිය වංශිකයන් ඔබ, මහරජ හැටියට පිළිගනී. ඔබ දසරාජ ධර්මයන්ගෙන් රාජ්‍ය කරත්වා. ක්ෂත්‍රියයන් ආදරයෙන් රකබලා ගනිත්වා. මීළඟට පුරෝහිත, සිටුවරු, ගෘහපතීන් ද මෙලෙස ඉල්ලා සිටි."

- බුදු දහම වැළඳ ගැනීමෙන් පසුව ලංකාවට වැඩම කළ ශ්‍රී මහා බෝධීන් වහන්සේ පිළිගැනීමට තිස්ස මහ රජතුමා දඹකොළ පටුනට එනම් යාපනයට නිවන්තගම තිවක්ඛ බ්‍රාහ්මණයාද, කතරගම ක්ෂත්‍රීයන්ද, චන්දනගම ක්ෂත්‍රීයන් ද, තවත් ප්‍රාදේශීය අධිපතිවරුන් සමග පැමිණියහ.
- තිස්ස රජතුමා බෝධි අංකුරය කතරගම, චන්දනගම, දඹකොල පටුන ඇතුලු දිවයිනේ නොයෙක් ප්‍රදේශවල රෝපණය සඳහා යවන ලදී.

- තිස්ස රජතුමා ස්වකීය ඥාතීන් පිරිසක් සසුන් ගත කළේය.
  එනම්,

  සොහොයුරා - මත්තාභය

  බෑණා - අරිට්ඨ සහ ඔහුගේ සොහොයුරන් 50

  අනුලා බිසව

- අරිට්ඨ තෙරණුවෝ ධර්මය ආරක්ෂා කිරීමට භාරගත්තේය.
- විනය පිටකය පවත්වාගෙන ගියේ එම ගෝල පරපුර වේ.
- වේලැයික්කාර සන්නස පරිදි රජ කෙනෙකු ශ්‍රේෂ්ඨ වූ කිරුළ දරන්නේ දරාගත්තේ බුද්ධ ශාසනයේ ආරක්ෂාවට බව කිය වේ.
- ඇතැම් රජවරු අවංකවම අධ්‍යාත්මික සුභසාධනය අපේක්ෂා කළහ.

  සද්ධාතිස්ස රජු

  භාතිකාභය රජු

  සිරිසඟබෝ රජු

# 7. පාඩම
# බුදු දහම හා කලා ශිල්ප

- ලොව සියලුම දේ අනිත්‍ය දුක්ඛ අනාත්ම යන ත්‍රිලක්ෂණයෙන් යුතුය.
- සියල්ල අනිත්‍ය වුවත් මිනිස් සහ දෙව් ලොව තුළ තාවකාලික සැප ඇති බව බුදුදහම පිළිගනී.
- අවසානයේ නිවන් අවබෝධ කරන තුරු තාවකාලික ලෞකික සැප විඳීමට බෞද්ධයාට බාධාවක් නැත.
- ඇලීම රතිය හෝ තෘෂ්ණාව අකුසලයට මුල් වෙයි. සතුට හෝ ප්‍රීතිය අකුසල කර්මයක් නොවේ. වින්දනයක් පමණි.
- එම නිසා සුන්දර වස්තුවකින් ආශ්වාදයක් ලැබීමට බෞද්ධ ගිහියාට බාධාවක් නැත.
- කලාව උපදින්නට ඇත්තේ ස්වභාවධර්මය තුළ ය.
- ස්වභාවධර්මයේ සුන්දර වස්තූන් මිනිස් සිතට ආහ්ලාදයක් ගෙන දෙන්නට ඇත.
- ඒවා ඇසුරෙන් කාව්‍ය ගී පද නිර්මාණය වෙන්නට ඇත. කලාව උපදින්නට ඇත්තේ මේ අයුරිනි.
- බුදුරජාණන් වහන්සේත් රහතන් වහන්සේලාත් ස්වභාවධර්මයේ සුන්දරත්වය දැක එයින් ප්‍රබෝධයට පත් ව එය උන්වහන්සේලාගේ චිත්ත සංවර්ධනයට ද උදව් කර ගත්හ.

උදාහරණ

1. බෝසතාණන් වහන්සේ බවුන් වැඩීමට උරුවෙලාව තෝරා ගැනීමට එහි සුන්දරත්වයද හේතුවක් වූ බව පහත ප්‍රකාශයෙන් සනාථ වේ.

"...මගධ රට පිළිවෙළින් සැරිසරනුයේ උරුවෙලා හි සේනානි නියම් ගමට පැමිණියෙමි.... ඒ දුටු මට මෙසේ සිතුණි. මේ භූමි භාගය රමණීය ය. වන ලැහැබ සිත් සතුටු කරන්නේ ය. සුදු වැලිතලා ඇති, මනා තොට ඇති රමණී හොය ද ගලයි. හාත්පසින් ගොදුරු බිම් ද වෙයි. වීර්ය කරනු කැමති කුල පුත්‍රයකු හට භාවනා වැඩීමට මේ ඉතාම මැනවි. මම මෙතන නැවතී පටන් වීර්යය වඩමි...."

2. බුදුරජාණන් වහන්සේ තවත් අවස්ථාවක,
" ආනන්දය, මේ විශාලා මහනුවර රමණීයයි. උදේන චෛත්‍යය ද සිත් අලවන සුලු ය. චාපාල නම් චෛත්‍යය ද සිත් පිනවයි "

යනුවෙන් පැවසූ බව මහා පරිනිබ්බාන සූත්‍රයේ ඇතුළත් ය.

3. සප්පක රහතන් වහන්සේ ගැයූ ථෙර ගාථාවක මෙලෙස සඳහන්ය "වැහි වලාකුළු දැක බියට පත් වූ කොකුන් සුදු පියාපත් විදහා නවාතැන් වෙත පියාඹන කල්හි අජකරණී නදිය මගේ සිත පිනවයි. "

4. "පැතුරුණු ලුණුවරණ ගස් පෙළින් විසිතුරු වූ මනහර බිම් පෙදෙස් ඇති, ඇතුන්ගේ කුංචනාදයෙන් ගිගුම් ගත් ඒ ගිරි කඳුරු මා සිත් අලවයි. " යනුවෙන් ප්‍රකාශ කරන්නේ මහා කාශ්‍යප රහතන් වහන්සේය.

පසුකාලීනව බෞද්ධ භික්ෂූන් වහන්සේලා විහාර ආරාම සඳහා තෝරා ගත්තේ පර්වත වනපෙත් වැනි ස්වභාවික සෞන්දර්යයෙන් පිරි ස්ථානයන්ය.
උදාහරණ - දඹදිව අජන්තා, එල්ලෝරා, භාග් සහ ලක්දිව මිහින්තලය ඉසුරුමුණිය වෙස්සගිරිය හා සිතුල්පව්ව වැනි ස්ථාන.

බෞද්ධයන් කලාව යොදා ගත් අස්ථාවලට උදාහරණ -

- ධාර්මික විනෝදය සමග කුසල් රැස්කර ගැනීම සඳහා ගැයුම් වැයුම් නැටුම් සහිත පෙරහැර, බුද්ධ පූජා පිරිත් පින්කම් ආදිය ද පැවැත්වීම.

- චිත්‍ර ශිල්පීහු ජාතක කතා සහ බුදු සිරිත සිතුවමට නැගූහ.
  කැටයම් කරුවෝ ඒව කැටයමට නැගූහ. උදා-සඳකඩ පහණ

- මූර්ති ශිල්පීහු බුද්ධ ප්‍රතිමා නිර්මාණය කළහ.

- ගෘහ නිර්මාණ ශිල්පීන් දාගැබ් ඉදි කළහ.

# 8. පාඩම
# බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පය

- බෞද්ධයන්ගේ ගෞරවයට පත් ප්‍රධාන සංකේත තුනකි.
- ඒ, දාගැබ් වහන්සේ, බෝධින් වහන්සේ සහ බුදු පිළිම වහන්සේත් ය.
- සියලු ම බෞද්ධ කලාවන් සංවර්ධනය වී ඇත්තේ දාගැබ් වහන්සේ, බෝධීන් වහන්සේ සහ පිළිම වහන්සේ මුල් කරගෙන ය.
- සඳකඩ පහණ, මුරගල්, පියගැට, කොරවක් ගල්, වාහල්කඩ, පූජාසන, මණ්ඩප, කැටයම්, බිතු සිතුවම් ආදී උපාංග රාශියක් ද බෞද්ධ විහාරයක කලා කෘති අතර ඇත්තේය.
- බෞද්ධ විහාරය බෞද්ධ කලා ශිල්පයන්හි කේන්ද්‍රස්ථානය යි.

## දාගැබ් වහන්සේ හෙවත් චෛත්‍යය

- බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පයේ වැදගත්ම තැන හිමි වන්නේ දාගැබට යි.
- දාගැබ යනු ධාතු ගර්භය යන්න යි.
- ධාතු ගර්භය චෛත්‍යයක වැදගත් අංගයකි. චෛත්‍යය, ථූපය, ස්තූපය හා වෙහෙර යන නම් වලින් ද දාගැබ හැඳින්වෙයි.
- බුදුරජාණන් වහන්සේ ජීවත් ව වැඩ සිටිය දී ම පිරිනිවන් පා වදාළා වූ සාරිපුත්‍ර හා මොග්ගල්ලාන යන අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලාගේ ධාතු නිදන් කොට චෛත්‍යයන් ගොඩ නැංවීම බුදුරජාණන් වහන්සේ ගේ උපදේශකත්වය යටතේ සිදු වූ බව කියයි.
- එසේ ම කුසිනාරා නුවර පරිනිර්වාණ මඤ්චකයේ දී ආනන්ද තෙරුන් ඇමතූ බුදුරජාණන් වහන්සේ විසින් බුදු, පසේ බුදු, මහරහත් හා සක්විති රජ යන උතුමන් සඳහා ස්තූප බැඳ ගෞරව කළ යුතු බව දේශනා කළ වග මහාපරිනිර්වාණ සූත්‍රයේ ඇතුළත් ය.
- පුරාවෘත්ත අනුව ස්තූප ගොඩ නැඟීම ලක්දිව ආරම්භ වූයේ ද බුදුරදුන් ජීවමානව වැඩ සිටිද්දීය.
- එකල ගොඩ නගන ලදැයි සිතන එක් ආදීම ථූපයක් නම් මහවැලි ගං මිටියාවතේ අලුත් නුවර පිහිටුවා ඇති මහියංගන දාගැබයි.
- බුද්ධත්වයෙන් අටවෙනි මස ලක්දිව වැඩි බුදුරදුන් සුමන සමන් දෙවියන්ට පරිත්‍යාග කළ කේශ ධාතූන් මෙම දාගැබෙහි නිදන් කර ඇත.
- ලක්දිව නැගෙනහිර වෙරළේ තිරියායි නම් ස්ථානයේ ඇති ස්තූපය තවත් පුරාවෘත්ත වල සඳහන් ආදි දාගැබකි.
- බුදුරදුන්ට ප්‍රථම දන්වේල පිළිගැන්වූ තපස්සු භල්ලුක නම් වෙළඳ දෙබෑයින්ට ලැබුණු කේශ ධාතූන් තිරියායි දාගැබෙහි නිදන් කොට ඇති බව කියනු ලැබේ.
- මෙම ස්ථානයෙන්ම සොයා ගත් හත්වන සියවසට අයත් සංස්කෘත ශිලා ලිපියකින්ද මේ පුරාවෘත්තය සනාථ වේ.

- ලක්දිව ගොඩ නගන ලද ප්‍රථම ඓතිහාසික ථූපය අනුරාධපුරයේ ථූපාරාම දාගැබයි.

- මහාවංශයට අනුව, දෙවන පැතිස් රජු විසින් ගොඩ නගන ලද මේ දාගැබෙහි නිදන් කොට ඇත්තේ බුදුරදුන්ගේ දකුණු අකු ධාතුවයි.
- ථූපාරාම දාගැබේ මුල් ස්වභාවය අද දක්නට නැතත් වර්ෂ දෙදහසකටත් අධික කාලයක දී වරින් වර ප්‍රතිසංස්කරණයනට ලක් වී ඇත.
- ඉතා විශාල නිර්මාණයක් නොවන මෙහි පාදයේ විෂ්කම්භය අඩි 59 කි.
- දෙවන පැතිස්ස රජුගෙන් ආරම්භ වූ චෛත්‍ය නිර්මාණය ඊළඟ ශත වර්ෂ පහක් හයක් තුළ නොකඩවා කෙරීගෙන ගිය බව පෙනේ.
- මහා මහින්ද හිමියන්ගේ පිරිනිවීමෙන් පසු උන් වහන්සේගේ භෂ්මාවශේෂ නිදන් කොට, මිහින්තලේ අම්බස්ථල චෛතිය ගොඩනඟන ලද්දේ දෙවන පැතිස් රජුගේ සොහොයුරු උත්තිය (ක්‍රි.පූ. 207 – 197) රජු විසිනි.
- මහින්ද රහතන් වහන්සේට තිස්ස රජතුමා මුල් වරට හමුවූ ස්ථානයේ ගොඩ නඟන ලදැයි සැලකෙන මෙම චෛත්‍යය ප්‍රමාණයෙන් කුඩා වුවත් ස්වරූපයෙන් අනුරාධපුර ථූපාරාම දාගැබ බඳුය.
- අනුරාධපුරයේ විශාල දාගැබ් නිර්මාණය ඇරඹුණේ දුටුගැමුණු රජුගෙනි.
- එතුමා මුලින් ගොඩ නැගූ මිරිසවැටි දාගැබ රියන් 80 ක් (අඩි 200) උස් වූයේ යයි කියනු ලැබේ.
- එහි පාදයේ වර්තමාන විෂ්කම්භය අඩි 168 කි.
- දුටුගැමුණු රජු විසින් ආරම්භ කර, ඔහුගේ සොහොයුරු සද්ධාතිස්ස රජු විසින් අවසන් කළේ යයි කියනු ලබන රුවන්මැලි සෑය එකල බෞද්ධ ලෝකයේ තිබූ විශාලතම චෛත්‍යය යයි කියනු ලැබේ.
- උසින් අඩි 300ක් පමණ වූ මෙම චෛත්‍යයේ පාදයේ වර්තමාන විෂ්කම්භය අඩි 298ක
- ඉන්දියාවේ විශාලතම චෛත්‍යය වන සාංචි ස්තූපයේ පාදයේ විෂ්කම්භය අඩි 120කි.
- එය උසින් අඩි 54 කි. දඹදිව රාමගාම ස්තූපයේ නිදන් කොට තිබූ සර්වඥ ධාතූන් වහන්සේලා රුවන්මැලි මහා සෑයේ නිදන් කරනු ලැබුවේ යයි කියනු ලැබේ.
- ඊළඟට මහා ස්තූප ගොඩ නැගීමේ කීර්තිය හිමිවනුයේ වළගම්බා (ක්‍රි.පූ. 103 – 77) රජුට ය.
- කලක් එළාර සොහොන යයි සලකනු ලැබූ දක්ඛිණ ථූපයත්, අභයගිරි නමින් හැඳින්වෙන උත්තර චෛත්‍යයත් ඔහුගේ කෘතීන් ලෙස සලකනු ලැබේ.
- කණිට්ඨ තිස්ස රජු (167 - 187) විසින් විශාල කරනු ලැබූ දක්ඛිණ ථූපයේ පාදයේ විෂ්කම්භය අඩි 224 කි.
- 1 ගජබා (114 – 136) රජු විසින් ප්‍රතිසංස්කරණය කරනු ලැබූ අභයගිරියේ පාදයේ විෂ්කම්භය අඩි 325 කි.
- එය උසින් අඩි 350 ක් පමණ විය.
- මේ අන්දමින් එය දුටුගැමුණු රජුගේ මහා ථූපයට වඩා විශාල විය.
- අනුරාධපුර මුල් අවධියේ මිහින්තලේ තවත් ස්තූප ගොඩ නැගුණි.
- මහාදාඨික මහානාග (ක්‍රි.ව. 7 – 19) රජු විසින් මිහින්තලා කන්ද මුදුනේ ගොඩ නගන ලද මහා ස්තූපයේ පාද විෂ්කම්භය අඩි 136කි.
- ප්‍රමාණයෙන් මීට කුඩා වුවත් මේ අවධියේ ම මිහින්තලේ ගොඩ නැගුණු කණ්ඨක චෛතිය වඩා අලංකාර වූවකි.
- අනුරාධපුර විශාලතම දාගැබ වන ජේතවනාරාමය ගොඩ නැගීමේ කීර්තිය හිමි වනුයේ මහා වංශයේ අන්තිම වන මහසෙන් (274 – 301) ටය.
- මෙකල පවා අඩි 232 ක් උස් වූ මෙම ථූපයේ පාදයේ වර්තමාන විෂ්කම්භය අඩි 367 කි.
- මෙම දැවැන්ත ස්තූපය දෙවෙනි වන්නේ මිසරයේ විශාලතම පිරමීඩයට පමණි.

- ඊළඟට මහා දාගැබ් අපට දක්නට ලැබෙන්නේ පොළොන්නරු යුගයේ ය. මහා පැරකුම්බා (1153 - 1187) රජුගේ බිසවක වූ භද්දවතී දේවිය විසින් ගොඩ නගන ලදැයි සලකනු ලබන පොළොන්නරුවේ කිරිවෙහෙර මුල් ස්වරූපයෙන් මෙතෙක් ආරක්ෂා වී ඇති චෛත්‍යය ලෙස සලකනු ලැබේ.
- මධ්‍යම ප්‍රමාණයේ දාගැබක් වූ එහි පාදයේ විෂ්කම්භය අඩි 89 කි.
- දැනට නටබුන්ව ඇති පබළු වෙහෙර මහ පැරකුම්බාවන්ගේ රූපවතී බිසව විසින් කරවන ලද්දක් සේ සලකනු ලැබේ.
- පොළොන්නරුවේ දෙමළ මහා සෑය නමින් හැඳින්වෙන, දැනට වල් බිහි වූ තත්ත්වයේ ඇති, එකල සම්පූර්ණ නොකරන ලද සේ පෙනෙනා චෛත්‍යය සම්පූර්ණයෙන් නිමාවට පත් වූයේ නම් ලෝකයේ විශාලතම දාගැබ වීමට ඉඩ තිබුණි.
- මහා පරාක්‍රමබාහු රජුගේම කෘතියක් ලෙස සැලකෙන මෙහි ගර්භය මත වූ මලුවක කුඩා චෛත්‍යයක් දක්නට ලැබේ.
- පරාක්‍රමබාහුට පසුව රජ පැමිණි නිශ්ශංක මල්ල (1187 – 1196) රජ අභිනවයෙන් විශාල දාගැබක් ඉදි කෙළේය.
- අනුරාධපුර රුවන්මැලි සෑ චෛත්‍යයේ ම නම තබනු ලැබූ මෙම ථූපය අද හඳුන් වන්නේ රන්කොත් වෙහෙර නමිනි.
- එහි පාදයේ විෂ්කම්භය අඩි 186 කි. පොළොන්නරු යුගයෙන් පසු සිංහල බෞද්ධ ශිෂ්ටාචාරය පිරිහීමට පටන් ගත් හෙයින් දාගැබ් ගොඩනැගීම ද අභාවයට ගිය බව පෙනේ.

දාගැබක හැඩය.

- සුදෝ සුදු කොත් කැරැල්ල සහිත සමමිතික වූ දාගැබ,
- දාගැබක බඳ කොටසෙහි හෙවත් ගර්භ ගෘහයෙහි හැඩය අනුව වර්ග කොට ඇත.

(1) ධාන්‍යාකාර (වී ගොඩක හැඩයේ) ස්තූප
(2) ඝණ්ඨාකාර (ඝණ්ඨාවක හැඩයේ) ස්තූප
(3) බුබ්බුලාකාර (දිය බුබුලක හැඩයේ) ස්තූප
(4) ඝටාකාර (කළයක හැඩයේ) ස්තූප
(5) පද්මාකාර (නෙළුම් මලක හැඩයේ) ස්තූප
(6) ආම්ලාකාර (නෙල්ලි ගෙඩියක හැඩයේ) ස්තූප

යන නම් වලින් හැඳින් වේ.

- ලක්දිව ජනප්‍රියම බුබ්බුලාකාර, ඝණ්ඨාකාර දාගැබ් ය.
- රුවන්මැලි සෑය, අභයගිරිය, ජේතවනාරාමය, මිහින්තලා මහා සෑය, තිස්සමහාරාමය, පොළොන්නරුවේ කිරිවෙහෙර හා රන්කොත් වෙහෙර ආදිය බුබ්බුලාකාර ස්වරූපයක් ගනී.
- මුල දී ධාන්‍යාකාර හැඩයෙන් යුක්ත වූයේ යයි කියනු ලබන ථූපාරාම දාගැබ වර්තමානයේ දක්නට ලැබෙන්නේ ඝණ්ඨාකාර ස්වරූපයෙනි.
- ථූපාරාමයට බෙහෙවින් සමාන අම්බස්ථල චේතියත්, අනුරාධපුර ලංකාරාම දාගැබත්, මිහින්තලේ ඝණ්ඨාකාර ස්වරූපයට උදාහරණ වශයෙන් දක්විය හැකි අතර වර්තමානයේ ඉදි කර ඇති බොහෝ කුඩා චෛත්‍යයන් අනුගමනය කර ඇත්තේත් ඝණ්ඨාකාර ස්වරූපය යි.
- උල්පොත චෛත්‍යයත්, කැළණි දාගැබත් ධාන්‍යාකාර හැඩයට නිදසුන් වශයෙන් දැක්විය හැකිය.

- සටාකාර දාගැබ් පුරාණයේ දී ලක්දිව තිබුණේ දැයි ස්ථිරව කිව නො හැකි ය. කාවන්තිස්ස රජ සමයේ ආරම්භ වූ යටාල වෙහෙර ප්‍රතිසංස්කරණයේ දී සොයා ගත් ධාතු කරඬු අතරින් නම් සටාකාර වූ කුඩා ධාතු කරඬු සොයා ගෙන තිබේ.
- සාමාන්‍යයෙන් ධාතු කරඬුවේ ස්වරූපය ස්තූපයේ හැඩය ගන්නා බැවින් මේ කුඩා ධාතු කරඬු එකල තිබූ සමහර ස්තූපයන්ගේ හැඩයෙන් විය හැකි ය.
- මුණින් නමන ලද විශාල කළයක් මත තවත් කළයක් මුණින් නමා තැබීමේ ක්‍රමයට ක්‍රමයෙන් කුඩා වී ගෙන යන ආකාරයේ කළ රැසක් මෙන් දක්නට ලැබෙන ස්තූප ක්‍රමයක් තායිලන්තයේ දක්නට ලැබේ.
- තායිලන්තයේ වියෙන්මායි නගරයේ පිහිටි වත් කූ තාවෝ චෛත්‍යය මෙයට උදාහරණයකි. මේවා සටාකාර වර්ගයේ චෛත්‍යයන්ට උදාහරණ සේ සැලකිය හැකි
- පද්මාකාර හා ආමලකාකාර චෛත්‍යයන් ධාතු කරඬු වල ස්වරූපයෙන් වත් මෙතෙක් ලක්දිව සොයා ගෙන නැත.
- එහෙත් මිහින්තලේ ඉදිකටු සෑය වැනි දිගටි ගර්භ වලින් යුක්ත චෛත්‍යයන්ගේ පාදම්වල නෙළුම් පෙති බොරදම් යොදා තිබේ. සමහර විටෙක මෙබඳු සැරසිලි වලින් යුත් දාගැබ් පද්මාකාර චෛත්‍ය ලෙස සැලකුවා දැයි කිය නොහැක.
- ඉහත සඳහන් කරන ලද ආකාර හැඩයන්ට වෙනස් වූ විවිධාකාර හැඩයන් - ගෙන් යුක්ත වූ චෛත්‍යයන් බුරුමය, සියම් හා ටිබැට් රට යන දේශයන්හි දී දැක්ක හැකි ය.
- පොළොන්නරුවේ සත්මහල් ප්‍රාසාදය නමින් හැඳින්වෙන ගොඩනැගිල්ල ද ඇත්ත වශයෙන් ප්‍රාසාදයක් නොව තවත් ආකාරයක චෛත්‍යයකි.

**චෛත්‍යයක අංග**

- ලංකාවේ මුල් කාලයේ ඉදිකරන ලද විශාල දාගැබ් ඉන්දියාවේ විශාලතම ස්තූපයන්ට වඩා ප්‍රමාණයෙන් විශාල වූ නමුත්, ස්වරූපයෙන් ඒවා ඉන්දියානු ස්තූපයන්ට වඩාත් සමාන් විය.
- ලංකාවේ දාගැබ්වලට මුල් ආදර්ශ ලැබී ඇත්තේ ඉන්දියාවේ සුප්‍රසිද්ධ සාංචි ස්තූපයෙනි.
- සාංචි ස්තූපය මහින්ද මහරහතන් වහන්සේගේ ජාත භූමිය වූ විදිසා නගරය ආසන්නයේ පිහිටා ඇත.
- දාගැබක වැදගත් අංගය වූයේ අර්ධ ගෝලාකාර ගර්භයයි.
- සාංචියේ අර්ධ ගෝලාකාර ගර්භයේ පාදම වටා ඇත්තේ එක් මේධියක් හෙවත් පේසා වළල්ලකි.
- එහෙත් ලංකාවේ දාගැබ් වල අර්ධ ගෝලාකාර ගර්භය නැගී සිටියේ එක මත එක පිහිටි ක්‍රමයෙන් කුඩා වන පේසා වළලු තුනක් මතය.
- සාංචියේ මේධිය වටා ගල් ගරාදි වැටකි.
- ගර්භය මුදුනෙහි හර්මිකා නමින් හැඳින්වෙන සතරැස් කොටුවයි.
- සාංචියේ හතරැස් කොටුව වටා ද ගල් ගරාදි වැටකි.
- ලංකාවේ චෛත්‍යවල ගඩොලින් කළ සතරැස් කොටුවේ බිත්තිවල බදාමයෙන් කළ තීරු වලින් වැටක ස්වරූපය පෙන්වා තිබේ.
- හතරැස් කොටුවෙහි මධ්‍යයේ සිටවන ලද ගලින් කළ යෂ්ටියකි.
- සාංචියේ ඇති මේ ලක්ෂණය ලංකාවේ ආදි ස්තූප වල ද තිබුණ බව සොයාගෙන තිබේ.
- යෂ්ටිය මත ගලින් කළ ඡත්‍රයකි.
- ලංකාවේ ස්තූප වල මේ ලක්ෂණය පසු කාලයේ දී ඡත්‍රාවලියකට පරිවර්තනය වී තිබේ.

- දාගැබක නොපෙනෙන කොටස අත්තිවාරම යි.
- රුවන්මැලි සෑ දාගැබෙහි අත්තිවාරම සකස් කළ යුරු මහා වංශයේ විස්තර වී ඇත.
- පොළොවෙන් සත් රියනක් යටට කැණ ඇතුන් ලවා විශාල ගල්කුට්ටි ගෙන්වා එහි අතුරා ඇතුන් ලවා පාගවා ඒ මතුපිට තට්ටුවෙන් තට්ටුව, ගල්, පස්, මැලියම් හා යකඩ දල් අතුරා සකස් කරන ලදී.
- මෙසේ සකස් කළ අඩිතාලම මත තුන් මහල් පේසාවන් ගොඩ නැගුණි.
- මුල් පේසාව පළල් වටත්, ඊළඟ පේසාවන් ක්‍රමයෙන් පටුවන අයුරිනුත් ගොඩ නැගූ බව ද පැහැදිලිය.
- මහාවංශයේ පුෂ්පදාන නමින් හැඳින්වෙන මෙම පේසාවන් මල් පිදීමේ ආසන සඳහා අදහස් කරන ලද බව කෙනෙකුගේ අදහසයි.
- තවත් කෙනෙකු විසින් ඒවා ප්‍රදක්ෂිණා වේදිකා වශයෙන් සලකනු ලැබේ.
- එහෙත් වර්තමානයේ මේ එක් ප්‍රයෝජනයක්වත් සඳහා පේසා වළලු භාවිත නොවේ.
- සාංචියේ ඇති පේසාව නම් ප්‍රදක්ෂිණා පථයක් වශයෙන් අදහස් කළ බව ඊට නැගීම සඳහා ඇති පියගැට පෙළින් තීරණය කළ හැකිය.

- ගර්භය ඇරඹෙන්නේ තුන්වෙනි පේසාවෙනි.
- මහා ථූපයේ ධාතු ගර්භය තුළ ඇති මැදිරි හා විවිධ කර්මාන්තයන් පිළිබඳ වර්ණනයක් මහාවංශයේ ඇතුළත් ය.
- ඒ අනුව චෛත්‍යයේ අර්ධ ගෝලය තුළ නිමකර ඇති ධාතු ගර්භය විශාල ගල් පුවරු හයක් මංජුසාවක ආකාරයෙන් උපරිම පේසාවේ තලය මත තැන්පත් කිරීමෙන් ගොඩ නගා ඇති බව පැහැදිලි වේ.
- එහෙත් මේ විශාල ස්තූපයන්ගේ අභ්‍යන්තරය තවම පර්යේෂණවලට ලක් වී නැත.
- බෙල් මහතා විසින් කණිනු ලැබූ සීගිරි දාගැබ් අනුව සමහර දාගැබ්වල ධාතු ගර්භ කීපයක්ම ඇති බැව් සොයාගෙන තිබේ.
- සීගිරි දාගැබෙහි එකිනෙකට උඩින් ධාතු ගර්භ තුනක් පිහිටි බව සොයා ගන්නා ලද්දේය.
- ගර්භය තුළ තැන්පත් කරන්නේ ධාතු කරඬුවක් පමණක් නොවන බව පෙනේ.
- බුද්ධ රූපය, සිව්වරම් දෙවිවරු, ස්වස්තික, සංඛ ආදි මංගල වස්තූන් ද, හස්ති, අශ්ව, සිංහ, වෘෂභ ආදී සත්ව රූප ද, ස්වර්ණමය පුෂ්ප, ආභරණ, කාසි ආදිය ද දාගැබ් වල ධාතු ගර්භ වලින් සොයාගෙන ඇත්තේය.
- ඇතැම් ධාතු ගර්භවල මධ්‍යයේ මහමෙරු පර්වතය නිරූපණය කෙරෙන සතරැස් ගල් ටැඹක් පිහිටුවා ඇති බව ද පෙනේ.

- පැරණි ඉන්දියානු ගල්කැටයම් අතර දක්නට ලැබෙන ස්තූප කැටයම් වල ගර්භ ගෘහයේ පිටතින් දිවෙන මාලාකර්ම, ලතා කර්ම මෝස්තර ද දක්නට ලැබේ.
- එහෙත් අපේ චෛත්‍ය ගර්භ ගෘහයන්ගේ ඇත්තේ කැටයම් විරහිත වූ හුණු පිරියමින් ධවල වූ වාම් මතුපිටකි.

## හතරැස් කොටුව

- ගර්භ ගෘහය මත ඉදිවෙන සම සතරැස් කොටුව පැරණි ඉන්දීය ථූපයන්ගේ " තර්මිකා" නමින් හැඳින් වේ.

- පසු කාලයේ දී ගරාදි වැටක් නොව ගරාදි වැටක ලක්ෂණ බදාමයෙන් මෙම හතරැස් කොටුව වටා පෙන ඇත්තේ ය.
- හර්මිකාවේ සතර බිත්තිය ලියවැල්, හංස රූප, හා ඉර හඳ කැටයම් යොදා අලංකාර කරනු ලැබේ.
- මෙම සතරැස් කොටුව මධ්‍යයේද ධාතූ නිදහන් කරනු ලැබේ.

## දේවතා කොටුව

- පැරණි ඉන්දීය ථූපවල දක්නට නොමැති මෙය මෙරට ථූපවල හතරැස් කොටුව මත ගොඩ නැගුණු නවාංගයකි.
- සිලින්ඩරාකාර හැඩයකින් යුත් දේවතා කොටුව වටා සිව්වරම් දෙවිවරුන්ගේ රූප ද නෙළා ඇත්තේය.

## කොත්කැරැල්ල

- කොත් කැරැල්ල ආරම්භ වනුයේ දේවතා කොටුවෙනි.
- ආදි කාලීන චෛත්‍යවල හතරැස් කොටුව මත වූයේ ශිලා යෂ්ටියක් සහිත ඡත්‍රයකි.
- පසු කාලයේ එක් ඡත්‍රයක් මත තවත් ඡත්‍රයක් බැගින් වරින් වර විවිධ පුද්ගලයන් විසින් ඡත්‍ර ගොඩ නැගූ බව පෙනේ.
- කල් යත්ම මුල් ඡත්‍රය අමතක වී ක්‍රමයෙන් කුඩා වන ඡත්‍රාවලියක් නිරූපණය කරමින් වළලු රැසකින් හෙබි කොත් කැරැල්ලක් බිහි වූ පෙනේ.
- කොත් කැරැල්ල අග ඇත්තේ ලෝහයෙන් කළ (බොහෝ විට ස්වර්ණාලේප කළ) කොතකි.
- මහාථූපයේ කොත කෙළවර වන්නේ චූඩා මාණික්‍යයකිනි.

## වාහල්කඩ හා මලසුන් ගෙවල්

- පැරණි ඉන්දීය දාගැබ් වටා ඉදිවූ අලංකාර සතර තොරණක් දක්නට ලැබේ.
- ලංකාවේ දාගැබ් වටා ද මුල දී ලීයෙන් කළ තොරණ තිබූ බව පිළිගනු ලැබේ.
- එහෙත් පසු කාලයේ දී තොරණ වෙනුවට " වාහල් කඩ " නමින් හැඳින්වෙන කලාත්මක අංගයක් චෛත්‍ය ගර්භ ගෘහයට ම සම්බන්ධ කොට ඉදි කරන ලද්දේය.
- සතර දිසාවට මුහුණ ලා ඉදි කරනු ලැබූ වාහල්කඩවල් දෙකක් අතර මලසුන් ගෙයක් බැගින් ඇත.

## චේතියඝර

- චෛත්‍යයට ම සම්බන්ධ වූ තවත් අංගයකි චේතියඝරය. ඝරය යනු ගෘහය යි.
- එබැවින් චෛත්‍යය සඳහා ඉදිකරන ලද ගෘහය චෙතිය ඝර යන්නෙන් අදහස් කෙරේ.
- පැරණි යුගයේ කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ චෛත්‍යයන් සඳහා ඒවා ආවරණය කරමින් සෑදූ ගෙවල් තිබූ බව අනුරාධපුරයේ ථූපාරාමය, ලංකාරාමය හා මිහින්තලේ අම්බස්ථල චෛත්‍යය වටා දැනට ඉතිරි වී ඇති ගල් කුලුනු පේළිවලින් සිතා ගත හැකිය.
- ථූපාරාමය වැනි දාගැබ් මා හැඟි නිර්මාණයෙන් වශයෙන් සැලකීමට එක් හේතුවක් නම් ඒවා වටා එක කේන්ද්‍රිකව පිහිටා ඇති මෙම ගල් කුලුනු පෙළවල් ය.

- දඹදිව බෞද්ධ ගොඩනැගිලි අතර මෙබඳු චෛතසර සහිත දාගැබ් දක්නට නොලැබෙතත් චෛත්‍ය ශාලා නමින් විශාල ගල්පර්වත සිදුරු කර, කුලුනු බෝරා සකස් කරන ලද ශාලා විශේෂයක් දක්නට ලැබේ.
- ආයතාකාර මෙම ශාලා ඇතුළත බිත්ති, කුලුනු හා පියස්සේ පරාල ආදිය පැහැදිලි ව නෙළා තිබේ.
- මෙම චෛත්‍ය ශාලාවල ඇත කෙළවර කුඩා චෛත්‍යයන් ගලින් ම නිමවා ඇති බැවින් මෙම ශාලා හැඳින් වීමට යොදන නම අන්වර්ත යැයි සිතේ.
- ලංකාවේ කුඩා ස්තූප වලට චේතිය සරයක් සැදීමට මෙම චෛත්‍ය ශාලා වලින් ඉගියක් ලැබෙන්නට ඇතැයි සිතිය හැකි ය.
- චේතිය සරයෙන් චෛත්‍යයට ආරක්ෂාවක් ලැබෙන අතර බැතිමතුනට අව්වෙන් වැස්සෙන් පීඩා නොවිඳ වැඳුම් පිදුම් කිරීමට ඉඩ ලැබෙන්නට ඇත. චේතියසරය ව්‍යවහාරයේ හැඳි වෙන්නේ වටදාගෙය නමිනි.

## ථූපාරාම චේතියසරය

- ථූපාරාම ස්තූපය පිහිටියේ භූමියෙන් අඩි 11 අඟල් 4ක් උස් වූ, අඩි 164 අඟල් 6 ක් විෂ්කම්භය ඇති වෘත්තාකාර වේදිකාවක් හෙවත් මලුවක් මත ය.
- මධ්‍යයෙහි පිහිටි චෛත්‍යය වටා ඒක කේන්ද්‍රිකව දිවෙන අලංකාර ගල් කුලුනු පේළි සතරකි.
- තනි ගලින් නිමවන ලද මෙම ගල් කුලුනක පහත කොටස හතරැස් ය.
- කුලුනේ තුනෙන් දෙකක් පමණ වූ ඉහළ කොටස අෂ්ටාශ්‍රාකාර වේ.
- කැටයමින් අලංකාර අෂ්ටාශ්‍රාකාර කුලුනු හිස් වෙනම නෙළා ඇත.
- කුලුනක මුදුනෙහි ඇති කුඩුම්බි මගින් කුඩුම්බි තව් සහිත කුලුනු හිස් සම්බන්ධ කෙරේ.
- ගර්භයට අඩි 3 අඟල් 1 ක් ඈතින් ගර්භය වටා ඇතුළතින් ම දිවෙන කුලුනු පෙළ අඩි 22 අඟල් 10ක් උසැති කුලුනු 52 කින් සමන්ත විත වෙයි.
- දෙවන කුලුනු වටය පළමුවන කුලුනු වටයට අධි 10 අඟල් 3ක් ඈතින් පිහිටා ඇති අතර අඩි 21 අඟල් 3 ක් උසැති කුලුනු 36 කින් සමන්විත වෙයි.
- තුන්වන කුලුනුවටය දෙවන කුලුනු වටයට වඩා අඩි 9 අඟල් 7 ක් ඈතින් පිහිටියේ ය.
- එහි අඩි 19 අඟල් 9ක් උස කුලුනු 40කි.
- තුන් වන කුලුනු වටයට අඩි 14ක් ඈතින් පිහිටි බාහිර කුලුනු වටයේ අඩි 14 ක් උස් වූ කුලුනු 48කි.
- අභ්‍යන්තර කුලුනු පේළියේ සිට බාහිර කුලුනු පේලිය දක්වා ක්‍රමයෙන් බෑවුම් වන පරිද්දෙන් වෘත්තාකාර ලී පියස්සක් මේ කුලුනු මත රඳවා තිබුණු බව පෙනේ.
- පියස්සේ මධ්‍යයෙ චෛත්‍යයයේ කොත් කැරැල්ලට ඉහළින් අර්ධ ගෝලාකාර ව විහිදෙන්නට ඇත.
- මෙම චෛත්‍ය මලුවෙහි ගල්පුවරු අතුරා තිබේ.
- තෙවන කුලුනු පෙළත්, සිව්වන කුලුනු පෙළත් අතර වෘත්තාකාර ගඩොල් බිත්තියක නටබුන් දක්නට ලැබේ.
- චෛත්‍ය මලුවට ගොඩ නැගීම සඳහා උතුරු දිසාවෙන් හා දකුණු දිසාවෙන් සඳකඩ පහණ හා මුරගල් ආදියෙන් අලංකාර වූ පියගැට පේළි දෙකක් ඇත්තේ ය.

- ථූපාරාමයට වඩා ප්‍රමාණයෙන් කුඩා වූ ලංකාරාම චෛත්‍යය පිහිට ඇත්තේ විෂ්කම්භය අඩි 132 ක් පමණ වූ වෘත්තාකාර වේදිකාවක් මත ය.
- මෙම චෛත්‍යය වටා ඇත්තේ කුලුනු පේළි තුනකි.
- මෙම කුලුනුවල හිස් කුලුනු කඳටම සම්බන්ධ කොට නෙළා ඇත.
- කුලුනු හිස් මත ථූපාරාමයේ ම බඳු දැව පියස්සක් තිබෙන්නට ඇත.
- මිහින්තලේ අම්බස්ථල චෛත්‍යය වටා ද මෙබඳු කුලුනු පේළි දෙකක් දක්නට ලැබේ.
- ඉහත සඳහන් චේතියඝරවලට වඩා වෙනස් වුවත් වර්තමානයේ ද ගෘහයන් ඇතුළත චෛත්‍යයන් දක්නට ලැබේ.
- සිරිසඟබෝ රජුගේ චරිතය හා සම්බන්ධ අත්තනගල්ල විහාරයේ ඇති දාගැබ මෙබන්දකි.
- මහනුවර ආසන්නයේ ගඩලාදෙණි විහාරයේ පිහිටි විජයොත්පාය නමින් හැඳින්වෙන කුඩා චෛත්‍යය ද පියස්සක් යට පිහිටියේ ය.

## වට දා ගෙවල්

- චේතියඝර සංකල්පයම සංවර්ධනය වීමෙන් කුඩා ධාතු ගර්භයක් වටකර නිර්මාණය වූ වෘත්තාකාර අලංකාර මන්දිර විශේෂයකි.
- හොඳ නිදර්ශනය දක්නට ලැබෙන්නේ තමන්කඩුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරියේ ය.
- පුරාණ මණ්ඩල ගිරි විහාරය නමින් හැඳින්වෙන මෙය ක්‍රිස්තු පූර්ව කාලයට අයත් වෙතත් මෙහි පැරණි චෛත්‍යය වටා නිර්මාණය කොට ඇති දැනට දක්නට ලැබෙන වටදාගෙය අයත් වන්නේ සිව් වැනි අග්බෝ (ක්‍රි.ව. 667 - 683 ) රජුගේ කාලයට ය.

- මැදිරිගිරියේ වටදාගෙය පිහිටියේ ද උස් වූ වෘත්තාකාර වේදිකාවක් මතය.
- එහි ඒක කේන්ද්‍රික වූ කුලුනු වට තුනකි. අභ්‍යන්තර කුලුනු වටයේ කුලුනු 16කි.
- දෙවෙනි වටයේ කුලුනු 20කි.
- තුන්වන බාහිර වටයේ කුලුනු 32 කි.
- කුලුනු හිස් අනුරාධපුර ථූපාරාම කුලුනු හිස්වලට සමාන වන අතර සියලුම කුලුනු අද දක්වා ම දක්නට ලැබේ.
- දෙවන සහ තුන්වන කුලුනු පේළි අතර සතර දිශාවට මුහුණ ලා ඇති දොරටු සතරක් සහිත වෘත්තාකාර ගඩොල් බිත්තියකි.
- මෙහි තවත් විශේෂ ලක්ෂණයක් නම් බාහිර වටය සමඟම දිවෙන අඩි තුනහමාරක් උස් වූ ගල් ආවරණ පවුර යි.
- මෙම ගල් ආවරණ පවුර ඉන්දියාවේ හා ලංකාවේ පැරණි ගෘහ නිර්මාණ අතර දක්නට ලැබෙන ගල් ගරාදි වැට මෝස්තරයෙන් අලංකාර වෙයි.
- මැදිරිගිරියේ වටදාගෙයි වේදිකාවට පිවිසීමට ඇති, පියගැට 27 කින් යුක්ත ගල් සෝපාන පංතිය ද විශිෂ්ට නිර්මාණයක් ලෙස සලකනු ලැබේ.

- පොළොන්නරු වටදාගෙය ගොඩ නගා ඇති අභ්‍යන්තර මලුව පිහිටා ඇත්තේ පොළෝ මට්ටමෙන් අඩි 4 1/2 ක් පමණ උස් වූ, අඩි 120 ක විෂ්කම්භයක් ඇති දෙවැනි බාහිර මලුවත් මතය.
- අභ්‍යන්තර මලුවට ඇතුල්වීම සඳහා සතර දිසාවට මුහුණ ලා නිමවන ලද සඳකඩ පහණ හා මුරගල් සහිත ද්වාර සතරකි.
- මධ්‍යයෙහි පිහිටි කුඩා ස්ථූපය වටා සතර දිසාවට මුහුණ ලා වැඩ සිටි බුදු පිළිම සතරකි.

- මැදිරිගිරියේ චෛතිය ඝරයේ සැලැස්මට සමාන වූ මේ වටදාගෙයි ඇතුළත කුලුනු පේළි දෙකෙහි එකම කුලුනක් වත් මුල් ස්ථානයේ නොමැත.
- බාහිර වටයේ කුලුනු 32 කි.
- කුලුනු හිසත් සමඟ මෙම කුලුනක උස අඩි අටකි.
- මෙම වටදාගෙයි විශේෂ ලක්ෂණය වනුයේ බාහිර කුලුනු වටය සමඟ දිවෙන අඩි 2 අඟල් 9ක් උස කැටයමින් හෙබි ගලින් නිම කළ මිටි තාප්පය යි.
- මෙම තාප්පයේ ගැඹුරට කැටයම් කොටා ඇති පෙති හතරේ මල් මෝස්තරය විසිතුරුය.
- දෙවෙනි කුලුනු පෙළත් තුන්වන කුලුනු පෙළත් අතර පිහිටි වෘත්තාකාර ගඩොල් බිත්තිය නියම උසට තවමත් ආරක්ෂා වී තිබේ.
- තිරියාය වටදාගෙයි නටබුන් අතරින් ම සොයාගත් අටවැනි සියවසට අයත් සංස්කෘත සෙල් ලිපියකින් එම විහාරයේ පැරණි නාමය ගිරිකණ්ඩ චෛත්‍යය බව පැහැදිලි වේ.
- ලංකාවේ වටදා ගෙවල් ඉන්දියාවෙන් ලබාගත් මූලික අදහස මත ඉදි වී ඇත.

### බෝධි ඝරය

- බෝධි ඝරය යනු බෝධීන් වහන්සේ වටා සාදන ලද පටු පියස්සක් සහිත මණ්ඩපයකි.
- ආදිම ඉන්දියානු බෞද්ධ ගැල්කැටයම් වල බුදුන් වහන්සේ නිරූපණය කරන සංකේතයක් වශයෙන්ද බෝධීන් වහන්සේ යොදා ගෙන තිබේ.
- සාංචියේ හා අමරාවතියේ ගල්කැටයම් අතර බෝධීන් වහන්සේ නිරූපණය වන ස්ථානයන්හි බෝධි ඝරයක රූප සටහනක් දක්නට ලැබේ.
- දඹදිව ශ්‍රී මහා බෝධීන් වහන්සේ වටා මෙන් ම අනුරාධපුර ශ්‍රී මහා බෝධීන් වහන්සේ වටා ද බෝධි ඝරයක් තිබූ බව මහා වංශයේ සඳහන් ය.
- අනුරාධපුර බෝධීන් වහන්සේ වටා ගරාදි වැටක්, උතුරු පැත්තේ දොරටු කොටුවත්, සතර දොරටුවෙහි ගල්කුලුනු මත ධර්ම චක්‍ර රූප ආදියත් වූ බව මහා වංශ විස්තරයේ සඳහන් ය.
- එහෙත් පසුකාලීන ප්‍රතිසංස්කරණ නිසා ශ්‍රී මහා බෝධීන් වහන්සේ වටා පිහිටි බෝධි ඝරයේ ලක්ෂණ සියල්ල දැන් මැකී ගොස්ය.

- මෙතෙක් සෑහෙන තත්ත්වයකින් ආරක්ෂා වී ඇති බෝධි ඝරයක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිල්ලක්ගම ගමින් හමු වේ.
- මලු දෙකකින් සමන්විත මෙහි පහත මලුවේ පැත්තක දිග අඩි 34 කි.
- උඩ මලුවේ පැත්තක දිග අඩි 13කි.
- බෝධි වෘක්ෂය පිහිටා තිබුණේ උඩ මලුවේය.
- බෝධි වෘක්ෂය වටා පිහිටි මණ්ඩපය පහත මලුවේ ගල්කණු සොළසක් මත පිහිටියේ ය.
- පහත මලුවට ඇතුල් වීමට තිබුණු දොර කොටු සහ උඩ මලුවේ බැම් කැටයම් වලින් අලංකාර කොට ඇත්තේ ය.
- සමස්තයක් වශයෙන් ගත්කල මෙම නිර්මාණය සමමිතිකය, සුන්දරය.
- අව්වෙන් වැස්සෙන් පීඩා නොවිඳ බෝධි පූජා පැවැත්වීම සඳහා බෝධි ඝරය සැදැහැවතුන්ට ප්‍රයෝජනවත් වන්නට ඇත.

### පටිමා ඝර

- බුදු පිළිම වහන්සේ සඳහා සකස් කළ කුටි පටිමා ඝර හෙවත් පිළිම ගෙවල් නමින් හැඳින් වේ.

- මුල් කාලයේ දී සැදූ පිළිම වහන්සේලා, බෝධීන් වහන්සේලා යට තැන්පත් කරන්නට ඇති බව සලකනු ලැබේ.
- අනුරාධපුර වට රවුම් පාරේ ඇති සුප්‍රසිද්ධ සමාධි පිළිමය ද බෝධීන් වහන්සේ ඉදිරිපිට තැන්පත් කළ එකක් ලෙස සලකනු ලැබේ.
- මෙසේ අවකාශයේ බුදු පිළිමය තැබීමෙන් එයට ලැබෙන ගෞරවය බෝධීන් වහන්සේට දෙවෙනි බව පෙනී ගිය නිසාදෝ බුදු පිළිම සඳහා ද ආවරණ සහිත පිළිම ගෙවල් වැඩිකල් නොගොස් ම ගොඩ නගන ලද බව පෙනේ.

- දහවන සියවසට අයත් සෙල් ලිපියක අභයගිරි විහාරයේ හඳුන්වා ඇත්තේ " ගඳල " යන වචනයෙහි, “ගඳල” යනු පාලි ‘‘ ගන්ධ කුටි” යන්නෙන් ආවකි.
- ගන්ධකුටි යනු බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වාසය කළ කුටියට කියන නමකි.
- මුලින් ම ලක්දිව සැදූ පිළිම ගෙවල් ද ජේතවනාරාමයේ ගන්ධ කුටියේ ආකෘතිය අනුගමනය කළ බව සිතන්නට ඉඩ තිබේ.
- සැවැත් නුවර ජේතවනාරාමයේ නටබුන් අතරින් හඳුනා ගත් බුදුරජාණන් වහන්සේගේ ගන්ධ කුටිය සම සතරැස් ගෘහයකින් හා ඊට පිවිසීමට යා කරන ලද කුඩා මණ්ඩපයකින් යුක්ත විය.
- ලංකාවේ පුරාණතම පිළිම ගෙවල් ද චතුරශ්‍රාකාර ගර්භ ගෘහයකින් හා ඊට සම්බන්ධ මණ්ඩපයකින් යුක්ත ය.
- මෙයට ඉතා ම හොඳ නිදර්ශනයක් නම් අනුරාධපුරයට උතුරින් පිහිටි කිරිබත් වෙහෙර පිළිම ගෙය යි.
- මෙහි සම සතරැස් ගර්භයෙහි පැත්තක දිග අඩි 20කි.
- ගර්භ ගෘහයේ පසු භාගයේ අඩි 12ක් පමණ උස හිටි පිළිමයකි.

- අනුරාධපුරයේ ථූපාරාමය අසල ඇති දළදා මාලිගය යනුවෙන් වැරදි ලෙස භාවිත කරනු ලබන විහාර ගෙයි පැරණි කොටස ද පැරණි පිළිම ගෙයකට තවත් හොඳ නිදර්ශනයකි.
- මෙය කිරිබත් වෙහෙර පිළිම ගෙයටත් වඩා ශෝභනය. පටිමාඝරය, ගර්භගෘහ, අන්තරාල හා මණ්ඩප යන කොටස් තුනකින් යුක්ත විය.
- මුලින් සඳහන් කළ ථූපාරාම විහාර ගෙයි අඩි - තාලම පරීක්ෂා කිරීමෙන් මේ අංග තුනම දැක ගත හැකි ය.

- මේ හැරෙන්නට තවත් වර්ගයක ආයතාකාර බිම් සැලැස්මක් දක්නට ලැබේ.
- මෙම මන්දිර වල දොරටුව වැටී ඇත්තේ ගොඩනැගිල්ලේ දික් පැත්තට සම්බන්ධ වූ ද්වාර මණ්ඩපයක සිට ය.
- මෙම විහාර වල තවත් ලක්ෂණයක් නම් ප්‍රධාන ගොඩනැගිල්ල මැදි කොට කොන් හතරේ කුඩා ගොඩනැගිලි හතරක් තිබීම ය.
- මේවාට හොඳම නිදර්ශනයක් නම් අනුරාධපුර වටරවුම පාරේ ඇති මහසෙන් මාලිගය නමින් හැඳින්වෙන ගොඩනැගිල්ල ය.
- එබඳු සෑම මන්දිරයක ම උඩුමහල් තලයක් තිබූ බව කියනු ලැබේ.

- මෙම පැරණි විහාර මන්දිර වල දැනට ඉතිරිව ඇත්තේ ගලින් හෝ ගඩොලින් කරන ලද අධිෂ්ඨාන හෙවත් ගොඩනැගිලි පාද, ගල් කණු, පියගැට, මුරගල් හා සඳකඩ පහණ ය.

- ගඩොලින් හා ලියෙන් තනනු ලැබූ මෙම ගොඩනැගිලිවල උපරි භාගයන් විනාශයට පත් ව ඇත.
- අනුරාධපුර යුගයේ ගොඩනැගිලිවල වහල සහිත හැඩයන් නිරූපණය කරන පැතලි රූප කැටයම් සංඝාරාමයන්හි කැසිකිළි ගල්වල දක්නට ලැබේ.
- මේවායින් ආදී ගොඩනැගිලි වල පියස්ස පිළිබඳ අදහසක් සිතා ගත හැකිය.

## ගෙඩි ගෙවල්

- අනුරාධපුරයේ අග භාගයේ දී ගඩොලින් ම නිමවන ලද විශාල පිළිම ගෙවල් විශේෂයක් දක්නට ලැබේ.
- සිංහල ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ සැළකිය යුතු නිර්මාණයන්ගෙන් එකක් වන මේ වර්ගයේ වඩා හොඳ පිළිම ගෙවල් පොළොන්නරුවේ දක්නට ලැබේ. අනුරාධපුරයේ ජේතවනාරාම ස්තූපයට බටහිරින් පැරණි ජේතවනාරාම විහාරයට අයත් ගඩොල් බිත්ති වලින් යුත් පිළිම ගෙයක නටබුන් දක්නට ලැබේ. හිටපු පුරා විද්‍යා කොමසාරිස්වරයකු වූ එච්. සී. පී. බෙල් මහතා කියන පරිදි මෙහි චතුරශ්‍රාකාර කොටසේ පැත්තක දිග අඩි 69 කි.
- බිත්ති වල ඝනකම අඩි 5 කි. ප්‍රධාන ශාලාවට කවුළු 14ක් හා අන්තරාලයට කවුළු 3 ක් තිබුණි.
- විශාල පිළිමයක් මෙහි තිබූ බවට ලකුණු ඇතත් එම පිළිමයේ කිසිවක් දැනට නොමැත.
- මෙම පිළිමගෙයි විශාල ගල් උළුවස්සෙන් කොටසක් දැනට දක්නට ඇති බැවින් ඒ අනුව පිළිම ගෙහි විශාලත්වය සිතා ගත හැකි ය.
- ගෙඩි ගේ නමින් හැඳින් වෙන මෙම පිළිම ගෙවල පියස්ස ද ආරුක්කු ආකාරව ගඩොලින් ම නිමවා තිබුණු බව පෙනේ.

- මේ වර්ගයට අයත් වඩා හොඳ තත්ත්වයේ ඇති පිළිම ගෙවල් තුනක් පොළොන්නරුවේ දක්නට ලැබේ.
- මේවා නම් මහා පරාක්‍රමබාහු රජු විසින් ගොඩ නගන ලද්දේ යයි කියනු ලබන ථූපාරාමය, ජේතවනාරාමය හා ලංකාතිලකය යි.

- මේවායින් තවමත් සම්පූර්ණයෙන් පියස්ස සහිතව ආරක්ෂා වි ඇත්තේ ථූපාරාමය නමින් හැඳින්වෙන පිළිම ගෙයයි.
- එය අනෙක් පිළිම ගෙවල් දෙකට වඩා ප්‍රමාණයෙන් කුඩාය.
- මෙම ගොඩනැගිලි ගඩොල් හා හුණු බදාමයෙන් ගොඩ නගා ඇති අතර ඒවායේ පියසිද ආරුක්කු ආකාරයට ගඩොලින් නිමවා තිබූ බව පෙනේ.
- මෙම ගොඩනැගිලි තුනටම තවත් පොදු ලක්ෂණයක් නම් සතරැස් ගර්භයකුත් එයින් පිටතට විහිදෙන ආයත අන්තරාලයකුත් තිබීමයි.
- මේවායේ බිත්ති අඩි 7ක් පමණ ඝනකම් වන බැවින් පිටතින් පෙනෙන විශාලත්වයේ තරමට ඇතුළත ඉඩ කඩ අඩු බව පෙනේ.

- මෙම පිළිම ගෙවල් තුනෙන් විශාලතම වන්නේ ලංකාතිලක පිළිම ගෙයයි. පිටතින් එහි දිග අඩි 124 ක් වන අතර පළල අඩි 66 කි.
- දැනට ඉතිරි වී ඇති බිත්ති වල උස අඩි 55 ක් පමණ වේ.
- ලංකාතිලක පිළිමගේත්, ජේතවනාරාමය නමින් හැඳින්වෙන තිවංක පිළිමගේත් පියස්ස කැඩී බිඳී ඇත.

- තිවංක පිළිමගෙයි සම සතරැස් ගර්භ ගෘහයේ පැත්තක් අඩි 41 ක් පමණ වේ.
- ගර්භ ගෘහයට ඉදිරියෙන් ආයතාකාර මණ්ඩපය පිහිටියේ ය. මණ්ඩපයට ඇතුළු වන දොරටුව අඩි 40 ක් පමණ උස් වෙයි.
- මණ්ඩපයට ඇතුල් වීමට දිගින් අඩි 18ක් පමණ වූ පියගැට තුනකි.

- ලංකාතිලක පිළිම ගෙයි ඇත්තේ වැඩ සිටි පිළිමයකි.
- දැනට හිස නොමැති එම පිළිමය අඩි 40 ක් පමණ උස් වෙයි.
- වන්දනාකරුවන්ට බුදු පිළිමය පිළිබඳ ආසන්න දර්ශනයක් ලබාගැනීමට හැකි වන පරිද්දෙන් ගර්භ ගෘහය දෙපස බිත්ති වලට යාබදව ලී වලින් සැදූ වේදිකා ආලින්ද දෙකක් තිබූ බවට ලකුණු තිබේ.
- මෙම ආලින්ද රැඳී සිටියේ අඩි 12 ක් උස සම සතරැස් කුලුනු මතය.
- ථූපාරාම පිළිම ගෙයි වූයේ වැඩ හිඳිනා පිළිම වහන්සේ නමකි.
- ජේතවනාරාම පිළිම ගෙයි වැඩ සිටි පිළිමයේ ස්වරූපය අනුව එම පිළිම ගෙය තිවංක පිළිම ගෙය නමින් හැඳින් වෙයි.
- මෙම ගොඩනැගිලි මෙන්ම පිළිම ද ගඩොලින් හා හුණු බදාමයෙන් ම නිමවන ලද්දේ වෙයි.

- පොළොන්නරුවේ මෙම ආරුක්කු වහලවල් හෙවත් බොකු වහලවල් සහිත පිළිම ගෙවල බාහිර දර්ශනය අතින් ඒවා හින්දු දේවාල වලට නෑකම් කියයි.
- මේවායේ බිත්ති, කුලුනු කැටයම් වලින් අලංකාර කොට ඇත්තේය.
- මේ කුලුනු දෙකක් අතර පිහිටි කුඩා ප්‍රාසාද මුඛවල බදාමයෙන් කළ දේව රූප දක්නට ලැබේ.
- ඒවායින් විමාන සහිත ව පැමිණි දෙවිවරුන් පිළිබිඹු වෙතියි සැලකේ.
- මේ හැරෙන්නට ගොඩනැගිල්ල වටා බොරදම් වශයෙන් දිවෙන සිංහ, වාමන සහ හංස රූප වලින් ද ඉතා සිත් ගන්නා සුලුය.
- මේ පිළිම ගෙවල බිත්ති මතුපිට පෙනෙන සැරසිලි වල සංකීර්ණත්වය හින්දු ආගමික බලපෑම නිසා සිදුවී යයි අදහස් කෙරේ.

## අටදාගේ හා හැටදාගේ

- අටදාගේ යනු පළමු වන විජයබාහු රජු විසින් ගොඩ නැගූ දළදා මාලිගාව වන අතර හැටදාගේ යනු නිශ්ශංක මල්ල රජු විසින් ගොඩ නැගූ දළදා මාලිගාව යි.

- අටදාගේ බිම් සැලැස්ම අනුරාධපුරයේ සම සතරැස් ගර්භය හා ආයත අන්තරාලය සහිත පිළිම ගෙවල බිම් සැලැස්ම අනුගමනය කරයි.
- දෙමහල් ගොඩනැගිල්ලක් වන අටදාගේ දැනට ඉතිරිව ඇත්තේ බිම් මහලේ අඩිතාලම, බිත්ති හා ගල්කණු පමණි.
- අඩි 8ක් උස ගල්කණු 54 ක් මත දැවයෙන් කළ උඩුමාලය ගොඩ නැගී තිබුණු බව අදහස් කරනු ලැබේ.
- දළදා වහන්සේ වැඩ සිටියේ උඩු මාලයේ ය.
- බිම් මහලේ ගල්කණු 32 ක් පමණ බිත්ති තුළට ගිල්වා ඇත්තේය.
- මෙහි අන්තරලායේ කැටයම් කළ ගල්කුලුනු විශේෂත්වයක් දරයි.
- බිම් මහලේ බුදු පිළිම තුනක් විද්‍යාමාන වෙයි.

- හැටදාගේ නමින් හැඳින්වෙන දළදා මාලිගාට අඩි 120ක් දිග අඩි 90 ක් පළල කොටුවක් තුළ පිහිටියේ ය.
- දෙමහල් ගොඩනැගිල්ලක් වන මෙහි වැදගත් අංගයක් වන්නේ අඩි 9ක් උසට කළු ගලින් බැඳ තිබෙන බිත්තිය.
- මෙහි ද දැවයෙන් කළ උඩුමහලේ දළදා වහන්සේ වැඩ සිටින්නට ඇතැයි අදහස් කෙරේ.

## ලංකාතිලකය හා ගඩලාදෙනිය

- පොළොන්නරු යුගයෙන් පසුව සැලකිය යුතු පිළිම ගෙවල් දෙකක් හමුවන්නේ ගම්පොල යුගයේදීය.
- මේ විහාර දෙක නම්,
  මහනුවර උඩුනුවර පිහිටි ලංකාතිලක විහාරය හා ගඩලාදෙණි විහාරයත්ය.
- මේ විහාර දෙකම ගම්පොළ රජ කළ iv බුවනෙකබාහු රජු කල නිම වන ලද බව එම ස්ථානයන්හි ම කොටා ඇති ශිලා ලේඛන වලින් පැහැදිලි වේ.
- ලංකාතිලක විහාරය ගොඩ නැඟු ශිල්පියා ස්ථපතියා නම් කෙනෙකු බවත් ගඩලාදෙනි විහාරය කළ ශිල්පියා ගණේස්වරා - චාර්ය බවත් එම ශිලා ලේඛනවල සඳහන් ය.

- ලංකාතිලක විහාරය පොළොන්නරුවේ ආරුක්කු වහල සහිත පිළිම ගෙවල් වල ආකෘතියක් ලෙස සැලකිය හැකි වුවත්, කාලීන අවශ්‍යතා අනුව වෙනස් වූවකි.
- එහි මධ්‍ය ගර්භ ගෘහය පැත්තක් අඩි 70ක් පමණ වූ සම චතුරශ්‍රයකි.
- මෙම සමචතුරශ්‍රයෙන් සතර දිසාවට නෙරන ලද ආයාතාකාර කොටස් හතරකි.
- මෙයින් උතුර, දකුණ හා බටහිරට නෙරන ලද කොටසක් අඩි 30 ක් දික් වූ අතර අඩි 10ක් පළල් වෙයි.
- ප්‍රධාන දොරටුව සහිත වූ නැගෙනහිරට නෙරන ලද කොටස අඩි 30 ක් දික් වූ අතර අඩි 20 පළල් වෙයි.
- මුළු ගොඩනැගිල්ල වටා දිවෙන බිත්තිය අඩි 7ක් පමණ ඝනකම වෙයි.
- ගොඩනැල්ලේ මෙම ස්වරූපය බුදුන් පිදීමත්, දෙවියන් පිදීමත් එක්තැන් කිරීමට ගත් උත්සාහයක් ලෙස පෙනේ.
- ගඩොලින් හා හුණු බදාමයෙන් කරන ලද මෙම ගොඩනැගිල්ලේ මධ්‍ය ගර්භ ගෘහයෙහි ගඩොලින් හා හුණු බදාමයෙන් ම නිම කළ විශාල වැඩ හිඳිනා පිළිමයකි.
- දකුණ, බටහිර හා උතුරු දෙසට විහිදුනු ගෘහයන් පිළිවෙළින් උපුල්වන්, සමන් හා විභීෂණ යන දෙවිවරුන් සඳහා වෙන් වූයේ වෙයි.
- නැගෙනහිර පැත්තේ ප්‍රධාන දොරටුව දෙපස කුහර තවත් දෙවිවරුන් දෙදෙනෙකු සඳහා වෙන් කරන ලද්දේය.
- දොරටුවට දකුණත් පස කුහරය ස්කන්ධ දේවයාටත්, වමත්පස කුහරය ගණේශ දෙවියන්ටත් වෙන් කරන ලද්දේ ය.
- නැගෙනහිර පැත්තේ ප්‍රධාන දොරටුව පිහිටි අතර උතුර දකුණ හා බටහිර පැත්තේ ද දොරටු පිහිටියේ ය.
- මේ විහාරය පිළිබඳ විස්තර ඇතුළත් තඹ සන්නසක් අනුව මෙය මාල සතරක් හෙවත් තට්ටු හතරකින් යුක්ත විය.
- ඉහළ මාල දෙක කඩා වැටී ඇති අතර ඉතිරි වී ඇත්තේ බිම් මහල හා දෙවෙනි මහලත් ය.

- පසු කාලයේ කරන ලද උළු සෙවිලි කළ ලී පියස්සෙන් දෙවෙනි මහල වැසී ඇත.
- මෙම ගොඩනැගිල්ල රියන් 32 ක් (අඩි 80) පමණ උස් වූයේය.
- දැනට සුදු හුණු ආලේප කොට ඇති බාහිර බිත්තිය ඇතුන්ගේ ඉදිරි කොටස් දැක්වෙන රූප වලින් අලංකාර කොට තිබේ.
- මේ ඇත් රූප ගණනින් 16කි.
- ඇත් රූප වලින් ගොඩනැගිල්ලේ ඉහළ කොටස උසුලාගෙන සිටී.

## ගඩලාදෙණි පිළිම ගේ

- ලංකාතිලකය මෙන් ම ගල්තලාවක් මත ගොඩනගා ඇති ගඩලාදෙණිය විහාරය සම්පූර්ණයෙන් ද්‍රවිඩ ගෘහ නිර්මාණ ශෛලිය විදහාපායි.
- මෙය ද ලංකා තිලකය මෙන් ම බෞද්ධ පූජා විධි හා දේව පූජා විධි එක්තැන් කිරීමට කළ උත්සාහයකි.
- ගර්භ ගෘහය, අන්තරාලය සහ මණ්ඩපය සහිත පටිමා සරය නැගෙනහිරට මුහුණ ලා ගොඩ නගා ඇති අතර එම පටිමා සරයට යාබදව දේවාලය දකුණට මුහුණලා ගොඩ නගා ඇත.
- පිළිම ගෙයත්, දේවාලයත් එකම ගොඩනැගිල්ලේ එකම පියස්සයට ඒකාබද්ධ කිරීමක් මෙහි දී දක්නට ලැබේ.
- පොළොන්නරුවේ ශිව දේවාල මෙන් මෙය සම්පූර්ණයෙන් ම කළු - ගලින් ගොඩ නගන ලද්දකි.
- පියස්ස ද ගලින් ම කරන ලද සිඛරයකින් කෙළවර වෙයි.

- විහාරයට ඇතුල්වන ද්වාර මණ්ඩපය දකුණු ඉන්දියාවේ විජයනගර ගොඩනැගිලි සම්ප්‍රදායයේ ලක්ෂණ පෙන්වයි.
- මෙම මණ්ඩපයේ පැතලි වහල රඳා ඇත්තේ සතරැස් හා අටපට්ටම් ලක්ෂණ මිශ්‍රව යොදා ඇති ත්‍රිත්ව කුලුනු යුගලයක් මත ය.
- මෙම කුලුනු නැගී සිටින්නේ හිස ඔසවා ගත් සිංහයකුගේ රූපයක් සහිත කුලුණු පාදයකිනි.
- කුලුනු බඳෙහි ඇති සම සතරැස් කොටස්වල මූණත් නටරාජ, කෘෂ්ණ ආදී හින්දු දෙවිවරුන් නිරූපිත කැටයමින් අලංකාර වෙයි.
- බාහිර ලක්ෂණ විසින් මෙම පිළිම ගෙය හින්දු දේවාලයකට වඩා ළංවන බවක් පෙනෙයි.

## ටැම්පිට පිළිම ගෙවල්

- මහනුවර රාජධානි කාලය තුළ සංවර්ධනය වූ පිළිම ගෙවල් විශේෂයකි ටැම්පිට පිළිම ගෙය.
- මෙයින් අදහස් කරන්නේ ගල්කණු පිට දැව ඇද ඒ මත්තේ ලෑලි අතුරුවා ඒ උඩ බිත්ති බැඳ කරනු ලබන පිළිම ගෙයකි.
- ටැම්පිට පිළිම ගෙවල ඉතිහාසය සෙවීමේ දී ඒවායින් බොහොමයක් දෙමහල් පිළිම ගෙවලින් පරිණාමය වූ ඒවා බව පෙනේ.
- මුලින් දෙමහල් ව සෑදා පිළිම ගෙවල් ඒවා ජරාවට පත් වූ පසු නැවත ප්‍රතිසංස්කරණය කිරීමේ බිම්මහල ගල්කණු වලින් පමණක් යුක්ත කිරීමෙන් ඒවා ටැම්පිට පිළිම ගෙවල් බවට පරිවර්තනය වී ඇත.
- මෙබඳු ටැම්පිට පිළිම ගෙවල් දෙකක් නම් මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස් පත්තුවේ මැදවල පිළිම ගෙය සහ කෑගලු දිස්ත්‍රික්කයේ හතර කෝරලේ අම්බුලුගල පිළිම ගෙයයි.

- මැදවල විහාර සන්නස අනුව, මැදවල විහාරය 14 සියවසේ ඉදිකළ දෙමහල් පිළිම ගෙයක් බවත්, එය මහනුවර කීර්ති ශ්‍රී රාජ සිංහ රජතුමා විසින් විහාර භූමිය කටු කොහොල් අරවා පවුරු පදනම් බඳවා දැව ගෝනැස් සහිත කොට සත්රියන් ටැම්පිට පිළිම ගෙයක් ලෙස කළ බවත් පෙනේ.
- මෙසේම අම්බුලුගල පිළිම ගෙය ද කෝට්ටේ vi ශ්‍රී පරාක්‍රමබාහු (1410 – 1467) රජු විසින් දළදා ගෙයක් සඳහා කරවන ලද්දකි.
- එය ද මහනුවර යුගයේ දී ටැම්පිට පිළිමගෙයක් බවට පත් වී තිබේ.
- උඩරට ප්‍රදේශවල ගල්කණු මත ගොඩ නගනු ලබන වී අටුවල මූලධර්මයම ටැම්පිට විහාර වලට යොදාගෙන ඇති බව පෙනේ.
- ගල්කණු මත විශාල දැව යොදා වී අටු ගොඩනගන්නේ වෙයන්ගෙන් ආරක්ෂා වීම සඳහා ය.

## අම්බුලුගල ටැම්පිට පිළිම ගේ

මෙම විහාරය ගොඩ නගා ඇත්තේ අඩි 26ක් දිග, අඩි 18 ක් පළල, අඩි 2 ක් උස, ගල් ඇල්ලූ වේදිකාවක් මතය.
ආයාකාර සැලැස්මේ ගල්කණු දෙපෙළක් විහිදෙයි. ඇතුළත ගල්කණු අඩි 9 කුත් අඟල් 10 ක් උස්වන අතර පිටත ගල්කණු අඩි 8 කුත් අඟල් 9 ක් උසය.
මේ ගල් කණු මත දැව බාල්ක යොදා ඒ මත්තේ දැව තට්ටුවක් යොදා, ඒ මත පිළිම ගෙයි බිත්ති බැඳ ඇත්තේය.
පිළිම ගෙය අඩි 10 1/2ක් දික්වන අතර 7ක් පළල් ය.
පිළිමගෙය වටා බරාඳයකි. එය ඉදිරි පසින් අඩි 7 ක් පළල් වන අතර පසු පසින් අඩි 4ක් පළල් ය.
දෙපස අඩි 2 1/2 බැගින් පළල්ය.
උඩු මහලේ සිට පිළිමගෙයි සීලිම දක්වා අඩි 8 අඟල් 3 ක් උස ය.
බරාඳය වටා ඇති ලී කණු අඩි 6 අඟල් 5 ක් උස ය.
උඩුමහලට නගින්නේ ලී තරප්පුවකිනි.

- මෙම විහාර වල පියසි දැවයෙන් කළ, පෙති උළු සෙවිලි කළ, මහනුවර යුගයේ සාම්ප්‍රදායික ඒවාය.
- සම්පූර්ණ ගොඩනැගිල්ලම සමස්තයක් වශයෙන් ගත් කල කලාත්මක නිර්මාණයකි.
- මුලින් දෙමහල් පිළිම ගෙවල් වශයෙන් සාදා පසුව ටැම්පිට පිළිම ගෙවල් බවට හැර වූ විහාර හැරෙන්නට මුලින්ම ටැම්පිට විහාර වශයෙන්ම සාදන ලද පිළිම ගෙවල් ද ඇත්තේය.
- කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ දොරබාවල ටැම්පිට විහාරය එබන්දකි.
- දේවමැදි හත්පත්තුවේ දේවමැද්ද කෝරළේ නාවින්න නම් ගමේ ද ටැම්පිට විහාරයක් ඇත.
- සමහර ටැම්පිට විහාර ප්‍රතිසංස්කරණ නිසා හඳුනා ගැනීමට නොහැකි තරම් වෙනස් වී ඇත.
- එබන්දකි මහනුවර ප්‍රදේශයේ ඇති සූරියගොඩ විහාරය.

## වෙනත් විවිධ බෞද්ධ ගොඩනැගිලි

### සංඝාරාම

- භික්ෂූන් වහන්සේලාගේ වාසය සඳහා මුලින්ම සකස් කරන ලද්දේ මිහින්තලේ, වෙස්සගිරිය, ඉසුරුමුණිය හා සිතුල්පව්ව ආදී ස්ථානයන් හි ස්වාභාවිකව පිහිටා තිබූ ගල් ගුහාය.
- පර්වතය මුදුනෙන් ගල් ගුහාව තුළට ගලාබස්නා වැහි වතුර වැළැක්වීම සඳහා ගුහා මුව දොර ඉහළින් කටාරම් කොටා, බිම සකස් කොට, සුවපහසු වාසය සඳහා මෙම ගල්ගුහා සකස් කරගත හැකි විය.
- එහෙත් වැඩිකල් යන්නට මත්තෙන් භික්ෂූන් වහන්සේලා ගේ සංඛ්‍යාව ශීඝ්‍රව වැඩි වන්නට වූයෙන්, වඩා පහසුකම් ඇති සංඝාවාස ගොඩ නැගීමට සිදු විය.
- මිහිඳු මහරහතන් වහන්සේගේ වාසය සඳහා ද දීඝසන්ද සෙනෙවියා විසින් කුලුනු අටකින් සමන්විත විශාල ප්‍රාසාදයක් සාදා දුන් බව සඳහන් වෙයි.
- මෙය අලංකාර ගල් වැටකින් හා මනාව සුසැදි බිත්ති වලින් යුක්ත බව මහාවංශ ටීකාව කියයි.
- ලීයෙන් සාදන ලද මෙම ගොඩනැගිල්ලේ නටබුන් දැනට දක්නට නොලැබේ.

### රත්න ප්‍රසාදය

- පසුකාලයේ ගල්වලින් කළ, කල් පවතින මාහැඟි මන්දිර ගැන ද අසන්නට ලැබේ.
- කණිට්ඨ තිස්ස (167 – 186) රජු විසින් සාදන ලද රත්න ප්‍රාසාදය මෙබන්ධකි.
- එය පසු කාලයේ දෙවෙනි මිහිඳු රජු විසින් රන් මසු 3,00,000 වැය කොට අංග සම්පූර්ණ කළ බව ද කියනු ලැබේ.
- මේ ගොඩනැගිල්ලේ හා එහි ඇති ගල් කණුවල විශාලත්වය නිසාදෝ එය ඇත්හල නමින් ද ප්‍රසිද්ධ වී ඇත.
- මෙහි ගොඩනැගිලි පාදය දිගින් අඩි 138 ක් වන අතර පළලින් අඩි 66 ක් වෙයි.
- මෙම ගොඩනැගිල්ලේ ගල්කණු 208ක් තිබූ බවට ලකුණු තිබේ. අඩි 2 ක් දිග පළල ඇති.
- උසින් අඩි 16 ක් වූ (පොළොවට යට වූ ප්‍රමාණයත් සමඟ නම් අඩි 22 ක් වූ) කුලුනු 9 ක් තවමත් විද්‍යාමානය.
- ලීයෙන් කළ මහල් ගණනක් මෙම කුලුනු මත දරා සිටින්නට ඇත.
- අනුරාධපුර යුගයට අයත් ඉතා ම කලාත්මක වූ නාග මුරගලක් දක්නට ලැබෙන්නේ මේ ස්ථානයේ ය.
- රත්න ප්‍රාසාදය වැනි විශාල තත්ත්වයේ භික්ෂු ආරාමවලට වඩා කුඩා ප්‍රමාණයේ සංඝාවාස රාශියක පදනම් අනුරාධපුර නටබුන් අතරින් සොයා ගත හැකි ය.

### උපෝසථාගාර

- භික්ෂූන් වහන්සේලාගේ විනය කර්ම කිරීම සඳහා අතිශයින් වැදගත් වූ ගොඩනැගිලි විශේෂයකි.

- උපෝසථාගාර නමින් හැඳින්වෙන්නේ අනුරාධපුරයේ අභයගිරිය, දක්ඛිණ විහාරය හා ජේතවනාරාමය වැනි එක් එක් නිකායික විහාරයන් සඳහා වෙන් වෙන් වූ උපෝසථාගාර තිබූ බව පෙනේ.
- පොහෝ දිනයන්හි භික්ෂූන් වහන්සේලා විනය කර්ම සඳහා මේවායේ රැස්වූහ.
- උපෝසථාගාරවලින් ඉතා ශෝභන වූත්, විශාල වූත් ගොඩනැගිල්ල වන්නේ මහා විහාරයේ උපෝසථාගාරය වන දුටු ගැමුණු රජතුමා විසින් කරවන ලද ලෝහප්‍රාසාදය යි.
- කාමර සියය බැගින් යුත්, මහල් නවයක් මෙම ගොඩනැගිල්ලට තිබුණේ යයි මහාවංශයේ කියැවේ.
- උසස් ගෘහ නිර්මාණ ලක්ෂණ වලින් යුක්ත වූ මෙහි පියස්සට තඹ ඔබ්බ වූ උළු සෙවිලි කළ බවත්, ඒ නිසා ම " ලෝහ ප්‍රාසාදය " යන නම් ඇති වූ බවත් කියනු ලැබේ.
- ගින්නෙන් දැවුණු මෙම නව මහල් මන්දිරය පසුව සත්මහල් කොට සද්ධාතිස්ස රජු විසින් ගොඩ නගන ලද්දේය.
- දැනට මෙහි බිම් මහලේ පෙළකට 40 බැගින් ගල්කණු 1600ක් දක්නට ලැබේ.
- මේ ගල්කණු දොළොස්වන සියවසේ මහා පරාක්‍රමබාහු රජතුමා විසින් කළ ප්‍රතිසංස්කරණයේ ඒවා බව විචාරකයින්ගේ හැඟීමයි. මේ ගල්කණු මත ඉතිරි මහල් ලියෙන් සාදා තිබෙන්නට ඇත.

- මහා පරාක්‍රමබාහු රජතුමා විසින් පොළොන්නරුවේ ඉදි කරන ලද අලාහන පිරිවෙනට අයත් ගොඩනැගිලි සමූහයේ ඉතා ඉහළම මලුවේ පිහිටි " බද්ධ සීමා පාසාදය " ද උපෝසථාගාරයකි.
- චූලවංශයේ සඳහන් විස්තරය අනුව මෙහි මහල් 12 කි.
- චූල වංශයේ සඳහන් මහල් අප විසින් අදහස් කරනු ලබන සොල්දර තට්ටු ද යි නිශ්චය වශයෙන් කිව නො හැකි ය.
- එහෙත් දැනට පෙනෙන අන්දමට අඩි 4 1/2ක් උස දිගින් අඩි 113 ක් වූත්.
- පළලින් අඩි 106ක් වූත් අධිෂ්ඨානයක් (වේදිකාවක්) මත දක්නට ලැබෙන, මාර්ග, ශාලා, කාමර, කුලුනු හා ඉහළ මාලයට නගින තරප්පු පෙළක නටබුන් ආදිය ගැන සලකා බලන විට මෙය ඉතා කදිම ගොඩනැගිල්ලක් වන්නට ඇති බව සිතිය හැක.

- පොළොන්නරුවේ තෝපා වැව් කෙළවර නටඹුන් අතර පොත්ගුල නමින් හැඳින්වෙන වෘත්තාකාර ගොඩනැගිල්ල විශිෂ්ට නිර්මාණයක් ලෙස සැලකිය හැකි ය.
- වට ප්‍රමාණය අඩි 157ක් පමණ වූ මෙම ගොඩනැගිල්ලේ නැගෙනහිරට ආයත අන්තරාලයක් විහිදෙයි.
- බොකු වහලයක් සහිත වූ මෙම ගොඩනැගිල්ල කුමක්දැයි නිශ්චය වශයෙන් තීරණය කර නැත.
- මහා පරාක්‍රමබාහු රජුගේ චන්ද්‍රවතී දේවිය විසින් මෙම ස්ථානයේ මණ්ඩපයක් කළ බව ද කියැවේ.
- මෙම ගොඩනැගිල්ල වටා ද භික්ෂු ආරාම වශයෙන් සැලකිය හැකි ගොඩනැගිලි සංඛ්‍යාවක් ඇත්තේ ය.

## නාන පොකුණු

- සෑම භික්ෂු ආරාමයකට ම අත්‍යවශ්‍ය වූ නාන පොකුණු ජලය රැස්කර ගැනීම සඳහා මුල් කාලයේ දී ගල් පර්වතවල සෑහෙන ප්‍රමාණයක විශාල කවාකාර වළවල් හෙවත් පොකුණු සාදා ගන්නා ලදී.
- ගල් පර්වත නොවූ ස්ථානවල පොකුණු හාරා ඒවායේ බිත්ති සේදී යෑම වැළැක්වීම සඳහා ගලින් තාප්ප බඳින ලදී.
- ආරාමයන්හි ධනය වැඩි වූවාට පසුව මෙන්ම බාහිරාලංකාරය ගැන සැළකිල්ල වැඩි වූවාට පසුව පොකුණු තුළට බැසීමට ශෝභන පියගැට පෙළවල් සහිත, මටසිලුටු කළ විශාල ගල්පුවරු වලින් අලංකාර කළ ඉවුරු ඇති කලාත්මක පොකුණු නිර්මාණය කිරීම ඇරඹිණි.
- මේ වර්ගයට ඉතා ම කදිම උදාහරණයක් නම් අනුරාධපුර අභයගිරි විහාරය අසල දකින්නට ලැබෙන කුට්ටම් පොකුණ නමින් හැඳින්වෙන පොකුණු යුග්මය යි.

- මේ පොකුණු දෙකම ඔප මට්ටම් කළ මිටි ශෛලමය ප්‍රාකාරයකින් වට වී තිබේ.
- ප්‍රාකාරයේ සමාන දුර ප්‍රමාණයකින් තැනින් තැන පිහිටුවන ලද පියගැට පේළි වලින් පොකුණු බිමට බැසිය හැකිය.
- පළලින් මේ පොකුණු දෙක එක සමානය.
- එනම් අඩි 21කි.
- දිගින් අසමාන වූ එක් පොකුණක් අඩි 132 ක් දික්වන අතර, අනෙක අඩි 91 ක් දිග ය.
- ආයතාකාරව එක පෙළට පිහිටුවා ඇති පොකුණු දෙක අතර දුර අඩි 18 කි.
- ලොකු පොකුණ අඩි 17 ක් ගැඹුර වන අතර කුඩා පොකුණ අඩි 14 ක් ගැඹුරු වෙයි.
- පොකුණු පතුලේ සිට ම පොකුණු ඉවුරු ගැට්ට දක්වාම පොකුණු බිත්ති ස්ටේට්ටම් ගල් වලින් කළ ආවරණය කළේ වෙයි.
- ලොකු පොකුණට බැසීමට ශෛලමය සෝපාන පන්ති තුනකි.
- කුඩා පොකුණට බැසීමට ශෛලමය සෝපාන පන්ති දෙකකි.
- සෑම පියගැට පෙළකට දෙපස පිහිටි කුඩා තුලනු මත අර්ධ විෂ්කම්භය අඩි 2 අඟල් 5 ක් වූ ශෛලමය පුන්කළස් නගා ඇත.
- කළස්වල කරින් ඉහළ කොටස් නෙළුම් කොළ, මල් පොහොට්ටු ආදියෙන් කැටයම් කර ඇත.

## ප්‍රධාන සර

- සිංහලෙන් " පියන්ගල්" නමින් හැඳින්වෙන මේ ගොඩනැගිලි විශේෂය භාවනානුයෝගී භික්ෂූන්ගේ අවශ්‍යතා ඉටු කිරීමට සකස් වූවකි.
- මුල් කාලයේ දී භාවනානුයෝගී භික්ෂූන් වහන්සේලාගේ තවුස් පැල සකස් වූයේ වනාන්තරයේ ගල් තලාවක් මතය.
- සතුන්ගෙන් ආරක්ෂාවීම සඳහා බොහෝ විට මේ ගල්තලාව වටා දිය අගලත් ද සකස් කෙරිණි.
- පසු කාලයේ දී මෙය අනුගමනය කරමින් ජනාවාසයෙන් තොර විවේකී භූමියක පොකුණු, දිය අගල්, සක්මන් මලු, භාවනා කුටි ආදී අංගයන්ගෙන් යුක්ත කොට ඇත.

- මෙබඳු ගොඩනැගිලි සමූහයක් අනුරාධපුර නගරයට බටහිරින් පිහිටි පශ්චිම ආරාම නමින් හඳුන්වනු ලබන නටබුන් අතරින් පුරාවිද්‍යාඥයන් විසින් සොයාගෙන ඇත්තේ ය.
- මේ ගොඩනැගිලි සාදා ඇත්තේ පැතලි ගල්තලාවන් මත ය.

- එක් ගොඩනැගිලි ඒකකයකට කොඳු සහිත ගලින් කළ වේදිකා දෙකක් ඇතුළත් වෙයි.
- එයින් පිටුපස වේදිකාව පර්වතයක් මත තනා ඇති දිය අගලකින් වට කරන ලද්දේ වෙයි.
- කපා මට්ටම් කළ ගල් දිය අගල දෙපැත්තේ ම අල්ලා ඇත්තේ ය.
- දිය අගලින් වට වූ වේදිකාව මත ගොඩ නැගුණු ගල්කණු මත තරමක විශාල පියස්සක් විය.
- ඉදිරිපස වේදිකාවේ ගල්කණු නොමැති බැවින් එයට පියස්සක් නොවීය.
- ගල්පුවරු වලින් කළ විශාල පාලමකින් වේදිකා දෙක සම්බන්ධ වෙයි.
- මේ ගල් පාලම දිගින් අඩි 14 අඟල් 8 ක් වන අතර පළලින් අඩි 13 කුත් අඟල් 6 කි .
- ඝනකමින් අඩි 2 අඟල් 3කි.
- ඉදිරිපස වේදිකාව දිගින් අඩි 44 අඟල් 6ක් වූ අතර පළලින් අඩි 37 අඟල් 3 කි.
- පසු පස වේදිකාව දිගින් අඩි 41 ක් ද, පළලින් අඩි 33ක් ද වෙයි.
- පසුපස වේදිකාවේ මණ්ඩපයේ ලී පියස්ස රඳා තිබුණේ ගල් කුලුනු 24 ක් මතය.
- ප්‍රධාන සරයට අයත් තවත් ප්‍රධාන දේවල් නම් ගලින් බැඳි පොකුණු, උස්කර තැනූ සක්මන් මලු හා වටා පිහිටි කුටි ආදිය යි.
- බාහිර ව පිහිටි එක් කුටියක් වැසිකිළියක් සඳහා ය.
- මෙහි කැටයමක් වශයෙන් දකින්නට ලැබෙන්නේ කෙසිකිළි ගලක කැටයම් කර ඇති ගොඩනැගිලි සටහන පමණි. මෙම ප්‍රධානසර ශාලාවට ඇතුල් විය හැකි වූයේ ගල් පියස්සක් සහිත කුලුනු බැඳී ද්වාර මණ්ඩපයක් තුළිනි.
- මෙබඳු ප්‍රධානසර වර්ගයට අයත් භාවනා ශාලා රිටිගල. මානාකන්ද, සහ අරන්තැලේ යන ස්ථාන වලින් ද සොයා ගෙන තිබේ.

## ආසන සර

- මුල් කාලයේ දී මේ ආසනයෙන් පිළිබිඹු කලේ බුදුරජාණන් වහන්සේගේ වජ්‍රාසනය යි.
- අනුරාධපුර ශ්‍රී මහා බෝධීන් වහන්සේ ළඟ ද මෙබඳු ආසනයක් තබා තිබූ බව වංශ කථා අනුව පෙනේ.
- මුල් කාලවල දී මේ ආසන, බෝධිසර හෝ චෛතිය සරවල තබා තිබුණි. එහෙත් පසු කාලවල දී ආසන සඳහා ම ගෘහයක් සෑදූ බව පෙනේ.
- මේවා ආසනසර නමින් හැඳින් වේ.
- ආසන සරයක වැඳුම් පිදුම් සඳහා ඇති ආසනය මට සිලුටු ලෙස කපා වේදිකාවක් උඩ පිහිටුවන ලද ආයත චතුරශ්‍රාකාර ගල් පුවරුවකි.
- මෙබඳු ආසන සහිත ආසනසර ක්‍රි.ව. 8 වන සියවස පමණ කාලය දක්වා භාවිත වූ බව සොයා ගෙන ඇති ආසනසර නටබුන් වලින් පෙනේ.
- ආසනසර වෘත්තාකාර හෝ චතුරශ්‍රාකාර ගොඩනැගිලි වූ බව පෙනේ.
- වෘත්තාකාර ආසනසර වල පියස්ස වටදා ගෙවල මෙන් ලීයෙන් කරන ලද ඒවා වෙන්නට ඇත.
- දැනට හමු වී ඇති ආසන සර කීපයක් නම්,

( 1 ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන්නි හත්පත්තුවේ කටුවන්න කෝරලේ කටුවන්නාව ආසන සරය.
( 2 ) මඩකලපු දිසාවේ පුළුකුණාව ආසන සරය.
( 3 ) අනුරාධපුර දිසාවේ හුරුළු පළාතේ හල්මිල්ල වැටිය ආසන සරය.
( 4 ) හුරුළු පළාතේ උඟ්ගල්ල කෝරළේ උත්ති මඩුව ආසන සරය.
( 5 ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ මගුල් ඕතොට කෝරළේ ගණේ වැව ආසන සරය.

- මෙයින් කටුවන්නාව ආසන සරය විෂ්කම්භය අඩි 40ක් වූ වෘත්තාකාර සැලැස්මක අටැස් ගල් කුලුනු 20ක් මත ඉදි වූවකි.
- ගල් කුලුනක් පොළොවෙන් උඩ අඩි 8 කි. මේ ආසන ආරයේ ආසන දෙකක් දක්නට ලැබේ.
- ඉන් එකක් අඩි 12ක් දික්වන අතර අඩි 5ක් පමණ පළල අඩි අනෙක අඩි 8 1/2ක් දික් වන අතර, අඩි 3 1/2ක් හඳුළ ය.

**පුළුකුණාව ආසන සරය**

- මෙම ආසනසරයේ අත්තිවාරමත්, අසුනත් පමණක් දක්නට ලැබේ.
- වෘත්තාකාර වූ ආසන සරය කණු 24 ක් මත ගොඩ නගා තිබූ බව පොළොවේ ඇති ගලින් කළ කණු පාද වලින් පෙනේ.
- ආසනය දිගින් අඩි 16කුත් අඟල් 8කි.
- පළලින් අඩි 5 කුත් අඟල් 5 කි. ඝනත්වය අඩි 2 කි. එය අඩි 2 ක් පමණ උස් වූ ගල්කණු මත තබා ඇත.
- ගල් පුවරුවේ බොරදම දක්වා ගඩොලින් බිත්ති බැඳ තිබී ඇත.

# 9. පාඩම
# බෞද්ධ මූර්ති කලාව

## බුදු පිළිමය

### බුදු පිළිමයේ උපත

- බුදුරජාණන් වහන්සේ නියෝජනය කරනු ලබන සංකේත තුන- බෝධීන් වහන්සේ, දාගැබ් වහන්සේ හා බුදු පිළිම වහන්සේ.
- බෝධි වන්දනාව සහ දාගැබ් වන්දනාව බුද්ධ කාලයේදීම ආරම්භ විය.
- බුදු පිළිම වන්දනාව ආරම්භ වී ඇත්තේ බුද්ධ පරිනිර්වාණයෙන් සියවස් පහකටත් පසුව ය. හේතුව- බුදුන් වහන්සේ රූපකායකින් නිරූපණය කිරීම කළ නොහැකි දෙයක් ලෙස හෝ එසේ කිරීම උන් වහන්සේට කරන අගෞරවයක් ලෙස හෝ සැලකීම.
- ක්‍රි.පූ. තුන්වන සියවසට අයත් සාංචි භාරුත් ආදී කැටයම් වල සිද්ධාර්ථ බෝධිසත්වයන් වහන්සේ හෝ බුදුන් වහන්සේ නිරූපණය කර ඇත්තේ සිරිපතුල, ධර්ම චක්‍රය, බෝධි වෘක්ෂය, ආසනය වැනි සංකේත වලිනි.
- පළමුවරට බුදුන් වහන්සේ රූපකායෙන් දක්වනු ලැබුයේ- කනිෂ්ක රජුගේ කාසියක(ක්‍රි.ව. 78-144)
- ග්‍රීක්වරුන්ගේ පිළිම නෙළීමේ ශිල්පය වයඹදිග ඉන්දියාවට පැතිරුණු පසු ගන්ධාර දේශයේ දී ග්‍රීක් ශිල්පීන් අතින් මුල් ම බුද්ධ ප්‍රතිමාව නිර්මාණය වෙන්නට ඇතැයි සැලකේ.
- ගන්ධාර සම්ප්‍රදායේ බුදු පිළිමවල විශේෂත්වය - ග්‍රීක දෙවිවරුන් පරිද්දෙන් බුදුන් වහන්සේ ද මනා කඩවසමින් යුතු බාහිර රූපලාවන්‍යයෙන් අගතැන්පත් කෙනෙකු ලෙස දැක්වීම.
- දේශීය සම්ප්‍රදායන්ට අනුව මථුරා ප්‍රදේශයේ ද බුදු පිළිම නිර්මාණ විය.
- මථුරා බුදු පිළිමවල ප්‍රධාන ලක්ෂණය- බුදුන් වහන්සේගේ මහා කරුණාව, ප්‍රඥාව වැනි ආධ්‍යාත්මික ගතිගුණ මූර්තිමත් කිරීම
- ගන්ධාර ප්‍රතිමා සම්ප්‍රදායත්, මථුරා ප්‍රතිමා සම්ප්‍රදායත් යන දෙකම සංකලනය වීමෙන් දකුණු ඉන්දියාවේ ආන්ද්‍රා ප්‍රදේශයේ අමරාවතී ප්‍රදේශයේ තවත් සම්ප්‍රදායක් බිහිවිය. - අමරාවතී සම්ප්‍රදාය
- මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ අදහස- ලංකාවේ බුදු පිළිම නෙළීම ආරම්භ වූයේ අමරාවතී සම්ප්‍රදාය ගුරු කොට ගෙන බව
- ඩී.ටී. දේවේන්ද්‍ර, නන්දදේව විජේසේකර හා ආචාර්ය සී ගුණසිංහ යන විද්වතුන්ගේ අදහස- බුදුදහම ලක්දිවට පැමිණි මුල්කාලයේ සිටම ලංකාවේ බුදු පිළිම ඇතිවූ බව
- මහාවංශයේ ,
  - දෙවන පැතිස් රජ ථූපාරාමයේ පිහිට වූ "ශිලා පටිමා" නමැති පිළිමය දෙටු තිස් රජු විසින් පාචීන පබ්බත විහාරයේ තැබූ බව
  - රුවන්වැලි සෑ විස්තරයේ දුටුගැමුණු රජ විසින් රනින් කළ බුදු පිළිමයක් තැබූ බව ද සඳහන් වේ.

## බුදු පිළිම වර්ග

- ලංකාවේ බුදු පිළිම නිර්මාණය කළ මාධ්‍යයන්- කිරි ගරුඬ, කළුගල, මැටි, බදාම, ලෝහ, ඇත්දත්, දැව
- බුදු පිළිම ඇතුලත් පිළිම තැනීම පිළිබඳ උපදෙස් අන්තර්ගත ග්‍රන්ථය- "සාරිපුත්‍රය" නම් ග්‍රන්ථය
- සෑම බුදුපිළිමයකම යම්කිසි මුද්‍රාවක් නිරූපණය වේ.
- ප්‍රචලිත මුද්‍රා
    - ධම්මචක්ක මුද්‍රාව- බුදුන් වහන්සේ යමක් පැහැදිලි කරමින් ධර්මය දේශනා කරන අයුරු නිරූපණය වේ.
    - අභය මුද්‍රාව- බිය නොවන්න යන හැඟීම පළකරයි.
    - ධ්‍යාන මුද්‍රාව- බුදුන් වහන්සේ භාවනායෝගී යෝගාවරයෙක් ලෙස නිරූපණය වේ.
    - භූමි ස්පර්ශ මුද්‍රාව- තමා පාරමී ධර්ම පිරූ බවට මිහිකත සාක්ෂි දරයි යන්න මාරයාට ප්‍රකාශ කොට බුදුන් වහන්සේ පොළොවට අත දිගු කර සිටින ලීලාව ප්‍රකාශ වේ.

- ඉරියව් වශයෙන්ද බුදු පිළිම වර්ග තුනකි.
    - හිටි පිළිම
    - ඉඳි පිළිම
    - ඔත් පිළිම/ සැතපෙන පිළිම

### හිටි පිළිම

- වැඩ සිටින ඉරියව්වෙන් නෙළා ඇති පිළිම වේ.
- අනාබද්ධ හිටි පිළිම- බාහිර ආධාරකයක් නොමැතිව වැඩ සිටින සේ නෙළා ඇති බුදු පිළිම.
- ආබද්ධ හිටි පිළිම- පිටුපසින් ඇති පර්වතයකට සම්බන්ධ කොට නෙලා ඇති පිළිම.

### අනුරාධපුරයේ මහ ඉලුප්පල්ලම බුදු පිළිමය



- ලක්දිව පැරණිම බුදු පිළිමය ලෙස සැලකේ.
- අඩි 6ක් උස අනාබද්ධ පිළිමයක් වේ.
- අමරාවතී සම්ප්‍රදායට අයත් මෙය දකුණු ඉන්දියානු කිරිගරුඬ විශේෂයකින් නෙළා ඇති බැවින් ඉන්දියාවෙන් ගෙන් වූ බවට සැලකේ.
- දකුණු අත්ල ඉදිරියට පෙනෙන සේ අභය මුද්‍රාවෙන් නෙලා ඇති මෙහි වැලමිටෙන් ඉහලට නැමුණු වම් අතේ අග්‍ර බාහුවෙන් පාදේ ඇස් වටය දක්වා පහලට එල්ලෙන සිවුර කොට දරා සිටින අතර එම අතේ ඉහලට නැමුණු ඇඟිලි තුඩින් සිවුර ස්පර්ශ කරන බවක් හඟවයි. දකුණු උරහිස විවෘත වන පරිදි ඒකාංශ කොට සිවුර පොරවා ඇති අතර සිවුරු රැළි ද පැහැදිලිව නිරූපණය වේ.
- ආන්ද්‍රා ප්‍රදේශයෙන් ගෙනෙන ලදැයි සලකනු ලබන මෙම පිළිමයේ හස්ත මුද්‍රාව, සිවුරෙහි විස්තර, මුහුණ, ශරීරයේ උස මහත ආදිය වැඩි වෙනසක් නොමැතිව පෙන්වන හිරි ගල් මුවා බුදු පිළිම රුවන්වැලි දාගැබ් මළුවේ පිළිම ගෙයින් ද ලැබී තිබේ.
- ක්‍රි.ව. 2 හෝ 3 වන සියවස් වලට අයත් සේ සලකයි.

## බුත්තල මාළිගාවෙල බුදු පිළිමය



●උසින් අඩි 34 වන අතර උරහිස් හරහා පළල අඩි 10ක් පමණ වේ.
●වෙනත් තැනක නෙළා මෙතැනට ගෙනවුත් ඊට සරිලන පාද පීඨයක පිහිටුවන ලද අනාබද්ධ පිළිමයකි.
●චූල වංශයේ සඳහන් රුහුණෙහි අග්ග බෝධි කුමාරයා විසින් ක්‍රි.ව.600 පමණ දී කානගාමයේ කරවන ලදැයි සළකනු ලබන පිළිමය මෙය විය හැක.

## අවුකන හිටි පිළිමය

- කලාවැව සමීපයේ හුදෙකලා පර්වතයකට සිහින් තීරුවකින් පිටුපසින් සම්බන්ධ වනසේ නෙළා ඇති, පාද පීඨයත් සමග අඩි 42 පමණ උසැති ආබද්ධ හිටි පිළිමයකි.
- චූලවංශයේ ධාතුසේන රජතුමා විසින් කාලසෙල (කලාගල) නම් ස්ථානයේ කරවන ලද පිළිමය මෙය විය හැක.
- බුදුන් වහන්සේගේ දස බලදාරි ගුණය මෙයින් නිරූපනය වෙතැයි සැලකේ.
- අමරාවතී සම්ප්‍රදායේ ලක්ෂණ විද්‍යාමාන වන මෙහි චීවර රැළි ගැඹුරින් මතුකර ඇත. වැලමිටෙන් ඉහලට නැමුණු දකුණු අතේ අත්ල අඩක් පෙරට හැරී ඇති අතර එය ආශීව මුද්‍රාව ලෙස සැලකේ.

අනුරාධපුර යුගයේ අවසාන භාගයට අයත් ලෙස,

- අවුකන ආසන්නයේම සැස්සේරුව නම් ස්ථානයේ පර්වතයක ආබද්ධ පිළිමයක් ලෙස නෙළා ඇති හිටි පිළිමය ද
- වැල්ලවාය අසල බුදුරුවගල නමින් නම් පර්වතයෙහි මහායාන බෝසත්වරුන් පිරිවර කොට ඇතිව නෙළා ඇති අඩි 50 ක් පමණ උස් වූ ආබද්ධ පිළිමයද සැලකේ. එය අවුකන පිළිමය තරම් ඉදිරියට නෙරා එන පරිදි මතු කර නොමැති අතර සියුම් කොටස් බදාම යොදා සකස්කර ඇත. සාමාන්‍යයෙන් හතරැස් හැඩයක් ගන්නා මුහුණක් ඇති මේ ප්‍රතිමාව මහායානිකයන්ගේ නිර්මාණයක් ලෙස සැළකේ.



අවුකන හිටි පිළිමය



බුදුරුවගල හිටි පිළිමය

## ගල් විහාරයේ හිටි පිළිමය



- පොළොන්නරු යුගයට අයත් ආබද්ධ පිළිමයකි.
- මහා පරාක්‍රමබාහු රජු විසින් කරවන ලද උත්තරා රාමයේ පිහිටා. (මෙකල ගල් විහාරය ලෙස හැඳින්වේ)
- සැතපෙන බුදු පිළිමයේ හිස දෙසින් නෙළා ඇති, අඩි 22 ක් පමණ උස, පපුවේ බැඳගත් දෑතින් යුතුව දුක්මුසු ලීලාවක් පිළිබිඹු කරන මෙය බුද්ධ පරිනිර්වාණයේදී ශෝකයට පත් අනද තෙරුන්ගේ පිළිරුව ලෙස ද පිළිගැනේ.
- නමුත්,

  වෙනත් මුද්‍රාවක බුදු පිළිමයක් ලෙස ද පිළිගැනීමට හේතු :-

  - වෙනම ප්‍රතිමා ගෘහයක තිබූ බව සනාථ කරන බිත්ති නටබුන් තිබීම.
  - පිළිමයේ ලඹ සවන් හා වකුටු හිසකේ තිබීම.
  - ශෛලමය පද්මාසනයක් මත වැඩ සිටින සේ නෙළා තිබීම.

- මෙමගින් නිරූපණය වන්නේ පරදුක්ඛ දුක්ඛිත භාවය (අනුන්ගේ දුකේදී කරුණාව දැක්වීම) බව පරණවිතාන මහතාගේ අදහසයි.
- පළල් මුහුණකින් සහ පටු නළලකින්ද, තරමක දිගු නහයකින් ද, ඒකාංශකර පෙරවූ සිවුරකින්ද යුත් මෙහි සිවුරේ රැළි පෙන්වා ඇත්තේ සමාන්තරව ගමන් කරන රේඛා දෙකකිනි.
- පොළොවට මදක් බර වී ඇති දකුණු පාදය ද වම් පාදයේ දණහිස මදක් ඉදිරියට නැමී තිබීමද මෙහි විශේෂ ලක්ෂණයකි.
- මෙම ශෛලියෙන් නෙළන ලද ප්‍රතිමා දෙකක් තිස්සමහාරාමයේ යටාල වෙහෙරින් හා දඹුලු විහාරයෙන් හමුවේ.
- මහනුවර යුගයට අයත් විශාල ශෛලමය හිටි පිළිමයක් මහනුවර ගංගාරාම විහාරයේ ඇත.
- සිරස් පතක් තිබීම මහනුවර යුගයේ පිළිමවල විශේෂ ලක්ෂණයකි.

## වැඩ හිඳිනා පිළිම

- පැරණිම හිඳි පිළිමය ලෙස සැලකෙන්නේ කොළඹ කෞතුකාගාරයේ ඇති - තොලුවිල පිළිමය
- අඩි 5 යි අඟල් 9ක් උස මෙය අනුරාධපුරයේ වටරවුම් පාරේ අභයගිරි පෙදෙසේ තොලුවිල ප්‍රතිමා මන්දිරයක තිබී සොයා ගෙන ඇත.
- ධ්‍යාන මුද්‍රාවෙන් හා වීරාසනයෙන් නිරූපිත වේ.
    - වීරාසනය- දකුණු පය පහසුවෙන් වම්පය උඩ රැඳෙන සේ නෙළා තිබීම
    - පද්මාසනය- පතුල් දෙකම උඩට මතු වී පෙනෙන පරිද්දෙන් නෙළා තිබීම, මෙය ඉන්දියානු වැඩ හිඳිනා පිළිමවල දක්නට ලැබේ.

## මහමෙව්නාවේ සමාධි ප්‍රතිමාව



- අනුරාධපුර මහමෙව්නා උයනේ ඇති අතර ක්‍රි.ව. 4 වන සියවසට පමණ අයත් වේ.
- ධ්‍යාන මුද්‍රාවෙන් හා වීරාසනයෙන් නිරූපිත ය.
- ඉන්දියාවේ මථුරා පිළිම සම්ප්‍රදායට වඩා නැකම් දක්වන බව සැලකේ.
- දකුණු උරහිස විවෘත වන පරිදි ඒකාංශ කොට පොරවා ඇති සිවුර ඇඟට ඇලුණු ස්වභාවයක් පෙන්වන අතර එහි සීමාව කිසිල්ල හා පපුව හරහා යන සියුම් රේඛාවකින් පෙන්වයි.

- පංකුලියේ වැඩහිඳිනා පිළිමය,
    - අනුරාධපුර යුගයට අයත් වේ.(ක්‍රි.ව. 7-8)
    - එක් අතක් අභය මුද්‍රාවෙන් නිරූපිතයි.
- මැදිරිගිරිය වටදාගෙයි ඇති වැඩහිඳිනා පිළිම ද ,පිළිම ගෙය හා සමකාලීන ලෙස හෙවත් සිව් වැනි අග්බෝ රජ සමයට අයත් ලෙස සැලකේ.

## ගල් විහාරයේ වැඩහිඳිනා පිළිම



- පොළොන්නරුවේ උත්තරාරාමය හෙවත් ගල් විහාරයේ දක්නට ලැබෙන පිළිම හතරෙන් දෙකක් වැඩහිඳිනා පිළිම වේ
- විශාල පිළිමය උස අඩි 15 වේ. කුඩා පිළිමය විජ්ජාධර ගුහාවේ ඇත.
- ධ්‍යාන මුද්‍රාව හා වීරාසනය පිළිබිඹු වේ.
- සිවුරු රැළි පෙන්වා ඇත්තේ සමාන්තර රේඛා දෙකකිනි.
- මෙම පිළිම වැඩ හිඳිනා ආසන ද කැටයම්කර ඇති අතර මාරුවෙන් මාරුවට යොදා ඇති සිංහ රූප හා වජ්‍ර රූප කැටයම විශේෂ වේ.
- පිළිම දෙකෙහිම පසුබිම් පර්වත බිත්තිය සාංචි තොරණ කැටයමින් අලංකාර කර ඇත.

- විශාල පිළිමයේ හිස වටා කැටයම් කල රශ්වළල්ලක් ඇති අතර එයට ඉහළින් කුඩා විමාන පහක් තුළ කුඩා ධ්‍යානි බුද්ධරූප 5ක්ඇත.
- මින් මහායානයේ සඳහන් ධ්‍යානි බුදුවරුන් නිරූපණය වන බව සැලකේ.
- කුඩා පිළිමය ශෛලමය ඡත්‍රයක් යට වැඩ සිටින අතර හිස වටා කැටයම් රහිත ප්‍රභා මණ්ඩලයක් ඇත.
- පොළොන්නරුව වටදාගේ බුදු පිළිම වල හිසකෙස් දක්වා ඇත්තේ බොකුටු හිසකෙස් වලින් නොව හිසට ම ඇලී තිබෙන හිස්වැස්මවල් පැළඳගත් ආකාරයෙනි. ඇඟටම ඇලුණු රැලි සහිත සිවුරු ද මේවයේ දැකිය හැක.
- ගඩලාදෙණි විහාරයේ සහ ලංකාතිලක විහාරයේ ඇති වැඩ හිඳිනා පිළිම ගඩොලින් සහ බදාමයෙන් නිමවන ලද ඒවා වේ.
- කෝට්ටේ යුගයේ රචිත සිරි රහල් හිමියන්ගේ සැළලිහිණි සංදේශයේ, කැලණි විහාරයේ පැවැති පිළිම රාශියක් පිළිබඳ විස්තර ඇත. මුචලින්ද නාග දරණයේ වැඩ විසූ ආකාරය පෙන්වන වැඩහිඳිනා පිළිමයක් හා සමාධි පිළිමයක් ඒ අතර වේ.

## ඔත් පිළිම

- බුදුන් වහන්සේ සැතපෙන ඉරියව්වෙන් නිර්මිත පිළිම වේ.
- ගලින් නෙළා ඇති ඇලහැර සැතපෙන පිළිමයත්, තන්තිරිමලේ සැතපෙන පිළිමයත් අනුරාධපුර යුගයේ අගභාගයට අයත් වේ.
- හොඳ තත්ත්වයකින් ඇති විශාලතම ඔත් පිළිමය වන්නේ පොලොන්නරුවේ ගල්විහාරයේ සැතපෙන පිළිමයයි.
- මෙය හිස පටන් දෙපතුල දක්වා දිගින් අඩි 46 කි. සමාන්තර රේඛා දෙකකින් සිවුරු රැළි දක්වා ඇත.
- කෝට්ටෙ යුගයේදී VI වන ශ්‍රී පරාක්‍රමබාහු රජුගේ කාලයේ රචිත සැළලිහිණි සංදේශයේ කැලණි විහාරයේ තිබූ ඔත් පිළිමයක් පිළිබඳ සඳහන් වේ.
- මහනුවරයුගයේ ලෙන් විහාර රාශියකම ගලින් හා ගඩොලින් කළ විශාල ඔත් පිළිම ඇත.
- දඹුල්ලේ දෙව්රජ විහාරය නම් පිළිමගෙයි ඇති ශෛලමය ඔත් පිළිමය රන් ආලේප කර ඇත. මහනුවර යුගයට අයත්වේ.
- දෙගල්දොරුව ලෙන් විහාරයේත්, කැලණිය පැරණි විහාරයේ ඇති ඔත් පිළිම ද මහනුවර යුගයේ කීර්ති ශ්‍රී රාජසිංහ සමයට අයත් සේ සැලකේ.




ගල් විහාරයේ සැතපෙන පිළිමය

## බෝධිසත්ව ප්‍රතිමා

- ක්‍රි.ව. 5 වන සියවසින් මෙපිට කාලයේදි බෝධි සත්ව වන්දනාව ඇති වී ඇත.
- හීනයාන බුදුදහම හා මහායාන බුදුදහම යන දෙකටම පොදු වූ මෛත්‍රී බෝධි සත්වයන්ට වැඳුම් පිදුම් කිරීම අනුරාධපුර යුගයේ අවසාන භාගයේ දී දක්නට තිබේ.

### මෛත්‍රී බෝධිසත්ව ප්‍රතිමා

- චූලවංශයේ,
    - දප්පුල රජ විසින් රියන් 15 උස බෝධි සත්ත්ව පිළිමයක් ද
    - පරාක්‍රමබාහු රජ විසින් මෛත්‍රී බෝධිසත්ව පිළිම තුනක්ද කරවූ බව සඳහන් වේ.
- මහනුවර කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා මෛත්‍රී බෝධි බෝසත් පිළිම දෙකක් කුරුණෑගල රිදී විහාරයේ කළ බව සඳහන් වේ.
- මේවා සාමාන්‍යයෙන් ස්වර්ණාභරණ විභූෂිතව වැඩ සිටින විලාශයෙන් නිරූපණය කරයි
- හඳුනා ගැනීමට හැකි විශේෂ ලක්ෂණය වන්නේ ජටා මකුටයේ (හිස්වැස්ම) ඇති ස්තූප සංකේතයයි.
- එහි අත්වලින් ධර්ම චක්‍ර, විතර්ක වැනි මුද්‍රාවලින් එකක් හෝ දෙකක් නිරූපණය වේ.
- පරන්තන් වලින් ලැබුණු ප්‍රතිමාව අඩි පහක් උස වන අතර දැනට අනුරාධපුර කෞතුකාගාරයේ ඇත.
- කොළඹ කෞතුකාගාරයේ ඇති විශාල පිළිමය අඟල් 18 ක් පමණ උස් වේ. මෙය අනුරාධපුරයේ ථූපාරාමය අතුරින් සොයාගෙන ඇත. දණහිස, ඉහටිය සහ උරහිස යන තුන් තැනකින් වක්වූ තිවංක පිළිමයකි. දකුණතින් විතර්ක මුද්‍රාවත්, වමතින් වරද මුද්‍රාවත් නිරූපණය වේ.

### වෙනත් මහායාන බෝධිසත්ව ප්‍රතිමා

- බුදුරුවගල හිටි පිළිමය දෙපසින් මහායාන බෝධිසත්ව වරුන්ගේ ප්‍රතිමා දැකිය හැක.
- බුදු පිළිමයට දකුණු පසින් අවලෝකිතේශ්වර බෝධිසත්වයන්ගේ ද ඔහුගේ බිසව වන තාරා දේවියගේ ද පිළිරුව දක්නට ඇත.



- බුදු පිළිමයට දකුණු පසින් මංජු ශ්‍රී බෝධිසත්වයන් හා ඔහුගේ ශක්තියත් (බිසවත්) හඳුනාගත හැක.

#### කුෂ්ඨරාජගල

- ගාලු මාතර මාර්ගය අසල වැලිගම පර්වතයක නෙළා ඇති අවලෝකිතේශ්වර ප්‍රතිමාවකි.
- ජටා මකුටයෙහි ඉදිරියෙන් හා දෙපසින් කුඩා ධ්‍යානි බුද්ධ රූප හතරක සටහන් දක්නට ඇත.
- දකුණු අතින් විතර්ක මුද්‍රාවත් වම් අතින් වරද මුද්‍රාවත් නිරූපණය වේ.
- ඍජු ශරීරය සමමිතික ස්වරූපයක් ගනී.
- මෙය සමන්ත භද්‍ර මහායාන බෝධිසත්වයන් ගේ පිළිරුවක් බව ප්‍රකාශ කෙරේ.

# 10. පාඩම
# බෞද්ධ කැටයම් කලාව

## පැරණි විහාර දොරටුවක අංග

- ප්‍රධාන අංග කිහිපයකි.
  - සඳකඩ පහණ
  - මුරගල්
  - පියගැට
  - කොරවක් ගල

## සඳකඩ පහණ

- පැරණි බෞද්ධ සිද්ධස්ථානයකට ඇතුළුවන පියගැට පෙළ පාමුල ඇති අර්ධ කවාකාර ගල් පඩිය වේ.
- ඉන්දියාවේ ආන්ද්‍රා දේශයේ නාගාර්ජුන කොණ්ඩයෙත්, අජන්තා ගුහා විහාර කිහිපයක් ළඟත් වාම් සඳකඩපහණ දක්නට ඇත.
- භාරතයේ හොඳම සඳකඩ පහණ ඇත්තේ නාගර්ජුන කොණ්ඩ විහාරයේ සිංහලාරාමයේය.
- ඉතා මටසිලුටු අර්ධ වෘත්තාකාර ගල් පඩියක් වටා පිටතින් නෙළා ඇති සත්ත්ව රූපාවලිය මෙහි ඇති එකම කැටයම වේ.
- අනුරාධපුර ශ්‍රී මහා බෝධි විහාරයේ ඇති, මධ්‍යයේ අඩ නෙළුමක රූසටහන සහිත අර්ධ කවාකාර ගල් පඩිය අප රටේ මුල් කාලයේ කැටයම් විරල වාම් සඳකඩ පහණ නිර්මාණය කළ බවට නිදසුනකි.

## අනුරාධපුර යුගයේ සඳකඩපහණ

- අර්ධ වෘත්තාකාර සඳකඩපහණෙහි අර්ධ වෘත්තයට සමාන්තරව ඒක කේන්ද්‍රික ව විහිදෙන තීරු ගණනාවක් ඇත.
- පිටත සිට මධ්‍යයට ඒවා මෙසේය.
  - ගිනි සිළු වැනි පලා පෙති කැටයම- ලෝකයා රාග, ද්වේෂ නමැති ගින්නෙන් පිලිස්සෙන බව ප්‍රකාශ වේ.
  - එක එකා පිටිපස්සෙන් ගමන් කරන ඇතා ,අශ්වයා, සිංහයා සහ ගොනා යන සතුන් සතර දෙනා නැවත නැවත නිරූපණය කරන කැටයම- ජාති, ජරා ,ව්‍යාධි, මරණ යන සතර භය නිරූපණය වේ.
  - ලියවැළ- ලෝවැසි සත්වයා තණ්හා ලතාවෙන් බැඳී කම්සැප විඳීම නිරූපණය වේ.
  - එක පැත්තකට ගමන් ගන්නා හංසාවලිය- තණ්හාවට පිටුපා ගිහිගෙය අතහැර යන ආර්ය පුද්ගලයන් නිරූපණය වේ.

- ○ මධ්‍යයෙහි ඇතුලට සහ පිටතට විහිදුණු පෙති දෙපළක් සහිත අර්ධ පද්මය- ශුද්ධාවාසයන් හෙවත් බඹලොව මූර්තිමත් කරයි.
- මෙසේ පරණවිතාන මහතාගේ අදහස අනුව සඳකඩ පහණ බව චක්‍රය සංකේතවත් කරයි.
- අනුරාධපුර යුගයේ විශිෂ්ටතම සඳකඩපහණ ලෙස බිසෝ මාළිගය නම් ස්ථානයේ ඇති සඳකඩපහණ සැලකේ.
- මෙම සඳකඩ පහණේ හංසයන් තුඩින් කොළ දෙකක් සහිත නෙළුම් කැකුලක් දරා සිටී.
- අනුරාධපුර ථූපාරාමය අසල පිහිටි දළදා මාලිගයේ සඳකඩපහණේ හංසයන් තුඩින් කිසිවක් නොදරයි.
- මීට අමතරව රුවන්වැලිසෑයත්, ථූපාරාමයත් අතර ගොඩනැගිල්ලක ඇති සඳකඩපහණ ද, රුවන්වැලිසෑය හා බසවක්කුලම අතර ඇති සඳකඩ පහණ ද, ශ්‍රී මහා බෝධි විහාරයේ ඇති සඳකඩ පහණ ද දැකිය හැක.

## පොළොන්නරු යුගයේ හා ඉන්පසු සඳකඩ පහණ

- අනුරාධපුර යුගයේදී ඇතා සිංහයා ආදී සතුන් සතර දෙනා එකම තීරුවක දැක්වූ නමුත්, පොළොන්නරු යුගයේදී එක් එක් සතුන් හංසාවලිය මෙන් වෙන් වෙන් තීරවල යොදා ඇත.
- හින්දූන්ගේ පූජ්‍ය වස්තුවක් වූ ගවයා පොළොන්නරු සඳකඩ පහණෙන් ඉවත් කර ඇත.
- කැටයම් බහුලවීම නිසා චාම් බව ඉවත් වී ඇත.
- වටදාගෙයි සඳකඩපහණ පොළොන්නරුවේ සඳකඩපහණ වලට නිදසුනකි.
- පොළොන්නරු යුගයෙන් පසු සඳකඩ පහණ ක්‍රමයෙන් අඩ කවයකට වඩා විශාල විය.
- මහනුවර යුගයේදී, සඳකඩ පහණෙහි මධ්‍ය වෘත්තය. සම්පූර්ණයෙන්ම පද්මය දැක්වේ.
- පසුකාලීනව සත්ව රූප සම්පූර්ණයෙන්ම ඉවත් වී ඇති අතර ලියවැල්, පලාපෙති සහ වෙනත් ලතා කර්ම වලින් සම්පූර්ණයෙන්ම කැටයම් කිරීම සිදු කර ඇත.



බිසෝමාළිගයේ සඳකඩ පහණ



වටදාගෙයි සඳකඩපහණ



මහනුවර යුගයේ සඳකඩ පහණ

## මුරගල්/ ද්වාර රූප

- විහාර දොරටුවක සඳකඩපහණ දෙපස කොරවක් ගලට ඉදිරියෙන් ඇත.
- මූර්ති කැටයම් සහිත හෝ රහිත අර්ධ කවාකාර මුදුනක් සහිත ගල් පුවරු වේ.
- මුල් කාලයේදී කැටයම් රහිත අර්ධ කවාකාර හෝ පලාපෙති හැඩයක් ඇති ආයතාකාර ගල් පුවරු විය.
- පසුව පූර්ණ කැටයමක් සහිත මුරගල් බිහිවූ අතර එහිදී සමහරෙක පූර්ණ ඝටයක සටහනක් පමණක් දැක්වෙන අතර සමහර මුරගල් වල කොළ, මල් විහිදෙන පුන්කළසක රූපයක් දැකිය හැක.
- ඉන්පසු බහිරව රූප හෙවත් වාමන රූප සහිත මුරගල් බිහිවිය. මෙවැනි මුරගල් තොලුවිල ද, අනුරාධපුරයේ අභයගිරි දාගැබෙහි ද, I විජයබා රජ මාලිගයේ ද දක්නට ඇත.
- මුරගලේ විකාශයේ  දියුණුම අවස්ථාව වන්නේ මිනිස් වෙස් ගත්නා රජ මුරගලයි.
- මෙවැනි නා රජ මුරගලක් අනුරාධපුරයේ ථූපාරාමයට නිරිතදිග පැත්තෙ පූජනීය ස්ථානයක ඇත.
- කලාකෘතියක් වශයෙන් ඉතාම අගය කරනු ලබන මුරගල හමුවන්නේ අනුරාධපුරයේ රත්නප්‍රාසාදයෙනි.





## කොරවක් ගල

- සාමාන්‍යයෙන් එක් පියගැටපෙළක් දෙපස කොරවක් ගල් දෙකක් පිහිටන අතර මුරගලට පිටුපසින් පිහිටා ඇත.
- මෙමගින් පඩි පෙළෙහි නගින්නන්ට ආරක්ෂාව සැපයීමත්, පඩිපෙළෙහි ස්ථාවරත්වය රැකීමත් සිදුවේ.
- පූජනීය ස්ථානවලට ප්‍රවිෂ්ට වන ස්ථානයන්හි පමණක් නොව රජමාලිගා වලට ඇතුල් වන ස්ථානවල හෝ පොකුණුවලට බසින තැන්වල පියගැට දෙපස ද කොරවක්ගල් දැකිය හැක.
- කැටයම් ආදියක් නොමැති රළු කොරවක්ගල් ආදීතම කොරවක්ගල් වේ.
- අනුරාධපුර යුගයේ කොරවක්ගල් ශීර්ෂය මකර මුඛයකින් නිකුත්වන ලිය වැලක විලාශය ගන්නා අතර මෙම ලියවැල විශාල වෘත්තාකාර දඟරයක් හෙවත් සංසසූරි ලතා කරණයකින් කෙළවර වේ.
- කොරවක් ගලේ පිටට පෙනෙන සිරස් බිත්තියේ සිංහ, හස්ති, නාග හෝ වාමන රූප කැටයමක් බොහෝවිට දක්නට ඇත.
- ථූපාරාමය අසල ගොඩනැගිල්ලක ඇති එක් කොරවක්ගලක පහතින් ඇති සිංහ රූපය ට ඉහළින් යම් කතාවක් හෝ ජාතක කතාවක් කැටයම් කර ඇති බව ද දැකගත හැක. එහි වඳුරා, නයා, මුගටියා හා මොණරා වැනි සතුන් නිරූපිතය.
- පොළොන්නරුවෙ කොරවක්ගල් අනුරාධපුර යුගයේ කොරවක් ගල් වලට සමාන වුවද මකර රුව රඳා සිටින කුලුනු කැටයමෙන් කොරවක් ගල් බිත්තිය අසමාන කොටස් දෙකකට බෙදේ.
- කුඩා ඉඩ කොටසෙහි තිවංක ඉරියව්වෙන් නෙළා ඇති නාග රජෙකු බඳු රූපයක් ඇති අතර විශාල කොටසේ සිංහ රූපයක් දක්නට ලැබේ.
- පොළොන්නරු යුගයෙන් පසු ගජසිංහ හිස්, ඇත් හිස් හෝ සිංහ හිස් සහිත කොරවක්ගල් දක්නට ඇත.
- යාපහුව දළදා මාළිගාවට පිවිසෙන පියගැට පෙළ - ගජසිංහ රූපයක්.
- දඹදෙණියේ නටබුන් අතර හස්ති රුවක් සහිත කොරවක් ගලක්
- ගඩලාදෙණිය විහාරය- ගජසිංහ රූප සහිත කොරවක්ගල්



ගජසිංහ හිස සහිත කොරවක්ගල




හස්ති හිස සහිත කොරවක් ගල

## පියගැට

- පියගැට පහලම පඩිය සඳකඩ පහණ වන අතර ආරක්ෂක අත්වැල වශයෙන් කොරවක්ගල් පිහිටා ඇත.
- පියගැටයෙහි ඉදිරිපස හෙවත් සිරස්තලය කැටයම් කර තිබුණි.
- අනුරාධපුර සිද්ධස්ථානවලට ඇතුළු වන මාර්ගයන්හි පියගැට කැටයම් වශයෙන් බොහෝ විට ඇත්තේ වාමන රූපයි.
- පියගැටෙහි දෙකෙලවර හා මැද වාමන රූප තුනක් ඇති අතර එක් එක් වාමන රූපය දෙපසින් කුලුනු කැටයම් දෙකකි.
- පොළොන්නරු යුගයේ පිය ගැටයක වාමන රූප රාශියක් දක්නට ඇත.



## චෛත්‍යය වාහල්කඩ කැටයම්

- ඉන්දියානු දාගැබ්වල නොමැති ලංකාවේ දාගැබ්වල ඇති විශේෂ අංගයකි.
- දාගැබක වාහල්කඩ හතරක් ඇත
- චෛත්‍යයේ ගර්භයටම සම්බන්ධ කර ඇති අතර මේවා සතර දිග දොරටුවලට මුහුණලා ඇත.

### මිහින්තලේ කණ්ඨක චෛත්‍යයේ වාහල්කඩ කැටයම්

- කණ්ඨක චෛත්‍ය සෑදූ රජු සඳහන් නැතත් සද්ධාතිස්ස රජ ප්‍රතිසංස්කරණය කළ බවත් ලඤ්ජතිස්ස රජ ථූපය විශාල කළ බවත් සඳහන් වේ.
- වාහල්කඩවල පහළ කොටස ගලින් නිම වී ඇති අතර ඉහළ කොටස ගඩොලින් හා හුණු බදාමයෙන් නිම කර ඇත.
- වාහල්කඩ දෙපස ඇති ගල් කුළුණු වලින් පැති දෙකක් ගඩොල් බැම්මට සම්බන්ධ ඇති අතර ඉතිරි පැති දෙක අල්පෝන්නත කැටයමින් අලංකාර වේ.
- වාහල්කඩ සතරේ කුලුනු මත සත්ව රූප වර්ග හතරක් ඇත

- නැගෙනහිර කුළුණු - ඇත් රූප
    - උතුරු කුළුණු - සිංහ රූප
    - දකුණු කුළුණු - වෘෂභ රූප
    - බටහිර කුළුණු - අශ්ව රූප
- නැගෙනහිර වාහල්කඩ කුළුණක එක් තලයක් ආයතාකාර ඵලක වලට බෙදා ඇති අතර සමහර ඵලකවල ඇතා, පැටවුන් සමඟ මොණරෙකු හා කළයකින් නිකුත් වන කොළ මල් සහිත කැටයමක් ද යොදා ඇත. මෙය කණ්ඨක චෛත්‍යයට ම විශේෂ වේ.





## අභයගිරි චෛත්‍යයේ වාහල්කඩ කැටයම්

.

- සූර්ය දේවයාගේ රූපය, සප්ත රත්තනය සහිත චක්‍රවර්තී රජෙකුගේ රූපය වැනි මූර්තීන් දක්නට ඇත.
- සම්ප්‍රදායයෙන් මේ මූර්තී කැටයම් ආන්ද්‍ර දේශයේ අමරාවතී හා නාගාර්ජුන කොණ්ඩ ශිල්ප ක්‍රමයට සමානකමක් දක්වයි.

# 11. පාඩම
# බෞද්ධ චිත්‍ර කලාව

## අනුරාධපුර යුගයේ බිතු සිතුවම්

- ලංකාවට බුදු දහම එන්නට පළමුද මෙරට චිත්‍ර කලාවක් තිබෙන්නට ඇත.
- මෙකලත් පවත්නා බලි චිත්‍ර කලාව එම ආදී දේශීය චිත්‍ර කලාවෙන් පැවතෙන්න කැයි අදහස් කෙරේ.

### ආදිම බෞද්ධ චිත්‍ර

- චුල්ල වග්ගයේ සේනාසනක්ඛන්ධයේ දැක්වෙන පරිදි භික්ෂු ආරාමයන්හි බිත්ති හා ගෙබිමෙහි සුදු පාට, ගුරුපාට වර්ණාලේපය බුදුන් වහන්සේ විසින් අනුදැන වදාළ බව පෙනේ.
- මේ වර්ණ භාවිතය බෞද්ධ චිත්‍ර කලාවේ මුල් අවස්ථාවක් ලෙස සිතිය හැකි ය.
- මනාව ඔප මට්ටම් කළ බිත්ති ඇති කල්හි ඒවායේ සිතුවම් ඇඳීමට පෙළෙඹීම ස්වාභාවිකය.
- සමහර භික්ෂූන් වහන්සේලා මේ බිත්ති වල ස්ත්‍රී රූප හා පුරුෂ රූප ආදිය සිතුවම් කළහ.
- මහජන මතය ගරු කළ බුදුන් වහන්සේ ඊට විරුද්ධත්වය ප්‍රකාශ කොට මේ ස්ත්‍ර පුරුෂ රූප වෙනුවට මල්කම්, ලියකම් ආදී සිතුවමින් සැරසීම අනුදැන වදාළහ.
- මේ අනුව ස්වභාව ධර්මයේ ඇති මල් ලියකම් ආදිය අනුගමනය කරමින් භික්ෂූන් වහන්සේලා ද චිත්‍ර කලාවේ නියැලුන බව සිතිය හැකි ය.

- ථෙරගාථා අටුවාව අනුව බිම්සර රජ (ක්‍රි. පූ. 542 - 490) ස්වකීය මිත්‍රයෙකුට බුද්ධ චරිතාපදානය සිතුවම් පටියකට නංවා යැවූ බව පෙනේ.
- කුස ජාතකයේ එන බෝධිසත්වයෝ විරක් එකල අනෙක් කලාකරුවන් පුදුමයට පත් කරමින් ලස්සන කාන්තා රුවක් රනින් මූර්තිමත් කළහ.
- මනහර සිතුවම්වලින් උමඟක් අලංකාර කළ අයුරු උමංදාවේ එයි.
- සඟමිත් තෙරණියන්ගේ දේහය ආදාහනය කරන ලද්දේ ථූපාරාමයට නැගෙණහිරින් පිහිටි “චිත්‍රශාලාව" සමීපයෙහි ය.
- මේ " චිත්‍ර ශාලාව " සිතුවම් සඳහා කැප කළ ගොඩනැගිල්ලක් විය හැකි ය.
- දුටුගැමුණු රජුට ලෝහ ප්‍රාසාදය සඳහා සැලසුම සපයන ලද්දේ භික්ෂූන් වහන්සේ විසිනි.
- රහතන් වහන්සේලා " හරණි" නම් එක් දෙව් දුවකගේ මාහැඟි විමානයක් දැක එය හිඟුලෙන් වස්ත්‍රයක ඇඳගෙන (මහාවංශ 27 පරි. 18 ගාථාව) රජුට ඉදිරිපත් කළ බව කියැවේ.
- භික්ෂූන් වහන්සේ චිත්‍ර කලාව හුරුවක් ලද කෙනෙකු බවත්, එකල “චිත්‍ර වස්ත්‍ර” හෙවත් රෙදි පිළි පින්තාරු ක්‍රමය තිබී ඇත.

- පස්වෙනි සියවසේ අටුවාචාරි බුද්ධඝෝෂ හිමියන් රචනා කළ විසුද්ධි මාර්ගයෙහි කුරණ්ඩක ලෙනෙහි සත් බුදුවරුන්ගේ අභිනිෂ්ක්‍රමණ චිත්‍රයට නගා තිබූ බව සඳහන් වේ.

"කුරණ්ඩක ලෙණෙ කිර සත්තන්නං බුද්ධාන -
අභිනික්මෙන චිත්ත කම්මං මනොරඹා
අහොසි (විසුද්ධිමගග - සීලනිද්දෙස) "

- මෙහි සඳහන් කුරණ්ඩක ලෙණ දකුණු පලාතේ පිහිටි ‘‘කරවිගල’’ ලෙස හඳුනාගෙන ඇති අතර එය ක්‍රි.ව. 2 සියවසට අයත් ලෙස සලකනු ලැබේ,

## සීගිරි සිතුවම්

- ලක්දිව විද්‍යාමාන ආදිම පැරණි සිතුවම් ලෙස සලකනු ලබන්නේ 5 සියවසට අයත් සීගිරි සිතුවම් ය.
- සීගිරි සිතුවම් අතර ඇත්තේ මල් ලියකම් සහිත අලංකාර ශීර්ෂාභරණයන්ගෙන් සැරසුණු හිස් ඇති, අලංකාර ආභරණයන්ගෙන් සුසැදුනු සවන්, ගෙල, ළය හා දෑත් ඇති විවිධ ඉරියව්වෙන් යුත්, උඩුකය පමණක් දැක්වෙන නාරි රූප යි.
- මේ සිතුවම් බෞද්ධ ආගමික චිත්‍ර දැයි කෙනකුට සිතෙනු ඇත.
- සීගිරි කාන්තාවන් නිරූපණය කරන්නේ කවුරුන් ද යන්න පිළිබඳ ව විචාරකයෝ විවිධ මත දරති.
- පුරාවිද්‍යා කොමසාරිස්ව සිටි බෙල් මහතා ප්‍රකාශ කෙළේ මේ චිත්‍ර වලින් නිරූපණය වන්නේ කාශ්‍යප රජුගේ බිසෝවරුන් හා සේවිකාවන් අසල ඇති පිදුරංගල විහාරයට වන්දනාවේ යන බවයි.
- වන්දනාව නම් ආගමික කටයුත්තකි.
- ආනන්ද කුමාරස්වාමි, කොඩ්රිංටන්,හොකාට් සහ බෙන්ජමින් රෝලන්ඩ් වැනි විද්වතුන් ප්‍රකාශ කළේ ඔවුන් අප්සරාවන් බව යි.
- මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා ඔවුන් හඳුන්වන්නේ විජ්ජුලතා (විදුලි කුමරියන්) හා මේඝලතා (වලා කුමරියන්) යන නම් වලිනි.
- ගොවිතැන සඳහා අවශ්‍ය වූ වැස්සත් ඒ හා සම්බන්ධ වූ විදුලියත් දේවත්වයෙන් පුදන ලද බව ඒ මහතාගේ අදහසයි.

- සිගිරි සිතුවම් වලින් නිරූපණය වන විෂය ආගමික වූවත් නුවූවත් සීගිරි සිතුවම් දඹදිව අජන්තා විහාරයන්හි බෞද්ධ සිතුවම් ගුරු කොට ගෙන ඇති බව විචාරකයෝ කවුරුත් පිළිගනිති.
- එසේම සිගිරි යුගයෙන් පසු පොළොන්නරු යුගයේ අවසානය දක්වා ම බෞද්ධ සිතුවම් සඳහා සීගිරි සම්ප්‍රදාය අනුගමනය කර ඇති බව පෙනෙන බැවිනුත් සීගිරි සිතුවම් සම්ප්‍රදාය බෞද්ධ සිතුවම් කලාවක් ලෙස පිළිගැනීම වරදක් නොවේ.

- සීගිරි සිතුවම් අතර දැනට විද්‍යාමාන වන්නේ කාන්තා රූප 21 ක් පමණ වුවත් එහි පින්තූර පන්සිය ගණනක් තිබූ බව කැටපත් පවුරේ කුරුටු ගී වලින් (ගී.අං. 249 හා 560) පෙනේ.
- කැටපත් පවුරේ ඇති හත්සිය ගණනක් වූ කුරුටු ගී අතරින් වැඩි ගණනකින් කියැවෙන්නේ නරඹන්නන් මේ කාන්තා රූ දැක වශී වූ හැටිය.

- සීගිරි කලාවේදීන් ද අජන්තා ශිලිපීන් මෙන් ම මිනිස් ශරීර ව්‍යුහය පිළිබඳ මනා අවබෝධයක් ලබා සිටිය බව පැහැදිලි ය.

- ශිල්ප ක්‍රමය කෙසේ වෙතත් වර්ණ, හැඩ, රේඛා හා මුද්‍රා යන අංග වලින් සීගිරි සිතුවම් අජන්තා සිතුවම් වලට සමහර කරුණු වලින් සමාන වෙයි.
- සීගිරි චිත්‍ර ඇඳීම සඳහා ගල්තලය පිළියෙල කරගෙන ඇත්තේ මැටි, කිරිමැටි, දහයියා හා කොහු යන මේවායින් සාදා ගත් මිශ්‍රණයක් ආලේප කිරීමෙනි.
- ඒ මත සුදු හුණු ගා පිරිමැද රතු පැහැයෙන් ආකෘති ඇඳ ඇත. ඉක්බිති කහ, රතු කොළ (පච) යන වර්ණ යොදා චිත්‍ර සම්පූර්ණ කර ඇත.
- ශරීරයේ හා අඟපසඟ වල හැඩය, පුෂ්ටිමත් බව පෙනෙන පරිද්දෙන් රේඛා භාවිතා කොට ඇත.
- හතරවන හා පස්වන සියවස් මෙරට ලලිත කලාවන් ගේත් උපරිම දියුණු යුගය ලෙස සැලකිය හැකි ය.

- විශේෂයෙන් ම අත් ඇඟිලි නිරූපණය කිරීමේ දී ඉතා සියුම් අන්දමකින් රේඛා හසුරුවා ඇති බව පෙනේ.
- සුන්දර කාන්තාවන්ගේ ලක්ෂණ හැටියට එකල පොදුවේ පිළිගත් සිහිනිඟ හා පුත් පියොවුරින් යුත් මේ වනිතා රූප නරඹන්නන් තුළ තරමක සරාගී බවත් දනවයි.
- එසේ ම මේ රූප අජන්තා සිතුවම් වලටත් වඩා සජීවී බවක් දක්වන බව පරණවිතාන මහතාගේ අදහස යි.

## හිඳගල චිත්‍ර

- සීගිරි සම්ප්‍රදායයටම අයත් චිත්‍ර ඊළඟට දැකිය හැක්කේ මහනුවර ආසන්නයේ හිඳගල විහාරයේය.
- දැනට මැකී ගොස් ඇති මේ සිතුවම් ක්‍රි.ව. 7 සියවසට අයත් ලෙස සලකනු ලැබේ.
- මිනිස් රූප නොයෙක් ඉරියව්වෙන් දැකීමට සමත් වී ඇති බව පෙනේ.
- සීගිරි සිතුවම් වලටත් වඩා ප්‍රාණවත් රේඛා භාවිතය මේ සිතුවම් අතර දැකිය හැකි බව පරණවිතාන මතය යි.
- ඉන්ද්‍රශාල ගුහාවෙහි බුදුරදුන් වැඩ සිටි අවස්ථාවක දී උන්වහන්සේ හමුවීමට ශක්‍රයා පැමිණි වග මේ සිතුවම් වලින් නිරූපණය වෙයි.
- මිහින්තලේ දාගැබක ධාතු ගර්භයකින් සොයාගත් දේවතාවන් වලාකුළු තුළින් මතුවන අන්දම දැක්වෙන සිතුවම් ද සීගිරි සිතුවම් කලාවේ ලක්ෂණ පෙන්වයි. මේ සිතුවමේ ඇත්තේ ආකෘතික රේඛා පමණි. මෙය 8 වන සියවසට අයත් ලෙස සැලකේ.

## පොළොන්නරු යුගයේ බිතු සිතුවම්

- රාජමාලිගාත්, සරස්වතී මණ්ඩපයත් සිතුවමින් අලංකාර කොට තිබූ බව චූලවංශයේ සඳහන් වේ.
- පොළොන්නරු යුගයට අයත් පැරණි ම සිතුවම් ලෙස සැලකිය හැක්කේ මහියංගන ථූපයේ ධාතු ගර්භයෙන් සොයාගත් චිත්‍රයි.
- මේ සිතුවම් අයත් වන්නේ 1 විජයබාහු (1055 – 1110) රජුගේ කාලයට යි.
- රේඛා වලින් රූප සටහන් ඇඳ සුදුසු වර්ණ යොදා නිමකොට ඇති මේ සිතුවම් අනුරාධපුර යුගයේ සිතුවම් සම්ප්‍රදාය අඛණ්ඩව පොළොන්නරු යුගයට ද පැමිණ ඇති බව පෙනේ.
- මාර පරාජය කොට බුද්ධත්වය ලබා ගැනීම පිළිබඳ සිද්ධිය මෙහි ඇතුළත් චිත්‍ර කථාව යි.
- බුදුරජාණන් වහන්සේ දෙව් බඹුන් පිරිවරා බෝරුක මුල වැඩ සිටිනු පෙනේ.
- වෙන් වෙන්ව ඇඳි බෝපත් ඉතා පැහැදිලි ය.
- පිරිවර දෙවිවරුන් අතරින් ශිව සහ විෂ්ණු යන දෙදෙනා ද හඳුනා ගත හැකි ය. දෙවියන්ගේ ශරීර වල හා අත් පා ආදියේ වටකුරු බව පෙන්වන අයුරින් රේඛා භාවිත කොට ඇති අතර අත් ඇඟිලි දක්වා ඇති අයුරු මනහර ය.
- ඒවා කෙනකුට අජන්තා චිත්‍ර සිහිගන්වයි.
- රතු කහ, කළු සහ සුදු වර්ණ යොදා ඇති මේ චිත්‍ර සෞන්දර්යය අතින් උසස්ය.
- කාලයේ අනුපිළිවෙළට ඊළඟට සැලකිය යුත්තේ දිඹුලාගල හෙවත් උදුම්බරගිරි විහාරයේ සිතුවම්ය.
- මෙහි මාර වීදිය නමැති ස්ථානයේ ලෙන්වල ඇඳ තිබුණු චිත්‍ර අතර සස ජාතක කථාවත්, දේවදත්ත තෙරුන් හා ඇතකු පිළිබඳ සිද්ධියකුත් දැක්වෙන චිත්‍ර තිබූ බව කියනු ලැබේ. මේ චිත්‍ර මැකී යමින් පවතී.
- දිඹුලාගල අසලම පුල්ලිගොඩ පර්වත කුහරයත රැස් වළලු සහිතව මල් ගත් අත් ඇතිව බුමුතුරුණක හිඳගෙන සිටින පස් දෙනෙකුගේ සිතුවමක් දැකිය හැකිය.
- සමහර විට මේ බුදුන් වඳින දෙවිවරුන් කණ්ඩායමක් විය හැකි ය.
- පොළොන්නරුවේ ගල් විහාරයේ සහ ලංකාතිලකයේ ද වර්ණ චිත්‍ර කැබලි කීපයක් දක්නට ලැබේ.
- ගල් විහාරයේ බිත්ති මුල්ලක ඉතිරි වී ඇති දික් රැවුලක් සහිත උඩුකය විතරක් ඇති මිනිස් රූපය මුහුකුරා ගිය නුවණක් හා භක්ති මහිමයක් එහි මුහුණෙන් පිළිබිඹු කරයි.

### තිවංක පිළිම ගේ බිතු සිතුවම්

- පොළොන්නරුවේ ඇති විශාලතම චිත්‍රාවලිය දක්නට ලැබෙන්නේ මහා පරාක්‍රමබාහු (1153 – 1186) රජු විසින් ගොඩ නගන ලද තිවංක පිළිමගෙය නමින් හැඳින්වෙන විහාරයේ ය.
- මෙම විහාරය ii පැරකුම්බා (1236 - 1271) රජ කාලයේදීත් ප්‍රතිසංස්කරණය කර ඇති බැවින් මෙහි ඉතිරි වී ඇති සිතුවම් මහා පැරකුම්බා රජුගේ හෝ ii පැරකුම්බා රජුගේ කාලයට ඇතුළත් විය යුතුය.

- මෙහි ගන්ධ කුටියේ බිත්ති වල ඇති සිතුවම් වැඩි වශයෙන් බුද්ධ චරිතය නිරූපණය කරන අතර අන්තරාලයේ සිතුවම් වලින් ජාතක කථා දැක්වෙයි.

- මට සිලුටු කරන ලද වියළි බිත්ති මත පළමුවෙන් රතු පාටින් චිත්‍රයන්ගේ බාහිර රේඛා ඇඳ ඇති අතර රතු, කහ, කොළ යන වර්ණ යොදා සිතුවම් සම්පූර්ණ කර ඇති බව පෙනේ.
- තැනට ගැලපෙන පරිද්දෙන් රේඛා නැමීමෙන් ද, රේඛාවල මහත අඩු වැඩි කිරීමෙන් ද කුඩා සිහින් ඉරි කැබලි යෙදීමෙන් ද මිනිස් රූප, ගස් ආදියේ වටකුරු ගතිය පෙන්වා ඇත්තේය.
- භාරතයේ උපන් අජන්තා චිත්‍ර සම්ප්‍රදාය දොළොස් වන සියවසේ අග භාගය දක්වාම ලංකාවේ අඛණ්ඩ ව තිබුණු බවට සාක්ෂි දරයි.

- ගන්ධ කුටියේ හඳුනාගත හැකි සිතුවම් නම් බුදුරදුන් දෙව්ලොව සිට සංකස්ස පුරයට වැඩම කිරීමත්, විශාලා නුවර වාසීන් විපතින් බේරා ගැනීමට ගංගා නදිය දිගේ නැවකින් එහි වැඩම කිරීමත් දැක්වෙන සිතුවම් ය.
- මේ සිතුවම් කළ කාලයට ආසන්න කාලයක දී රචනා කළ බුත්සරණ නම් සාහිත්‍ය ග්‍රන්ථයෙහි බුදුරදුන් තව්තිසාවේ සිට සංකස්ස පුර දොරටුවට වැඩි අයුරු වර්ණනා කර ඇත. පහත දැක්වෙන්නේ එයින් වාක්‍ය කීහිපයකි.

- “දකුණු ශ්‍රී හස්තය දිශායෙහි රන් හිණින් බස්නා දෙවියන් හා වම් ශ්‍රී හස්තය දිශායෙහි රිදී හිණින් බස්නා මහා බ්‍රහ්මයන් හා, මැද සත්රුවන් හිණින් බස්නා ස්වාමිදරුවාණන් හා වඩනා ඒ ශ්‍රී නොබුදු වැ කවුරු සිතා නිමවා ගනිත් ද? දෙවියන් ඇස් නිව් ගියේ බඹුන් සිත් සැනහී ගියේ, මිනිස්සු බිමැ වැද පෙරළෙන්නට වන්හැ....”

- මහා බ්‍රහ්මයා ශ්වේත ඡත්‍රයක් අල්වා ගෙනැ වාම භාගයෙහි රිදී හිණින් බස්නට පටන් ගත. සෙසු සුයාම - සන්තුසිතා දී දිව්‍ය පුත්‍රයෝ තමන් තමන්ට සුදුසු වූ වල්විදුනා ආදී වූ නොයෙක් මංගලෝපකරණ ගෙණැ නික්මුණාහ.
- දස දහස් සක්වලැ දස දහස් ශක්‍රයෝ දස දහසක් විජයුත්තර පිඹිහින් නික්මුණාහ. නටන්නා වූ දිව්‍ය ස්ත්‍රීන්ගේ ගණන් නැත.
- ගී කියන්නා වූ දිව්‍ය ස්ත්‍රීහු මෙතෙකැයි පමණ නැත. (බුත්සරණ 112 – 113 පිටු සෝරත සංස්කරණය)

- බිත්තිය වසා සිටින එම සිතුවමෙහි හිණිමං තුනෙක සටහන් දැක්වේ.
- මැද හිණිමගෙහි පහළට බුදුහු වඩිති. මහබඹු ඇල්ලූ සේසතින් බුදුහිසට සෙවන දෙයි.
- බුදුරුව අජන්තාහි දක්නට ලැබෙන බුදු රූ වලට නෑකමක් පෙන්වයි. සිතුවමෙහි සමහර කොටස් ගැලවී හා මැකී ගොස් ඇතත් කලාකරුවා මැවීමට ගිය සිතුවමෙහි චමත්කාරය විඳීමට තවමත් අපහසුවක් නොවෙයි.
- අන්තරාලයේ ඇති සිතුවම් වලින් සස ජාතකය පහසුවෙන් හඳුනා ගත හැනියි. බෝසතුන් ඇඟ මස් දන්දෙනු සඳහා ගින්නට පැන්න සැටිත්, හාවාගේ ජීවිත පූජාව මුළු ලොව පුරා පතළ කරනු වස් සක්රජ සස රූපය සඳ මඬලේ අඳින සැටිත්, සාවාගේ මිතුරන් සිල් රකින සැටිත් දැක්වෙන කොටස් මේ සිතුවමේ තවමත් දැක ගත හැකිය.
- තිවංක පිළිමගෙයි චිත්‍ර අතර තවත් හඳුනාගත හැකි ජාතක කථා නම් වෙස්සන්තර ජාතකය, ආසංඛවතී ජාතකය, තුණ්ඩිල ජාතකය, විධුර ජාතකය, ගුත්තිල ජාතකය, චුල්ලපදුම ජාතකය, මෛත්‍රී බල ජාතකය, සාම ජාතකය, මහා සුදස්සන ජාතකය, කුස ජාතකය හා මහා උම්මග්ග ජාතකය යි.

- ගර්භ ගෘහයටත්, අන්තරාලයටත් අතර කොටසේ විශාල දෙව් පිරිසක් දැක්වෙන චිත්‍රය ද වැදගත් ය.
- තුසිත භවනයේ සිටින බෝසතාණන් වහන්සේට බුදුවීම සඳහා මනුලොව වැඩීමට දෙවියන් ආරාධනා කරන සැටි මෙම සිතුවමෙන් නිරූපණය වේ යයි මහාචාර්ය පරණවිතාන මහතා කියයි.
- විවිධ මුහුණු හැඩ ඇඳීමේ නිපුණත්වයක් කලා කරුවාට තිබුණ වග මේ සමූහ චිත්‍රයෙන් පැහැදිලි ව පෙනෙයි.
- එක් අතකින් පුෂ්පයක් දරණ බෝධි සත්වයන් වහන්සේ මේ රූප අතරින් පහසුවෙන් හඳුනා ගත හැකි වෙයි.
- මෙම බෝසත් රුව අජන්තා ගුහාවන්හි එන "පද්මපාණී" නමින් හැඳින්වෙන බෝසත් රුවට තරමක සමානකමක් පෙන්වන බව විචාරකයෝ පිළිගනිති.
- ඒ ඒ පුද්ගලයන්ගේ ඇඳුම් පැළඳුම් හා ආභරණ නිරූපණය කිරීමට කලාකරුවා මහත් සැලකිල්ලක් දක්වා ඇති බව පෙනේ.
- හිස් වෙළුම් ඉතා විචිත්‍රය.
- ඉතා සියුම් මෝස්තර වලින් යුක්ත ය.
- මුහුණු මෝස්තරය ද උදාර ය.
- සමස්තයක් වශයෙන් ගත් කල අජන්නා සම්ප්‍රදායය අන්තිම වරට දක්නට ලැබෙන්නේ පොළොන්නරු යුගයේය.

## මහනුවර යුගයේ බිතු සිතුවම්

- පොළොන්නරු යුගයෙන් පසු ව යාපහුව, දඹදෙණිය, ගම්පොළ, කෝට්ටේ, සීතාවක හා මහනුවර යන නගර පිළිවෙලින් සිරිලක රාජධානි බවට පත් වූ බව පැහැදිලිය.
- දකුණු ඉන්දියානු පෘතුගීසි, ලංදේසි හා ඉංග්‍රීසි යන විදේශීය ජාතීන්ගේ බලපෑම නිසා අනුරාධපුරය හා පොළොන්නරුව යුගවල දී ඉතිරි වී තිබෙන තරම් ගොඩනැගිලි, මූර්ති හෝ චිත්‍ර මේ යුගයෙන් ඉතිරි වී නොමැත.
- ගඩලාදෙණිය ලංකාතිලකය, දඹුල්ල, රිදී විහාරය, කෝට්ටේ, කැළණිය හා තොටගමුව වැනි ස්ථානයන්හි විහාර ආරාම වල එම ගොඩනැගිලි ආරම්භ වූ කාල වලට අයත් චිත්‍ර තිබෙන්නට ඇත.
- නමුත් ඒ සියල්ල 18 වන ශත වර්ෂයේ සිදු වූ කලා පුනර්ජීවනයේ දී කරන ලද ප්‍රතිසංස්කරණ වලින් යටපත් වී ඇති බව පෙනේ.
- එබැවින් ඉහත සඳහන් විහාරයන්හි දැනට දක්නට ලැබෙන්නේ 18 සියවස තුළ දී හෝ ඉන්පසු ව අඳින ලද බිතුසිතුවම් ය.

- 1591 දී 1 විමලධර්මසූරිය මහනුවර රජවිය. ඔහුගේ කාලයේ දී (1591 – 1604) මෙන් ම ඉන්පසු රජ පැමිණි සෙනරත් (1604 - 1635) හා 11 රාජසිංහ (1629 - 1687) රාජ්‍ය කාලයන් ද සිංහල, පරංගි හා සිංහල ලන්දේසි සටන් වලින් මෙරට ඉතිහාසය පිරී ගියේය.

- කුණ්ඩසාලේ රජ නමින් ද හැඳින්වුණු සිංහල රාජ වංශයේ අන්තිම නරපතියා වූ ද ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජ සමයේ දී මහනුවර දළදා මැදුර සඳහා දෙමහල් පායක් කරවා එයට ඇතුළු වන දෙපස බිත්තියේ ජාතක කථා සිතුවම් ඇන්ද වූ බව පැවසෙතත් මෙකල එම සිතුවම් දකින්නට නොමැත.
- මහනුවර නාථ දේවාලයේ දාගැබ හා බෝධි ප්‍රාකාරය ද මේ රජතුමාගේ කෘතියක් බව සඳහන් වේ.
- ඊට පසුව රජ පැමිණි ශ්‍රී විජය රාජසිංහ (1739 - 1747) මෙරට නැතිව තිබූ උපසම්පදාව යළිත් ඇති කිරීම සඳහා වැලිවිට සරණංකර හිමියන් ගේ උපදෙස් පරිදි සියම් රටට දූතයන් යවන ලද්දේය.
- මෙම දූතයන් උපසම්පදාවට අවශ්‍යතා සපුරාගෙන ලංකාවට පැමිණියේ කීර්ති ශ්‍රී රාජසිංහ (1747 - 1780) රජ සමයේ ය.
- 1753 දී ලක්දිව උපසම්පදාව ආරම්භ කිරීමෙන් පසුව උඩරට රාජ්‍යයේ විශාල ශාසන ප්‍රබෝධයක් ඇති විය.
- මේ ශාසන ප්‍රබෝධයේ ප්‍රතිඵලයක් වශයෙන් මහනුවර හා අවට ප්‍රදේශවල අභාවයට ගොස් තුබූ වෙහෙර විහාර අලුත්වැඩියා කොට බිතු සිතුවම් ඇඳීම් ආදියෙන් ඒවා අලංකාර කරන ලද්දේ ය.
- කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා මල්වතු පුෂ්පාරාම විහාර භූමියෙහි පිරිවෙනක් ද කරවා බෞද්ධ ධර්ම ශාස්ත්‍රීය කටයුතු වලට ද අනුබල දුන්නේ ය.
- මේ කටයුතු වල දී වැලිවිට සරණංකර සඟරජ හිමියන්ගේ මාර්ගෝපදේශකත්වය රජුට ලැබිණ.
- මහනුවර ගංගාරාම විහාරය ගොඩ නැගීමේ කීර්තිය ද හිමි වන්නේ කීර්ති ශ්‍රී රාජසිංහ රජුට ය.
- දෙගල්දොරුව, දඹුල්ල, රිදී විහාරය, කැළණිය (පරණ විහාරය) හා තොටගමුව වැනි විහාරයන්හි අද දක්වාම දක්නට ලැබෙන සිතුවම් කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමයේ උදා වූ කලා ප්‍රබෝධයේ ප්‍රතිඵල ලෙස සැලකිය හැකි ය.
- ගංගාරාමයේ නවරියන් ශෛලමය ප්‍රතිමාව ද මහනුවර දර්ශනීය වැව හා ප්‍රාකාරය ද, දළදා මාලිගාවේ පත්තිරිප්පුව හා මඟුල් මඩුව ද මහනුවර අන්තිම රජ වූ ශ්‍රී වික්‍රම රාජසිංහ ගේ කෘතීන් ය.

- මහනුවර යුගයේ බිතු සිතුවම් සැහෙන හොඳ තත්ත්වයකින් ආරක්ෂා වී ඇති උඩරට රාජධානියේ ඉතා ප්‍රසිද්ධ ස්ථාන කීපයක් නම් මහනුවර ආසන්නයේ ම පිහිටි දෙගල්දොරු විහාරය හා මැදවල විහාරයත්, රන්ගිරි දඹුලු විහාරයත්, කුරුණෑගල ආසන්නයේ පිහිටි රිදී විහාරයක්ය.
- මේවායින් මැදවල විහාරය හැර ඉතිරි තුනම ලෙන් විහාරයි.
- ලෙන් විහාර ස්වාභාවිකව ම ආරක්ෂා වීම නිසා ඒවායේ බිතු සිතුවම් ද බොහෝ දුරට ආරක්ෂා වී තිබේ.
- මේ හැම විහාරයක ම බිතු සිතුවම් සම්ප්‍රදාය විසින් ද, වස්තු විෂය වශයෙන් ද සමාන වෙයි.
- දෙගල්දොරුව හා දඹුල්ල, ඒවායේ ඇති චිත්‍ර ප්‍රමාණය සැලකිල්ලට ගත්විට උඩරට මහා කලාගාරයන් ලෙස සැලකිය හැකිය.

## දෙගල් දොරුව විහාරයේ බිතු සිතුවම්

- කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් කරවන ලද මෙම විහාරය මොරතොට ධම්මක් ඛන්ධ නායක හිමියන් සහිත ගෝල පරම්පරාවට පවරා දුන් වග විහාර සන්නස් වල සඳහන්ව ඇත්තේය. මෙහි චිත්‍ර ශිල්පියා දෙවරගම්පොල සිල්වත් තැන නමැති භික්ෂුවකි.
- මෙම ලෙනෙහි බඳනා ලද ශෛලමය බිත්තියකින් විහාර ගෘහය වෙන් කර ඇත.
- විහාර ගෘහයට ඉදිරියෙන් බරාඳය පිහිටියේ ය.
- අෂ්ටාශ්‍ර ගල්කුලුනු දොළොසක් මත බරාඳයේ පියස්ස රඳයි.
- මෙහි සිලිම ලෑලි වලින් සාදන ලද්දකි.
- සීලිම මත අලවන ලද රෙද්දක පලාපෙති ජ්‍යාමිතික හැඩතල ආදියෙන් යුක්ත වියන් මෝස්තර යොදා ඇත්තේය.
- ශාලාවට මුහුණ පා ඇති විහාරයේ ඉදිරි බිත්තිය සම්පූර්ණයෙන්ම වාගේ ජාතක කථා සිතුවම් වලට වෙන් වී ඇත්තේ ය.
- ජාතක කථා නිරූපණය කර ඇත්තේ බිත්තියේ තීරු වශයෙන් හෙවත් සිතියම් පටි වශයෙනි.
- සිත්තරා අඛණ්ඩ කථන ක්‍රමය හෙවත් කථා නායකයා කීප වරක් පුන පුනා පෙනෙන පරිද්දෙන් එකම කථාවේ සිද්ධි කීපයක් එකට දැක්වීමේ ක්‍රමය අනුගමනය කර ඇත්තේ ය.
- ප්‍රේක්ෂකයාට කථාන්තරය නැරඹීම සඳහා මුලින් ආරම්භ කොට අනුපිළිවෙළින් එක් එක් සිද්ධිය පසු කරමින් ඉදිරියට යන්නට සිදු වෙයි.
- නූතන චිත්‍රපටියක් නැරඹීමේ දී නම් ප්‍රේක්ෂකයා නිශ්චලව වාඩි වී සිටිද්දී ඔහු ඉදිරියෙන් චිත්‍රපටිය ගමන් කරයි.
- මෙහිදී සිදුවනුයේ චිත්‍රපටය නිශ්චලව තිබෙද්දී ප්‍රේක්ෂකයා ගමන් කිරීම යි.
- එක් එක් චිත්‍රය යටින් සිද්ධියේ මාතෘකාව ද ලියා ඇත්තේය.
- මෙහි නිරූපණය කර ඇති ජාතක කීපයක් නම් සීලව ජාතකය, වෙස්සන්තර ජාතකය, සුතසෝම ජාතකය හා සතුභක ජාතකය යි.
- වැඩිදුර අවබෝධය සඳහා වෙස්සන්තර ජාතකයේ අවස්ථා එහි නම්කර ඇති අයුරින් ම පහත දක්වනු ලැබේ.

1. සිවිරට සඳ මහ රජාණෝ රජකරවන වග.
2. බිහි වූ කෙණෙහි මව් දේවීන්ගෙන් දන වස්තු ඉල්ලු වග.
3. රාජාභිෂේක කළ වග.
4. ඇලි ඇතා දන් දුන් වග.
5. වෙසතුරු රජාණෝ දසරාජ ධර්මයෙන් රජකළ වග.
6. හසුන් ගෙනවුත් සැළකළ වග.
7. සත්සතු මහදන් දුන්වහ.
8. වංගගිරියට වඩින්නට අවසර ගත් වග
9. අසුන් දන් දුන් වග,
10. දෙවියෝ රථය ඇදපු වග.
11. නැවත රථය දන් දුන් වග.
12. තිස් යොදුන් මග ගෙවා චේතිය රට ජයතුරා නුවර ශාලාවට වැඩිය වග.
13. චේතිය රජ හට අමාත්‍යයෝ සැළකළ වග.

14. චෛතිය රජ ඇතුළු දහසක් රජ්ජුරුවෝ සුලු වන ගෙවා ගොස් මහ වනයට පාර කියා වැඩිය වග.

15. ජූජකයාගේ අඹුව ළිඳට ගොස් කළහ.
16. දැසි දසුන් ගෙනෙන්නට යන වග.
17. වැදි මුදලියා විසින් විදිනට තැනූ වග.
18. ජාලිය ක්‍රිෂ්ණජිනා දෙදෙනා දන්දුන් වග.
19. අච්චුන තාපසයෝ පාර කියාපු වග.
20. මුද්‍රි දේවි හඬා වැටුන වග
21. දෙදෙනාම ඉසි වෙස් ගෙන පැවිදිවූ වග.
22. පද්‍රි දේවී සිහිමුළා වී වැටුණ වග.
23. දෙවියෝ දෙමව්පිය වෙස් ගෙන වනාන්තරයේ දී උපකාර කරන වය.
24. සඳ මහ රජාණෝ ක්‍රිෂ්ණජිනාවුන් බරට කිරා රන්මසු දුන් විය.
25. රස බොජුන් අනුභව කොට පූජකයා මරණ ප්‍රාප්ත වූ වග.

- බුදුගෙයි ඇතුළත ගල් පියස්ස බදාමයෙන් වසා සිතුවම් ඇඳීමට යොදාගෙන ඇත.
- මෙහි සිතුවම් අතර ප්‍රධාන වශයෙන් ඇත්තේ බුද්ධ චරිතයේ වැදගත් සිදුවීම්ය. පියස්ස මධ්‍යයෙහි ඇඳ ඇත්තේ බුද්ධත්වය ලබා බෝ මැඩ අරා වැඩ සිටි බුදුරදුන් වෙත වසවත් මරු යුදයට පිවිසි සැටි ය.
- එවෙලෙහි මිහිකත දෙස් තිබූ සැටි ද දැක්වෙන මේ චිත්‍රසිත් ගන්නා සුලු ය.
- ඇතුළු බිත්තිවල චිත්‍ර අතර බුදුන් වහන්සේට කරන පූජා, සත් සතිය ගත කළ අයුරු හා මරහන රැඟුම් ආදිය ද දැක් වේ.

## චිත්‍ර සම්ප්‍රදාය

- දෙගල්දොරු විහාරයේ චිත්‍රත් සමකාලීන ව දහ අට වන සියවසේ අඳින ලද වෙනත් විහාරාරාමවල දක්නට ලැබෙන චිත්‍රත් සම්ප්‍රදායය අතින් පොළොන්නරුවේ චිත්‍රවලට බෙහෙවින් වෙනස් වෙයි.
- දෙගල්දොරු චිත්‍ර ශිල්පියා මිනිස් රූප වල මුහුණු වලින් සිතුම් පැතුම් ප්‍රකාශ කිරීමට හෝ අත්වල මුද්‍රාවන්ගෙන් අදහස් ප්‍රකාශ කිරීමට හෝ තැත් කළ බවක් නොපෙනේ.
- එසේ ම සිත් කලු ගැහැණු පිරිමි රූප ඇඳීමෙන් රසිකයන් ආකර්ෂණය කර ගැනීමට හෝ ඔහු වෑයමක් කළ බවක් නොපෙනේ.
- එසේම ඔහුගේ රූප වල ශරීරය හා අංගෝ පාංගයන්ගේ වටකුරු බව හෝ එළිය අඳුර දැක්වීම හෝ පර්යාලෝකය (ළඟ හා ඈත වස්තු පෙනෙන ආකාරය) දැක්වීමක් හෝ නොකෙරේ.
- ඔහුගේ මේ සිතුවම් බුද්ධිගෝචර නොවේ.
- එහෙත් ඒවා අක්ෂි ගෝචර වේ.

- ඔහු විසින් අඳින ලද සතුන් හෝ මිනිසුන් සැබෑ සතුන්ට හෝ මිනිසුන්ට සමාන නොවේ.
- සමහර විට අග පසඟ ශරීරයට ප්‍රමාණානුකූල නොවේ.
- ඔහු මුහුණ ඉදිරියට පෙනෙන ලෙස ඇන්දත් පා අඳින්නේ පැත්තට පෙනෙන ලෙස ය.
- පැත්තට පෙනෙන මුහුණේ ඇස් අඳින්නේ ඉදිරියට පෙනෙන පරිද්දෙනි. අඟ පසඟවල රැළි හෝ වටකුරු බවක් නො පෙනේ.
- ඔහුගේ රූප තාත්වික බැවින් තොර ය.
- ඔහු ඇඳි ගස කොළ පවා තාත්වික රූප නොව නිපදවා ගත් රටාය.
- ඔහු බෝ ගස හා එහි අතු පතර අඳින්නේ ගලා යන රේඛා වලිනි.
- එක් එක් කොළය වෙන් වෙන් වශයෙන් ම අඳියි.
- සමස්තයක් වශයෙන් ගත් කල ගසේ මුදුන අර්ධ කවාකාර ස්වරූපයක් ගනි යි.
- මේ ගස තාත්වික නුවූවත් ප්‍රේක්ෂකයෝ එය බෝ ගස් එන්ම හඳුනා ගකිති.
- මහනුවර යුගයේ චිත්‍ර ශිල්පියාගේ චිත්‍ර ඇඳීමේ ක්‍රමය රේඛා ක්‍රමය හා වර්ණපූරණය යන අංග දෙකකින් යුක්ත වෙයි.
- ඔහු පළමුව රූපවල බාහිර රේඛා ඇඳ පසුව රූප වර්ණයෙන් පුරවයි.
- ඔහු ප්‍රධාන වශයෙන් යොදා ගන්නා මූලික වර්ණ නම් රතු, සුදු, සහ හා කලු ය.
- අඩු වශයෙන් නිල් සහ කොළ පාට ද යොදා ගනු ලැබේ.
- මේ චිත්‍ර වල ඇස පිණවීමේ ගතිය ප්‍රධාන වශයෙන් රඳා පවතින්නේ රේඛා රටාවේ ශක්තිය මතය.
- වර්ණ ආලේප කිරීම සම්ප්‍රදායානුකූල වේ.
- චිත්‍ර පසුබිම් රතු පැහැයක් ගනී.
- රතු පසුබිමේ චිත්‍ර ඉස්මතු වී පෙනේ.
- බුදුරුව හෝ මිනිස් රූප සුදු හෝ කහ පැහැයෙන් වර්ණ කිරීම සාමාන්‍ය සම්ප්‍රදායයි.
- විශාල රතු පසුබිමක් ඇති විට ඉඳහිට කඩුපුල්, නෙළුම් ආදී පසුබිමේ සිතුවම් කිරීමෙන් රතු පසුබිමෙන් ඇසට ඇතිවන වේදනාට නැති කරනු ලැබේ.
- සියුම් ඇස්, කන් හා ඇඳුම් රැළි ආදිය පෙන්වන්නේ රේඛා උපයෝගී කරගෙන ය.
- මෙම චිත්‍ර වල රේඛාවට හා වර්ණ වලට ලැබී ඇත්තේ සමතැන් ය.
- මහනුවර හෝ උඩරට සිතුවම් ක්‍රමය නමින් හැඳින්වෙන මෙම සිතුවම් කලාවේ ලක්ෂණ පැරණි මිසරය හා ග්‍රීසිය වැනි රට වල පැවති සිතුවම් කලාවේ ද දක්නට ලැබේ.
- මහනුවර කීර්ති ශ්‍රී රාජසිංහ රජ සව්යේ ලක්දිව ප්‍රචලිත වූ මෙම චිත්‍ර ක්‍රමය දකුණු ඉන්දියාවෙන් පැමිණියකැයි සමහරු සිතති.
- නායක්කර් වංශිකයෝ රජ පවුලේ නෑයන් වශයෙන් මෙහි පැමිණ සිටියහ.
- එසේම මහනුවර චිත්‍ර මෝස්තර අතර දක්නට ලැබෙන වක දෙක තිරිහි තලේ. සැරපෙන්දීයා, පංචනාරී සටිය, උතුපරය, අෂ්ටනාරි රථය, චතුර්නාරි පල්ලැක්කිය වැනි පෝස්තර දකුණු ඉන්දියානු සැරසිලි මෝස්තර අතර දක්නට ලැබේ යයි කියනු ලැබේ.

- මහනුවර යුගයේ ලක්දිව සමඟ පැවති සියුම් සම්බන්ධය නිසා මේ චිත්‍ර ක්‍රමය සියමෙන් මෙරටට එන්නට ඇතැයි තවත් සමහරු සිතති.
- කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමයේ උපාලි හිමියන් සමග ලංකාවට උපසම්පදයාට පැමිණියේ ය .

- මහනුවර යුගයේ බුදු පිළිමවල සිරස්පත හා කේතු මාලාව පැමිණියේත් සියමෙන් යයි කියනු ලැබේ.
- එසේම බුදුපිළිම වල සිරස්පත සිවුරු දරන ක්‍රමය ද සියමේ පිළිවෙලට නැකම් කියයි.
- සියම් දූත පිරිස ආපසු එද්දී බුදු පිළිමයක් මෙහි වැඩිමඩනු ලැබූ බව ද කියනු ලැබේ.
- සියමේ අයෝධ්‍යා නගරයේ රාජ්පුරන් විහාරයේ චිත්‍ර මහනුවර චිත්‍ර වලට බෙහෙවින් සමාන බව ද කියනු ලැබේ.
- මහනුවර යුගය තෙක් ලංකාවේ බිතු සිතුවම් අතර දක්නට නොලැබුණ සූවිසි විවරණ, අටවිසි බුදුන්, සත්සතිය, මාර යුද්ධය වැනි දර්ශක සියම් බිතු සිතුවම් අතර දක්නට ලැබෙන බව ද කියනු ලැබේ.
- වැලිවිට සරණංකර හිමියන් හා කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ සහයෝගයෙන් මහනුවර යුගයේ දී ව්‍යාප්ත වූ බෞද්ධ සංස්කෘතියේ සියම් ලක්ෂණ බෙහෙවින් දක්නට ලැබෙන බැවින් මහනුවර යුගයේ චිත්‍ර සම්ප්‍රදාය ද සියමේ ආභාෂය ලැබූවක් ලෙස පිළිගත හැකි ය.

## මහනුවර යුගයේ වෙනත් බිතු සිතුවම්

- මෙම සිතුවම් කීර්ති ශ්‍රී රාජසිංහ සමයට අයත් වෙයි. දඹුලු විහාරය මේ කාලයේ දී ප්‍රතිසංස්කරණයට භාජන වූ අතර එහි එක් විහාර මන්දිරයක කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ පිළිරුවක් ද වෙයි.
- දඹුලු විහාරයේ පිළිමගෙවල් බවට හරවන ලද විශාල ලෙන් පහක් ඇත්තේ ය.
- මේවා ලක්දිව දක්නට ලැබෙන ඉතා විශාලම ලෙන් වන අතර ඒ හැම ලෙනක්ම කලාගාරයක් බවට පත්ව ඇත.
- ලෙන් තුළ, ගල්, ගඩොල් හා ලී වලින් සාදන ලද විවිධ ප්‍රමාණයේ බුදු පිළිම සියයකටත් වැඩි ප්‍රමාණයක් වෙයි.
- ලෙන්වල බිත්ති හා පියසි බදාම ආලේප කොට චිත්‍ර ඇඳිමට සකස් කරගෙන ඇත.
- ලෙන් පියසිවල විශාලත්වය මහා පරිමාණයේ විශාල චිත්‍ර ඇඳීමට සිත්තරාට ඉඩ සපයා ඇත.
- එක් ලෙන් පියස්සක සීලිමේ ඇඳ ඇති මාර පරාජය දැක්වෙන සිතුවට මෙබඳු විශාල සිතුවටකි.
- බුද්ධ චරිතය, ජාතක කථා, සූවිසි විවරණ හා ඓතිහාසික සිද්ධි චිත්‍ර වලට මාතෘකා වී ඇත.
- වෙනත් කිසි ම බෞද්ධ විහාරයක නැති තරම් ඉතිහාස ගත සිද්ධි මෙම ලෙන් වල චිත්‍රයට නැඟි ඇත්තේ ය.
- විජයාගමනය. දුටුගැමුණු එළාර යුද්ධය, රුවන්වැලි සෑයේ ධාතු නිදානෝත්සවය ආදිය මෙහි චිත්‍රයට නැඟී ඇති ඓතිහාසික සිද්ධීන්ගෙන් කීපයකි.
- සිතුවම් ක්‍රමය හා පාවිච්චි කරන ලද වර්ණ ආදිය දෙගල්දොරුවේ චිත්‍ර ක්‍රමය හා වර්ණ වලට සමානය.
- මේ යුගයට අයත් චිත්‍ර ඇතුළත් වෙනත් ස්ථාන කීපයක් නම් රිදී විහාරය, මහනුවර ආසන්නයේ මැදවල විහාරය, කැළණියේ පැරණි විහාරය, තොටගමු විහාරය හා මුල්කිරිගල විහාරයත් ය.

- මේ සිතුවම් මාතෘකා වී ඇත්තේ බුදු සිරිත හා ජාතක අධ්‍යාපනය අතින් පිරිහුණු යුගයක අකුරු නොදත් මිනිසුන්ට කථාන්තර මගින් ධර්මය හා සදාචාරය උගන්වන්නට මේ සිතුවම් බෙහෙවින් ප්‍රයෝජනවත් වී ඇති බව කිව යුතුය.
- මුහුදුබඩ ප්‍රදේශ වල විහාර වල ද මහනුවර චිත්‍ර ක්‍රමයම භාවිත වුවත් චිත්‍රවල ඇඳුම් පැළඳුම් ආදියේ ප්‍රාදේශීය වෙනස්කම් දක්නට හැකි වන්නේය.

## නූතන යුගයේ බිතු සිතුවම්

- ඉංග්‍රීසීන් ලංකාව අල්ලා ගත්තායින් පසු කාලය නූතන යුගය හෙවත් කොළඹ යුගය වේ.
- මහනුවර යුගයේ දක්නට ලැබෙන දේශීය බිතු සිතුවම් සම්ප්‍රදායය කොළඹ යුගයේ දී අභාවයට ගිය බව පෙනේ.
- මෙයට ප්‍රධාන වශයෙන් හේතු වන්නට ඇත්තේ බටහිර වානිජ සංස්කෘත අන්ධානුකරණයෙන් මෙරට පිළිගැනීම නිසා දේශීය කලා ශිල්ප පිරිහී යාමයි.
- මේ යුගයේ විහාර සිතුවම් වල දකින්නට ලැබෙන්නේ බටහිර තාත්වික සම්ප්‍රදායය අනුගමනය කිරීමට කරන වෑයමයි.
- නූතන යුගයේ විහාර සිතුවම් රාශියක් ම එම්. සාර්ලිස් මහතා සහ ඔහුගේ ගෝල පරපුරේ කෘතීන් ලෙස සැලකිය හැකි ය.
- ඒවා සම්පූර්ණයෙන්ම වාගේ මහනුවර යුගයේ බිතු සිතුවම් කලාවට පටහැනි ය.
- ඒවායේ දක්නට ලැබෙනුයේ යුරෝපයේ වාස්තු විද්‍යාත්මක සැරසිලි අංග, රෝමානු සම්ප්‍රදායයේ ආරුක්කු, කිරිගරුඬ ගල් ඇල්ලූ බිත්ති, පිගන් ගඩොල් ඇල්ලූ බිත්ති ආදි අද්භූතවාදී ලක්ෂණ යි.
- පර්යාලෝකය පිළිබඳ නීති රීති අනුගමනය කරමින් තාත්වික සම්ප්‍රදායයක් ඉදිරිපත් කිරීමට මේ ශිල්පීන් උත්සාහ කර ඇතත් දේශීය චිත්‍ර කලාවේ හරය හෝ බටහිර චිත්‍ර කලාවේ හරය හෝ ඔවුන් අවබෝධ කරගෙන තිබුණ බවක් නොපෙනේ.
- එහෙත් කොළඹ යුගයේ දී ද උසස් විහාර බිතු සිතුවම් දක්නට ලැබෙන ස්ථාන කීපයකි.
- ඒවා නම් කැළණියේ අළුත් විහාරය, බොරැල්ලේ ගෝතම් විහාරය, සේදවන්නේ වෙහෙරගොඩැල්ලේ විහාරයත්

### කැළණි විහාරයේ නව සිතුවම්

- කැළණි විහාරයේ නව පිළිමගෙයි බිතු සිතුවම් විසිවන ශත වර්ෂයේ මුල් දසක වල දී අඳින ලද්දේ සෝලියස් මැන්ඩිස් නැමැත්තකු විසිනි.
- ඒ මහතා අජන්තා ආදී ස්ථානයන්හි දක්නට ලැබෙන භාරතීය බෞද්ධ චිත්‍ර කලා සම්ප්‍රදායයත්, පැරණි සිංහල බිතු සිතුවම් සම්ප්‍රදායයත් මැනවින් අධ්‍යයනය කොට නිර්මාණය කර ඇති බව පෙනේ.

- එසේ ම ඔහුගේ සිතුවම් ආගමික වශයෙන් හා ඓතිහාසික වශයෙන් ද වැදගත් වේ. කැළණි විහාරයේ දක්නට ලැබෙන ඔහු විසින් අඳින ලද සිතුවම් කීපයක් නම් කැළණියට හා නාගදීපයට බුදුරදුන්ගේ වැඩීම, මහියංගනයේ දී යකුන් දමනය කිරීම, සමන්ත කූටයේ සිරිපතුල පිහිටුවීම, විජයාවතරණය, මහින්දාගමනය, සංඝමිත්තා තෙරණිය විසින් ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩමවීම, දන්ත කුමරු හා හේමමාලා විසින් දළදා වහන්සේ වැඩම වීම, බුද්ධඝෝෂ හිමියන් විසුද්ධි මාර්ගය පිළිගැන්වීම ආදියයි.
- අජන්තා සිතුවම් මෙන් මේවා ද විශාල සිතුවම් වීම, සියලුදේ විස්තරාත්මකව නිරූපනය කිරීම විශේෂ ලක්ෂණ වේ.

## බොරැල්ලේ ගෝතමී විහාරයේ සිතුවම්

- මෙම චිත්‍රයන්ගේ නිර්මාතෘවරයා සුප්‍රසිද්ධ චිත්‍ර ශිල්පී ජෝර්ජ් කීට් මහතාය.
- වර්ණ සංයෝජනය අතින් ද, රූප සම්පිණ්ඩනය අතින් ද උසස් බවක් පෙන්වන මේ සිතුවම් වල 20 වන සියවසේ කීර්තිමත් බටහිර චිත්‍ර ශිල්පියකු වූ පිකාසෝ ගේ චිත්‍ර වලින් ලබා ඇති ආභාශය මැනවින් දක්නට ලැබේ.
- දේවාරාධනයේ සිට පරිනිර්වාණය දක්වා බුද්ධ චරිත සිද්ධි ගණනක් මේ සිතුවම්වලට ඇතුළත්ය.
- මේ සිතුවම් අතර ඇති " මාර යුද්ධය " නමැති චිත්‍රයෙන් මාරයන්ගේ බිහිසුණු භාවයත් බුදුරදුන්ගේ ශාන්ත භාවයත් රසවත් අන්දමකින් නිරූපණය කර ඇත.

## සේදවත්තේ වෙහෙර ගොඩැල්ල විහාරයේ බිතු සිතුවම්

- මේ සිතුවම් සුප්‍රසිද්ධ චිත්‍ර ශිල්පී ඇල්බට් ධර්මසිරි මහතාගේ ය.
- පෙර අපර දෙදිගම චිත්‍ර සම්ප්‍රදායයන් ඔහුගේ සිතුවම් වල ඇති බව පෙනේ.
- සිද්ධාර්ථ කුමාර උත්පත්තිය, අභිනිෂ්ක්‍රමන, කේශ ඡේදනය, දුෂ්කර ක්‍රියාව හා මාර පරාජය මෙහි සිතුවම් කීපයකි.
- වර්ණ භාවිතයේ විශේෂ දක්ෂකමක් පෙන්වන මොහු සුදු වර්ණය භාවිතයෙන් විශේෂ ගුණයක් මතු කිරීමට සමත් වී ඇත.
- ඔහුගේ සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය දැක්වෙන සිත්තමෙහි මුලු ලොව ප්‍රාතිහාර්යයකින් ආලෝකමත් වූ බවක් පෙන්වන්නේ සුදු වර්ණයේ මේ විශේෂ භාවිතය නිසාය.

# 12. පාඩම
# බෞද්ධ සිංහල සාහිත්‍යය

- දැනට භාවිතා වන සම්භාව්‍ය සිංහල ග්‍රන්ථ රැසක් ක්‍රි.ව. 10 හා 19 අතර සියවස්වලදී ලියැවී ඇත.

## සිංහල සාහිත්‍යයේ වස්තු විෂය

- අතීතයේ සිංහල සාහිත්‍යකරනයේ වැඩි වශයෙන් නියැළුණේ බෞද්ධ භික්ෂූන් වහන්සේ ය.

### අතීත ගද්‍ය පද්‍ය සාහිත්‍ය කෘතීන් සඳහා පසුබිම්වූ ක්ෂේත්‍ර

නව අරහාදී බුදු ගුණ වලින් එකක් තෝරා ගෙන කතන්දර මාර්ගයෙන් විස්තර කල අවස්ථා

උදා;

- ගුරුළුගෝමී පඬිතුමා(පොලොන්නරුව) - අමාවතුර (පුරිසදම්මසාරථී ගුණය)
- මයුරපාද පරිවේනාධිපති බුද්ධපුත්‍ර හිමි දඹදෙණිය - පූජාවලිය (බුදුරදුන්ගේ පූජාර්හ ගුණය)
- වැලිවිට සරණංකර හිමි (මහනුවර යුගය)- සාරාර්ථ සංග්‍රහය (බුද්ධ නම් ගුණය)
- තිබ්බටුවාවේ බුද්ධරක්ඛිත හිමියෝ - ධර්මාවවාද සංග්‍රහය (සත්ථා ගුණය)

### තෙරුවන් ගුණ වර්ණනා කිරීම

උදා:-

- විද්‍යා චක්‍රවර්ති පඬිවරයා (දඹදෙණිය) - බුත්සරණ, දහම්සරණ, සඟසරණ

### බෞද්ධ කතා සාහිත්‍ය

උදා:-

- කුරුණෑගල යුගය - ජාතක පොත් වහන්සේ
- ධර්මසේන හිමි (දඹදෙණිය) - සද්ධර්මරත්නාවලිය
- ධර්මකීර්ති හිමි (ගඩලාදෙණිය) - සද්ධර්මාලංකාරය
- විමලකීර්ති හිමි සද්ධර්මරත්නාකරය

## ත්‍රිවිධ චෛත්‍යයන් පිළිබඳ කතා

- උදා: පරාක්‍රම පණ්ඩිත(අනුරාධපුර යුගය) - ථූපවංශය (පළමු ග්‍රන්ථයයි)
- දෙව්රද දම් පසඟිනාවන් (කුරුණෑගල) - දළදා සිරිත
- දළදා පූජාවලිය
- කකුසඳ හිමි - ධාතු වංශය
- විල්ගම්මුල හිමි - සිංහල බෝධි වංශය
- වීදාගම හිමි - එළු අත්තනගලු වංශය

## සිංහල පද්‍ය සාහිත්‍යය

- ජාතක කතා වස්තු කොට ගෙන ගොඩ නැගී ඇත.
- මුල්ම පද්‍ය ග්‍රන්ථ සංස්කෘත මහා කාව්‍ය සම්ප්‍රදාය අනුගමනය කර ඇත.
  උදා: මුව දෙව්දාවත (ගී කාව්‍යයකි), සසදාවත
- අලංකාර නීති රීති වලට අනුව ලියූ මහා කාව්‍යයකි - කව්සිළුමිණ (දෙවැනි පැරකුම් රජු)
- සිව්පද විරිතින් පද්‍ය කාව්‍ය ප්‍රචලිත වූයේ - කෝට්ටේ යුගයේදීය
  උදා:කාව්‍යශේඛරය
- සීතාවක යුගයේ රචකයෙකු වූ අලගියවන්නයන්ගේ පද්‍ය ග්‍රන්ථ
  කුස හතක කාව්‍යය, දහම්සොඬ කාව්‍යය
- සීතාවක යුගයෙන් පසු විල්ගම්මුල හිමියන් විසින් සඳකිඳුරුදා කව රචනා කර ඇත

## ජාතක පොත් වහන්සේ

- කතා සංඛ්‍යාව - 547 (ආසන්න අගය සලකා 550 යැයි ව්‍යවහාර කෙරේ.)
- මුල් කොටගත් ග්‍රන්ථය පාලි ජාතකට්ඨ කතාව (ත්‍රිපිටකයේ සූත්‍ර පිටකයට අයත් ඛුද්දක නිකායේ පාලි ජාතක ඇතුළත්වේ)
- රචකයා - දෙවැනි පණ්ඩිත පරාක්‍රමබාහු හෙවත් හතරවන පරාක්‍රමබාහු රජු (කුරුණෑගල යුගය) (ග්‍රන්ථයෙහි සඳහන් වන්නේ පරාක්‍රම නම් ඇමතිවරයාගේ හා වීරසිංහ ප්‍රතිරාජයන්ගේ උත්සාහයෙන් රචනා වූ බවය.)
- ජාතක පොත ලිවීමට පෙර සිංහලෙන් ලියැවී තිබෙන ජාතක කතා අඩංගුග්‍රන්ථ - බුත්සරණ, ධර්මප්‍රදීපිකාව, පූජාවලිය
- ජාතක කතා රචනයේ දී අනුගමනය කරන මූලික ආකෘතිය - වර්තමාන කතාව, අතීත කතාව, පූර්වාපර සන්ධි ගැලපීම
- රචනයේ දී අනුගමනය කළ මාර්ගය - බණ මග
- ජාතක කතාවල අධ්‍යාත්මික හරය- රාග ද්වේශ මෝහ ආදී කෙලෙස් වල ගෙවී දුක් විඳින සත්ත්වයා වෙත අපේ අනුකම්පාව දයාව යොමුවිය යුතු බව ප්‍රකාශ කිරීම.

## පූජාවලිය

- කර්තෘ වරයා - මයුරපාද පරිවේනාධිපති බුද්ධපුත්‍ර හිමි (දඹදෙණි යුගය)
- රචනා කිරීමට ආරාධනා කළේ - දෙවැනි පණ්ඩිත පරාක්‍රමබාහු රජුගේ ඇමැති වූ දේව ප්‍රතිරාජ විසින්
- රචනා කිරීමේ අරමුණු - බුදු බව පැතීමට ආශාවක් ඇති වන පරිදි ග්‍රන්ථයක් රචනා කිරීමේ අවශ්‍යතාව, සිංහල පාඨකයන් තුළ ශ්‍රද්ධා භක්තිය ඇති කිරීම මගින් නිවන් මග පාදා දීම , කාන්තාවන්ට නිවසේම රැඳී බණ දහම් ඉගෙනීමට පහසුකම් සලසා දීම.
- ග්‍රන්ථයට පාදක වූ බුදු ගුණය - නව අරහාදී ගුණ වල අරහ යන ගුණය (බුදුන් වහන්සේ පූජාවට සුදුසු වූ බැවිනුත් පූජා ලද බැවින් අරහං වන සේක යන අර්ථය)
- පරිච්ඡේද සංඛ්‍යාව - 34යි
- ග්‍රන්ථය මඟින් ආවරණය කරන බුද්ධ චරිතයේ විවිධ කාල වකවානු - පාරමී දම් පුරමින්බෝසත් වරයෙකු ලෙස ගත කළ කාලය, සිද්ධාර්ථ කුමරා ලෙස ගත කළ කාලය, බුද්ධත්වයෙන් පසු පරිනිර්වාණය දක්වා බුද්ධ චරිතය ගත කළ ආකාරය

## සද්ධර්මරත්නාවලිය

- රචකයා ධර්මසේන හිමි (දඹදෙණි යුගය)
- මූලාශ්‍ර කරගත් ප්‍රධාන ග්‍රන්ථය- පාලි ධම්මපදට්ඨ කථාව
- වෙනත් මූලාශ්‍රවලින් සද්ධර්ම රත්නාවලියට උපුටාගත් කතා- මංගල සූත්‍ර කතා, නාගසේන
- කතාව, සාතාගිර හේමවත උප්පත්ති කතා, කාෂ්ඨ වාහන කතාව, බරණැස් රජුගේ කතාව
- ග්‍රන්ථ රචනා කිරීමේ අරමුණ - පොදු ජනයා යහ මගට හැරවීම
- ග්‍රන්ථය රචනයේ දී අනුගමනය කරන මූලික ආකෘතිය - බණ මග

## බුදුගුණ අලංකාරය

- රචකයා - වීදාගම මෛත්‍රිය නාහිමි(කෝට්ටේ යුගය)
- ග්‍රන්ථයට පාදක වූ කතා වස්තුව බුදුරජාණන් වහන්සේ විශාලා මහ නුවරට වැඩ එහි එකල උද්ගතව තිබූ දුර්භික්ෂ රෝග සහ අමනුෂ්‍යයන් ත්‍රිවිධ භය දුරු කිරීම පිළිබඳ පුවත
- ග්‍රන්ථය ලිවීමේ අරමුණ - තත්කාලීන බ්‍රාහ්මණ හා දේව ඇදහිලි නිෂ්ප්‍රයෝජන කාර්යයන් බව පාඨකයාට පෙන්වා දීම සහ බුදුගුණ වර්ණනා කිරීම
- ග්‍රන්ථයෙහි එන බුද්ධ වර්ණනාවන් - බුදුරජාණන් වහන්සේගේ ගුණ සමුදාය, රූපශ්‍රීය, උන්වහන්සේ ලැබූ පුද පූජා
- පද්‍ය සංඛ්‍යාව - 612

**තුන් සරණය**

- රචකයා - තාඹුගල නම් ග්‍රාමයෙහි වැසියෙකි (මහනුවර යුගය)
- ග්‍රන්ථය මගින් වර්ණනා කරන ගුණය - ත්‍රිවිධ රත්නයේ ගුණ
- ග්‍රන්ථයේ එන කවි සංඛ්‍යාව - 130
- ග්‍රන්ථයෙහි ඇති විශේෂ ලක්ෂණ - උසස් සම්භාව්‍ය පද්‍ය කෘතියක් නොවීම, කතා ව්‍යවහර භාෂාවෙන් ලියා තිබීම, ජාතක කතා ඉතා කෙටි කවි මඟින් ඉදිරිපත් කර තිබීම

# 13. පාඩම
# බුරුමයේ බුදුදහම

- නිර්මල බුදු දහම වර්තමානය දක්වා පිරිසිදු අන්දමින් රැකගත් රටවල් අතර බුරුමයට ප්‍රමුඛ ස්ථානයක් හිමි වේ.

## බුරුමයේ ශාසනික ඉතිහාසය

මෙය කාලපරිච්ඡේද තුනකට බෙදා දැක්විය හැකිය .

1) ආරම්භයේ සිට ක්‍රි.ව. 10 සියවස දක්වා වූ පුරාතන යුගය
2) 11 සියවසේ සිට 15 සියවස දක්වා වූ මධ්‍යතන යුගය
3) 16 සියවසයේ සිට මේ දක්වා වූ නූතන යුගය

## පුරාතන යුගය

- බුරුමයේ පුරාතන යුගයේ බුදු දහම ගැන තොරතුරු යමක් කිය හැක්කේ වංශකතා හා ජනප්‍රවාද වලින් හෙළිවන තොරතුරුත්, පුරාවිද්‍යාත්මක තොරතුරුත් අනුව ය .

- ශ්‍රී ලංකාව මෙන්ම බුරුම දේශය ද ඈත අතීතයේ සිට පිරිසිදු ථෙරවාද බුදු දහම අදහන රටක් වශයෙන් සලකනු ලැබේ .

- දීපවංශය, මහාවංශය වැනි වංශකතාවලින් දැක්වෙන පරිදි බුරුමයට ද බුදුදහම පැමිණ ඇත්තේ ක්‍රි.පූ. 3 වන සියවසේ අශෝක අධිරාජයාගේ සමයේදීය .

### බුරුමයට බුදු දහම පැමිණීම

- මොග්ගලීපුත්තතිස්ස ස්ථවිරයන්ගේ අනුශාසනා පරිදි තුන්වන ධර්ම සංගායනාවෙන් පසුව අශෝක රජතුමා විසින් සෝණ සහ උත්තර යන භික්ෂූන් දෙනමක් ධර්ම ප්‍රචාරණය සඳහා ස්වර්ණ භූමියට යැවූ බව වාර්තා ගත වී ඇත .

- සෝණ හා උත්තර දෙනම සමග පැමිණි පිරිස ඉරවඩි ගඟ මුහුදට වැටෙන "මර්තබාන්" සමුද්‍ර වංකය ඔස්සේ පැමිණ ගං මිටියාවත දිගේ ඉහලට ගමන් කොට මධ්‍යම බුරුම දක්වා ධර්ම ප්‍රචාරය කරන්නට ඇතැයි සිතිය හැක .

- බුරුමයේ එන පාරම්පරික ජනප්‍රවාදයක් අනුව එරටට බුදු දහම පැමිණ ඇත්තේ බුදුරජුන් ජීවත්ව සිටිය සමයේ දී ම ය .

- බුදුරදුන්ට ප්‍රථම දානය පිළිගැන්වූ තපස්සු භල්ලුක යන "මෝන්" ජාතික වෙළඳ දෙබෑයන් ඔවුන්ට බුදුරදුන්ගෙන් ලැබුණු කේශ ධාතු රැගෙනවිත් සිංගුත්තර කඳුමුදුනෙහි ස්වේදගොන් දාගැබෙහි තැන්පත් කළ බව ජනප්‍රවාදයෙහි එයි .

## පැරණි පුරාවස්තු වලින් හෙළිවන කරුණු

- වර්තමාන "පෝම්" සහ "හ්මව්සා" නගර ආශ්‍රිත ප්‍රදේශයෙන් ලැබී ඇති පුරාවස්තු අනුව ක්‍රි.ව. 5 සහ 6 වන සියවස්වලදී ඒ ප්‍රදේශයේ ප්‍රබල සංස්කෘතියක් පැතිර පැවති ඇත .

- මේ පුරාවස්තු අතර පාලි ලේඛන, ආන්ද්‍ර සහ පල්ලව සම්ප්‍රදායෙන් සකස් වුණු මූර්ත, බ්‍රාහ්මී අක්ෂරවලින් සටහන් වුනු සංස්කෘත ලේඛන, ගුප්ත කලා සම්ප්‍රදාය පිළිබිඹුවන හිස සුන් බුදු පිළිම ඇතුළත්ය .

- ක්‍රි.ව. 7 සියවසේ ඉන්දියාවට පැමිණි ඉ-චිං නැමැති චීන දේශාටක භික්ෂුවගේ වාර්තා අනුව මේ රාජ්‍යයේ මූල සර්වාස්තිවාදී බෞද්ධ ධර්මය පැතිර තිබූ බව පෙනේ .

- ක්‍රි.ව. 5 සියවසේ ලංකාවට පැමිණි පාලි අට්ඨකථා ලියූ බුද්ධඝෝෂ හිමියන් ද බුරුම ජාතිකයෙකු බව බුරුම වංශකතාවල සඳහන් ය .

## බුරුමයේ වෙනත් පැරණි රාජ්‍යයන්

- පේගු රාජ්‍යයේද, ථෙටොන් රජ්‍යයේද ථෙරවාදී බුදු දහම බුදු දහම ව්‍යාප්තව තිබූ බව පෙනේ. රාමඤ්ඤ දේශය නමින් හැඳින්වූයේ මේ නගර ඇතුළත් ප්‍රදේශයයි .

# මධ්‍යතන යුගය (ක්‍රි.ව. 11 සියවසේ සිට 15 සියවස දක්වා )

## පගාන් රාජ්‍යය

- බෞද්ධ ග්‍රන්ථ වල "අරිමද්දන පුරය" ලෙසද හැඳින්වෙන පගාන් රාජ්‍යය අයත් වන්නේ උතුරු බුරුමයටයි.

- ථේටන් රාජ්‍යයෙන් පැමිණි ධර්මදර්ශී හෙවත් "අරහන්" නැමැති භික්ෂුවක් අනුරුද්ධ රජු ථේරවාද බුදු දහමට හරවා ගත්තේය.

- අනුරුද්ධ රජු ථේටන් රාජ්‍යයෙන් කල ඉල්ලීම මනුහ(මනෝහරී) රජු ප්‍රතික්ෂේප කිරීම නිසා අනුරුද්ධ රජු ථේටන් නගරය ආක්‍රමණය කර බෞද්ධ පොත්පත් ගෙන ගියේ යැයි කියනු ලැබේ.

## ලංකාව හා සබඳකම්

- මෙකල ලංකාවේ රජ කළේ I විජයබාහු (1055-1110) රජතුමාය.

- විජයබාහු රජු ලක්දිව ශාසන සංශෝධනයට උගත් භික්ෂු පිරිසක් එවන ලෙස අනුරුද්ධ රජු වෙත කල ඉල්ලීම සලකා බලා එතුමා උගත් සිල්වත් භික්ෂු පිරිසක් මෙරටට එවීය.

## කෙයංසිත්ථ රජ

- අනුරුද්ධ රජතුමාගේන් පසු මීලගට රජ වූයේ ඔහුගේ පුත් කෙයංසිත්ථ (1084-1113) රජුය.

- ආනන්ද විහාරස්ථානය හා ඔහුගේ පිය රජු ආරම්භ කළ ස්වේදගොන් චෛත්‍යයේ වැඩ අවසන් කළේ මෙතුමාය.

- "ධම්ම සේනාපති නැමැති උගත් භික්ෂුවක් "කරිකා","එතිමාසමිදීපනී" හා "මනෝහාර" නැමැති පාලි ග්‍රන්ථ සම්පාදනය කළේය.

- 1093 දී "අයත්සෙවසන්සො" සෙල්ලිපියට අනුව මෙතුමා දඹදිව බුද්ධගයාව ප්‍රතිසංස්කරණය කිරීමට දූත පිරිසක් යැවීය.

## බුරුමය හා ලංකාව අතර යුද්ධයක්

- සිංහල වංශ කථා හා ශිලා ලේඛන අනුව 12 වන සියවසයේදී මහා පරාක්‍රමබාහු (1153-1186) රජු කල ලංකාවත් බුරුමයත් අතර යුද්ධයක් සිදුවිය.

- මෙයට හේතු වී ඇත්තේ ලංකාවෙන් කාම්බෝජයට ගිය සිංහල කුමරියකට හා වෙළෙඳ කණ්ඩායමකට බුරුම රජු හිරිහැර කිරීමයි.

- දෙවනගල ශිලා ලිපියට අනුව මෙම යුද්ධය මෙහෙයවා පාලනය කොට ඇත්තේ කිත්නුවරගල් සෙනවියා විසිනි.

## බුරුමයේ සීහළ සංඝ නිකායේ ආරම්භය

- මහා පරාක්‍රමබාහු රජු සමයේ බුරුමයේ සංඝ නායක ධුරය දැරූ "උත්තරජීව" තෙරුන්වහන්සේ "ජප්පට" සමණේරයනුත් සමග ලංකාවට වැඩි සේක.

- ජප්පට සාමණේරයන් වහන්සේ සිංහල භික්ෂූන් අතින් උපසම්පදාව ලබා දසවසක් මෙහි රැදී සිට මහා විහාරයෙන් "සද්ධම්ම ජෝතිපාල"යන උපාධිය ලබාගත් සේක.

- ඉන් අනතුරුව තාම්‍රලිප්ති වාසී සීවලී,කාම්බෝජ වාසී කාමලින්ද, කාඤ්චිපුර වාසී ආනන්ද හා ලංකා වාසී රාහුල යන තෙරවරුන සමඟ ජප්පට හිමියෝ ආපසු බුරුමයට වැඩියහ.

- ආපසු බුරුමයට වැඩි මෙම භික්ෂූන් වහන්සේලාගෙන් බුරුමයේ සිටි විශාල සංඛ්‍යාවක් උපසම්පදාව ලැබීය. එම භික්ෂු පරපුර "සීහල සංඝ" නිකාය නමින් හැඳින්විනි.

- බුරුම උපසම්පදාව උසස් කොට සැලකූ පිරිසත්, ජප්පට භික්ෂුව ඇතුලු පිරිසට විරුද්ධව ක්‍රියා කල පිරිසත් "මරම්ම සංඝ" නමින් හැඳින්වෙන්නට විය.

## පිරිහීමක්

- නරපතී සිටු රජුගේ අභාවයෙන් 13 වන සියවසේ මුල් භාගයේ දී පගාන් රාජ්‍යය පරිහානියට පත් විය.

- 13 වන සියවස අග භාගය වන විට චීන රාජ්‍යයේ පාලකයා වූ කුබ්ලයි ඛාන්තුමා 1277 දී පගාන් රාජ්‍යය ආක්‍රමණය කළේය. ඉන් අනතුරුව නැවතත් කළ චීන වැටලීමේ දී පගාන්හී රජු වූ "නරතිහපතෙ" පගාන් නගරය හැර පලා ගියේය.

- මෙයින් 15 වන සියවස දක්වාම රටේ ආරවුල් ඇති විය, ආගම අඩපණ වූ අතර සංඝයා භේද භින්න විය, බුරුම රාජ්‍යයේ බොහෝ කොටස් "ෂන්" ගෝත්‍රික ප්‍රධානීන් අතර බෙදී ගියේය.

## සංඝ සංශෝධනයක්

- 15 සියවසේ මධ්‍ය භාගය වන තුරුත් භික්ෂූන් භේද භින්නව සිටීමත්, භික්ෂූන්ගේ නොමනා පැවැත්මත් නිසා ශාසනය තව තවත් පරිහානියට පත්විය. මෙයින් සසුන බේරා ගැනීමට බුරුමයේ "පේගු"රාජ්‍යයේ රජු වූ කලින් පැවිදි ජීවිතයක් ගත කල ධම්ම චේතිය රජු තීරණය කලේය.

- මෙකල ලංකාවේ පාලකයා වූයේ 4 බුවනෙකබාහු (1470-1478) රජුය.

- ධම්ම චේතිය රජු විසින් සසුන බේර ගැනීමට එකම උපසම්පදා ක්‍රමයක් ඇති කිරීම බලාපොරොත්තුවෙන් ස්ථවිරයන් වහන්සේලා 22ක් හා සාමණේරයන් වහන්සේලා 22ක් මොග්ගල්ලාන හා මහා සීවලී යන ස්ථවිරයන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙන් නැව් දෙකකින් ලංකාවට එවන ලද අතර එක් නැවක් කොළොම් තොටටත් අනිත් නැව වැලිගම් තොටටත් සම්ප්‍රාප්ත විය.

- මෙම පිරිස ඉතා සාදරයෙන් පිලිගත් බුවනෙකබාහු රජු කැළණි නදියේ ඉදිකල උදකුක්ඛෙප සීමා මාලකයකදී සිව් දිනකින් මේ සියලු පිරිසම උපසම්පදා කලහ.

- මෙහිදී පැමිණි මොග්ගල්ලාන තෙරුන්ට "ධම්මකිත්ති ලෝක ගරු සාමි" යන ගරු නාමයත්, මහා සීවලී තෙරුන්ට "සිරිසංඝබෝධි සාමි" යන ගරු නාමයත් ප්‍රදානය කළ බව කල්‍යාණි ශිලා ලිපියේ සඳහන්ය.

## නූතන යුගය(16 සියවසේ සිට මේ දක්වා)

- 1527 දී ආවා නුවර රජ වූ ථොහන්බවා රජ භික්ෂූන් 3000ක් පමණ රැස් කරවා එකවර මරා දැමීමට කටයුතු කර ඇත.

- 16 සියවස අග භාගයේදී බුරුමයට පැමිණි "පිලිප් ද බ්‍රිටෝ" නැමැති පෘතුගීසී නිලධාරියා බෞද්ධ සිද්ධස්ථාන විනාශ කර වස්තුව පැහැර ගත් බැවින් 1605 දී රජු වූ ධම්මරාජ රජු විසින් ඔහු මරා දමන ලදි.

### පාරුපණ වාදය

- පාරුපණ නම් දෙවුර වසා සිවුරු පෙරවීමයි. ඒකංසික නම් එක් උරයක් පමණක් වසා සිවුරු පෙරවීමයි. මෙම ක්‍රම දෙකට භික්ෂූන් අතර වාද ඇති විය.

- 1782 රජු වූ බොදෞපයා රජු මෙය විසඳීමට සංඝයා වහන්සේලා ඇතුලු කොමිටියකට බාර දෙන ලදි. එහිදී දෙවුර වැසීමේ සම්ප්‍රදායට ජය අත් විය.

### ලක්දිව අමරපුර නිකාය පිහිටුවීම

- ක්‍රි.ව. 1800 දී ලංකාවේ ගොවි කුලයට පරිබාහිර කුලවලට අයත් සාමණේර පිරිසක් අඹගහපිටියේ ඤාණවිමතිස්ස තෙරුන්ගේ ප්‍රධානත්වයෙන් බුරුමයට ගොස් උපසම්පදාව ලැබීය.

- මේ පිරිස 1802 දී ලංකාවට පැමිණ අමරපුර නිකාය නම් භික්ෂු පරපුර ආරම්භ කරන ලදි.

### මින්දොන් මින් රාජ්‍ය සමය

- 1852 දී මින්දොන් මින් රජු රාජ්‍යයත්වයට පත් වූ අතර ශාසන වංශය ඇතුලු පාලි ග්‍රන්ථ රාශියක් රචනා කල පඤ්ඤසාම මහතෙර එතුමාගේ ගුරුවරයා විය.

- 1871 දී මණ්ඩලේ නුවර මෙතුමා විසින් පවත්වන ලද පංචම සංගායනාවට භික්ෂූන් දෙදහස් දෙසීයයක් සහභාගී වූ අතර මෙම සංගායනාවෙන් සංශෝධනයට පත් කල කිරිගරුඬ ගල් පුවරු හත්සිය විසිනවයක කොටවන ලදි.

- මේ පුවරු ලෝක මරාජින නම් දාගැබ වටේ අල්ලා එක් එක් පුවරුව ආවරණය වන ලෙස වෙන් වෙන් වශයෙන් ගෙවල් සාදා ඇත. මේ සඳහා රුපියල් පහළොස් කෝටියක් වැය කල බව සඳහන්ය.

## බුරුමයේ වර්තමාන භික්ෂු නිකායන්

- වැඩිම භික්ෂු පිරිසක් සිටින සුධම්ම නිකාය කුඩ භාවිතය, පාවහන් පැළඳීම, බුලත් කෑම, ධූම පානය සහ පිරිත් දෙසීමේදී වටාපතක් භාවිතය අනුමත කරයි.

- මිනිඩොන් රාජ සමයේදි ජාගර මහථෙර විසින් ආරම්භ කල ස්වේජින් නිකාය ඉරු අවරට ගියපසු බුලත් කෑමත්, ධූම පානයත් අනුමත නොකරයි.

- ද්වාර නිකායේ භික්ෂූහු කායකම්ම, වචීකම්ම හා මනෝකම්ම යන ව්‍යවහරය වෙනුවට කායද්වාර, වචීද්වාර හා මනෝ ද්වාර යන ව්‍යවහාරය භාවිත කරයි.

## බුරුම ජනයා කෙරෙහි බුදු දහමේ බලපෑම

- බුදු දහමේ ආලෝකය ලද බුරුමයෙන් කුල භේදය තුරන් වී ගොස් ඇත. කුලභේදය නොසලකන එකම ථේරවාදී බෞද්ධ රට බුරුමය වශයෙන් සැලකිය හැකිය.

- බුරුමයේ සෑම පිරිමියෙක්ම ජීවිතයේ යම්කිසි අවස්ථාවකදී සුළු කලකට හෝ පැවිදි වෙයි. සිවුරු හළ පුරවැසියා බුරුමයේ උසස් කොට සලකනු ලැබේ.

## අධ්‍යාපනය හා සාහිත්‍යය

- පාලි භාෂාව හා සාහිත්‍යය ඉගෙනීම සඳහා පමණක් පාලි විශ්වවිද්‍යාලයක් පිහිටුවා තිබේ.

- බුද්ධ ධර්මය පිලිබඳව ශාස්ත්‍රීය අධ්‍යනයක් කරන වැදගත්ම රට බුරුමයයි. බුරුමයේ මණ්ඩලේ නුවර මේ ශාස්ත්‍රීය අධ්‍යාපනයේ මධ්‍යස්ථානයයි.

## බුරුමයේ කලා ශිල්ප

- පුරාතන යුගයට අයත් බුරුම කලා ශිල්ප දක්නට ලැබෙන්නේ පැරණි "ප්‍යූ" නගර වලය.

- ඉහළ ඉරවඩී ද්‍රෝණියේ පිහිටි ප්‍යූ නගර වලින් අනාවරණය කර ඇත්තේ පැරණි ශ්‍රී ක්ෂේත්‍ර නගරයයි. මෙහි කලා වස්තු අතර ථේරවාද මෙන්ම මහායාන බුදු පිළිමත්, බෝධිසත්ව රූපත්, හින්දු දේව රූපත්, ආදිම දාගැබ් වල ආකෘති ද දක්නට ලැබේ.

## දාගැබ්

- බුරුමයේ සෑම තැනකම දක්නට ලැබෙන ගොඩනැගිල්ල නම් "පැගොඩා" නමින් හැඳින්වෙන දාගැබයි.

- අනුරුද්ධ රජු විසින් පාගාන් නගරයේ පමණක් පන්දහසකට නො අඩු දාගැබ් ගණනක් ඉදිකර ඇත. මේවායින් පැරණිම එකක් නම් "බූපයා" චෛත්‍යයයි.

- පගාන් ගෘහ නිර්මාණයේ තවත් ලක්ෂණයක් නම් විහාරය හා චෛත්‍යය ඒකාබද්ධ කිරීමයි. එනම් පිළිම ගෘහය මත චෛත්‍යය ගොඩනැගීමයි. මෙයට උදාහරණයක් නම් පගාන්හී අබෙයදාන චෛත්‍යයයි. තවද පගාන් හී විශිෂ්ට දාගැබක් වන ආනන්ද චෛත්‍යයයි. මෙහි පිළිම ගෘහයෙහි ඇති විශාල වැඩ සිටිනා බුදු පිළිමත්, බෞද්ධ කතා නිරූපණය කරන කැටයමුත් වැදගත් වේ.
- බුරුමයේ අති උත්කෘෂ්ඨ දාගැබ ලෙස සලකනු ලබන්නේ ස්වේදගොන් චෛත්‍යයයි. චෛත්‍යයේ මුදුන් පෙදෙසේ රන් ආලේප කිරීමෙන් අලංකාර කිරීමද විශේෂ ලක්ෂණයකි.

## පන්සල් ගොඩනැගිලි

- පේගු නගරයේ පිහිටි "ස්වේ හ්මව් දව්" පන්සලත්, අරකන්හි "මින්ගන්" පන්සලත් මණ්ඩලේ නගරයේ ඇති "මහා මියත්මුනි" පන්සලත් චීන මෝස්තර මිශ්‍ර බුරුම සම්ප්‍රදායේ ගොඩනැගිලිය.

## බුදු පිළිම

- බුරුමයේ බුදු පිළිම ලංකාවේ බුදු පිළිම මෙන් කලාත්මක නොවීමට හේතු නම් පැතළි මුහුණ හා ශරීර හැඩය මතුකර නොපෙන්වන සිවුර නිරූපණය කිරීමේ සම්ප්‍රදායයි.

- විශාල බුදු පිළිම ගඩොලින් හා බදාමෙන් නිමවන ලද අතර රන් ආලේප කරයි.

## මූර්ත කැටයම්

- මූර්ත කැටයම් වලට වස්තු වී ඇත්තේ ජාතක කතාය. පගාන් නුවර ආනන්ද දාගැබෙහි ඇති කැටයම් මූර්ත කලාවේ ආදර්ශමත් කැටයම් වේ.

## චිත්‍ර

- පගාන් නුවර විහාර කිහිපයක 13 සියවසට අයත් චිත්‍ර කලා සම්ප්‍රදායය අනුව හැඩ ගැසී ඇති බව කිව හැකිය. වට් - ක්යි - ඊන් හා අබෙයදාන විහාර වල ඇති බිතු සිතුවම් මෙයට නිදසුන් වේ.

# 14. පාඩම

# තායිලන්තයේ බුදු දහම

- අග්නිදිග ආසියාවේ ඉන්දු චීන අර්ධද්වීපයට අයත් මීනැම් ගං මිටියාවතේ පිහිටා ඇත.
- සියම නමින්ද හඳුන්වයි.
- ලංකාව මෙන් 8 ගුණයක් පමණ විශාලය.
- බටහිරින් බුරුමයෙන්, උතුරෙන් හා නැගෙනහිරින් ලාඕසයෙන්, ගිණිකොණ දෙසින් කාම්බෝජයෙන් දකුණෙන් සියම් බොක්ක හා මලයාවෙන් සීමා වේ.
- ජනගහනය කෝටි හතරයි - 90% බෞද්ධ
- ථෙරවාදී බුදු දහම
- සියම් නිකාය ආරම්භ වීම

## ශාසන ඉතිහාසය

- ස්වර්ණ භූමියට/ බුරුමයට ගිය සෝණ හා උත්තර යන ධර්ම ප්‍රචාරක හිමිවරුන්ගේ මාර්ගයෙන් ආරම්භ විය.
- ක්‍රි.ව. 7 වන සියවසේ පමණ පහල මිටියාවතේ දියුණුවට පත් ද්වාරවතී නම් රාජ්‍ය පිළිබඳව හියුං සියැං නම් දේශාටකයාගේ ගමන් විස්තරයේ ඇතුලත් ය.
- ක්‍රි.ව. 9 වන සියවස - කාම්බෝජය අධිරාජ්‍යයේ ආදිපත්‍යයට යට වීම.
- මෙකල ශිව ආගම හා මහායාන ධර්මය බලවත්ව තිබිණි.
- ක්‍රි.ව. 10 සියවස දකුණු චීනයේ යුනාන්හි සිටි තායි ජනයා මීනැම් මිටියාවතට පැමිණීම.
- ඔවුන් සුඛෝදයෙහි හා අයෝධයෙහි ස්වාධීන රාජ්‍යයන් පිහිටවීම.
- තවත් පිරිසක් යෝන රට්ඨය/ බටහිර ලාඕසය පැහැර ගැනීම - අගනුවර හරිපුඤ්ජය
- මලය අර්ධද්වීපය අයත් ශ්‍රී ධර්මරාජ රාජධානියද/ නූතන ලිගෝරය, බටහිරින් මොන් ප්‍රදේශයේ ද තිබූ ථෙරවාදී බුදු දහම තායි ජනයාට ලැබී ඇත.

### යුග හතරක්

- 1 - ක්‍රි.පූ. 3 වන සියවසේ සිට නකොම්පටොම් නගරය ආශ්‍රිතව ව්‍යාප්‍තිය

ආරම්භයේදී ථෙරවාදී බුදු දහම පැතිරුණි.

බැංකොක් නගරයට බටහිරින් පිහිටි පොංතුක් හා පාපටොන් වල බෞද්ධ ගොඩනැගිලි, බුදුපිළිම හා ධර්ම චක්‍ර

- 2 - ක්‍රි.ව. 700දී පමණ

පලම්බාන් (සුමාත්‍රා) රාජ්‍යයෙන් ව්‍යාප්ත වූ මහායාන බුදුදහම පැවති යුගයයි.

- 3 - ක්‍රි.ව. 1000දී පමණ බුරුමයේ අනවරත රජුගේ කාලයේදී
- 4 - ශ්‍රී සූර්යවංශ රාම මහා ධාර්මික රාජාධිරාජ රජතුමන්ගේ කාලයේ

## ලංකා තායි සබඳකම්

- දඹදෙණි යුගයේදී හෝ ඊටත් ප්‍රථම සිට
- මලයා අර්ධද්වීපයේ ශ්‍රී ධර්ම රාජ රාජධානිය මගින් සබඳකම් ඇතිවී ඇත
- මුල්වරට සුඛෝදයෙහි රෝචරාජගේ කාලයේදී
- මේ හා සම්බන්ධව අද්භූත බල සහිත බුදු පිළිම වහන්සේ නමක් ලංකාවෙන් තායිලන්තයට වැඩමවීම පිලිබඳව ජිනකාල මාලිනී නම් පාලි කෘතියේ සදහන් වේ. (බටහිර ලාඕසයේ ක්සියෙංමායිහි මහා බෝධාරාමයේ වැඩ විසූ රතනපඤ්ඤ හිමි 1516 දී ලියූවකි.)

### සීහළ පයීමා

- බුද්ධ පරිනිර්වාණයෙන් 700 වසරකට පසු, ලංකාවේ රජ කෙනෙකුට ජීවමාන බුදුරදුන්ගේ ස්වරූපය දැකීමට අවශ්‍ය වූ නිසා නාග රාජයෙක් රජු ඉදිරියේ පෙනීසිට බුද්ධ ප්‍රතිමූර්තියක් මැවීය. රජු සත් දිනක් දිවා රෑ බුදුරුවට වන්දනාමාන පවත්වා එයට සමාන බුදුරුවක් රන් හා ඊයම් මිශ්‍ර ලෝහයෙන් කරවන ලදී.

- ලංකාවෙන් සියමට බුදු පිළිම වහන්සේ නමක් වැඩමවීම.

- බුද්ධ පරිනිර්වාණයෙන් අටලොස් සියවසක් ගත වූ කාලයේ සියම් දේශයේ රෝච නම් රජු සහ සිරිධම්ම නගරයේ සිරිධම්ම රජු පොදු රාජ දූතයෙකු ලක්දිවට යවා සිංහල රජුගෙන් සීහළ ප්‍රතිමාව ඉල්ලා සිටීම. ප්‍රතිමාව රැගත් නෞකාව කුණාටුවකට හසුවී මුහුදුබත් උවද නාග රාජයින්ගේ බලයෙන් ලී පුවරුවක නැගී සිරිධම්ම නගරයට පැමිණීම. රෝච රජු එම පිළිම වහන්සේ සුඛෝදය පුරයට වැඩමවීම.

- මෙහි රෝච රජු හා සියම් අක්ෂර නිපදවූ රාමවාම්හෙං රජුත් දෙදෙනාම එක්කෙනෙකු බවද සැලකේ.
- මලය අර්ධද්වීපයේ සිරිධම්ම නගරය නූතන ලිගෝරයයි.
- මලයා බසින් - නඛොන් සි තම්මරත්
- පාලියෙන් - තම්බරට්ඨය
- සිංහලෙන් - තම්බලිංගය/ තමලිංගමුව

- දඹදෙණියෙහි දෙවන පරාක්‍රමබාහු රජු කල ලංකාව දෙවරක් ආක්‍රමණය කල චන්ද්‍රභානු නම් ජාවක රාජයා සිරිධම්ම රජුම බව නිගමනය කරයි.
- හේතුව - ජයියා නම් සථානයේ සෙල්ලිපියක චන්ද්‍රභානු හා තාම්බ්‍රලිංගේශ්වර යන උපාධි නාම වලින් හඳුන්වන බව සඳහන් වේ.

- 12 වන ශතවර්ෂයේ පටන් සිරිධම්ම නගරයත් ලංකාවත් අතර සබඳකම් තිබී ඇත.

- දෙවන පැරකුම්බා රජු තම්බරට්ඨයෙන් ධර්ම කීර්ති නම් විශාරද තෙරුන් වහන්සේ නමක් ගෙන්වා ගැනීම.
- සොළී දේශයේ පවා ආගමික කටයුතු වල යෙදුන ආනන්ද නම් සිංහල මහාසාමි නමක් තම්බරට්ඨයේද ආගමික කටයුතු වල නියැලීම.
- රාමඤ්ඤ දේශයට වැඩම කල උදුම්බරගිරි (දිඹුලාගල) මහා ස්ථවිර කෙනෙක් ශිෂ්‍යයන් වූ සුමන ස්ථවිරයන් සුඛෝදයේ ධර්මරාජ රජු වෙතත්, ආනන්ද ස්ථවිරයන් නම්බිසිපුර කිලනා රජු වෙතත් යැවීම.
- සුඛෝදයෙහි ශ්‍රී සූර්යවංශ රාම මහා ධර්ම රාජාධිරාජ (ලිදයිය රජතුමා) ලංකාවෙන් සංඝරාජයන් වහන්සේ නමක් වැඩමවා රාජ්‍යයේ මහා බෞද්ධ ප්‍රබෝධයක් ඇති කල බව සුඛෝදයේ වත්ජායිහි තිබූ සෙල්ලිපියක සඳහන් වේ. අවසානයේ පැවදි වී ඇත.
- මෙම රජුගේ තවත් සෙල්ලිපියක ලංකාවෙන් ශ්‍රී මහා බෝධි අංකුරයක් ගෙන්වූ බවද අනාගතයේ බුද්ධ ධර්මය ලෝකයේ පිරිහී ගොස් අවසන් වන අයුරුද සඳහන් වේ.

- පසුව සුඛෝදය රජවරුන්ගේ බලය පිරිහී අයෝධ්‍යා පුරයෙහි රාජ බලය වැඩි වීම
- මෙහි සිටි පළමුවන පරමරාජ විසින් සිය අගනුවරෙහි ලංකාරාමය නමින් සංඝාරාමයක් කරවන ලදී.
- මෙහි වැඩ සිටි "සද්ධම්ම සඞගහ" නම් පාළි කෘතියේ කර්තෘ වන ධම්මකීර්ති නම් භික්ෂූන් වහන්සේ ලක්දිවට පැමිණ විද්වත් ධර්ම කීර්ති හිමිපාණන් කෙනෙකුගෙන් (ගඩලාදෙනියේ දෙවන ධර්මකීර්ති හිමියන් විය හැක.) ධර්මය ඉගෙන නැවත ලංකාරාමයට වැඩම කර ඇත.

## කැළණියේ මහා උපසම්පදා උළෙලක්

- ශ්‍රී බු.ව. 1968 දී සියම් හා කාම්බෝජ භික්ෂුහු බොහෝ දෙනෙක් කැළණියේ දී උපසම්පදාව ලැබූ බව ජිනකාලමාලිනියෙහි සඳහන් වේ.
- මහාධම්ම ගම්භීර, මහා මෙධංකර, මහා ඥාන මංගල, මහා සීලවංශ, මහා සාරිපුත්ත, මහා රත්නාකර, මහා බුද්ධසාගර ඇතුලු නම්බිසිපුරයෙහි වැඩවිසූ මහ තෙරුන් වහන්සේලා 25 නමක්ද,
- මහා ඥාන විසුද්ධි ප්‍රමුඛ තෙරුන් වහන්සේලා 8 නමක්ද වශයෙන් 33 නමක් වහන්සේලා කැළණියට පැමිණ, වනරතන මහා සාමීන් වෙත වැඩ සිටිමින් ග්‍රන්ථ හැදෑරූහ.
- උන්වහන්සේලා සහ රාමඤ්ඤ රටින් පැමිණි භික්ෂූන් වහන්සේලා 6 නමක්, වනරතන නා හිමියන් ප්‍රමුඛ 20 දෙනෙකුගෙන් යුත් සංඝ සභාවක් ඉදිරියේ, කෝට්ටේ හතරවන ශ්‍රී පරාක්‍රමබාහු රජු විසින් කල්‍යාණියෙහි යාපා පටුනෙහි බඳවන ලද හඟුලක වැඩ සිට උපසම්පදාව ලබා ගෙන සියරටට ගොස් සීහළ සංඝ නම් නිකායක් ඇති කළහ. මෙහි වනරතන හිමියන් හංස සංදේශයෙහි වර්ණිත වනරතන හිමියන්ය.

## ලංකාවට තායිලන්තයෙන් උදව්

- ශ්‍රී ලංකා තායි සබඳකම් නැවත ආරම්භ ඌනේ මහනුවර ශ්‍රී විජයරාජසිංහ රජු දවසය.
- කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවස වැලිවිට සරණංකර මාහිමියන් ගේ බලවත් උත්සාහයෙන්, පට්ටිපොළ මොහොට්ටාලගේ නායකත්වයෙන් උපසම්පදාව ගෙන ඒමට තායිලන්තයට දූත පිරිසක් යවන ලදී. ඒ අනුව උපාලි මහ තෙරුන් ප්‍රමුඛ තායි භික්ෂූන් 20 නමක්ද, ඇමතිවරුන් 5 දෙනෙක්ද, රනින් කල පිළිමයක්ද ලංකාවට එවීය.
- උපාලි මහතෙරුන් ප්‍රමුඛ තායි භික්ෂූන් වහන්සේලා වැලිවිට සරණංකර හිමි ප්‍රමුඛ ලාංකික සාමනේර පිරිසක් උපසම්පදාව කලහ.
- මෙලෙස වර්තමානයේ ශ්‍යාමෝපාලී වංශ මහා නිකායේ ආරම්භය ඇතිවිය.

## තායිලන්තයේ බුද්ධාගමට හිමි තැන

- රජයේ ආගම බුද්ධාගම යි.
- බුද්ධාගම නඩත්තු කිරීමට, දියුණු කිරීමට හා ආරක්ෂා කිරීමට රජය බැඳී සිටී.
- රජයේ ප්‍රධානියා බෞද්ධයෙකු විය යුතුය.
- බෞද්ධ විහාර ආරාම සියල්ල රජය මගින් පාලනය වේ.
- රජයේ විශාල මුදලක් වැය කරන්නේ ආගමික කටයුතු සඳහා ය.
- සඟරාජතුමා පත් කරන්නේද රජය විසිනි.

## සංඝ සංවිධානය හා පැවදි ජීවිතය

## සංඝ සංවිධානය

1) සංඝ රාජයන් වහන්සේ

2) උත්තරීතර සංඝ සභාව

3) සංඝ මන්ත්‍රී මණ්ඩලය

4) ප්‍රාදේශීය පාලක මණ්ඩලය

5) භික්ෂු කොමසාරිස්වරු

6) දිස්ත්‍රික් කාරක සභා

7) ග්‍රාම සංඝ කාරක සභා

**සංඝ රාජයන් වහන්සේ** - පාලන තන්ත්‍රයේ ප්‍රමුඛයා

- විනය නීති පැනවීම
- සංඝ පාලනය
- අධිකරණ බලය

- පාලන තන්ත්‍රයේ ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂන ඇත.

## උත්තරීතර සංඝ සභාව/ සංඝරාජතුමාගේ උපදේශක සභාව

- 45 නමක්
- මෙම සංඛ්‍යාව අනුව සියම් අකුරින් මුද්‍රිත පාලි ත්‍රිපිටකය කොටස් 45කට බෙදා ඇත.
- මෙහි සාමාජිකයෙකු වීමට, පාලි භාෂාව පිලිබඳ දැනුම හා ධර්මඥානය තිබිය යුතුය

**සංඝ මන්ත්‍රී මණ්ඩලය**

- සාමාජිකයින් 9කි.

4 - උත්තරීතර සංඝ සභාවෙන්

5 - පොදු මහා සංඝයාගෙන් පත්කර ගනී

- පාලනය
- අධ්‍යාපනය
- ප්‍රචාරක කටයුතු
- සමාජ සේවය

**ප්‍රාදේශීය පාලක මණ්ඩල**

- සංඝ මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු වල පහසුව සඳහා
- එක් එක් ප්‍රදේශ වල පාලන, අධ්‍යාපනික, සාමාජික හා ප්‍රචාරක කටයුතු පිලිබඳව සංඝ මන්ත්‍රී මණ්ඩලයට වගකිව යුතුය.

**භික්ෂු කොමසාරිස්වරු**

- පාලක මණ්ඩල වල කටයුතු පරීක්ෂා කිරීම සඳහා
- කොමසාරිස් පාලන කොටස් 5 කි.
- එක් කොටසකට කොමසාරිස්වරයකු, නියෝජ්‍ය කොමසාරිස්වරු, කාරක සභා ඇත.

**දිස්ත්‍රික් කාරක සභා**

- සංඝ මන්ත්‍රී මණ්ඩලයේ යෝජනා දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රියාත්මක කිරීම.

**ග්‍රාම සංඝ කාරක සභාව**

- ඉතාම කුඩා පරිපාලන ඒකකයයි.
- අවම පන්සල් 5ක් ඇතුලත් ය.

**අධිකරණ සංඝ සභාව**

- ස්වතන්ත්‍ර සභාවකි.
- කොටස් 3 කි - ප්‍රථමාධිකරණය , මධ්‍යම අධිකරණය, ශ්‍රේෂ්ඨාධිකරණය
- රජතුමාගේ අධිකරණ බලය නිසි ලෙස ක්‍රියාවේ යොදවයි.

## පැවිදි ජීවිතය

- ටික දිනක් හෝ පැවිදි වී ජීවිතය ගත කිරීම තායිවරුන්ගේ චිරාගත සම්ප්‍රදායයි.
- පැවිදි වීමේ පූර්ව කෘත්‍යයන් උත්සව සහිතව කෙරේ.
- පැවිදි කිරීම හා කිරීම හා උපසම්පදා කිරීම පිළිබඳ සංසකර්ම බොහෝදුරට ලංකාවේ මෙනි.
- පැවිදි වීමෙන් පසුව ද ගිහි නම භාවිතා කළ හැකිය.
- සාමණේර කාලයේ දී ගිහි නමට මුලින් "සාමණේර" යන්නද, උපසම්පදා වූ විට නමට මුලින් "ප්‍ර" ද යොදනු ලැබේ.
- තායි භික්ෂුවගේ ප්‍රධාන කාර්යයන් වන්නේ බණ දහම් ඉගෙනීම, බණ භාවනා කිරීම, වත් පිළිවෙත් කිරීම හා දායක දායිකාවන්ගේ මංගල හා අවමංගල අවස්ථාවන් හි ආගමික කටයුතු කිරීමත් ය.

➢ විහාරාධිපති තනතුර සඳහා ප්‍රධාන සුදුසුකම්

1) උගත්කම

2) පක්ෂ භජනයෙන් තොරව කටයුතු කිරීම

3) වෛර හා දිරි පිරිමහන්නෙකු නොවීම

4) සීලයෙන් හා සිහියෙන් යුක්තවීම

5) නිර්භය වීම

- මේ සඳහා විහාරස්ථ දායකයින්ගේ අදහස් අනුව දිස්ත්‍රික්ක සංඝ සභාව විසින් කෙනෙකු තෝරා ගනී.
- විහාරාධිපතිවරයා තමාගේ වගකීම් කොමිටියට බෙදාදෙයි.
- එහි සාමාජිකයන්ගේ වගකීම් වන්නේ ගොඩනැගිලි කටයුතු, දානමාන කටයුතු සංවිධානය, ආරාධනා භාර ගැනීම, වත්පිළිවෙත් සොයා බැලීම, සාමණේරවරුන් ගැන සොයා බැලීම හා අධ්‍යාපන කටයුතු ය.
- සෑම භික්ෂුවකට ම හැඳින්වීමේ පත්‍රයක් ඇත.
- පිටු 28ක කුඩා පොත.
- එහි ස්ථාන මාරු, ලබා ගන්නා සහතික, දඬුවම් ආදි විස්තර ඇත.
- ආරාමයක නැවතීමට හැඳුනුම්පත අවශ්‍ය වන අතර පොදු ප්‍රවාහනයේදී සහනදායක පහසුකම් ලැබේ.
- මුලින් තමන් සතුව තිබූ ඉඩකඩම් ව්‍යාපාර කැපකරුවෙකු යටතේ තැබිය යුතුය.
- දේශපාලන කටයුතු වලට සහභාගී වීම සහ ඡන්ද බලය අහිමි ය.
- සිවුරු හැරීම ද උත්සවාකාරයෙන් කෙරේ.
- මසකට දෙවරක් පෝය කිරීම භික්ෂූන්ගේ වැදගත් චාරිත්‍රයකි.
- තායි භික්ෂූන් දිනපතා පිණ්ඩපාතයේ වැඩීම සිදුකර.
- චාරිකාවේ යෙදෙන භික්ෂූහු කොටසක්ද තායිලන්තයේ සිටිති.
- තායිලන්තයේ ආරාම සේනාසන ද ඇත. ආරාම ලෙස වනාන්තර වල ඇති පැරණි ගල් ගුහා භාවිතා කරයි.
- ථේරවාද භික්ෂු නිකාය දෙකකි - ධම්මයුක්තික නිකාය, මහා නිකාය

- මොන්කුත් රජතුමා ආරම්භ කළ ධම්මයුක්තික නිකායේ විනය නීති දැඩි ය.
- මහා නිකායට වැඩි භික්ෂූන් ගණනක් අයත් වේ.

➢ නිකායයන් දෙක හදුනා ගත හැකි ලක්ෂණ

1) ධම්මයුක්තිකයින් සිවුරු පොරවන්නේ වම්පසට සිවුරු කොන් අඹරවා ගැටවටුව ගැසීමෙනි. මහා නිකායිකයෝ දකුණු පසට ගැටවටුව ගැසීමෙන් සිවුරු පොරවයි.

2) ධම්මයුක්තිකයින් මහජනතාව ඉදිරියේ පාමොක් දෙසන අතර මහා නිකායිකයෝ සීමාවට වී දොර වසා ගෙන පාමොක් දෙසති.

3) ධම්මයුක්තිකයින් ඇවැත් දෙසන්නේ තමාට ඇවතක් සිද්ධ වී යැයි සිතුණොත් පමණි. මහා නිකායිකයෝ නොවරදවාම දවසට දෙවරක් ඇවැත් දෙසති

## බෞද්ධ ගිහි ජීවිතය

- සෑම භික්ෂුවකටම පාහේ කුළුපග දායකයෙක් සිටියි
- ගිහි සාමීචි ප්‍රතිපදාව
- මෙයට එක් හේතුවක් නම් සෑම ගිහියෙකුම තාවකාලිකව ටික කලකට මහණ වී භික්ෂූන් සමග එකට මහණදම් පිරීම යි.
- දිනපතා ආගම් ඇදහීමේ කටයුතුවල යෙදෙයි.
- විහාරස්ථාන වලට සම්බන්ධ දේවාල නොමැත.
- ඔවුන් අදහන භූමි දෙවතාවකුට දිනපතා පහනක් දැල්වීම සිරිතකි.
- පිරිත් කිරීමෙන් සකසන ලද බුද්ධ රූප කරේ පැළඳ ගෙන සිටීම.
- භික්ෂූන් වහන්සේලාට අංග අංග සම්පූර්ණ ආරාමයන් සාදා දීම.

### ගිහි පැවිදි සම්බන්ධය

- තායිවරුන්ගේ බොහෝ පන්සල් වල බොහෝ ළමයි ද වාසය කරති.
- ඔවුන් "ඩෙවවට" නමින් හඳුන්වයි.
- ප්‍රධාන කාර්ය පාසල් ගොස් ඉගැනීමයි. ඒ හැරෙන්නට තමන්ගේ කුටි පවිත්‍ර කර ගැනීම, භික්ෂූන්ට වතාවත් කිරීම, ඇඳුම් සෝදා ගැනීම උදේ හවස ව්‍යායාම් කිරීම, බුදුන් වැඳ පිරිත් කීම කළ යුතුය.

➢ හොද ගිහි පැවති සම්බන්ධයක් ඇති වීමට හේතු

1) කුඩා කාලයේදීම ගිහියන් පන්සලේ භික්ෂුවක් ඇසුරේ වැඩීම.

2) හැම පිරිමියෙකුම ටික කලක් පැවිදි වී භික්ෂූන් සමග කටයුතු කිරීම.

3) සෑම මවකගේම පුතකු හෝ සහෝදරයකු පැවිදි වී සිටීම.

- වැඩි වයස් භික්ෂුවකට අමතන්නේ - ලුවංපෝ - ගරු තාත්තා
- තරුණ භික්ෂුවකට - ලුවංපී - ගරු අයියා හෙවත් සහෝදරයා
- කුඩා සාමණේර වරු - ලුක්හේන් - සාමණේර පුතා

## ආගමික උත්සව අධ්‍යාපනය හා කලා ශිල්ප

### උත්සව

- වෙසක් උත්සවය - ආගමික මාතෘකා යටතේ ප්‍රසිද්ධ කතා පැවැත්වීම.
- කඨින පිංකම් උත්සවය - පෙරහැර ජාතික ක්‍රීඩා වලින් සමන්විත වූවකි.
- පිරිත් උත්සව

### අධ්‍යාපනය

- පොදු ජන අධ්‍යාපනය ලබා දුන්නේ වට් නමින් හැඳින්වෙන පන්සල යි
- ප්‍රධාන විෂයන් නම් තායි භාෂාව, කියවීම, ලිවීම, ආගම ධර්මය, පාලි භාෂාව, ගණිත ශාස්ත්‍රය සහ යහපත් සිරිත් විරිත් පිළිබඳ ආචාර ධර්ම යි.
- මොන්කුත් හෙවත් සිව් වන රාම රජුගේ කාලයේ දී මෙම පන්සල් අධ්‍යාපන ක්‍රමය ආගමික අංශයෙන් පූර්ණත්වයක් ලැබීය.
- 1929 දී සියලුම රාජ්‍ය පාසල්වල බුද්ධ ධර්මය ඉගැන්වීම.
- 1957 - පාලි පමණක් දැරීමට පාසල් 495
- ධර්මය හැදෑරීමට පාසල් 6201
- බැංකොක් නගරයේ භික්ෂූන්ට පමණක් සීමා වූ විශ්වවිද්‍යාල මට්ටමේ පාසල් දෙකකි - මහා මකුත් රාජ විද්‍යාලය, මහා චුලාලොන්කෝන් රාජ විද්‍යාලය

### බුද්ධ ධර්ම අධ්‍යයන කටයුතු

- බුද්ධ ජයන්ති වර්ෂය වන විට තායි (සියම්) අකුරින් මුළු ත්‍රිපිටකයම කාණ්ඩ 45 කට වෙන් කොට මුද්‍රණය කිරීම.
- අතිරේකව අට්ඨ කථා කාණ්ඩ 30 ක්ද, ප්‍රකරණ කාණ්ඩ 10ක්ද මුද්‍රිතය.
- විශේෂ ලක්ෂණය නම් මේ හැම ග්‍රන්ථයක ම සූචියක් තිබීමය.
- බැංකොක් නගරයේ වජිරඥාණ අත්පිටපත් පුස්තකාලය තිබීම.
- විසුද්ධි මාර්ගයට ලියන ලද "සංඛපත්ථජොතනී" නම් අට්ඨ කථාවක් ද මෙහි ඇත. මෙය ආරම්භ වනුයේ "ස්වස්ති බුද්ධාය" යන වචන වලිනි.
- "සංගීතිවංශය" නමැති ග්‍රන්ථයේ සංගායනා 9 ක්ද ඇතුළත් වේ.
- මින් ,
    - 1,2,3 - ඉන්දියාවේ
    - 4,5,6,7 - ලක්දිවදී
    - 8,9 - තායිලන්තයේ දී කරන ලද සංගායනා වේ.

**ලංකාවේ සංගායනා**

- දඹදිව සිදු වූ ථෙරවාද බෞද්ධ සංගායනා වලට අනුව ලංකාවේ මුල්ම සංගායනාව හතරවන සංගායනාවයි.

4 සංගායනාව

- දෙවන පෑතිස් රජ සමයේ (247-207) ථූපාරාමයේ දී අරිට්ඨ මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන්

5 සංගායනාව

- වළගම්බා රජ සමයේ (101-77) මාතලේ අළුවිහාරයේ දී රක්ඛිත මහරහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන්
- ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමේ සංගායනාව යි.

6 සංගායනාව

- මහානාම රජු දවස බුද්ධඝොෂ අටුවාචාරීන් විසින්
- සිංහල අට්ඨකථා පාලි භාෂාවට පරිවර්තනය කිරීම.

7 සංගායනාව

- මහා පරාක්‍රමබාහු රජු දවස (1156-1186) මහා කාශ්‍යප හිමියන්ගේ ප්‍රධානත්වයෙන්
- ත්‍රිපිටකය අයත් අට්ඨකථා සංගායනා කිරීම.

**තායිලන්තයේ දී සිදුකරන ලද සංගායනා**

8 සංගායනාව

- උතුරු තායිලන්තයේ රජු වූ ශ්‍රී ධර්ම චක්‍රවර්තී තිලක රාජාධිරාජ විසින් චියෙන්ග්මායි අගනුවර මහා බෝධි ආරාමයේදී
- බුදුදහමේ පදනම තහවුරු කරගැනීම සඳහා

9 සංගායනාව

- පළමුවන රාම රජතුමා ගේ ප්‍රධානත්වයෙන් බැංකොක් නගරයේදී, මහතෙරවරුන් 218 දෙනෙක්ද ගිහි පඬිවරුන් 32ක්ද අවුරුද්දක් තුළ සංගායනාව පවත්වන ලදී.
- තායිලන්තය අසල්වැසි අසල්වැසි රටක් සමග යුධ කිරීම නිසා පැරණි අයෝධ්‍යා නගරය ගිනිබත් වී පොත්පත් අළුවීම සහ මෙ නිසා භික්ෂූන් වහන්සේලාද පිරිහීමට පත්වීම නිසා, බුදු දහමට නව ජීවනයක් ලබා දීමට පවත්වන ලදී.

# තායිලන්තය බෞද්ධ කලා ශිල්ප

- පන්සල් හඳුන්වන්නේ වට් (වත්) නමිනි.
  උදා:- වට් චැන්ග් ලොං, වට් ශ්‍රා ශ්‍රී සුඛෝතායි
- ආරාම සියල්ලකම " ප්‍රා චෙදි" (චෙදි=චෛත්‍යය, ප්‍රා=පූජනීය) නම් ගොඩනැගිල්ලක් ඇත.

## දාගැබ්

දාගැබ් කොටස් හතරකි.

1) "ප්‍රා" ධාතු චෙදී (පූජනීය ධාතු චෛත්‍යය)

2) ප්‍රා බෝරි පොක චෙදි (පූජනීය පාරිභෝගික චෛත්‍යය)

3) ප්‍රා ධම්ම චෙදි (පූජනීය ධම්ම චෛත්‍යය)

4) ප්‍රා උද්දේසික චෙදි (පූජනීය උද්දේසික චෛත්‍යය)

- සර්වඥ ධාතුන් තැන්පත් කර සාදන ලද චෛත්‍යය - ප්‍රා ධාතු මහා චෙදි
- මේවා සුඛෝදය, අයුද්ධ්‍යා ආදී පැරණි රාජධානිවල දක්නට ලැබේ

- රාජධානි අනුව තායි කලාශිල්ප යුගයන් ප්‍රධාන කොටස් හතරකි.

1) ද්වාරවතී යුගය (6,7,8 ශතවර්ෂ)

2) සුඛොතායි/ සුඛෝදය යුගය (11-14 සියවස දක්වා)

3) ආයුථියා/ අයොධ්‍යා යුගය (1350- 1762 දක්වා)

4) බැංකොක් යුගය/ වර්තමාන යුගය (1762 සිට මේ දක්වා)

- චෛත්‍යය නිර්මාණය
- "ශ්‍රා පුරි" නම් ස්ථානයකින් සොයාගන්නා ලද අඩි 2ක් පමණ උස කුඩා ශෛලමය ථූපය ද්වාරවතී යුගයට අයත් ලෙස සැලකේ.
- ලංකාවේ චෛත්‍යය වලට බෙහෙවින් සමාන බවක් දක්නට ලැබේ.
- සිංහල දාගැබ් ලක්ෂණ ඇති විශාල ථූපයක් මුල්වරට දැකිය හැක්කේ මලය අර්ධද්වීපයේ පිහිටි පැරණි නගර ශ්‍රී ධර්මරාජ රාජ්‍යයෙහිය - පොළොන්නරුවේ කිරි වෙහෙරේ ගර්භයට සමාන බවක් ඇත. චෛත්‍යයේ හැඩය බුරුමයේ පගාන් හි ජප්පට චෛත්‍යයේ හැඩයට සමානය.

- සුඛෝදය යුගයට අයත් සිංහල ස්තූප ලක්ෂණ පෙන්වන්නේ සජ්ජනාලය නගර මධ්‍යයේ පිහිටි "වට් චැන්ග් ලොම්" ආරාමයේ ස්තූපයයි. මෙය අනුරපුර රුවන්වැලි සෑ දාගැබ් ඒ ආකෘතියට සමාන ය.
- 15 වන සියවසේදී පමණ සුඛෝදයේ වට් ශ්‍රා ශ්‍රී හි ථූපය හා සජ්ජනාලයේ "වට් නැන්ග් පයා" චෛත්‍යය ගොඩනැගී ඇත. මේවායේ මූලික සිංහල ලක්ෂණ තිබුණද ඒවායේ අංග

පරිමාණයන් ලංකා දාගැබ් වලට සාපේක්ෂ පරිමාණයන්ට අනුකූල නොවීම හා සිහින් කඳකින් යුක්ත ව ඉහළට විහිදෙන ඉතා උස් කොත් කැරලි සහිත වීම විශේෂ ලක්ෂණ වේ.

- අයුධ්‍යා යුගයේ දෙවැනි රාමාධිපති රජු කල "සිංහල ථූප" ක්‍රමයට දාගැබ් ගොඩනැගීම තවත් වැඩි විය. අයුධ්‍යායෙහි වට් ශ්‍රී සර්බෙජ්ඤ (සර්වඥ) ස්ථූපය
- අයුධ්‍යා ථූපය විශේෂ ලක්ෂණය නම් හර්මිකාවත්, ඡත්‍ර පාදයත් හමුවන ස්ථානය වටා කෙටි කුලුනු පෙළක් යෙදීම යි.
- නගර පඨම ස්ථානයේ ඇති පඨම චෛත්‍යය හතරවන රාම රජු විසින් කරවන ලදී. එය ලන්ඩනයේ සාන්ත පෝල් දෙව්මැදුරට වඩා විශාල වන අතර දොඩම් පැහැ වර්ණවත් උළු සෙවිලි කර ඇත.

## පන්සල

දැනට ඉතිරි වී ඇත්තේ,

- බුද්ධගයාහි මහාබෝධි විහාරය අනුගමනය කරමින් චියෙන්මායි හි ගඩොලින් සාදා ඇති "වත් චෙත් යොත්" නම් විහාරය
- අයුධ්‍යාහි ඇති "වට් බුද්ධායි ස්වරිආ" ආරාමය
- අයුධ්‍යාහි "වට් ශ්‍රී සන්පෙත්" ආරාමය තායි පන්සල් ගොඩනැගිලි ක්‍රමයේ ඉහළම අවස්ථාවකි.
- බැංකොක් නගරය ආරම්භ වීමෙන් පසු ඇති වූ යුගයේ ගොඩනැගිලි වල චීන ගෘහ නිර්මාණ ලක්ෂණ ද ඇත - තුන්හුලස් බිත්ති , අධික බෑවුම් සහිත වහලවල් හා අලංකාර කොත් කැරලි

## බුදු පිළිම

- පැරණිම ප්‍රතිමා ශිල්පයට උදාහරණ ඇත්තේ ද්වාරවතී රාජධානියේය.
- මෙකල බුදු පිළිම හා ලෝකඩ පිළිම ආදියේ ඉන්දියාවේ පශ්චාත් ගුප්ත කලා ලක්ෂණත්, පූර්ව පාල යුගයේ කලා ලක්ෂණත් ලක්ෂණත් දක්නට ඇත.
  උදා:- ලොප්බුරි හි බුදුපිළිමය, ජායියා හි අවලෝකිතේශ්වර ලෝකඩ පිළිමය

- සමහර පිළිම වල අමරාවතී කලා ලක්ෂණ ද, ශ්‍රී විජය මූර්ති කලා ලක්ෂණ ද ඇත.
- බොහෝ පිළිමවලින් දැක්වෙන්නේ භූමි ස්පර්ශ මුද්‍රාව යි.
- ලංකාවෙන් ගෙන ගිය සීහල ප්‍රතිමාව තායි බසින් "ප්‍රාඃ සිහිං" යන නමින් හඳුන්වයි - දැනට යෝනක රට්ඨයෙහි නබ්බිති පුරයෙහි "ක්සියෙංමායි" හි වට් ප්‍රාඃ සිහිං ආරාමයේ තැන්පත් කර ඇත.
- සීහළ පයීමා නම් තවත් පිළිමයක් බැංකොක් ජාතික කෞතුකාගාරයේ ද, තවත් පිළිමයක් නා බොන් සි තම්මරත් (ශ්‍රී ධම්ම නගරයේ) ද ඇත.
- අභය මුද්‍රාවෙන් නෙලන ලද චංක්‍රමණ බුදු පිළිම උසස් සුඛෝතායි පිළිම ලෙස සලකයි.
- සිංහල බුදු පිළිම සම්ප්‍රදායත් තායිවරුන්ගේ "මොන්" සම්ප්‍රදායත් එක්වීමෙන් පිළිම නෙලීමේ ක්‍රමය "යූ තොන්ග්" සම්ප්‍රදාය නම් වේ.
- වර්තමාන යුගයේදී විශාල සැතපෙන පිළිම නෙලීම සම්ප්‍රදාය වේ.

**සාහිත්‍ය**

- ථේරවාද බුද්ධාගම නිසා පාලි භාෂාවත්, මහායාන බුද්ධාගම නිසා සංස්කෘත භාෂාවත් ඉගෙනීම සිදු කරයි.
- ජාතක කතා කතා මුල් කරගෙන නාට්‍යය, කාව්‍ය, නවකතා නිර්මාණය.
- ජනප්‍රියම ජාතකය නම් "මහ ඡත්බම් ථෙත්" හෙවත් වෙස්සන්තර ජාතකයයි.
- අයෝධ්‍යා යුගයේ ත්‍රෛ ලෝක නද රජු කවීන් ලවා වෙස්සන්තර ජාතකය විස්තරාත්මකව ලියවීම.

# 15. පාඩම
# චීනයේ බුදු දහම

- ඉන්දියාවට ඊසාන දෙසින් ආසියා මහද්වීපයේ නැගෙනහිරින් පිහිටි විශාල රට චීනයයි.

- චීනයේ ප්‍රධාන ඇදහීම් තුනකි.

   1. කොන්පියුසියස් ධර්මය
   2. තාඕ ධර්මය
   3. බුද්ධ ධර්මය

- මේ නිසා ආගම් තුනේ රට යනුවෙන් චීනය හඳුන්වයි.

## චීනයට බුදු දහම පැමිණීම හා ආරම්භක යුගය

### චීනයට බුදු දහම පැමිණීම

- චීන වංශකතා අනුව ක්‍රි.පූ 217 දී ඉන්දියානුවන් බුදු දහම රැගෙන චීනයේ ෂෙන්ෂි නගරයට පැමිණියේය. ක්‍රි.පූ.122 දී රත්රන් බුදු පිළිමයක්ද චීනයට රැගෙන විත් ඇත.

- මධ්‍ය ඉන්දියානු ජාතිකයෙකු වූ කාශ්‍යප මාතාංග නැමැති භික්ෂුව චීනයට ගොස් බුදු දහම ප්‍රචාරය කළ බව මෙකල මතයයි.

- ක්‍රි.ව. 1 සියවසේ සිට ක්‍රි.ව. 12 සියවස දක්වා කාලය අනු කොටස් 3 කට වෙන්කල හැක.

1.) ක්‍රි.ව. 1 සියවස සිට ක්‍රි.ව. 3 සියවස දක්වා වූ ආරම්භක යුගය
2.) ක්‍රි.ව. 4 සියවස සිට ක්‍රි.ව. 7 සියවස දක්වා වූ තහවුරු වීමේ යුගය
3.) ක්‍රි.ව. 8 සියවස සිට ක්‍රි.ව. 12 සියවස දක්වා වූ බුදු දහම දේශීය බවට පත්වීමේ යුගය

## ආරම්භක යුගය (ක්‍රි.ව.1 සියවස සිට 3 සියවස දක්වා)

- මෙකල චීනයේ බලයට පත්ව සිටියේ හැං වංශික (ක්‍රි.ව.25-264) රාජ පරම්පරාවය.

- මෙම රජවරුන්ට බුදු දහම පිළිබඳව අවබෝධයක් ලබාදීමට "මරණාසන්න වූ කෙනෙකුට භික්ෂූන් වහන්සේ නමකගේ ඇසුර ලබාගැනීමෙන් පරලොව සැපවත් කර ගත හැකිය" යන අදහස ජනතාව අතර ප්‍රචාරය කළහ.

- කොන්ෆියුසියස් හා තාඕ යන දහම් සමග බුදු දහම සන්සන්දනය කරමින් බුදු දහමේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳව හැං යුගය අවසානයේදී "මෝ - ත්සි" (ක්‍රි.ව.170-225) නැමැත්තෙක් පොතක් එළිදක්වනු ලැබිනි.

## චීනයේ බුදු දහම තහවුරු වීමේ යුගය (ක්‍රි.ව. 4-7 සියවස)

- මෙකල චීනයේ රාජ බලය ලබාගත්තේ බෞද්ධයන් වූ "වෙයි" වංශය නැමැති විදේශික ගෝත්‍රයකි.

- චීනයේ උසස් බෞද්ධ කලා නිර්මාණයන් මෙම යුගයට අයත් වෙයි.

- "වයි" වංශයේ පළමුවන අධිරාජ්‍යයා බුදු දහම රජයේ ආගම බවට පත් කර ඇත.

### චීනයේ භික්ෂුනී ශාසනය ඇරඹීම

- චීනයේ භික්ෂුනී ශාසනය ඇරඹීමට උදව් වී ඇත්තේ ලංකාවයි.

- ක්‍රි.ව. 433 දී නන්දි නම් නැව් හිමියෙකු ලංකාවේ දේවසාරා භික්ෂුනිය ප්‍රධාන භික්ෂුනී හූ එකොළොස් නමක් චීනයට රැගෙන ගිය අතර එම භික්ෂුනීන් වහන්සේලා සංඝවර්මන් නම් තෙරුන්ගේ සහාය ඇතිව චීනයේ භික්ෂුනී ශාසනය ආරම්භ කර ඇත.

- 5 සියවසයේදී චීන ජාතික පාහියන් භික්ෂුව ඉන්දියාව, ලංකාව වැනි රටවල් සංචාරය කර ධර්ම ගුප්ත නිකායේ විනය ග්‍රන්ථ 67ක් ද, සර්වාස්තිවාදයේ විනය කාණ්ඩ 157ක් ද, මහා සාංඝික විනය පොත් 40ක් ද, මහිසාසක විනය පොත් 30ක් ද චීනයට රැගෙන යාමට සමත් වූහ.

### කුමාරජීව පඬිවරයා

- ඉන්දියානු වංශවතෙකු වූ කුමාරායන මධ්‍ය ආසියාතියානු කුච දේශයේ ජීවා කුමරිය සමග විවාහ වීමෙන් ලැබුණු පුත්‍රයා කුමාරජීවය. ජීවා පසු කාලයක පැවිදි විය.

- කාශ්මීරයේ බන්ධුදත්ත නැමැත්තෙකු යටතේ ශාස්ත්‍ර අධ්‍යයනය කොට බුදු දහම පිළිබඳව විවිධ සම්ප්‍රදායන්ගේ පඬිවරයෙක් බවට කුමාරජීව පත්විය.

- ක්‍රි.ව. 401 දී ලී - කූ - ආන්ග් විසින් කුච දේශයට විරුද්ධව මෙහෙයවන ලද සටනේදී සිරකරුවෙකු වූ කුමාරජීව චීනයට ගෙනයනු ලැබුවේය.

- උගතෙකු වශයෙන් ප්‍රසිද්ධියට පත්ව සිටි කුමාරජීවට උගතුන් හා එකල සිටි ටී - සින් වංශයේ රජතුමා විසින් බොහෝ ගෞරව දක්වන ලද්දේය.

- උතුරු චීනයේ ජනගහනයෙන් දහයෙන් නවයක් පමණම කුමාරජීව චන්ගන් නගරයේ සිටි වර්ෂ 9 (405-413) තුළදී බුදු දහම වැළඳ ගත්හ.

- චීනයේ මාධ්‍යමික සම්ප්‍රදායේ ගුරුවරයා ලෙස සලකන්නේ කුමාරජීවය. 200කට අධික සංඛ්‍යාවක් ඔහුගේ පැවිදි ගෝලයෝ වූහ.

- කුමාරජීව චීන බසට පරිවර්තනය කළ ඉතා වැදගත් පොත් කිහිපයක් නම්,
- මහා ප්‍රඥා පාරමිතා ශාස්ත්‍රය, ශත ශාස්ත්‍රය, සුඛාවත්‍යාමෘත ව්‍යුහය, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය හා වජ්‍ර චේදිකා ප්‍රඥා පාරමිතා සූත්‍රයයි.

- 413 දී මරණ මංචකයේ උන් කුමාරජීව තමන්ගේ අනුගාමිකයන්ට කතා කර "අගය කළ යුත්තේ ඔහුගේ ජීවිතය නොව ඔහු කළ වැඩ බව" ප්‍රකාශ කර ඇත.

## පරමාර්ථ

- මෙතුමා බටහිර ඉන්දියාවේ උදේනි නගරයේ සංස්කෘත අධ්‍යයනය කළ පැවිද්දෙක් වන අතර අධ්‍යාපනය අවසන් කළ මෙතුමා පාඨලී පුත්‍ර නුවරට පැමිණියේය.

- මේ අතර බුදු දහම ඉගැන්වීමට ගුරුවරයෙකු ඉල්ලා චීන අධිරාජ්‍යයා කළ ඉල්ලීම පිළිගත් පරමාර්ථ දූත පිරිස සමග ක්‍රි.ව. 548 දී නැන්කින් නගරයට සැපත් විය.

- සංස්කෘත ග්‍රන්ථ 70ක් පමණ චීන බසට පරිවර්තනය කළ මෙතුමා චීනයේ මහායාන සම්පරිග්‍රහ ශාස්ත්‍ර නැමැති නිකාය ඇරඹූ තැනැත්තාය.

- වාද සම්ප්‍රදායේ සංස්කෘත ග්‍රන්ථ චීන බසට පරිවර්තනය කළ තිදෙනා වූ පරමාර්ථ ,බෝධිරුචි හා හියුං සියැං අතරින් හියුං සියැං ආරම්භ කළ සම්ප්‍රදාය "ධර්ම ලක්ෂණ" වේ.

- පරමාර්ථ විසින් චීන බසට පරිවර්තනය කළ පොත් අතරින් වැදගත් කිහිපයක්,
- සන්ධි නිර්මෝචන සූත්‍රය ,ප්‍රඥා පාරමිතා සූත්‍රය, මහායාන සම්පරිග්‍රහ ශාස්ත්‍රය, මධ්‍යාන්ත විභාග ශාස්ත්‍රය, අභිධර්ම කෝෂ ව්‍යාඛ්‍යා ශාස්ත්‍රය,මහායාන සම්පරිග්‍රහ ශාස්ත්‍ර ව්‍යාඛ්‍යාව, අෂ්ටාදශ ශූන්‍යතා ශාස්ත්‍රය.

## බෝධිධර්ම

- බෝධි ධර්ම ක්‍රි.ව. 526 දී ධර්ම ප්‍රචාරය සඳහා චීනයට පැමිණි ඉන්දියානු භික්ෂුවකි. මෙතුමා ශූන්‍යතා වාදියෙකි. ඔහු ග්‍රන්ථ ධුරය අගය නොකර සත්‍යාවබෝධය සඳහා ධ්‍යානෝප් ඇති වැදගත්කම පෙන්වා දුන් අයෙකි.

- පසුව ජපානයේ "සෙන්" බුදු දහම ගොඩනැගුණේ බෝධි ධර්මගේ මෙම දර්ශන මතය.

- ඔහු "මහා පරිනිර්වාණ සූත්‍ර ශාස්ත්‍ර" නැමැති එක් ග්‍රන්ථයක් පමණක් පරිවර්තනය කළේය.

## හියුං සියැං

- ක්‍රි.ව. 622 දී පැවිද්ද ලද හියුං සියැං හෝනන් ප්‍රදේශයේ චීන භික්ෂුවකි.

- චීනයේ බෞද්ධ ග්‍රන්ථ පරිවර්තන යුග 3කි.

1. ක්‍රි.ව. 67න් ආරම්භ වූ බුදු දහම චිනයට ප්‍රවිෂ්ට වූ යුගය
2 . ක්‍රි.ව. 405 දී කුමාරජීවගෙන් ඇරඹුණු යුගය
3 . ක්‍රි.ව. 646 දී හියුං සියැංගෙන් ඇරඹුණු යුගය යනුවෙනි.

- මේ කාලයේ අධිරාජ්‍යයේ තිබූ භික්ෂු ආරාම ගණන 3716කි.

- හියුං සියැං විසින් චීන බසට පරිවර්තනය කළ වැදගත් පොත්,
- මහා ප්‍රඥා පාරමිතා සූත්‍රය, විද්‍යාමාත්‍ර සිද්ධි-ත්‍රිදශ ශාස්ත්‍රය, කර්ම සිද්ධ ප්‍රකරණ ශාස්ත්‍රය, මධ්‍යාන්ත විභඞ්ග ශාස්ත්‍රය, මහායාන සම්පරිග්‍රහ ශාස්ත්‍ර මූලය.

## බෝධිරුචි

- මෙතුමාගේ මුල් නම "ධම්මරුචි" වේ.

- ක්‍රි.ව. 693 දී රත්න මේඝ සූත්‍රය චීන බසට මෙතුමා පරිවර්තනය කළහ.

- ක්‍රි.ව. 727 දී බෝධිරුචි මරණයට පත් වන විට ඔහුගේ වයස අවුරුදු 156ක් යැයි කියනු ලැබේ.

- ක්‍රි.ව. 693-713 අතර කාලය තුළදී බෝධිරුචි ග්‍රන්ථ 53ක් පරිවර්තනය කළ බව කියවේ.

- ඒවායින් වැදගත් කිහිපයක්,

- ප්‍රඥා පාරමිතා අර්ධ ශතිකාව, මහා රත්නකූට සූත්‍රය, අමිතායුශ ව්‍යුහය, විනය විනිශ්චය හා මහායාන වජ්‍ර චූඩාමණි බෝධිසත්ව චර්යා වර්ග සූත්‍රයයි.

### චීන බුදු දහම දේශීය බවට පත්වීමේ යුගය (ක්‍රි.ව. 8 සියවස සිට 12 සියවස දක්වා)

- 7 සියවසෙන් පසු තිබ්බතය සමගද චීන සම්බන්ධකම් ඇති විය. ඉන්පසු තිබ්බතයේ "ලාමා" ධර්මයේ අදහස්ද සම්බන්ධකම් ඇති විය.

### චීන බුදු දහමේ මෑත යුගය

- 1280 සිට 1361 දක්වා පැවති මොන්ගෝලීය රාජ කාලය තුළදී මොන්ගෝලියාවේ මෙන්ම චීනයේ ද තදින් ව්‍යාප්ත වූ ලාමා ධර්මයෙන් බුදු දහම සම්පූර්ණ විපර්යාසයකට පත් විය.

- 15 සියවසේ දී පාත්‍රා ධාතුව ලබාගැනීම සඳහා චීන රජකු ලංකාව ආක්‍රමණය කළ බවද පෙනේ.

### චීනයේ වර්තමාන බෞද්ධ ප්‍රබෝධය

- චීනයේ වර්තමාන බෞද්ධ ප්‍රබෝධයේ නායකයා වශයෙන් සැලකිය හැක්කේ 20 සියවසේ මුල් භාගයේ ජීවත් වුනු පූජ්‍ය තායි-හ්සූ ස්වාමීන් වහන්සේය.

- චීනයේ බෞද්ධ සම්මේලනය (1911), වුවැන්ග් බෞද්ධ අායතනය (1912), ජාත්‍යන්තර බෞද්ධ ආයතනය හා සිනෝ-තිබ්බත බෞද්ධ විද්‍යාලය (1930) සහ චීනයේ තරුණ බෞද්ධ සංගමය (1945) යන සංවිධාන මෙතුමා විසින් ආරම්භ කරන ලදි.

- බෝධි නම් සඟරාව මෙතුමා ආරම්භ කරන ලදි.

## චීනයේ බෞද්ධ නිකායයෝ

### සං ලුං සුං නිකාය

- මාධ්‍යමික ශාස්ත්‍රය,ශත ශාස්ත්‍රය සහ ද්වාදශ නිකාය ශාස්ත්‍රය මෙම නිකායට ප්‍රධාන වශයෙන් පදනම් වූ පොත් තුනකි.

### චාන් නිකාය

- මෙහි ආරම්භකයා වන්නේ ක්‍රි.ව.470 දී ඉන්දියාවට පැමිණි බෝධිධර්ම භික්ෂුවයි.

- මෙය "ධ්‍යාන" නිකාය නමින් හැඳින්වේ.බෝධිධර්ම භික්ෂුව චීනයේ වාඕ - ලින් ආශ්‍රමයේ අවුරුදු 9ක් ධ්‍යාන වැඩූ බව කියවේ.

## තියෙන්තායි නිකාය

- මෙය "චි - කා - යි" නැමැති  චීන භික්ෂුව ආරම්භ කරන ලද්දකි.

- මෙම නිකායට පදනම් වී ඇති මූලික ග්‍රන්ථ නම් "සද්ධර්ම පුණ්ඩරික සූත්‍රය" හා "මහා ප්‍රඥා පාරමිතා සූත්‍රයයි".

- මෙම නිකායේ දර්ශනය ඉන්දියාවේ විසූ "නාගර්ජුන" ආචාර්ය වරයාගේ දර්ශනය මත පදනම් වී ඇත.

## සුඛාවතී ව්‍යුහ නිකාය

- 7 සියවසයේදී චීනයේ ටාං රාජවංශය පැවති කාලයේදී "තලං" නැමැති භික්ෂුව විසින් සුඛාවතී ව්‍යුහ හෙවත් "පවිත්‍ර භූමි සම්ප්‍රදාය" ආරම්භ කරන ලදි.
- ක්‍රි.ව.186 දී ලෝකාක්ෂි භික්ෂුව විසින් පරිවර්තනය කළ මහා සුඛාවතී ව්‍යුහ නැමැති ග්‍රන්ථයත්, කුමාරජීව භික්ෂුවගේ "සුඛාවතී ව්‍යුහ" සූත්‍රයත්, කාලයසස් භික්ෂුවගේ "අමිතායුර් ධ්‍යාන" සූත්‍රයත් මෙම නිකායේ ප්‍රධාන ග්‍රන්ථ වේ.

## විනය නිකාය

- විනය හෙවත් ලූ - සුං සම්ප්‍රදායේ ආරම්භකයා 7 සියවසයේ විසූ තාඕ - සූආං ය.

## තන්ත්‍ර යානය

- තන්ත්‍ර හෙවත් මන්ත්‍රයානයේ ආරම්භකයා වන්නේ "චන් - වූ - වෙයි" හෙවත් සුභාකරයි. ඔහු නැගෙනහිර ඉන්දියාවේ ඔරිස්සාවේ රජ කෙනෙකි.

- "වෛරෝචන" බුදුන් වහන්සේ මෙම මන්ත්‍රයානයේ ප්‍රධාන දෙවියා ලෙස සැලකේ.

## අවංසත නිකාය

- පා - චූන් විසින් ආරම්භ කරන ලද මේ නිකාය චීන බසින් හැඳින්වෙන්නේ "පා- සීන්ග් - ත්සුන්ග්" නමිනි.

## බුදු දහම චීන සංස්කෘතිය කෙරෙහි කල බලපෑම

- චීන ජනයාට සාහිත්‍යයක්, ප්‍රතිමා ශිල්පයක් හා විශේෂ වර්ගයේ ගෘහ නිර්මාණ ශිල්පයක් ලැබුනේ බුදු දහමෙනි.

### සාහිත්‍යය

- විමලකීර්ති නිර්දේශ සූත්‍රය, සද්ධර්ම පුණ්ඩරික සූත්‍රය, සුරඞ්ගම සූත්‍රය වැනි සූත්‍ර ග්‍රන්ථයන්ගේ චීන පරිවර්තනයන් එකල සිටි උගත්තු බොහෝ අගය කළහ.

### චීනයේ බෞද්ධ කලා ශිල්ප

- බෞද්ධ ඉන්දියානු කලා සම්ප්‍රදායන් චීනයට පැමිණ ඇත්තේ මධ්‍යම ආසියාව ඔස්සේය.

- මුල් යුගයේ චීන කලා කෘති වල ලක්ෂණ මධ්‍යම ආසියානු නගර වූ "බෝටාන්", "කුචා හා තුං හුඅං" ආදී ස්ථානවල නටබුන් අතර දක්නට ලැබේ.

### ගෘහ නිර්මාණ ශිල්පය

- චීනයේ ඉදිකරනු ලැබූ ස්තූප ප්‍රධාන වශයෙන් ශෛලි දෙකකට අයත් වේ. ඒවා නම් ඉන්දියානු ස්තූප ශෛලිය හා චීන මණ්ඩප ශෛලියයි.

- චීන මණ්ඩප ශෛලියට අයත් ස්තූපයක් වූ "සඳා සමාය" නම් ස්තූපය අඩි 900 පමණ උස් වන අතර මහල් නමයකින් පමණ යුක්ත වෙයි.

### ප්‍රතිමා කලාව

- උතුරු චීනයේ ෂැංසි ප්‍රදේශයේ පිහිටි "යුංකාං" 5 සියවසට අයත් චීනයේ ඇති උසස් කලා මධ්‍යස්ථානයකි.

- ආසියානු හා චීන කලා සම්ප්‍රදායෙන් ගොඩනැගුණු ප්‍රතිමා වල විශේෂ ලක්ෂණයක් වූයේ මද සිනහව සහිත මුහුණේ ප්‍රකාශනයත් අලංකාර රැළි සහිත ඇඳුම් නිරූපණයත් ය.

- ඇවිදින ඉරියව්වෙන් නෙළා ඇති බෝධිසත්ව රූපයත්, දැනට බොස්ටන් කලාගාරයේ ඇති වැඩසිටිනා බෝධිසත්ව රූපයත් මේ යුගයට අයත් උසස් කලා කෘති වේ.

- නව සම්භාව්‍ය සම්ප්‍රදායට අයත් උසස් බෝධිසත්ව රූපයක් නිව්යෝර්ක් නගරයේ මෙට්‍රොපොලිටන් කෞතුකාගාරයේ ඇත.

- තවද අවලෝකිතේශ්වර බෝධිසත්වයන් කරුණාවේ හා අනුකම්පාවේ මූර්තියක් වූ "ක්වැන් - යින්" නැමැති දිව්‍යාංගනාවක් වශයෙන් නිරූපණය කිරීමය. දැවයෙන් කළ "ක්වැන් - යින්" ප්‍රතිමාවක් බොස්ටන් කෞතුකාගාරයේ ඇත්තේය.

## චිත්‍ර කලාව

- මෙකල කලාකරුවන්ගේ ප්‍රධාන මාතෘකා වූයේ ජාතක කතාත්, පිරිවර භික්ෂු සංගයා සහිත බුදුන් වහන්සේ නිරූපණය කිරීමත් ය.

- ක්‍රි.ව. 8 සියවසයේ ජීවත් වූ "වූ - තාම් - ත්සේ" සුප්‍රසිද්ධ චිත්‍ර කලාකරුවෙකි.

- දකුණු ෂැංසි පළාතේ පිහිටි කුආංග් - ෂෙංග් විහාරයේ ඇති බිතුසිතුවම් 14 සියවසට අයත් ය.

- මු - වී , වූ - චුං , සහ යිං - යූ - වියෙන් කීර්තිමත් චිත්‍ර කලා ශිල්පීන් කිහිපදෙනෙකි. මේ හැමදෙනාම භික්ෂූන් වහන්සේලාය.

# 16. පාඩම
# ජපානයේ බුදු දහම

- වැඩි කොටසක් අදහන්නේ මහායාන බුදුදහමයි

## ජපානයට බුදු දහම පැමිණීම

- බුදුදහම පැමිණියේ ක්‍රි.ව. 6 වන සියවසේදී ය.
- ඊට ප්‍රථම ජපානයේ ආගම වූයේ ස්වභාවධර්මයේ කල්පිත දෙවිවරුන් හා මළවුන් ඇදහීම යි - ෂින්ටෝ ධර්මය
- මෙහි ප්‍රධාන දෙවඟන වූයේ "අමතේරසු ඔමි කමි" නමැති හිරු දෙවඟනයි.
- බුදු දහම හඳුන්වා දී ඇත්තේ කොරියාවේ කුදරා රාජ්‍යයේ රජතුමා විසිනි.
- ඔහු බෞද්ධ පොත්පත් රැසක්ද, ලෝහ බුදු පිළිමයක් ද බුදු දහම පිළිබඳ ප්‍රශංසාත්මක ලියවිල්ලක් ද ජපානයේ අධිරාජ්‍යා වූ කිම්මෙයි වෙත ක්‍රි.ව. 552දී එවන ලදී.
- එකල ජපානයේ තිබූ සෝගා, මොනොනොබෙ, නකතොමී යන ගෝත්‍ර 3 න් මොනොනොබෙ හා නකතොමී ගෝත්‍රිකයෝ එයට විරුද්ධත්වය පළ කලද සෝගාවරුන් පක්ෂ වීම රජ මැදුර අසල මැදුරක් තනා බුදු පිළිමය තබා පුද පූජා පවත්වන ලදී.
- ක්‍රි.ව. 577දී භික්ෂූන් තිදෙනෙකුගෙන් යුතු දූත පිරිසක්, ප්‍රතිමා ශිල්පියෙක්, ගොඩනැගිලි ශිල්පියෙක් ද සහිතව ජපානයට පැමිණියහ.
- ක්‍රි.ව. 585දී යොමෙයි අධිරාජයා බුදුදහම වැළඳගැනීම.

## ජපානයේ බුදු බුදුදහම තහවුරු වීමේ යුගය

- ක්‍රි.ව. 592 දී කිම්මෙයි අධිරාජයාගේ දුවක වන සුයිකෝ කුමරිය ජපානය අධිරාජිනිය බවට පත්වීමත් සමඟ බුදු දහමට හොඳ යුගයක් උදාවිය. මෙකල යුවරජ වශයෙන් පෙනී සිටියේ උමයාදො කුමරු හෙවත් ෂොතොකු තයිෂි ය.

### ෂොතොකු තයිෂි (573-622)

- බුදුදහම ප්‍රතිෂ්ඨාපනය කිරීමටත් ව්‍යාප්ත කිරීමටත් පුරෝගාමී විය.
- මේ කාලයේ බෞද්ධ සිද්ධස්ථාන ඇරැඹිණි.
- ක්‍රි.ව.605දී බුදු පිළිමය ඉදිකිරීම.
- ලෝකයේ පැරණිම දැවමුවා ගොඩනැගිල්ල වන හොර්යුජි ආරාමය ගොඩනැගුණේ මේ අවධියේය.
- පාසල් ගොඩ නැගිණි.
- චීනය සමඟ තානාපති සබඳකම් ආරම්භය.
- ක්‍රි.ව. 594දී තිසරණය ආරක්ෂා කිරීම පිළිබඳ රාජ නියෝගයක් නිකුත් කිරීම.
- ක්‍රි.ව. 604දී කරුණු 17ක් සහිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කිරීම.

- සද්ධර්ම පුණ්ඩරික සූත්‍රය, ආයී ශ්‍රී මාලා දේවී සිංහාවදන නාම - මහායාන සූත්‍රය සහ විමලකීර්ති නිර්දශය යන මහායාන ග්‍රන්ථයන්ට අටුවා ලිව්වේය.
- මහායාන හීනයාන යන දෙකේම අදහස් ගැබ් උන ඒකායන වාදය ප්‍රචලිත කිරීම

## බුදුදහම නිසා සමාජයේ සිදු වූ වෙනස්කම්

- ෂින්තෝ ධර්මය බුදු දහමට බාධකයක් නොවීය.
- තෙම්මු අධිරාජයාගේ කාලයේ බුදුදහමටත් ෂින්තෝ ධර්මයටත් එක සේ සැලකිලි ලැබිණි.
- මුල්වරට දෝෂෝ නම් භික්ෂුවගේ සිරුර ආදාහනය කිරීම - ක්‍රි.ව. 700දී පමණ
- ජිතෝ අධිරාජිණිය මළ පසු මෘතදේහය ආදාහනය කිරීම.
- බිලි පූජා සඳහා සතුන් මැරීම තහනම් කිරීම.
- තද නියඟයක දී සතුන් මුදා හැරීම, දුෂ්කර අවස්ථාවක දී මත්පැනින් වැළකී සිටීමට ජනතාවට නියෝග කිරීම.
- භූමි කම්පා වල මතු ආරක්ෂාව සඳහා ත්‍රිපිටකය සංඝායනා කිරීම.
- අනුන්ගේ යහපත උදෙසා පැවිදි වීම.
  උදා:- යොමෙයි අධිරාජයා තදබල අසනීප වූ විට ෂිබා තිත්තොගේ පුතා පැවිදි වීම.

## නරා යුගය

- ගෙම්මොෆ් අධිරාජිනිය නරා ප්‍රදේශය අගනුවර කර ගැනීමෙන් ස්ථිර අගනුවරක් ඇතිවිය.
- ෂොමු අධිරාජයා සහ ඔහුගේ මෙහෙසිය වූ කෙමාපා රැජිණද බුදුදහමට ඉතා ලැදි විය.
- ගොාහී නම් උගත් භික්ෂුවගේ සහය රජුට ලැබිණි - බෝධිසත්ව යන ගෞරව නාමයෙන් පුදනු ලැබීය.
- සෑම ප්‍රදේශයකම බුද්ධ ප්‍රතිමා ඉදිකිරීම, ඥාන පාරමිතා සූත්‍රයේ පිටපත් බෙදා දීම, භික්ෂු ආරාම ගොඩනැගීම, භික්ෂුණී ආරාම ගොඩනැගීම, භික්ෂු භික්ෂුණීන් ලවා ධර්ම ප්‍රචාරය කර වීම
- නරාහි ප්‍රධාන බෞද්ධ මධ්‍යස්ථානය වූ තෝයිද්- ජී විහාරය ඉදි කිරීම.
- වෛරෝචන බුදුන්වහන්සේගේ විශාල පිළිමය මෙහි ඉදි කිරීම.
- මුත්සු ප්‍රදේශයෙන් රත්රන් මතුවීම ආශ්චර්යයක් යැයි සිතා ෂෝමා අධිරාජයා වෛරෝචන බුදු පිළිමය අභියස ස්තුති කතාවක් කිරීම.
- කෝනෙන් කුමරියගේ කාලයේ දී බෝධි සේන වැනි භික්ෂූන් ජපානයට පැමිණ සංස්කෘත හා බුද්ධාගම ඉගැන්වූ බව පෙනේ.
- කුෂා, ජොජිත්සු, රිත්සු, හොස්සෝ, සන්රොන් සහ කෙගොන් යන ප්‍රධාන බෞද්ධ සම්ප්‍රදායන් 6 ප්‍රචාරය වීම - මහායාන ධර්ම ග්‍රන්ථයන් පදනම් කොට සකස් වූ ඒවා ය.
- කුෂා - සර්වාස්ති වාදින්ගේ අභිධර්ම කෝෂය පදනම් වූ ආගමික සම්ප්‍රදාය යි.
- රිත්සු - සත්‍ය-සිද්ධි ග්‍රන්ථය මුල්කරගත් ශුන්‍යතාවාදය යි.
- හොස්සෝ- යෝගාචාර වාදයයි.
- සන්රොන් - නාගර්ජුනගේ මාධ්‍යමික ශාස්ත්‍රය පදනම් වූවකි.
- කෙගොන් - අවතංසක සූත්‍රය පදනම වූවකි.

## හෙයියන් යුගය

- රජ පවුලේ උදවිය සසුන්ගත වීම සමගම ලාභ ප්‍රයෝජන ගිජු වූවන් සසුන්ගත වීමද සිදුවිය.
- බුදු සසුනේ පිරිහීම සහ රාජ්‍යයේ අවුල් වියවුල් ඇතිවිය.
- ක්වම්මු අධිරාජයා සිය අගනුවර කියෝතෝ නගරයට ගෙන ගියේය.
- එයට සාම අගනුවර හෙවත් හෙයියන්ක්‍යෝ යන නම තැබීය.
- චීනයට ගොස් බුදු දහම ඉගෙන ගෙන පැමිණි දෙන්ග්‍යෝ දයිෂි සහ කෝබෝ දයිෂි ක්යෝතෝ අවට කඳුකරයේ භික්ෂුව රාම පිහිටුවා ගත්හ.
- දෙන්ග්‍යෝ දයිෂි භික්ෂුවගේ තෙන්ඩායි-ෂු නම් ස්වකීය නිකායයේ මධ්‍යස්ථානය - ක්යෝතෝහි හියෙයි කඳුකර ප්‍රදේශයේ
- කෝබෝ දයිෂි භික්ෂුවගේ ෂින්ගොන්-ෂු නැමැති ස්වකීය නිකායේ මධ්‍යස්ථානය - කෝයා කන්දේ පිහිටුවා ගත්තේය.
- මෙම ආරාම දෙක පදනම් කරගෙන ආරම්භ සහිත විශ්වවිද්‍යාල නගර පහළ විය.

## ධර්ම විනාශය

- එකොළොස් වන සියවස අගභාගයේ දී තරමක දේශපාලන නොසන්සුන් තාවයක් ඇති විය.
- හේතුව - වර්ෂ 1052 ධර්ම විනාශය සිදුවන යුගයේ ආරම්භය වශයෙන් සැල කිරීම.
- චීනයේ හා ජපානයේ පිළිගැනුනේ බුද්ධ පරිනිර්වාණය සිදු වූයේ ක්‍රි.පූ. නොමැති 949 වර්ෂයේ යනුයි.
- පරිනිර්වාණය සිට දහසක් අවුරුදු කාලය සද්ධර්මය පවතින කාලය වශයෙනුත්,
- ඊළඟ දහස් වර්ෂය ප්‍රතිරූප ධර්මය පවතින කාලය වශයෙනුත්,
- තුන්වනුව අවුරුදු දස දහසක් දැක්වූ කාලය පශ්චිම ධර්ම කාලය ලෙසත් ලෙස සැලකිණි. පරිහානි යුගයකි.
- තෙන්දායි හා ෂින්ගොන් නිකාය දෙකම පිරිහෙමින් පැවතුණේය.
- මෙම යුගයේදී වැඩි සැලකිල්ල චිරන්තන බුද්ධ ධර්මය කෙරෙහි යොමු විය.

## බුදුදහම පොදුජන අවශ්‍යතා වලට සකස්වීම හා ජපන් බෞද්ධ සම්ප්‍රදායයෝ

## කමාකුරා යුගය

- කමාකුරා නගරය අගනුවර වූ පසු පොදුජන අවශ්‍යතා වලට ගැලපෙන බුදු දහමක අවශ්‍යතාවයක් පෙනිණ.

## අමිතවාදය

- අමිතාභ බුදුන් (නෙම්බුත්සු) හෙවත් මහා ගැලවුම්කාරයාණන් පිළිබඳ ලියවී ඇති සුඛාවතීව්‍යූහ සූත්‍රයද හත්වන සියවසේ දී ජපානයට ලැබුණි.
- මේ අනුව මුලින්ම ප්‍රතිසංස්කරණයක් කිරීමට උත්සාහ කළේ කුයා ෂෝනින් තුමා ය

- මින්පසුව ගෙන්ෂින් නම් සුප්‍රකට භික්ෂුව විමුක්තිය ලබාගත හැක්කේ අමිත බුදුන්ගේ ස්වර්ගය වන සුඛාවතියෙහි ඉපදීමෙන් බව ප්‍රකාශ කරමින් ලියූ වොජො-යෝෂු (ශුද්ධ භූමියෙහි ඉපදීම) නම් ග්‍රන්ථය ලියන ලදී.
- නියම නෙම්බුත්සු නායකයා හෝනෙන් ෂොනින් තුමාය.
- හෝනෙන් ආගමික ඇදහිල්ල කොටස් දෙකකට බෙදී ය.
  1) ෂෝදෝ / පුණ්‍ය මාර්ගය - පින් කිරීම මගින් විමුක්තිය ලබාගැනීම

  2) ජෝදෝ/ ශුද්ධ භූමි මාර්ගය - අමිත බුදුන් කෙරෙහි විශ්වාසය තැබීම

## ෂින් නිකාය

- හෝනෙන්ගෙන් පසුව ජෝදෝ නිකායේ නායක බවට පත්වීමට සිටි ෂින්රාන් ෂොනින් ෂින් නිකාය පිහිට විය.
- අධ්‍යාත්මික සම්බන්ධය නොමැතිව යාඥාව ඵල රහිත බව එතුමාගේ අදහසයි.

## නිචිරෙන් නිකාය

- මෙම සම්ප්‍රදාය නිර්මාතෘවරයා නිචිරෙන් ෂෝනින් තුමාය.
- ඔහුගේ නිගමනය වූයේ බුද්ධ ධර්මය සත්‍ය ගැබ්වී ඇත්තේ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ බවය.
- අමිත නමස්කාරය කරනවා වෙනුවට "සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ට නමස්කාර වේවා" (නමු-මියෝ-හො-රෙන්-ගේ-ක්යෝ) යන පාඨය සජ්ඣායනය කිරීමෙන් පහසුවෙන් විමුක්තිය ලද හැකි බව ඔහු තීරණය කළේය.
- මෙසේ කිරීමෙන් මොන්ගෝලීය අධිරාජයාගේ ආක්‍රමණයෙන් බේරීමට හැකි බව කියූ නිසා ඔහු ජාතිය බේරාගත් බෝධි සත්වවරයා වශයෙන් හඳුන්වයි.

## සෙන් සම්ප්‍රදාය

- සෙන් බුදු දහම ජපානයට ලැබුණු චීනයෙනි
- "සෙන්" යනු ජපන් වචනයකි. මෙය "චන්" යන චීන පදයයි. (එය "ධ්‍යාන" යන සංස්කෘතික පදයේ විකෘතියයි.)
- ධ්‍යාන බුදු දහම චීනයට ගෙනාවෙ ඉන්දියානු ජාතික බෝධිධර්ම භික්ෂුව විසිනි.
- චීනයේ දී මෙය කොටස් දෙකට බෙදුනි.
  1) ක්‍රමික බුද්ධත්වය

  2) ක්ෂණික බුද්ධත්වය
- ධ්‍යාන ධර්මයට නියම චීන මුහුණුවර දුන්නේ හුයි නෙංග් ය.
- ස්ව-චිත්තය නැතහොත් ස්ව-ස්වභාවය සමීක්ෂණය කිරීමෙන් බුද්ධත්වය ලැබිය හැකි බව ඔහු පෙන්වීය.

## ජපානයේ සෙන් බුදු දහම

- ජපානයේ දී සෙන් බුදු දහමේ ප්‍රධාන ශාඛා දෙකකි.
  1) එන්සයි නම් භික්ෂුව විසින් පිහිටුවන ලද නිකාය රින්සයි නම් වේ.

  2) දොජොන් නම් භික්ෂුව පිහිට වූ නිකාය සොතෝ නම් වේ.

- සෙන් දහමේ පරමාර්ථය සතොරිය ලබා ගැනීමය.
- සතොරිය ලෙස හඳුන්වන්නේ යම් පුද්ගලයකු ඔහුගේ යථා ස්වභාවය හරිහැටි දැකීමෙන්, සසර බැඳ තබන විවිධ බැඳීම් බිඳීම නිසා ඔහුට ලැබෙන වින්දනයයි.
- මෙම වින්දනය, ක්ෂණික බව - දක්ෂිණ පාර්ශ්වය
- ක්‍රමික බව- උත්තර පාර්ශ්වය
- රින්සෙයි දහම - ක්ෂණික බුද්ධත්වය සංකල්පය
- සෝතෝ - ක්‍රමික බුද්ධත්ව සංකල්පය - භාවනා කිරීමේ ක්‍රමය
- එකම අරමුණ කරා යන වෙනස් මාර්ග දෙකකි.
- සෙන් දහම මගින් ජපන් සංස්කෘතිය පෝෂණය විය.
- සෙන් ආරාම කලා නිකේතන විය. පුෂ්පාලංකරණය (ඉකෙබානා), තේ මංගල්‍යය, චිත්‍ර ශිල්පය, මූර්ති ශිල්පය, ධනු ශිල්පය, කඩු හරඹය වැනි අංගයෝ මේ ආභාසය ලබා සකස් වූහ.

## බුදු දහම පිරිහීමට පත් වීම

- බුදු දහම ඉහළම තත්ත්වයට පත්වූයේ කමකුරා යුගයේ දී ය.
- නොබුනගා විසින් හිසෙයි කන්දේ තිබූ භික්ෂු බල ඇණි සියල්ල හා විහාරාරාම විනාශ කර දමන ලදී.
- මින් පසුව පාලනය ගත් හිදෙයොෂි, නෙගෝරෝ විහාරයත් භික්ෂූනුත් විනාශ කර දැමීය.
- මෙයට වගකිව යුත්තේ ශ්‍රේෂ්ඨ භික්ෂූන් වහන්සේලාගේ පසුකාලීන අනුගාමිකයින් ය.

### තොකුගාවා යුගය

- බුදු දහම දුබල වත්ම ෂින්තෝ හා කොන්ෆියුෂියන් ධර්මයන් ඉස්මතු විය.
- භික්ෂූන් තමන් සතු බලය අනිසි ලෙස යෙදීම නිසා තොකුගාවා අධිපතීන් ගේ නීතිරීති දැඩි විය.
- තොකුගාවා ඉයෙයසු වර්තමාන තෝකියෝවේ තම මාළිගය ඉදි කරන ලදී.
- තොකුගාවා අධිපතීන්ගේ දැඩි පාලනයෙන් කලකිරීම නිසා අධිරාජයාට වැඩි බලයක් ලබා දීමට ෂින්තෝ දහමට නැඹුරු වීමට ජනතාව යොමු විය.

### මෙයිජී යුගය

- ෂින්තෝ දහම රාජ්‍ය ආගම විය.
- නව පාලකයෝ බුදු දහම මැඩපැවැත්වීමට කටයුතු කළ නිසා මෙය ජපන් බෞද්ධ ඉතිහාසයේ ඉතාම දුර්භාග්‍ය සමයයි.
- සෙන් වාදික එකිදෝ, සෙස්සෝ, දෝකුබන් යන භික්ෂූහු ද, ජෝදෝවාදික තෙන්සුජෝ, ෂින්ෂුවාදික මොකුරයි, ෂින්ගෝ වාදික උන්ෂෝ ආදී භික්ෂූන්ගේ ද පුරෝගාමීත්වයෙන් 1872දී ආගමික කටයුතු පාලනය කිරීමට පැවිද්දන්ගේ මණ්ඩලයක් පිහිටුවන ලදී.
- එතැන් පටන් රාජ්‍ය ආගම නම් කළේ කළේ ශ්‍රේෂ්ඨ ධර්මය නමිනි.
- 1877දී පැවිද්දන්ගේ මණ්ඩලය විසුරුවිය.
- ප්‍රැන්සිස් ක්ෂාවියර් විසින් ජපානයට ක්‍රිස්තු ධර්මය රැගෙන යන ලදී.
- බටහිර සංස්කෘතියට හසු වූ ජපන් සමාජය ලෞකික පක්ෂයට බර විය.

- 1952දී ලෝක බෞද්ධ සම්මේලන වාරය ජපානයේ පැවැත්වීම නිසා නැවතත් ජපන් බෞද්ධයන් ප්‍රබෝධමත් යුගයක් ඇරඹිණි.

## බුදු දහමෙන් ජපානයට ඇති වූ බලපෑම

- ජපන් සංස්කෘතිය හා ජපන් ඉතිහාසය ඇරඹිණ.
- බුදු දහම වෙනත් ආගම් සමඟ ගැටෙන සුළු ආගමක් නොවීම නිසා ෂින්තෝ දහමත්, කොන්ෆියුෂියන් වාදයත් බුදු දහමේ ව්‍යාප්තිය සමඟ අභාවයට නොයාම.
- ෂින්තෝ අදහස් වලට බෞද්ධ මුහුණුවරක් ලබාදීම.

### බුදු දහම හා දේශපාලනය

- ජපානයේ බෞද්ධ බලය සෑම අංශයකටම පැතිර ගිය ෂොතොකු තයිෂිගේ අවුරුදු තිහක 30 ක පාලන කාලය ජපානයේ ස්වර්ණමය යුගයක් ලෙස හැඳින්වේ.
- එතුමා බුද්ධාගම ජපානයේ රාජ්‍ය ආගම බවට පත් කළේය.
- බුදු දහම පදනම් කරගෙන පාලන ව්‍යවස්ථා ක්‍රමයක් සකස් කළේය.
- ජපන් අධිරාජයෝ සහ අධිරාජිණියෝ විටින් විට පැවිදි බිමට ඇතුළත් වීම.
- ඇතැම් විට අධිරාජයෝ සිය අගනුවරවල් පවා වෙනස් කිරීම.

### සදාචාර සංවර්ධනය හා සමාජ සංවර්ධනය

- කෝබෝදයිෂි, දෙන් ගෙයෝදයිෂි, නිචිරෙන්, හෝනෙන් ෂෝනින්, ඒසයි ඒකනෙ මහා පුරුෂයන් හා වියතුන් බිහි වුණේ බුද්ධ ධර්මයේ එන සදාචාර වටිනාකම් තුළිනි.
- ගමෙන් ආරෝග්‍යශාලාවත්, අනාථ දරු නිවාසයත්, අභය භූමියත්, මහලු නිවාසයත්, වැන්දඹුවන්ගේ ක්ෂේම ස්ථානයත් පිහිටා තිබුණේ පන්සලේ ය.
- ග්යෝකි නම් වියත් භික්ෂුව ධර්ම ප්‍රචාරය මෙන්ම වාරිමාර්ග තැනීම, පාලම් මංමාවත් තැනීම ආදී කටයුතුවලද යෙදීම.

### අධ්‍යාපනය හා සාහිත්‍යය

- චීන සංස්කෘතියේ අංගයක් හෝ අක්ෂර විද්‍යාව ජපානයේ පැතිරයාම.
- ජපානයේ පන්සල්වල පිහිටා ඇති පාසල් - "තෙර කෝයා"
- මෙහි ගොවි දරුවන් හා වෙළඳ දරුවන් උගනී.
- ප්‍රධාන විෂයන් වන්නේ ලිවීම, කියවීම හා ගණිතය යි.
- චීනයෙන් ලැබුණු සංස්කෘත භාෂාවෙන් ලියනු ලැබූ බුද්ධ ධර්ම සාහිත්‍යය ඇති විය.
- බෞද්ධ කතා පදනම් වූ ජාතික සාහිත්‍යයක් බිහි විය.
- ප්‍රසිද්ධ ග්‍රන්ථ - තකෙතෝරි, මොනග තරි, ඉසෙමොනගතරි, තොස නික්කි
- කාව්‍යයන් - හයිකු, වසන්, ජොරුරි
- නාට්‍යයන් - බුන්රකු, කබුකි

# ජපානයේ කලා ශිල්ප

- පන්සල්, විහාර, බුදු පිළිම ආදිය ගොඩනැගීමත්, බිතු සිතුවම් ඇඳීම ඇරඹීමත් නිසා කලා කෞෂල්‍යය තවත් වර්ධනය විය.
- අසුකා, නරා, හෙයියාන්, කමාකුරා යුගයෙහි දී ඉතා දියුණු තත්ත්වයක තිබුණි.

## ගෘහ නිර්මාණය

- මුල් පන්සල් වල කැපී පෙනුණේ චීන ලක්ෂණයි.
- අසුකා යුගයට අයත් නරා නුවර අබියස පිහිටි "හොර්යුජි" පන්සල බෞද්ධ ලක්ෂණ සහිත පැරණි ජපන් පන්සලකි - ෂෝතොකු තයිෂි කුමාරයාගේ කාලයේ දී
- මෙය ලෝකයේ ඇති ඉපැරණිම දැවයෙන් කළ ගොඩනැගිල්ල වේ.
- හෙයියන් යුගයේදී පන්සල් ගොඩනැගුණේ ගොඩනැඟුනේ හියෙයි කන්දේ කෙන්දායි නිකාය මූලස්ථානයේ සහ කෝයා කන්දේ ෂින්ගොන් මූලස්ථානයේ ය.
- කියෝතෝ නගරයට නුදුරු ප්‍රදේශයක ඉදි කරන ලද බියෝදෝයින් පන්සල, පන්සල් ගෘහ නිර්මාණයේ උසස්ම කෘතියකි.
- කමකුරා නගරයේ ඉදි කරන ලද එන්ගකුජි පන්සල චීනයේ සුං වංශික රජුන්ගේ මාලිගා ක්‍රමය නිරූපණය කරයි.
- කල්යත්ම පන්සල් වල සරල ලක්ෂණ නැති වී රජමාලිගා පරිද්දෙන් අලංකාර කිරීම ඇරඹිණි.
- පන්සල් ඉදිරියේ තනන සාංචි වර්ගයේ තොරණ විශේෂ ලක්ෂණයකි.

## ජපානයේ මූර්ති කලාව

- බුදුපිළිම චීන - කොරියානු ප්‍රතිමා ලක්ෂණ විදහාපායි.
- මූර්ති කලාව ජපානයට හඳුන්වා දී ඇත්තේ ෂිබාතන්තෝ නම් චිත්‍ර ශිල්පියා ය.
- හොරියුජි පන්සලේ ඇති ලෝහමය ප්‍රතිමා නෙලන ලද්දේ ඔහුගේ මුණුබුරු තෝරි විසිනි.
- නරා යුගයේ මූර්ති වල චීන නිර්මාණ ලක්ෂණත් ජපන් ශිල්ප ක්‍රමයත් මිශ්‍ර වී තිබේ.
- තොජයි ජි පන්සලේ ඇති දයි බුත්සු නම් වෛරෝචන බුදුරදුන්ගේ යෝධ ප්‍රතිමාව, යකුෂිජ පන්සලේ ඇතින් රන් ආලේප කරන ලද ලෝහ බෝධිසත්ව පිළිමත්, තොදායි ජි පන්සලේ ලෝකපාල දෙවි පිළිමත් මේ යුගයටම අයත් ය.
- හෙයියාන් යුගයේදී, ජෝමෝ නම් නම් ශිල්පියා විසින් නෙළන ලද අමිදා බුදුන්ගේ ප්‍රතිමා - කියෝතෝ නගරයේ හොකයි ජි සහ බියෝ දොයින් පන්සල් වල ඇත.
- බියෝදෝ ඉන් හි අමිද බුදුන්ගේ ප්‍රතිමාව
- කමකුරා යුගයේදී,
- කොකෙයි, උන්කෙයි සහ කන්කෙයි වැනි උසස් ප්‍රතිමා ශිල්පීන් බිහිවිය.
- කමාකුරා දායිබුත්සු නම් මහා බුද්ධ ප්‍රතිමාව
- අමිද බුදුන්ගේ පිළිම, මිරෝකු නම් මෛත්‍රිය බෝසත් පිළිම, ක්වංනන් නම් අවලෝකිතේශ්වර බෝසත් පිළිම වැඩිපුර දක්නට ලැබේ.
- ජපන් මූර්ති කලාවේ ස්වර්ණමය යුගය කමකුරා යුගයයි.

## චිත්‍ර කලාව

- ආභාසය ලැබුණේ කොරියාවේ හා චීනය චිත්‍ර වලිනි.
- නාරා හි හොර්යූජි පන්සලේ දොරවල්වල හා ජනෙල් වල ඇත.
- තමා මුෂිමේ ෂුසි නම් මේ සිතුවම්වලින් බෝසත් සිරිත් නිරූපණය වේ.
- හෙයියාන් යුගයේදී අමිද බුදුන් හා නොයෙකුත් බෝසත්වරුන් දැක්වීමට අඳින ලද චිත්‍ර වැදගත්ය.
- බුදුරදුන් හා බෝසතුන් යැදීමේ මණ්ඩල ඇඳීම විශේෂාංගයකි.
- සුමියේ නම් කලා සම්ප්‍රදාය බුදු දහම නිසා ආරම්භ වේ.